මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission

# 2025

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

# සිංහල

## පටුන


**01. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය** ........................ 01

1.1. මැතිවරණ දෙපාර්තමේන්තුව ........................................................................ 01

1.2. මැතිවරණ කොමිෂන් සභාව ........................................................................ 01

1.3. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර ........................................ 02

1.4. මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථ, බලතල, කාර්යය හා කර්තව්‍යය .......... 02

1.5. සංවිධාන සටහන හා කාර්යාල පිරිසැකැස්ම .................................................. 04

**02. පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම** .................................................................. 05

2.1. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් .............................................................. 05

2.1.1. කොමිෂන් සභාව සමග පැවති විශේෂ සාකච්ඡා .................................. 05

2.2. ඡන්දහිමියන් ලියාපදිංචිය ........................................................................ 05

2.2.1. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම් ........................................................ 06

2.2.2. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා නුසුදුසුකම් ........................................................................ 06

2.2.3. 2021 අංක 22 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත .... 06

2.2.3.1. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට (ප්‍රධාන ප්‍රඥප්තිය) සිදු කළ මූලික සංශෝධන සහ ඊට අදාල සුවිශේෂි කරුණු ........................................................ 06

2.2.3.2. පරිපූරක ඡන්දහිමි නාමලේඛන සම්බන්ධයෙන් .................. 07

2.2.3.3. ඡන්දහිමියන් ලියාපදිංචියට අදාළව කටයුතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට ඇති නෛතික ප්‍රතිපාදන .................. 07

2.3. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2025 .................................... 07

2.3.1. 2025 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය අනුව ප්‍රධාන නාමලේඛනය සැකසීම ........................................................ 08

2.3.2. ‘අ’ ‘ආ’ ලැයිස්තු ප්‍රදර්ශනය : හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම ........ 09

2.3.3. වලංගු නාමලේඛනය (හෝ කොටසක්) සහ “අ” ලැයිස්තු හා “ආ” ලැයිස්තු ප්‍රදර්ශන ස්ථාන ........................................................ 10

2.3.4. හිමිකම් සහ විරෝධතා පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රමාද ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීම ........................................................ 11

2.3.5. 2025 ඡන්දහිමි නාමලේඛනයට අදාල සංඛ්‍යා සටහන් .................. 12

2.3.6. තුලනාත්මක සංඛ්‍යා සටහන් .............................................. 12

2.3.7. 2024(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම .................. 13

2.3.8. 2025 පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම. .................. 13

2.3.9. 2025 (1) වන පරිපූරක නාමලේඛනය .................................... 13

2.3.10. 2025 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය .......................... 14

2.3.11. 2025 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය .......................... 14

2.3.12. 2026 (1), 2026 (2) සහ 2026 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම ........................................................ 14

2.3.13. පරිපූරක නාමලේඛනවලට අදාල සටහන් .......................... 14

2.4. ඡන්දහිමි නාමලේඛන ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම ...... 15

2.4.1. ප්‍රතිශෝධනය පිළිබඳව කෙටි පණිවිඩ (SMS) මගින් ජනතාව දැනුම්වත් කිරීම ........................................................ 16

2.5. පාර්ලිමේන්තු මන්ත්‍රිධුර පුරප්පාඩු පිරවීම .......................... 18

2.6. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06 .......................... 18

2.6.1. පසුබිම ........................................................ 18

2.6.2. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරනු ලැබූ ගැසට් නිවේදන ............................................................................................ 20
2.6.3. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත නිකුත් කරනු ලැබූ චක්‍රලේඛ ………………….......…. 20
2.6.4. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය කරන ලද ලේඛන. ………………………………………...........…. 20
2.6.5. පළාත් පාලන ඡන්ද විමසීමට අදාළ නඩු කටයුතු ……………......……….. 20
2.6.6. තැපැල් ඡන්ද ………................................................................……... 21
2.6.6.1. තැපැල් ඡන්ද සලකුණු කිරීම .................................................... 21
2.6.6.2. තැපැල් ඡන්ද හිමියන් සඳහා ඉ - සේවාවන් ............................ 22
2.6.7. මැතිවරණ ආරවුල් කළමනාකරණ හා නීති බලාත්මක කිරීම...................... 23
2.6.7.1.නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ නීතිය බලාත්මක කිරීම සම්බන්ධයෙන් මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකයේ ක්‍රියාකාරීත්වය ............................................ 23
2.6.7.2.මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීම ............ 24
2.6.7.3.මැතිවරණ ආරවුල් කළමනාකරණය සම්බන්ධව පුහුණු වැඩසටහන් පැවත්වීම ............................................................ 24
2.6.7.4.මැතිවරණ නීති බලාත්මක කිරීම සඳහා නිකුත් කරන ලද ගැසට් නිවේදන ........................................................................... 25
2.6.7.5.ඡන්ද විමසීමේ කාලසීමාව තුළ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමේ හෝ අගතියට පත්වන ආකාරයේ කටයුතුවලින් වැලකිය යුතු බව 26
2.6.7.6.ඡන්ද විමසීම තරග කරන සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම, ස්වාධීන කණ්ඩායමකටම හා අපේක්ෂකයකුටම ඡන්ද විමසීම වෙනුවෙන් වැය කළ හැකි උපරිම වියදම් සීමාව හෙවත් අවසරලත් මුදල ............................................................................. 27
2.6.8. නිල ඡන්ද දැන්වීම්පත් ………………………………………………….… 27
2.6.9. මැතිවරණ නිරීක්ෂණ කටයුතු ................................................................. 27
2.6.9.1. දේශීය නිරීක්ෂණ සංවිධාන ..................................................... 27
2.6.10.අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමට අදාළ ආකෘති පත්‍ර සකස් කිරීම ................... 28
2.6.11.ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් ඇති වගකීම .............................................................................................. 28
2.6.11.1. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් ........................................... 28
2.6.11.2. කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් විසින් විශේෂ ප්‍රවාහන පහසුකම් සඳහා ඉල්ලුම් කිරීම සහ අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවසරය ...................................................................... 29
2.6.12.ඡන්දය ප්‍රකාශ කරන ආකාරය පිළිබඳ සියලුම ඡන්ද හිමියන් දැනුවත් කිරීම 29
2.6.13.සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකි වනු පිණිස නිවාඩු දීම 29
2.6.14. ඡන්දය පාවිච්චි කිරීමට පැමිණීමේ දී ඡන්දදායකයන් විසින් ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව ........................................................ 29
2.6.15.ඡන්ද විමසීම් සම්බන්ධයෙන් ප්‍රචාරක කටයුතු තහනම් කරන ලද නිහඬ කාලසීමාව .................................................................................................. 30
2.6.16.ඡන්දය ගණන් කිරීම, ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම හා ධූර සඳහා පත් කිරීම් 30

2.6.17.පළාත් පාලන ආයතනවල සභිකධුර පුරප්පාඩු පිරවීම ………..…….… 31
2.7.පළාත් සභා ඡන්ද විමසීම ……………………………………………... 31
2.8. විශේෂ ව්‍යාපෘති ………………………………………………….... 32
2.8.1. වාර්ෂික පර්යේෂණ සැසිය - 2025……………………………….... 32
2.8.2. වතු අංශයේ සහ ආන්තික ජන කොටස් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීම. ........................................................................................ 34
2.8.3. ශිෂ්‍ය පාර්ලිමේන්තු සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ………... 35
2.8.4. පුහුණුකරුවන් පුහුණු කිරීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ……... 36
2.8.5. දේශපාලනික වශයෙන් කාන්තාවන් සවිබල ගැන්වීම ……………..…. 36
2.9. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ……………………………………….. 36
2.10. 2022 - 2025 සහභාගීත්ව උපාය මාර්ග සැලැස්ම ............................................ 36
2.11. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු ……………………………………... 37
2.12. ලේඛනාගාරය …………………………………………………….... 37
2.13. දැනුම් කළමනාකරණ ඒකකය හා කෞතුගාරය ………………..……… 38
2.14. මාධ්‍ය ඒකකය පවත්වාගෙන යාම .......................................................................... 38
2.15.සමාජ මාධ්‍ය වේදිකා පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම ........................ 38
2.15.1. මැතිවරණ කොමිෂන් සභාවේ සමාජ මාධ්‍ය වේදිකා පාර්ශ්වකරුවන්/ පරිශීලකයන් අතර ප්‍රචලිත වීම සඳහා හේතු පාදක වූ කරුණු .................. 39
2.16. වසර තුළ එළි දක්වන ලද ප්‍රකාශන ............................................................... 39
2.17.නීති කටයුතු ……………………………………………………..…… 40
2.17.1. ශ්‍රේෂ්ඨාධිකරණය …………………………………………... 40
2.17.2. අභියාචනාධිකරණය …………………………………………...... 41
2.17.3. මහාධිකරණය …………………………………………..…... 42
2.17.4. දිසා අධිකරණය ……………………..………………… 42
2.17.5. මහේස්ත්‍රාත් අධිකරණය ………...……………………………… 43
2.17.6. නීතිපති උපදෙස් විමසීම් …………………………………………… 43
2.17.7. මානව හිමිකම් කොමිෂන් සභාවට අදාළ පැමිණිලි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන ……………..…..... 43
2.17.8. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ නෛතික කටයුතු සහ ඡන්ද හිමියන් ගණන් ගැනීමට අදාළ ලේඛන අපහරණය ...................... 43
2.18. මැතිවරණ නීති සංශෝධන ………………………………………… 43
2.19. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු ........................................................................................ 44
2.20. මැතිවරණ කාර්යය සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීම ...................................... 45
2.20.1. 2025 වර්ෂය සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීමේ කටයුතු ...................... 45
2.20.2 දැනටමත් පිළිගෙන ඇති දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීම 46
2.21. වත්කම් බැරකම් ප්‍රකාශ භාරගැනීම ........................................................... 46
2.22. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත හා මැතිවරණ නීති බලාත්මක කිරීමට ආදාල දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ...................................... 46
2.23. ද්‍රව්‍ය මිළදී ගැනීම, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම /අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම 47
2.23.1. ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම ................................................ 47
2.23.2. ඡන්දහිමි නාමලේඛන මුද්‍රණය ................................................ 47
2.23.3. යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම 47
2.23.4. ගෘහ භාණ්ඩ හා කාර්යාල භාණ්ඩ මිලදී ගැනීම .................................. 47
2.23.5. පොදු ........................................................................................ 48

2.24. තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය ........................................................ 48
2.24.1. තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යයනය, මෘදුකාංග නිර්මාණය, සංවර්ධනය හා නඩත්තු කිරීම ........................................................................ 49
2.24.2. මැතිවරණ ක්‍රියාවලියට අදාළ පාර්ශවකරුවන්හට ඊ සේවා සැපයීම ......... 51
2.24.3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම .................................................. 53
2.25. මූල්‍ය හා විගණන තොරතුරු ........................................................................ 53
2.26. අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු .............................................................. 54
2.27. ඉදිරි ඉලක්ක ....................................................................................... 55

**03. පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය** ................................................. 56
3.1. මූල්‍ය කාර්යසාධනය .............................................................................. 56
3.2. මූල්‍ය ප්‍රකාශ සටහන් ............................................................................... 60
3.2.1. ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ...................................... 60
3.2.2. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය ...... 60
3.2.3. මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන .............. 60
3.2.4.මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය .............. 61
3.2.5. විගණකාධිපතිවරයාගේ වාර්තාව .................................................. 62

**04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක** ................................................................... 80

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය** ........... 81
5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න ...................................... 82

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ** .............................................................. 83
6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය .................................................................. 83
6.2. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු ..................................................................................... 84
6.2.1. නව පත් කිරීම් .................................................................... 84
6.2.2. නිදහස් කිරීම් හා විශ්‍රාම ගැන්වීම් ............................................. 86
6.2.3.අභ්‍යන්තර ස්ථාන මාරුවීම් ........................................................ 86
6.2.4. වැඩ බැලීම හා රාජකාරි ආවරණය කිරීම සඳහා කරන ලද පත් කිරීම් ........... 88
6.2.5. උසස් කිරීම් .......................................................................... 89
6.3. පාලන අංශයේ කටයුතු .............................................................................. 90
6.3.1. පාලන අංශය ........................................................................ 90
6.3.1.1. ඉදිකිරීම් හා අලුත්වැඩියා .................................................... 90
6.3.1.2. දේශීය පුහුණු ................................................................ 90
6.3.1.3. මැතිවරණ ක්‍රමවේද සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IFES) මඟින් පවත්වන ලද පුහුණු .................................................................. 94
6.3.1.4. කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (KOICA) ආයතනය මඟින් පවත්වන ලද පුහුණු ......................................................... 95
6..3.1.5 Factum ආයතනය මඟින් පවත්වන ලද පුහුණු ............................ 95
6.3.2. ආයතන අංශය ............................................................................ 96
6.3.2.1. කාර්ය මණ්ඩල කටයුතු ...................................................... 96
6.2.2.2.. කළමනාකරණ සේවා නිලධාරි සේවය ...................................... 96
6.3.2.3. සංවර්ධන නිලධාරි සේවය .................................................. 97

6.3.2.4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය .......................... 97
6.3.2.5. කාර්යාල සේවක සේවය .................................................. 97
6.3.2.6. රියදුරු සේවය ........................................................................ 97
6.3.2.7. නව බඳවා ගැනීම් ............................................................. 98
6.3.2.7.1. කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනිම.......... 98
6.3.2.7.2. විදුලි කාර්මික නිලධාරි තනතුරට බඳවා ගැනීම............ 98
6.3.2.8. සේවය හැරයාමේ නිවේදන නිකුත් කිරීම ................................... 98
6.3.2.9. මියයාම් ............................................................................... 99
6.3.2.10. විශ්‍රාම ගැන්වීම් ................................................................ 99
6.3.2.11. තනතුරෙන් මුදා හැරීම .................................................. 99
6.3.2.12. නව පත්වීම් ........................................................................ 100
6.3.2.13. දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු අනුමත කිරීම .............. 100
6.3.2.14. නිවාඩු කළමනාකරණ පද්ධතිය පවත්වා ගෙන යාම .............. 100
6.3.2.15. වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම ................................................ 100
6.3.2.16. වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය .............. 102
6.3.2.17.පවිත්‍රතා කටයුතු ............................................................. 102
6.3.2.18.ආරක්ෂක කටයුතු ............................................................. 103
6.3.2.19. "සෙයිරි සතිය" ක්‍රියාත්මක කිරීම ............................................... 103
6.3.2.20. විදේශ ශිෂ්‍යත්ව ............................................................. 103
6.3.2.21.විදේශ පුහුණු ........................................................................ 103
6.3.2.22. විදේශ සම්මන්ත්‍රණ හා නිල චාරිකා ..................................... 103
6.3.3. ප්‍රවාහන අංශය ........................................................................ 104
6.3.3.1. වාහන පාලනය ........................................................................ 104
6.3.3.2. මැතිවරණ කාල සීමාව තුළ පරිපාලන කටයුතු ........................... 105
6.3.3.2.1 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ........................... 105
6.3.3.2.2.මැතිවරණ කොමිෂන් සභාවේ වාහන පිළිබඳ තොරතුරු ................ 105

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව** .............................................................. 106

**08 පරිච්ඡේදය - සමාප්තිය** .............................................................................. 113

## සටහන්


සටහන 01 - සංවිධාන සටහන .......................................................................... 117

සටහන 02 - මැතිවරණ කොට්ඨාසවලට අදාළව ඉවත් වන නම් ('අ'නම්) සහ ඇතුළත් වන නම් ('ආ' නම්) සංඛ්‍යාව ............................................................ 118

සටහන 03 - 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම ..................................... 119

සටහන 04 - එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචි බව අනාවරණය වූ බැවින් ලියාපදිංචි නොකල නම් සංඛ්‍යාව ............................................................ 120

සටහන 05 - 2025 ඔක්තෝබර් මස 31 වන දින සහතික කරන ලද 2025 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනට අනුව ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව ............... 121

සටහන 06 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරාපත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව වාර්ෂිකව ගණනය කිරීම - 2025 ප්‍රධාන නාමලේඛනය ..................................... 122

සටහන 07 - 2025 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය සහතික කර ඇති සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ විස්තර .................................................. 123

සටහන 08 - ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ පුද්ගලයින් සංඛ්‍යාව ....................... 124

සටහන 09 - ඡන්ද ප්‍රදේශ අනුව ප්‍රධාන නාමලේඛනයෙහි ලියාපදිංචි වී ඇති ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳව තුලනාත්මක සටහන 2014 - 2025 .......................... 125

සටහන 10 - 2014 – 2025 දක්වා වර්ෂවල ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවලදී ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ පුද්ගලයන් සංඛ්‍යාවේ ප්‍රතිශතය පිළිබඳ සංසන්දනාත්මක ප්‍රකාශය ............................................................ 132

සටහන 11 - 2001 – 2025 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවලදී පෙර වර්ෂයට සාපේක්ෂව ඡන්දහිමියන්ගේ වැඩිවීම හා වැඩිවීමේ ප්‍රතිශතය ............................................ 133

සටහන 12 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත්කර ගත යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන 2014 – 2025 .......................... 134

සටහන 13 - 2021 සිට 2025 දක්වා වලංගු ඡන්දහිමි නාමලේඛනවල ඡන්ද සංඛ්‍යාවේ වෙනස්වීම හා ඊට අදාල විස්තර.................................................................. 135

සටහන 14 - මැතිවරණ කොට්ඨාස අනුව ලියාපදිංචි වී ඇති ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන. 2024 – 2025 .......................................................... 136

සටහන 15 - 2025 පෙබරවාරි මස 01 දින සහතික කරන ලද 2024(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය අනුව ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව ................................. 137

සටහන 16 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (2025.02.01 දින 2024(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු) 138

සටහන 17 - 2025 ඔක්තෝබර් මස 15 වන දින සහතික කරන ලද 2025 (1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය අනුව ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව ............... 139

සටහන 18 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (2015.10.15 දින 2025(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු) 140

සටහන 19 - 2025 ඔක්තෝබර් මස 22 වන දින සහතික කරන ලද 2025(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය අනුව ලියාපදිංචි ඡන්ද හිමියන් සංඛ්‍යාව ............... 141

සටහන 20 - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (2025.10.22 දින 2025 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු) 142

සටහන 21 - 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ගැසට් නිවේදන පිළිබඳ තොරතුරු ……………………………………………. 143

සටහන 22 - 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත නිකුත් කරන ලද චක්‍රලේඛ …………………………….. 146

සටහන 23 - 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව මුද්‍රණය සඳහා රජයේ මුද්‍රණාලය වෙත ලබාදී ඇති ලිපි ලේඛන, ආකෘති පත්‍ර, ලිපි කවර, ජර්නල්, උපදෙස් පොත් සහ අනෙකුත් ලේඛන ………………………………….. 153

සටහන 24 - පළාත් පාලන ආයතන පුරප්පාඩු පිරවීම - 2025......................................... 156

සටහන 25 - 2025 වාර්ෂික පර්යේෂණ සැසියේ ඉදිරිපත් කිරීම් ………………………… 165

සටහන 26 - 2025 වාර්ෂික පර්යේෂණ සැසියේ සංවාද කණ්ඩායමේ සාමාජිකයින් ........... 166

සටහන 27 - වතු ප්‍රජාව, ආන්තික ජන කොටස් සහ දේශීය මැතිවරණ නිරීක්ෂකයින් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සාරාංශය .................................................. 167

සටහන 28 - ප්‍රජා නායකයන් / පුහුණුකරුවන් පුහුණු කිරීම, මැතිවරණ පාර්ශවකරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම .................................................. 170

සටහන 29 - 2025 වර්ෂයේ කාන්තා කටයුතු සම්බන්ධ වැඩමුළු පැවැත්වීම ...................... 171

සටහන 30 - 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන ........................................................................................... 173

සටහන 31 - 2025 වර්ෂයේ සේවයෙන් විශ්‍රාම ගන්වන ලද නිලධරයන් .......................... 178

සටහන 32- 2025 වර්ෂයේ විදේශ පුහුණු සඳහා සහභාගී වූ නිලධරයන් පිළිබඳ තොරතුරු 180

## ඇමුණුම්

ඇමුණුම 01 - ඡන්දහිමියන් ගණන් ගන්නා ක්‍රමවේදය පිළිබඳව වූ 2025.01.01 දිනැති ගැසට් නිවේදන අංක 2417/28 .............................................................. 189

ඇමුණුම 02 - ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම දක්වා වූ ඉදිරි ක්‍රියාකාරකම් සිදුකල යුතු දින වකවානු පිළිබඳ සැලැස්ම .................................................... 192

**ඇමුණුම 03 -** ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කාලසීමාව තුළ ග්‍රාම නිලධාරී ස්ථාන මාරුවීම් අත්හිටුවීම සහ එම කාලය තුළ කාර්යාල දින සීමා කිරීම් සඳහා රාජ්‍යපරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමු කරන ලද අංක HA/3/7/29-2 හා 2025.01.17 දිනැති ලිපිය ............... 204

ඇමුණුම 04 - 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අලුතින් නම් ඇතුළත් කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ නම් සඳහන් වන ‘ආ’ ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම පිළිබඳව වූ 2024.04.09 දිනැති ගැසට් නිවේදන අංක 2379/16 ............ 206

## 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. මැතිවරණ දෙපාර්තමේන්තුව

දිවයිනේ පාලන කටයුතුවල දී දේශීය ජනතාවට සහභාගිවීමේ වැඩි අවස්ථා සැලසිය යුතු යැයි 21 වන සියවසේ මුල් භාගයේ පැන නැගුණු ප්‍රබල උද්ඝෝෂණවලට ප්‍රතිචාරයක් වශයෙන් බ්‍රිතාන්‍ය කිරීටය විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා 1944 වසරේ දී සෝල්බරි කොමිසම පත් කරන ලදී. සෝල්බරි කොමිසම විසින් ඡන්දදායකයන් ලියාපදිංචි කිරීමත් පාර්ලිමේන්තු ඡන්ද විමසීම පැවැත්වීමත් සඳහා වූ නීති සම්පාදනය කරන ලද අතර 1946 සැප්තැම්බර් 26 දින පාර්ලිමේන්තු ඡන්ද විමසීම් රාජ ආඥාව පනවන ලදී. පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම පැවැත්වීම සඳහා 1946 දී පළාත් පාලන ආඥා පනත සම්මත කරන ලදී. 1946 සිට 1955 දක්වා වූ කාල වකවානුවේ දී ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමත් පාර්ලිමේන්තු ඡන්ද විමසීම් පැවැත්වීමත් සඳහා එක් කොමසාරිස්වරයෙකු යටතේ පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුවත් පළාත් පාලන ආයතනවල ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා තවත් කොමසාරිස්වරයෙකු යටතේ පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුවත් ක්‍රියාත්මක විය. එලෙස වෙන් වෙන්ව පැවති පාර්ලිමේන්තු මැතිවරණ දෙපාර්තමේන්තුව හා පළාත් පාලන මැතිවරණ දෙපාර්තමේන්තුව ඒකාබද්ධ කොට 1955 ඔක්තෝබර් 1 වැනි දින මැතිවරණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. එසේ ස්ථාපිත කරන ලද මැතිවරණ දෙපාර්තමේන්තුව වසර 60කට අධික කාලයක් සිය කාර්ය හා කර්තව්‍ය ඉටු කරන ලදී.

### 1.2. මැතිවරණ කොමිෂන් සභාව

2001 ඔක්තෝබර් 03 වැනිදා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 17 වැනි සංශෝධනය ගෙන එන ලද අතර එම සංශෝධනය අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා විසින් මැතිවරණ කොමිෂන් සභාව පත්කළ යුතු විය. එසේ වුව ද පත්කිරීම් පිළිබඳව ඇති වූ ගැටලු නිසා අපේක්ෂිත පරිදි මැතිවරණ කොමිෂන් සභාව පත් නොවීය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන එන ලද 17 වැනි සංශෝධනය අනුව මැතිවරණ කොමිෂන් සභාවක් පත් කරන තුරු එම තනතුරු දැරූ පස්වැනි මැතිවරණ කොමසාරිස්වරයාට මැතිවරණ කොමිෂන් සභාවේ රාජකාරි කටයුතු කිරීමට සිදුවිය. 2010.09.09 දින සම්මත කරන ලද 18 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් මැතිවරණ කොමිෂන් සභාවේ සංයුතිය සාමාජිකයන් පස් දෙනෙකු දක්වා වැඩි කරන ලදී. එසේම මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය කරන තෙක් කොමිෂන් සභාවේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම මැතිවරණ කොමසාරිස්වරයා විසින් ඉටු කළ යුතු විය. එසේ වුවද එවර ද මැතිවරණ කොමිෂන් සභාව සංස්ථාපනය නොවීය.

2015 වර්ෂයේ දී දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ස්වාධීන කොමිෂන් සභා ස්ථාපනය කිරීමට රජය විසින් පියවර ගත් අතර ඒ අනුව එතෙක් පැවති මැතිවරණ දෙපාර්තමේන්තුව අහෝසි වී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ මත අතිගරු ජනාධිපතිතුමා විසින් සභාපතිවරයකු ඇතුළු සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත මැතිවරණ කොමිෂන් සභාව 2015.11.13 දින සංස්ථාපනය කරනු ලැබීය. ඒ සඳහා පත් කරන ලද සභාපති ඇතුළුව සාමාජිකයන් තිදෙනා 2015.11.17 නව කොමිෂන් සභාවේ රාජකාරී කටයුතු ආරම්භ කරන ලදී. මහින්ද දේශප්‍රිය මහතා සභාපති වශයෙන් ද ජනාධිපති නීතිඥ එන්.ජේ.අබේසේකර මහතා සහ මහාචාර්ය එස්.රත්නජීවන් එච්.හූල් මහතා කොමිෂන් සභාවේ සාමාජිකයින් වශයෙන් පත් කරන ලදී. මැතිවරණ කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ විශ්‍රාමික නීතිඥ එච්.එම්.ටී.ඩී.හේරත් මහතා මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලදී.

2020 ඔක්තෝම්බර් 29 දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සිදු කරන ලද විසිවන සංශෝධනය මගින් මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව පහක් දක්වා වැඩි කරන ලදි. ඒ අනුව 2020.12.10 දින පාර්ලිමේන්තු සභාවේ නිර්දේශ මත දෙවන මැතිවරණ කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද අතර එය සභාපති ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය. නීතිඥ නිමල් ජී. පුංචිහේවා මහතා සභාපතිවරයා ලෙස ද මහ භාණ්ඩාගාරයේ හිටපු නියෝජ්‍ය ලේකම්වරයෙකු වූ එස්.බී.දිවාරත්න මහතා, හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ එම්.එම්.මොහමඩ් මහතා, හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු වූ කේ.පී.පී.පතිරණ මහතා, මානව හිමිකම් ක්‍රියාකාරියෙකු වූ ජීවන් ත්‍යාගරාජා යන මහත්වරු කොමිෂන් සභාවේ සෙසු සාමාජිකයන් ලෙස ද පත් කරන ලදී. ජීවන් ත්‍යාගරාජා මහතා උතුරු පළාත් ආණ්ඩුකාරවර ලෙස 2021.10.10 දින පත්ව ගිය අතර ඒ මහතා වෙනුවට ජ්‍යෙෂ්ඨ පරිපාලන නිලධාරිනියක වූ හිටපු උතුරු පළාත් ආණ්ඩුකාරවර පී.එස්.එම්.චාල්ස් මහත්මිය 2021.10.28 දින පත් කරන ලදී. එම කොමිෂන් සභාවේ සාමාජිකයින් පහක් වූ අතර සණ පූර්ණය සාමාජිකයන් තිදෙනෙකි. පළමු කොමිෂන් සභාවේ ලේකම්වරයා වශයෙන් පත් කරන ලද නීතිඥ එච්.එම්.ටී.ඩී.හේරත් මහතා දෙවන කොමිෂන් සභාවේ ද ලේකම්වරයා වශයෙන් සේවයේ නිරත කරවන ලදී.

2022.10.31 දින සම්මත වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21වන සංශෝධනයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත තෙවන මැතිවරණ කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලදී. එම කොමිෂන් සභාවේ සභාපති ලෙස හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ ආර්.එම්.ඒ.එල්.රත්නායක මහතා ද, සාමාජිකයින් ලෙස හිටපු මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයෙකු වූ එම්.ඒ.පී.සී.පෙරේරා මහතා හා නීතිඥ අමීර් ෆායිස් මහතා පත් කරන ලද අතර ඔවුන් 2023.07.05 දින රාජකාරී ආරම්භ කරන ලදී. නීතිඥ ඒ.ෂන්මුගනාදන් මෙනෙවිය සාමාජිකාවක් ලෙස පත් කරන ලද අතර ඇය 2023.09.11 දින රාජකාරී ආරම්භ කරන ලදී. තෙවන මැතිවරණ කොමිෂන් සභාවේ පස්වන සාමාජිකයා වශයෙන් මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා 2024.01.02 වනදින පත් කරන ලදී. ඒ අනුව මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක මහතා 2024.01.10 වනදින රාජකාරී භාරගැනීම සිදු කළ අතර කොමිෂන් සභාවේ සාමාජික සංඛ්‍යාව 05ක් වශයෙන් සම්පූර්ණ විය. තෙවන කොමිෂන් සභාවේ ලේකම් වශයෙන් ක්‍රියාකිරීම්වස් තවදුරටත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධරයකු ලෙස කටයුතු කළ නීතිඥ එච්.එම්.ටී.ඩී.හේරත් මහතාගේ සේවය දීර්ඝ කරන ලදී.

### 1.3. මැතිවරණ කොමිෂන් සභාවේ දැක්ම හා මෙහෙවර

"සර්වජන ඡන්ද බලය සුරකින දේශයක්" යන්න මැතිවරණ කොමිෂන් සභාවේ දැක්මයි.

එකී දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා "ජනතා පරමාධිපත්‍ය, සර්වජන ඡන්ද බලය හා සබැඳි ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම ආරක්ෂා කරමින් පුරවැසියන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වන පරිදි අදාළ සියලු පාර්ශව දැනුම්වත් කෙරෙන නිදහස්, සාධාරණ හා විශ්වාසනීය මැතිවරණ ක්‍රියාවලියක් කාර්යක්ෂමව හා සඵලදායි යුතුව මෙහෙය වීම." මැතිවරණ කොමිෂන් සභාවේ මෙහෙවර වේ.

### 1.4. මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථ, බලතල, කාර්යය හා කර්තව්‍යය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 (2) ව්‍යවස්ථාවෙහි සඳහන් පරිදි නිදහස් හා සාධාරණ ඡන්ද විමසීම් සහ ජනමත විචාරණ පැවැත්වීම මැතිවරණ කොමිෂන් සභාවේ පරමාර්ථය විය යුතු ය. එමෙන් ම පවත්නා මැතිවරණ නීති අනුව මැතිවරණ පැවැත්වීමටත්, වාර්ෂික ඡන්දහිමි නාමලේඛන පිළියෙල කිරීම හා ප්‍රතිශෝධනය කිරීමට ද කොමිෂන් සභාවට බලය ඇති අතර කොමිෂන් සභාවේ කටයුතු එම බලතලවලට සහ කාර්ය කර්තව්‍යවලට සීමා නොවන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (1) ව්‍යවස්ථාවෙහි දක්වා ඇත. මේ අනුව අදාළ අණ පනත් අනුව මැතිවරණ පැවැත්වීමේ වගකීම පැවැරුණු

මැතිවරණ දෙපාර්තමේන්තුවට වඩා විශේෂිත වගකීමක් මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇත. ඊට අදාළව දහනවවන ව්‍යවස්ථා සංශෝධනය මගින් මූලික නීතියට විශේෂ විධිවිධාන ඇතුළත් කිරීම තුළින් මැතිවරණ කොමිෂන් සභාවේ බලතල පුළුල් කර ඇත.

මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමේ දී කොමිෂන් සභාවට විශේෂ බලතල ලබා දී ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 අ ව්‍යවස්ථාව යටතේ අධිකරණ බලයට යටත්ව,

I. කොමිෂන් සභාවේ තීරණ, විධිවිධාන හෝ ක්‍රියා අවසානාත්මක හා තීරණාත්මක වීම හා

II. මැතිවරණ කොමිෂන් සභාවේ යම් සාමාජිකයෙකු හෝ නිලධරයකුට මැතිවරණයක් පැවැත්වීම හා සම්බන්ධ යම් නීතියක් යටතේ සද්භාවයෙන් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සිවිල් නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරිය නොහැකි වීම.

යන විශේෂ මුක්තීන් ලබා දී ඇත. මෙම මුක්තීන් ලබා දී ඇත්තේ 126 වන ව්‍යවස්ථාව යටතේ මූලික අයිතිවාසිකම් කඩවීම පිළිබඳ අභියාචනා අධිකරණ බලය, 130 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරණය, මැතිවරණ පෙත්සම් ආදිය සම්බන්ධයෙන් ඇති අභියාචනා අධිකරණ බලය, 144 වන ව්‍යවස්ථාව යටතේ මන්ත්‍රී ධුරයකට තෝරා ගැනීමට අදාළ පෙත්සම් විභාගයට ඇති අභියාචනා අධිකරණ බලයට යටත්ව ය. තවද, මැතිවරණ ක්‍රියාවලිය මෙහෙයවීමේ දී නීති බලාත්මක කිරීම හා සුරක්ෂිත කිරීම ද ස්වකීය කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ද හැර වෙනත් වගකීමට මැතිවරණ කොමිෂන් සභාව බැඳී නැති බව විශේෂිත කාරණයකි. මේ හැර රාජ්‍ය දේපළ අවභාවිතාව වැළැක්වීම සම්බන්ධයෙන් විශේෂිත බලයක් 104 ආ (4) (අ) ව්‍යවස්ථාව යටතේ ලබා දී ඇති අතර, 104 (5) (අ) ව්‍යවස්ථාව අනුව ඡන්ද විමසීම සීමාවේ දී නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමත් පැවැත්වීම සහතික කිරීම සඳහා මාධ්‍ය ආයතන වෙත මාධ්‍ය උපමාන නියම කිරීමට හා ඊට අදාළව විධිවිධාන පැනවීමට ඉඩ සලසා ඇත. 104 ඇ ව්‍යවස්ථාව යටතේ පොලිසිය යොදවා ගැනීමට ද, 104 ඈ ව්‍යවස්ථාව යටතේ සන්නද්ධ හමුදා යෙදවීමට ද, කොමිෂන් සභාව වෙත විශේෂ බලතල ලබා දී තිබේ.

කොමිෂන් සභා ලේකම් කාර්යාලය මගින් පහත සඳහන් කාර්යයන් සිදු කෙරේ.

- කොමිෂන් සභාවේ පරිපාලන කාර්යයන්.
- ව්‍යවස්ථාපිත කාර්යයන් සම්බන්ධීකරණය හා මෙහෙයවීම.
- කොමිෂන් සභාවේ සාමාජිකයන් පිළිබඳ ආයතනික කටයුතු.
- මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගැනීම, මාරු කිරීම හා නිදහස් කිරීම, මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සේවයේ නියුතු දීප ව්‍යාප්ත සේවා හා මාණ්ඩලික නිලධාරීන් පත්කිරීම්, උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම් සහ විශ්‍රාම ගැන්වීම්වලට අදාළ කටයුතු.
- කොමිෂන් සභාවේ රැස්වීම් හා වාර්තා සකස් කිරීම.
- මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු ඇතුළුව මානව සම්පත් සංවර්ධන කටයුතු.
- පාර්ලිමේන්තුව, ජනාධිපති ලේකම් කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය යන ආයතනයන් සමග සම්බන්ධීකරණ කටයුතු
- අනෙකුත් ස්වාධීන කොමිෂන් සභා, අමාත්‍යාංශ ඇතුළු රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණය.
- මාණ්ඩලික නිලධාරීන්ගේ වාර්ෂික වත්කම් බැරකම් ප්‍රකාශ පිළිබඳ කටයුතු.

- කොමිෂන් සභාව වෙත පැවැරෙන ඡන්ද විමසීම් නිදහස් හා සාධාරණ අන්දමින් පැවැත්වීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම හා ඒ අනුව ක්‍රියා කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

### 1.5. සංවිධාන සටහන හා කාර්යාල පිරිසැකැස්ම

මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා, මැතිවරණ මහලේකම් කාර්යාලයේ එක් එක් අංශ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ඇතුළත් සංවිධාන සටහන, සටහන 01 ලෙස ඇතුළත් කර ඇත.

ඉහත සංවිධාන සටහන අනුව මැතිවරණ කොමිෂන් සභාවට අයත් මැතිවරණ මහලේකම් කාර්යාලයේ, ජාතික මැතිවරණ, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්, ගිණුම්, පාලන, නීති විමර්ශණ ශාඛාද, පර්යේෂණ හා සැලසුම්, අභ්‍යන්තර විගණන, ආයතන, ප්‍රවාහන, ප්‍රසම්පාදන, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ලෙස අංශ ස්ථාපිත අතර සියලුම පරිපාලන දිස්ත්‍රික්ක තුළ ස්ථාපිත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ද එකිනෙක සම්බන්ධවන අයුරින් දක්වා, ඒ ඒ ඒකකය ඇතුළත්වන ආකාරයට කාර්යාල පිරිසැකැස්ම සකස්කර ඇත.

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

### 2.1. මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම්

මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති කාර්යය හා කර්තව්‍යවලට අදාළව ඉදිරිපත් කරනු ලබන කොමිෂන් පත්‍රිකා සාකච්ඡා කිරීම හා තීරණ ගැනීම සහ වෙනත් නිර්දේශ අනුව කොමිෂන් සභා රැස්වීම් අවශ්‍යතාව අනුව පවත්වනු ලැබේ. මේ අනුව 2025 වර්ෂයේ පළමු කාර්තුව තුළ රැස්වීම් වාර 12 ක් ද දෙවන කාර්තුව තුළ රැස්වීම් වාර 11 ක් ද තෙවන කාර්තුව තුළ රැස්වීම් වාර 12 ක් ද සිව්වන කාර්තුව තුළ රැස්වීම් වාර 12 ක් ද පවත්වා ඇති අතර, 2025 වර්ෂයේ සිව්වන කාර්තුව වන තෙක් රැස්වීම් වාර 47 ක් පවත්වා ඇත.

#### 2.1.1. කොමිෂන් සභාව සමග පැවති විශේෂ සාකච්ඡා.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම සඳහා නව නීති සංශෝධන සිදු කර, ඊට අදාළව නීති කෙටුම්පත් සම්පාදනය, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සාකච්ඡා පැවැත්වීමෙන් අනතුරුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව විශේෂ රැස්වීම්, සාකච්ඡා කොමිෂන් සභාව විසින් පවත්වන ලදී. මෙහිදී දේශපාලන පක්ෂ, අපේක්ෂකයන් සමග පවත්වන ලද සාකච්ඡාවලට අමතරව, නාමයෝජනා භාර ගැනීම ඇතුළු මැතිවරණ ක්‍රියාවලිය නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය පාර්ශ්ව සමග සාකච්ඡා පවත්වන ලද අතර ඊට අදාළ කොමිෂන් සභාවේ විශේෂ රැස්වීම් පැවැත්වීමට ද ක්‍රියා කරන ලදී.

### 2.2. ඡන්දහිමියන් ලියාපදිංචිය

සුදුසුකම් සැපිරූ සියලු පුරවැසියන්ට ජාතිය, ආගම, භාෂාව, වර්ගය, කුලය, අධ්‍යාපන මට්ටම, දේපළ හිමිකම, උපත, උපන් ස්ථානය, වත්පොහොසත්කම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ආදී කිසිදු විශේෂත්වයකින් තොරව රටෙහි පාලන බලයට හවුල්වීමේ අයිතිය හා ඒ සඳහා නියෝජිතයින් තෝරා පත්කර ගැනීමට ඇති අයිතිය ලබාගත හැකි වනුයේ සර්වජන ඡන්ද බලය මඟිනි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තුන්වන ව්‍යවස්ථාව ප්‍රකාරව සර්වජන ඡන්ද බලය සහතික කර ඇත. පරමාධිපත්‍ය ජනතාව සතු බවත්, අන්සතු කළ නොහැකි බවත්, පැවරිය නොහැකි බවත්, එකී පරමාධිපත්‍ය යන්නට පාලන බලතල, මූලික අයිතිවාසිකම් සහ ඡන්ද බලය යන අංග ඇතුළත් වන බවත් එහි සඳහන් වේ.

ඒ අනුව රටේ පුරවැසියන්ට ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ඡන්ද විමසීමක දී, පාර්ලිමේන්තු මහ මැතිවරණයක දී, ජනමත විචාරණයක දී, පළාත් සභා ඡන්ද විමසීමක දී හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමක දී තම ඡන්ද බලය ක්‍රියාත්මක කළ හැකිය. ඉහත සඳහන් ඡන්ද විමසීම්වල දී ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පුරවැසියන් අදාළ ඡන්ද විමසීමේ දී වලංගුව පවත්නා ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිව සිටීම අනිවාර්ය වේ.

මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම කටයුතු සිදුකරනු ලබනුයේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හා 2021 **අංක** 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ දැක්වෙන විධිවිධාන අනුව වේ.

**2.2.1. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය කරනු ලබන මූලික සුදුසුකම්**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
- ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන දිනය වන **පෙබරවාරි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කර තිබීම. (ඒ අනුව 2025 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට සුදුසුකම් ලබන්නේ 2007.01.31 හෝ එදිනට පෙර උපන් තැනැත්තන්ය.)**
- ඡන්දහිමි නාමලේඛයේ ලියාපදිංචියට ඉල්ලුම් කරන ලිපිනයේ සුදුසුකම් ලබන දිනයට සාමාන්‍ය පදිංචිය තිබීම.

**2.2.2. ඡන්දහිමියකු ලෙස ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා නුසුදුසුකම්**

- බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් බවට අධිකරණය මඟින් තීරණය වී තිබීම.
- අවුරුදු 02 කට නොඅඩු කාලයක් බන්ධනාගාරගත කිරීමකට යටත් කළ හැකි වරදකට අධිකරණය මඟින් වරදකරුවකු වී මාස 06 ක් හෝ ඊට වැඩි කාලයක් බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටිනම් හෝ ගතවූ සත් අවුරුදු කාලය තුළ ඒ දඬුවම සම්පූර්ණයෙන්ම විඳ සිටීම හෝ මරණ දණ්ඩනයට යටත්ව සිටීම.
- අල්ලස් චෝදනාවකට වරදකරු වී අවුරුදු 07ක කාලයක් ගත වී නොතිබීම.
- මැතිවරණ නීති උල්ලංඝනය කිරීම හේතුකොට ගෙන අධිකරණය විසින් වරදකරුවකු කර තිබීම.
- මහජන ආයතන (දූෂණ වැලැක්වීමේ) ආඥා පනත යටතේ වරදකරුවකු වී තිබීම.

**ඉහත සඳහන් නුසුදුසුකම් ඇතුළුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව යටතේ සඳහන් ඡන්ද බලය අහිමිවීමේ නුසුදුසුදුකම් වලට යටත් නොවූ තැනැත්තෙක් විය යුතුය.**

**2.2.3. 2021 අංක 22 දරණ ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත.**

මෙම සංශෝධන පනතේ ප්‍රධාන අරමුණ වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විගස පරිපූරක ඡන්දහිමි නාමලේඛන මඟින් ඡන්ද බලය ලබා දීම සහ ඡන්දහිමියන් ගණන් ගන්නා සුදුසුකම් ලැබීමේ දිනය සංශෝධනය කිරීම විය. 2022 වර්ෂයේ මුල්වරට ක්‍රියාත්මක වූ මෙම සංශෝධන පනතට අනුකූලව 2025 වර්ෂයේදී සිව්වන වරටත් ප්‍රතිශෝධන කටයුතු ක්‍රියාත්මක කරන ලදී.

**2.2.3.1. 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතට (ප්‍රධාන ප්‍රඥප්තිය) සිදු කළ මූලික සංශෝධන සහ ඊට අදාල සුවිශේෂී කරුණු.**

- මෙම පනත 2021 ඔක්තෝම්බර් මස 13 දින සහතික කරන ලදී.
- මෙම සංශෝධිත පනත 2022 පෙබරවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වේ.
- ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා සුදුසුවීම පිණිස යම් තැනැත්තෙකුගේ අටළොස්විය සම්පූර්ණ කර තිබිය යුතු දිනය ජුනි මස පළමු වන දිනය වෙනුවට පෙබරවාරි මස පළමු වන දිනය ලෙස සංශෝධනය කර ඇත.

- යම් කිසි මැතිවරණ කොට්ඨාසයක නාමලේඛනයෙහි ඇතුළත් කිරීම හෝ තබා ගැනීම සඳහාත්, සාමාන්‍යයෙන් පදිංචිව සිටිය යුතු සුදුසුකම් ලැබීමේ ලිපිනය සඳහාත් ඒ ආශ්‍රිත වෙනත් තීරණ සඳහාත් පැවති ජුනි මස පළමුවන දිනය වෙනුවට පෙබරවාරි මස පළමු වන දිනය ලෙස සංශෝධනය කර ඇත.
- එක් එක් වර්ෂයේ ජුනි මස පළමුවන දිනයෙහි හෝ එදිනට පෙර ප්‍රතිශෝධන කටයුතු ආරම්භ කිරීම වෙනුවට පෙබරවාරි මාසයේ පළමු වන දිනයෙහි හෝ එදිනට පෙර යන්න සංශෝධනය විය.
- 'අ' සහ 'ආ' ලැයිස්තු සම්පූර්ණ කිරීම ඊළගට එළඹෙන වර්ෂයේ ජනවාරි තිස් එක් වන දින හෝ එදිනට පෙර සම්පූර්ණ කරනු ලැබිය යුතු යන කරුණු වෙනුවට අදාළ වර්ෂයේ සැප්තැම්බර් මස තිස්වන දිනය ලෙස සංශෝධනය විය.

### 2.2.3.2. පරිපූරක ඡන්දහිමි නාමලේඛන සම්බන්ධයෙන්

- යම් වර්ෂයක පෙබරවාරි මස පළමු වන දිනෙන් ආරම්භ වී එම වර්ෂයේම මැයි මස තිස් එක් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත;
- යම් වර්ෂයක ජුනි මස පළමු වන දිනයෙන් ආරම්භ වී එම වර්ෂයේම සැප්තැම්බර් මස තිස් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත;
- යම් වර්ෂයක ඔක්තෝබර් මස පළමු වන දිනෙන් ආරම්භ වී පසුව එළඹෙන වර්ෂයේ ජනවාරි මස තිස් එක් වන දිනෙන් අවසන් වන්නා වූ කාලසීමාව ඇතුළත; අටලොස්විය සම්පූර්ණ කරන තැනැත්තෙකු ඡන්දහිමියෙකු ලෙස නාමලේඛනයට නම ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ලබන බවත් ඒ සඳහා උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් සමඟ ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වෙත ඉල්ලීම් කළ හැකි බවත් සංශෝධිත පනතට ඇතුළත් කර ඇත.
- එමෙන්ම ලියාපදිංචි කිරීමේ නිලධාරි විසින් පරිපූරක ලැයිස්තු සකස් කළ යුතු බවත් , එම පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කළ යුතු බවත්, මේ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ හා භාෂාත්‍රයෙන් ප්‍රවෘත්ති පත්‍රවල දැන්වීම් පළ කළ යුතු බවත් , එම දැන්වීම් පළ කළ දින සිට දින 10ක් ඇතුළත හිමිකම් ඉල්ලීම් හා විරෝධතා ඉල්ලීම් සිදු කළ හැකි බවත්, සංශෝධිත පනතට ඇතුළත් කර ඇත. එමෙන්ම හිමිකම් හා විරෝධතා පරීක්ෂණ පැවැත්වීමට අදාළ විධිවිධාන හා එම පරීක්ෂණ අවසානයේ පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කරන දිනය දක්වා කාර්යයන්ට අදාළ ප්‍රතිපාදන ඇතුළත් කර ඇත.
- පරිපූරක නාමලේඛන බලාත්මක වීම සහ නිෂ්ප්‍රභා වීම පිළිබඳව සංශෝධිත පනතේ සඳහන් කර ඇත.

### 2.2.3.3. ඡන්දහිමියන් ලියාපදිංචියට අදාළව කටයුතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාවට බලය පැවරෙන නෛතික ප්‍රතිපාදන

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මතුවන දුෂ්කරතා සහ කලින් අපේක්ෂා නොකළ කරුණු පිළිබඳව තීරණය කිරීම හෝ උචිත පරිදි වෙනස් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන නිකුත් කිරීමට කොමිෂන් සභාවට බලතල පවරා ඇත.

## 2.3. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2025

2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත මඟින් සිදු කළ සංශෝධන අනුව 2025 පෙබරවාරි 01 දින හෝ ඊට පෙර 2025 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීම ආරම්භ කළ යුතු විය.

### 2.3.1. 2025 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන ක්‍රියාවලිය අනුව ප්‍රධාන නාමලේඛනය සැකසීම

මෙම කාර්යය මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් පරිදි දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ නිලධාරීගේ සහ දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ මෙහෙය වීම මත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් සිදු කරනු ලබන අතර, ගෙයින් ගෙට ගොස් ක්ෂේත්‍රය තුළ ඡන්දහිමියන් ගණන් ගැනීම සඳහා ගණන් ගන්නා නිලධාරීන් ලෙස ග්‍රාම නිලධාරීවරුන් කටයුතු කරනු ලැබේ.

කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2021 සහ 2022 වර්ෂවල ගණන් ගැනීමේ නිලධාරීන් ගෙයින්ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු නොකරන ලදී. එහෙත් 2023 වර්ෂයේ මෙන්ම 2024 වර්ෂයේ ද ගෙයින්ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීම සිදු කළ ද, නැවතත් 2025 වර්ෂයේ ගෙයින් ගෙට ගොස් ඡන්දහිමියන් ගණන් ගැනීම සිදු නොකිරීමට කොමිෂන් සභාව තීරණය කරන ලදී.

පනතේ 12(1) වගන්තියට අනුකූලව නාමලේඛන ප්‍රතිශෝධනය ආරම්භ කරන බව, ඡන්දහිමියන් ගණන් ගන්නා ක්‍රමවේදය පිළිබඳව නිවේදනය අංක 2417/28 හා 2025.01.01 දිනැති රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදී. ඊට අමතරව ඒ පිළිබඳව දිනමිණ, තිනකරන් හා ඩේලිනිවුස් පුවත්පත්වල ද භාෂාත්‍රයෙන් පළකරන ලදී. (ඇමුණුම 01)

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සඳහා උපදෙස් චක්‍රලේඛය සියළුම දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වන දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් වන දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත 2024.12.17 දින නිකුත් කරන ලදී. ඡන්දහිමියන් ගණන් ගැනීමේ නෛතික හා ප්‍රායෝගික කරුණු පිළිබඳව උපදෙස් ලබා දීම සිදු කළ අතර ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීම දක්වා ඉදිරි ක්‍රියාකාරකම් සිදු කළ යුතු දින වකවානු පිළිබඳ සැලැස්ම ද ලබා දෙන ලදී. (ඇමුණුම 02)

2024(3) වන පරිපූරක නාමලේඛනය සහතික කිරීම 2025.02.01 දින සිදු කරන ලදී. නමුත් 2024 (3) පරිපූරක නාමලේඛනය සකස් කිරීමේ කටයුතු 2024 දෙසැම්බර් මාසයේ අවසන් කළ බැවින්, 2024 ප්‍රධාන නාමලේඛනයට සහතික කරන ලද 2024 (1), 2024 (2) නාමලේඛන සහ 2024 (3) පරිපූරක නාමලේඛනය සඳහා නිර්දේශිත නම් ඒකාබද්ධ කර ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා දත්ත මුද්‍රිත ඒකාබද්ධ ලැයිස්තු සකස් කිරීමත් එය පාදක කරගෙන 2025.01.01 දින සිට ගෙයින් ගෙට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීමත් සිදු කරන ලදී.

2025 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව ගණන් ගැනීමේ නිලධාරී සෑම ගෘහයකටම නොපැමිණෙන බැවින් අවස්ථාවෝචිතව 2024 ඒකාබද්ධ ලැයිස්තුවේ සංශෝධනයක් සිදුකළ යුතු අවස්ථාවලදී එනම්; 2024 ඒකාබද්ධ ලැයිස්තුවේ සඳහන් නමක් හෝ කිහිපයක් ඉවත්වන අවස්ථාවකදී හෝ 2024 ඒකාබද්ධ ලැයිස්තුවේ සඳහන් නොවූ නමක් හෝ කිහිපයක් ඇතුළත් කරන අවස්ථාවලදී පමණක් ග්‍රාම නිලධාරීන් නිවෙස්වලට ගොස් ගණන් ගැනීම සිදු කරන ලදී. ගණන් ගැනීමේ නිලධාරී නිවසට නොපැමිණියද තමාගේ ගෘහය යටතේ නමක්/නම් ඇතුළත්වීමක් හෝ ඉවත්වීමක් සිදුවන්නේ නම් හා වලංගු නාමලේඛනයේ සඳහන් නමෙහි, ජාතික හැඳුනුම්පත් අංකයෙහි, ගෘහ අංකයෙහි සංශෝධනයක් විය යුතු නම් ගණන් ගැනීමේ නිලධාරී මුණගැසී තොරතුරු ලබා දීම ගෘහ මූලිකගේ වගකීමක් විය. කිසිදු සංශෝධනයක් සිදුකිරීමට නොමැති නම් ඡන්ද හිමියෙකු ලෙස 2024 ඒකාබද්ධ ලැයිස්තුවේ ලියාපදිංචිව තිබූ ලිපිනය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියා කරනු ලැබිය. එවැනි අවස්ථාවලදී ගෘහමූලික විසින් කිසිදු ආකෘතියක් සම්පූර්ණ කිරීමේ අවශ්‍යා නොවීය.

2024 වර්ෂයේ ඒකාබද්ධ ලැයිස්තුවේ නම සඳහන්ව ඇති ඡන්දහිමියෙකු මිය යෑම හෝ පදිංචිය වෙනස්වීම හෝ වෙනත් හේතුවක් නිසා 2025 වර්ෂයේ ලියාපදිංචිය සඳහා සුදුසුකම් නොලබන විටදී ගණන් ගැනීමේ නිලධාරී විසින් නුසුදුසුකමට ලක්වන තැනැත්තන් 'අ' ලැයිස්තු ගත කර වලංගු නාමලේඛනයෙන් ඉවත් කරනු ලැබිය.

කිසියම් තැනැත්තෙකුගේ නම 2024 වර්ෂයේ ඒකාබද්ධ ලැයිස්තුවට ඇතුළත්ව නැත්නම් හෝ වයස අවුරුදු 18 සම්පූර්ණ වීම මත ප්‍රථම වරට ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වන්නේ නම් හෝ පදිංචිය වෙනස් වීම හෝ වෙනත් හේතුවක් නිසා 2025 වර්ෂයේ ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන්නේ නම්, ඔවුන් 2025/ER ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර ගණන් ගැනීමේ නිලධාරී වෙත භාර දිය යුතු විය. වලංගු නාමලේඛනයෙහි ඇතුළත්ව නොමැති එහෙත් සුදුසුකම් ලැබීමේ ලිපිනයක් යටතේ නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ලබන තැනැත්තන් 'ආ' ලැයිස්තු ගත කර 2025 නාමලේඛනයට ඇතුළත් කරනු ලැබිය.

ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කාලසීමාව තුළ ග්‍රාම නිලධාරී ස්ථාන මාරුවීම් අත්හිටුවීම සහ එම කාලය තුළ කාර්යාල දින සීමා කිරීම් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීම මත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් හා සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත 2025.01.17 දිනැතිව ලිඛිත උපදෙස් ලබා දෙන ලදී. (ඇමුණුම 03)

ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කටයුතු 2025.01.01 දින සිට 2025.02.28 දින දක්වා සිදු කිරීමටත්, ගණන් ගැනීමේ නිලධාරීන්ගෙන් ආකෘති පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත භාර ගැනීම 2025.03.03 දින සිට 2025.03.28 දින දක්වා සිදු කිරීමටත් සැලසුම් කර තිබුණි. එහෙත් පළාත් පාලන ඡන්ද විමසීම් නිවේදනය 2025.03.03 දින නිකුත් කිරීමත් සමඟ ප්‍රතිශෝධන ලියවිලි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත භාරගැනීම 2025.05.19 දින සිට 2025.06.20 දින දක්වා සිදු කිරීමට කටයුතු කරන ලදී.

### 2.3.2. 'අ' 'ආ' ලැයිස්තු ප්‍රදර්ශනය : හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම

2024 ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනයේ නම් සඳහන්ව ඇති අයගෙන් මියගොස් ඇති හෝ පදිංචිය හැරගොස් ඇති හෝ වෙනත් හේතුවක් මත හෝ සුදුසුකම් නොලබන තැනැත්තන්ගේ එනම් 2025 වර්ෂයේ ඉවත් කිරීමට නිර්දේශ කරන තැනැත්තන්ගේ නම් සඳහන් වන 'අ' ලැයිස්තුව හා 2024 වර්ෂයේ ඒකාබද්ධ ඡන්දහිමි නාමලේඛනයේ නම් ඇතුළත් නොවන නමුත් වයස අවුරුදු 18 සම්පූර්ණ වීම හෝ පදිංචියට පැමිණීම හෝ වෙනත් හේතුවක් මත හෝ 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අලුතින් නම් ඇතුළත් කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ නම් සඳහන් වන 'ආ' ලැයිස්තු ප්‍රදර්ශනය 2025.05.02 දින සිට 2025.05.29 දින දක්වා සිදු කිරීමට සැලසුම් කර තිබුණ ද 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම හේතුවෙන් 2025.07.11 දින සිට 2025.08.07 දින දක්වා සිදු කරන ලදී. මේ පිළිබඳව අංක: 2444/61 හා 2025.07.11 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා භාෂාත්‍රයෙන් පුවත්පත්වල දැන්වීම් පළ කරන ලදි. (ඇමුණුම 04)

### 2.3.3. වලංගු නාමලේඛනය (හෝ කොටසක්) සහ "අ" ලැයිස්තු හා "ආ" ලැයිස්තු ප්‍රදර්ශන ස්ථාන

| ප්‍රදර්ශනය පිණිස තබනු ලබන ස්ථානය | ප්‍රදර්ශනය පිණිස තබා ඇති ඡන්දහිමි නාමලේඛනය සහ ලැයිස්තු හෝ ඒවායේ කොටස් |
|---|---|
| එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | අදාළ මැතිවරණ කොට්ඨාසයෙහි (දිස්ත්‍රික්කයේ) වලංගු ඡන්දහිමි නාමලේඛනයේ සම්පූර්ණ පිටපත සහ ඊට අදාළ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත් |
| එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන වලංගු ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත් |
| එක් එක් පළාත් පාලන ආයතනය | අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුල පිහිටා ඇති සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන වලංගු ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත් |
| එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය | අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුල පිහිටා ඇති සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන වලංගු ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත් |

- **එයට අමතරව මැතිවරණ කොමිෂන් සභාවේ ඉ සේවා වෙත පිවිස යම් අයෙකුට ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර තමාගේ නම 2025 වර්ෂය සඳහා නිර්දේශ වී ඇත්ද යන්න පරීක්ෂා කිරීමට පහසුකම් සලසා තිබුණි.**

එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාල වූ එකී ඡන්දහිමි නාමලේඛනයේ තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නමක් ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තා වූ එහෙත් තමාගේ නම ඡන්දහිමි නාමලේඛනයෙන් හා "ආ" ලැයිස්තුවෙන් ඉවත් කොට හෝ "අ" ලැයිස්තුවේ ඇතුළත් කර හෝ ඇති යම්කිසිවෙකු විසින් තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන කෙනෙකු විසින් හෝ හිමිකම් ඉල්ලා සිටින්නේ නම් එසේ හිමිකම් ඉල්ලා සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ උප ලේඛනයේ නියම කර ඇති "අ" සහ "ආ"ආකෘතියට සාරානුකූලව ඉල්ලුම් කළ යුතු බවට වන දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 2025 ජූලි මස 11 දින පළ කරන ලද අතර එදින සිට සති 4 ක් ඇතුළත එනම් 2025.08.07 දිනට පෙර මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ලැබිය යුතු බව ප්‍රසිද්ධ කරන ලදී.

මැතිවරණ කොට්ඨාසයට අදාල වූ ඡන්දහිමි නාමලේඛනයේ හෝ "ආ" ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත්ව ඇත්තාවූ යම් කෙනෙකුට, තමාගේ නම හෝ එකී නාමලේඛනයේ හෝ "ආ" ලැයිස්තුවේ හෝ නම සඳහන් වී ඇත්තාවූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කර තිබීම ගැන හෝ එකී නාමලේඛනයේ නම ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාවන් යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි "ඇ" ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට එනම් 2025 ජූලි මස 11 දින සිට සති 4ක් ඇතුළත

එනම් 2025.08.07 දිනට පෙර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතු බව ප්‍රසිද්ධ කරන ලදී.

හිමිකම් ඉල්ලා සිටින අයකුගේ නමක් ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන දක්වනු ලබන සෑම විරුද්ධතාවයක්ම හිමිකම් ඉල්ලා සිටින්නන්ගේ නම් ලැයිස්තුවක් අඩංගු දැන්වීමක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රදර්ශනය කරනු ලැබූ දින සිට දින 14 ක් ඇතුළත යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි 'ඇ' ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම දැන්වීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල 2025 ජූලි මස 25 වන දින සහ 2025 අගෝස්තු මස 11 වන දින ප්‍රසිද්ධ කරන ලදී.

හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන 'අ' 'ආ' ආකෘති පත්‍ර සහ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන 'ඇ' 'ඈ' ආකෘති පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් හා ග්‍රාම නිලධාරී කාර්යාලවලින් ලබා ගැනීම සඳහා පහසුකම් ලබා දෙන ලදී. එයට අමතරව අවශ්‍ය අයකුට මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය හරහා ආකෘති පත්‍ර බාගත කර මුද්‍රණය කර ගැනීමට ද අවස්ථාව සලසා දෙන ලදී.

### 2.3.4. හිමිකම් සහ විරෝධතා පරීක්ෂණ පැවැත්වීම හා ප්‍රමාද ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කිරීම

'අ' 'ආ' ලැයිස්තුගත සංඛ්‍යාව හා හිමිකම් භාරගැනීමේ කාලපරිච්ඡේදය අවසානයේ ලැබී ඇති හිමිකම් සංඛ්‍යාව පිළිබඳව අවධානය යොමු කළ මැතිවරණ කොමිෂන් සභාව ඡන්දහිමියන් ගණන් ගැනීමේ දී සිදුවිය හැකි දෝෂ නිවැරදි කිරීම සඳහා යම් අයුරකින් මඟහැරී ඇති නමුත් සුදුසුකම් ලැබූ ඡන්දහිමියන් ප්‍රමාද ඉල්ලීම් ලෙස සලකා නාමලේඛන ගත කිරීමට අදාල උපදෙස් දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත නිකුත් කරන ලදී.

ප්‍රධාන නාමලේඛනය හා පරිපූරක නාමලේඛනය සකස් කිරීමේ දී අනාවරණය වූ බහු ලියාපදිංචි ඡන්දහිමියන් සම්බන්ධයෙන් ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(7) උප වගන්තිය අනුව ක්‍රියා කිරීමට උපදෙස් දෙන ලදී. ඒ අනුව බහු ලියාපදිංචිය සිදුවී ඇති ඡන්දහිමියන් ලියාපදිංචි වීමට කැමති ලිපිනය විමසීම ප්‍රථමයෙන් සිදු කරන අතර, ඊට ලැබෙන පිළිතුර අනුව එක් ලිපිනයකින් ඉවත් කර ඡන්දහිමියන් කැමැත්ත ප්‍රකාශ කරන ලද ලිපිනයේ ලියාපදිංචි කිරීම සිදු කෙරේ. මැතිවරණ කොට්ඨාසය තුළ බහු ලියාපදිංචිය සඳහා පිළිතුරු නොලද විට ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ අභිමතය පරිදි වඩාත්ම සුදුසු එක් ලිපිනයක ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ඇත. මැතිවරණ කොට්ඨාස දෙකක බහු ලියාපදිංචිය සම්බන්ධයෙන් තීරණය මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කිරීමෙන් අනතුරුව ලබා දීමට කටයුතු කරයි. ජාතික හැඳුනුම්පත් අංක අනුව බහු ලියාපදිංචි බව අනාවරණය වුව ද පුද්ගලයන් දෙදෙනෙකු බව නිරීක්ෂණය වන අවස්ථාවක දී හා එක් පුද්ගලයෙක් ද යන්න සැක සහිත අවස්ථාවන්හි දී තොරතුරු තහවුරු වන තෙක් තවදුරටත් වෙනදා මෙන්ම ලිපිනයක් දෙකෙහිම තබා ගැනීමට කටයුතු කරනු ඇත.

2025 ප්‍රධාන නාමලේඛනය 2025.09.15 දින සහතික කිරීමට සැලසුම් කර තිබුණ ද, 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම හේතුවෙන් සහ ඉදිරි පළාත් සභා ඡන්ද විමසීම ද සැලකිල්ලට ගනිමින්; 2026 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යෑම සඳහා 2025.10.31 දින සහතික කිරීමට කටයුතු කරන ලදී.

2025 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේ කටයුතු දිස්ත්‍රික් මට්ටමෙන් අවසන් කර 2025 ඔක්තෝබර් මස 31 වන දින දිවයිනේ සියලු මැතිවරණ කොට්ඨාසවල සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන් විසින් සහතික කරන ලදී.

ඒ පිළිබඳව 2025.10.31 දිනැතිව අංක 2460/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කිරීමටත්, භාෂාත්‍රයෙන් පුවත්පත් දැන්වීම් පළ කිරීමටත් කටයුතු කළ අතර මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කිරීම මෙන්ම, සහතික කරන ලද ඡන්දහිමි නාමලේඛනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල හා දිවයිනේ සියලුම ග්‍රාම නිලධාරී කාර්යාලවල මහජන ප්‍රදර්ශනය සඳහා තබන ලදී.

### 2.3.5. 2025 ඡන්දහිමි නාමලේඛනයට අදාල සංඛ්‍යා සටහන්

- එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ප්‍රවර්තන නාමලේඛනයෙහි (2024) ඉවත් කිරීමට නියමිත (‘අ’ ලැයිස්තුගත නම්) සහ 2025 ඇතුළත් කිරීමට නියමිත (‘ආ’ ලැයිස්තුගත නම්) සංඛ්‍යාව (සටහන 02)
- ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වගන්තිය යටතේ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම සහ ඉඩදුන් හිමිකම් හා විරෝධතා (සටහන 03)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචිය අනාවරණය වීම මත එක් ලිපිනයකින් ඉවත් කළ ඡන්දහිමියන් සංඛ්‍යාව (සටහන 04)
- එක් එක් මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව (සටහන 05)
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරාපත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව වාර්ෂිකව ගණනය කිරීම2025.10.31 දින 2025 ප්‍රධාන නාමලේඛනය සහතික කිරීමෙන් පසු (2025 ප්‍රධාන නාමලේඛනය හා 2025 (1), හා 2025 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනවල සඳහන් ඡන්දහිමියන් සංඛ්‍යාව පදනම්ව) (සටහන 06)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයන්ට අදාළ 2025 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය සහතික කර ඇති සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ විස්තර (සටහන 07)
- එක් එක් මැතිවරණ කොට්ඨාසයන්ට අදාළ ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ ඡන්දහිමියන් සංඛ්‍යාවේ ප්‍රතිශතය (සටහන 08)

### 2.3.6. තුලනාත්මක සංඛ්‍යා සටහන්

පසුගිය වර්ෂ කිහිපයක ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ කරුණු පිළිබඳ තුලනාත්මක සංඛ්‍යා සටහන් පහත පරිදි වේ.

- ඡන්ද ප්‍රදේශ අනුව ප්‍රධාන නාමලේඛනයෙහි ලියාපදිංචි වී ඇති ඡන්දහිමියන් සංඛ්‍යාව පිළිබඳව තුලනාත්මක සටහන 2014 - 2025 (සටහන 09)
- ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනවලදී ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ ඡන්දහිමියන් සංඛ්‍යාවේ ප්‍රතිශතය පිළිබඳව තුලනාත්මක සටහන 2014 - 2025 (සටහන 10)
- එක් එක් වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන් සහ පෙර වර්ෂයට සාපේක්ෂව වැඩිවීම හා වැඩිවීමේ ප්‍රතිශතය සංසන්දනය 2001 - 2025 (සටහන 11)
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) අනු ව්‍යවස්ථාව යටතේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීමෙන් පසු එක් එක් මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත්කර ගත යුතු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන 2014 – 2025 (සටහන 12)
- වලංගු ඡන්දහිමි නාමලේඛනවල ඡන්ද සංඛ්‍යාවේ වෙනස්වීම හා ඊට අදාල විස්තර (සටහන 13)
- 2024 - 2025 මැතිවරණ කොට්ඨාස මට්ටමෙන් ඡන්දහිමියන් ලියාපදිංචිය සැසඳීම (ඇමුණුම 14)

### 2.3.7. 2024 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීම

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනත අනුව 2024 ඔක්තෝම්බර් මස 01 දින සිට 2025 ජනවාරි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ කිසියම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛනයක් සකස් කළ යුතු වේ. මෙම පරිපූරක නාමලේඛනයට අදාළ ගණන් ගැනීමේ කටයුතු 2024 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය ගණන් ගැනීමට සමගාමීව සිදු කරන ලදි.

පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම, හිමිකම් හා විරෝධතා සම්බන්ධයෙන් අංක: 2381/41 හා 2024.04.26 දිනැති ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල භාෂාත්‍රයෙන් දැන්වීම පළ කරන ලදී.

අවස්ථා කිහිපයකදී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් මෙම කාල පරිච්ඡේදය තුළ අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ විස්තර ලබාගත් අතර එම විස්තර දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් මගින් ග්‍රාම නිලධාරීනට යැවීමට කටයුතු කරන ලදී. ඊට අමතරව එක් එක් තැනැත්තන් වෙත ලියාපදිංචි වීමට කටයුතු කරන ලෙස ලිපි මගින් දැනුම් දෙන ලදී.

හිමිකම් පරීක්ෂණ පැවැත්වීමෙන් අනතුරුව පරිපූරක ඡන්දහිමි නාමලේඛනය ආරම්භයේ දී සැලසුම් කළ ආකාරයට 2025.02.01 දින සහතික කිරීම සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් අංක 2421/55 හා 2025.02.01 දිනැති ගැසට් නිවේදනය හා පුවත්පත් දැන්වීම මගින් නිවේදනය කරන ලදී. මෙම පරිපූරක නාමලේඛනයේ ලියාපදිංචි මුළු ඡන්දහිමියන් සංඛ්‍යාව 77075ක් වේ.

### 2.3.8. 2025 පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම.

ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ සංශෝධිත පනත අනුව 2025 පෙබරවාරි මස 01 දින සිට 2025 මැයි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ, 2025 ජුනි මස 01 දින සිට 2025 සැප්තැම්බර් මස 30 දින දක්වා කාල පරිච්ඡේදය තුළ හා 2025 ඔක්තෝබර් මස 01 දින සිට 2026 ජනවාරි මස 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ කිසියම් දිනයක දී වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන් ඇතුළත් පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කළ යුතු වේ.

මෙම පරිපූරක නාමලේඛනවලට අදාළ මූලික තොරතුරු ලබාගැනීම 2024 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනීමට සමගාමීව ආරම්භ කරන ලදී. සුදුසුකම් ලැබූ සෙසු තැනැත්තන් ගණන් ගැනීමේ කටයුතු 2025 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය සඳහා ඡන්දහිමියන් ගණන් ගැනීමට සමගාමීව සිදු කරන ලදී.

අවස්ථා කිහිපයකදී පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් මෙම කාල පරිච්ඡේදය තුළ අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන තැනැත්තන්ගේ විස්තර ලබාගත් අතර එම විස්තර දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස් වරුන් මගින් ග්‍රාම නිලධාරීන්ට යැවීමට කටයුතු කරන ලදී. ඊට අමතරව එක් එක් තැනැත්තන්ගේ පෞද්ගලික ලිපිනය වෙත ලිපි මගින් ද දැනුම් දෙන ලදී.

පරිපූරක ලැයිස්තු ප්‍රදර්ශනය කිරීම, හිමිකම් හා විරෝධතා සම්බන්ධයෙන් අංක 2447/15 හා 2025.07.29 දිනැති ගැසට් පත්‍රයේ හා පුවත්පත්වල භාෂාත්‍රයෙන් දැන්වීම පළ කරන ලදී.

### 2.3.9. 2025 (1) වන පරිපූරක නාමලේඛනය

හිමිකම් පරීක්ෂණ අවසන්කර මෙම පරිපූරක නාමලේඛනය 2025.10.15 දින සහතික කරන ලදී.

මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව 68,667ක් වේ.

**2.3.10. 2025 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය**

හිමිකම් පරීක්ෂණ අවසන්කර මෙම පරිපූරක නාමලේඛනය 2025.10.22 දින සහතික කරන ලදී.

මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව 68,109 ක් වේ.

**2.3.11. 2025 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය**

2025.12.31 දින වන විට මෙම පරිපූරක නාමලේඛනයට අදාල බොහෝ කටයුතු අවසන් කර තිබුණි. පෙර සැලසුම් කළ පරිදි 2025.02.02 දින මෙම පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීමට නියමිතය. 2025.12.31 දිනවන විට මෙම පරිපූකර ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට නිර්දේශිත ඡන්දහිමියන් සංඛ්‍යාව 68,267 ක් වේ.

**2.3.12. 2026 (1), 2026 (2) සහ 202 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම.**

2026.02.01 සිට 2026.05.31 දක්වා සකස් කළ යුතු 2026 (1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය 2026.06.01 සිට 2026.09.30 දක්වා සකස් කළ යුතු 2026 (2) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සහ 2026.10.01 සිට 2027.01.31 දක්වා සකස් කළ යුතු 2026 (3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ විස්තර 2025 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට සමගාමීව එකතු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලදි.

ඒ අනුව 2025.12.31 දිනට 2026 වර්ෂයට අදාල පරිපූරක නාමලේඛන සඳහා නිර්දේශිත නම් සංඛ්‍යාව පහත දැක්වේ.

| පරිපූරක නාමලේඛනය | නිර්දේශිත නම් සංඛ්‍යාව |
|---|---|
| (1)2026 | 14525 |
| (2)2026 | 14115 |
| (3)2026 | 12807 |

**2.3.13.පරිපූරක නාමලේඛනවලට අදාල සටහන්**

- 2025.02.01 දින සහතික කරන ලද 2024(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට අදාලව එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් අනුව ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (සටහන 15)
- 2025.02.01 දින 2024(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (2024 ප්‍රධාන නාමලේඛනය, 2024 (1), 2024 (2) හා 2024 (3) පරිපූරක නාමලේඛනවල ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව පදනම්ව) (සටහන 16)
- 2025.10.15 දින සහතික කරන ලද 2025(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට අදාලව එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් අනුව ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (සටහන 17)

- 2025.10.15 දින 2025(1) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (2024 ප්‍රධාන නාමලේඛනය, 2024 (1), 2024 (2) , 2024 (3) හා 2025 (1) පරිපූරක නාමලේඛනවල ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව පදනම්ව) (සටහන 18)
- 2025.10.22 දින සහතික කරන ලද 2025(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට අදාලව එක් එක් මැතිවරණ කොට්ඨාස / දිස්ත්‍රික් ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව (සටහන 19)
- 2025.10.22 දින 2025(2) පරිපූරක ඡන්දහිමි නාමලේඛනය සහතික කළ පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත් කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව (2024 ප්‍රධාන නාමලේඛනය, 2024 (1), 2024 (2) , 2024 (3), 2025 (1) හා 2025 (2) පරිපූරක නාමලේඛනවල ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව පදනම්ව) (සටහන 20)

### 2.4. ඡන්දහිමි නාමලේඛන ක්‍රියාවලිය සඳහා තොරතුරු තාක්ෂණය හඳුන්වා දීම.

ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි විම සඳහා ග්‍රාම නිලධාරී කාර්යාල, මැතිවරණ කාර්යාල වෙත යාම වෙනුවට මැතිවරණ ඉ-සේවාවන් ඔස්සේ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට මහජනතාවට අවස්ථාව ලබාදීම.

එසේම 2021 වර්ෂයේදී හඳුන්වා දුන් සියළු පුරවැසියන් හට ඡන්දහිමි නාමලේඛන තොරතුරු ඇතුළත් ප්‍රකාශයක් තම ජංගම දුරකථනය/ පරිගණකය ඔස්සේ ලබා ගැනීමේ පහසුකම මෙම වසරේ ද එලෙසින්ම ක්‍රියාත්මක විය.

පළමු වසර සඳහා පාසල්වලට සිසුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා කලාප /කොට්ඨාස අධ්‍යාපන කාර්යාල වලට නොමිලයේ හා ඉල්ලුම් කරන පාසල් වලට නියමිත ගාස්තු අයකර ඉ-සේවාවක් මගින් පදිංචි විස්තර ලබාදීමේ සේවයක් ක්‍රියාත්මක විය.

මැතිවරණ කොමිෂන් සභාවේ ඉ-සේවා පද්ධතිය වැඩිදියුණු කිරීම මගින් මහජනතාව ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ පාර්ශවකරුවන් වෙත පහසුවෙන් තම සේවාවන් ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැලසීම.
ග්‍රාම නිලධාරීන්ගේ මැතිවරණ කොමිෂන් සභාව හා සම්බන්ධ කටයුතු මැතිවරණ ඉ-සේවා හරහා මාර්ගගතව සිදු කිරීමේ පහසුකම් ලබාදීම.

2025 වසරේ දී ග්‍රාම නිලධාරීන් 1152 දෙනෙකු සිය පෞද්ගලික උපාංග හා දත්ත භාවිත කරමින් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ දත්ත ඇතුළත් කිරීම සිදු කරන ලදී.

ආබාධිත පුරවැසියන්ට පහසුකම් සැලසීම සඳහා විශේෂ පහසුකම් ලබාදීම. මැතිවරණ ඉ-සේවා හරහා පුද්ගලයන්ගේ ආබාධිත බව පිළිබඳ දත්ත රැස්කිරීමේ කටයුතු ආරම්භ කිරීම. (මෙමගින් මැතිවරණයකදී ඔවුන්ට අවශ්‍ය විශේෂ පහසුකම් සැලසීමට හැකියාව ලැබේ.)

**2.4.1. ප්‍රතිශෝධනය පිළිබඳව කෙටි පණිවිඩ (SMS) මඟින් ජනතාව දැනුම්වත් කිරීම.**

2025 ඡන්ද හිමි නාමලේඛනයට නිර්දේශ නොවූ හෝ පදිංචි ලිපිනය වෙනස් කිරීමට අවශ්‍ය මේ දක්වා නිර්දේශ නොවූ පුරවැසියන් දැනුම්වත් කිරීම සඳහා ඩයලොග්, මොබිටෙල්, සහ හච්සන් යන ජංගම දුරකථන ග්‍රාහකයන් වෙත “Elections” යන ශීර්ෂ පාඨය යටතේ පහත සඳහන් කෙටි පණිවිඩය මුදල් අයකිරීමකින් තොරව 2025.02.14 දින යැවීමට කටයුතු කරන ලදී.

- <u>සිංහල</u>

  මෙවර ග්‍රාම නිලධාරී ගෙයින්ගෙට නොපැමිණෙන බැවින්, 2025 ඡන්දහිමි නාමලේඛන කෙටුම්පතට සංශෝධන ඇත්නම් පමණක් ඔහු විමසන්න. ec.lk/vrd

- <u>සිංග්ලිෂ්</u>

  Mewara Grama Niladhari Geingeta nopaminena bavin, 2025 Chandahimi Namalekana ketumpathata sanshodana athnam pamanak ohu vimasanna. ec.lk/vrd

- <u>தமிழ்</u>

  இம்முறை கிராம அலுவலர் வீடு வீடாக வருகை தருவதில்லையென்பதால், 2025 வாக்காளர் இடாப்பு வரைவுக்கு திருத்தங்கள் இருப்பின் மாத்திரம் அவரிடம் வினவவும். நஉ.டம/எசன

- <u>ටැංග්ලිෂ්</u>

  Immurai Kirama Aluvalar Veeduhalukku Varuvathillai enbathal, 2025 Vaakkalar Idappu varaivukku Thiruththangal Iruppin Maaththiram Avaridam Vinavavum. ec.lk/vrd

- **<u>English</u>**

  Since the Grama Niladhari will not be visiting houses this time, please contact him only if there are amendments to the 2025 draft electoral register.ec.lk/vrd

2025 ඡන්ද හිමි නාමලේඛනයට කෙටුම්පතට ඇතුළත් නොවූ හෝ පදිංචි ලිපිනය වෙනස් කිරීමට අවශ්‍ය පුරවැසියන් දැනුම්වත් කිරීම සඳහා ඩයලොග්, මොබිටෙල්, සහ හච්සන් යන ජංගම දුරකථන ග්‍රාහකයන් වෙත “Elections” යන ශීර්ෂ පාඨය යටතේ පහත සඳහන් කෙටි පණිවිඩය මුදල් අයකිරීමකින් තොරව 2025.05.09 දින යැවීමට කටයුතු කරන ලදී.

- <u>සිංහල</u>

  2025 ඡන්ද ලැයිස්තුවට නිර්දේශ වී නැති; ලිපිනයේ, නමේ / හැඳුනුම්පතේ සංශෝධන ඇති; 2009.02.01ට පෙර උපන් අය ග්‍රාම නිලධාරී විමසන්න. ec.lk/vrd

- <u>සිංග්ලිෂ්</u>

  2025 Chanda laisthuwata nirdesha vi nathi; lipinaye, name/ hadunumpathe sanshodana athi; 2009.02.01ta pera upan aya Grama Niladhari Vimasanna. ec.lk/vrd

- **<u>தமிழ்</u>**

  இம்முறை கிராம அலுவலர் வீடு வீடாக வருகை தருவதில்லையென்பதால், 2025 வாக்காளர் இடாப்பு வரைவுக்கு திருத்தங்கள் இருப்பின் மாத்திரம் அவரிடம் வினவவும். ec.lk/vrd

- **<u>ටැංග්ලිෂ්</u>**

  2025 vakkalar idappukku parinthuraikkapadatha@ mugawariyil, peyaril/ adaiyala attayil thiruththangal ulla; 2009.02.01 itku munnar piranthawargal kirama aluvalaridam vinavawum.ec.lk/vrd

- **<u>English</u>**

  Those not recommended for 2025 electoral register / have changes in your address, name or NIC, born before 01.02.2009 enquire the Grama Niladhari. ec.lk/vrd

2025 ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව මහජනතාව දැනුම්වත් කිරීම සඳහා ඩයලොග්, මොබිටෙල්, සහ හච්සන් යන ජංගම දුරකථන ග්‍රාහකයන් වෙත “Elections” යන ශීර්ෂ පාඨය යටතේ පහත සඳහන් කෙටි පණිවිඩය 2025.07.15 දින යැවීමට කටයුතු කරන ලදී. මෙහිදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නියෝගයන්ට අනුව මොබිටෙල් දුරකථන සමාගම් වෙත අදාළ ගාස්තු සහ බදු මුදල් ගෙවීමට කටයුතු කරන ලද අතර ඩයලොග් හා හච්සන් දුරකථන සමාගම් මෙවර ද අදාළ පණිවිඩය නොමිලයේ යැවීමට කටයුතු කරන ලදී.

- **<u>සිංහල</u>**

  2025 ඡන්ද ලැයිස්තුවට නිර්දේශ නොවූ; පදිංචිය, නමේ, හැඳුනුම්පතේ සංශෝධන ඇති 2008.02.01ට පෙර උපන් අය ග්‍රාම නිලධාරී විමසන්න. ec.lk/vrd

- **<u>සිංග්ලිෂ්</u>**

  2025 Chanda laisthuwata nirdesha novu; padinchiya, name/ hedunumpathe sanshodhana ethi 2008.02.01 ta pera upan aya Grama Niladhari vimasanna. ec.lk/vrd

- **<u>தமிழ்</u>**

  2025 தேருநர் இடாப்புக்கு பரிந்துரைக்கப்படாத வதிவிடம்இ பெயர்.்.அடையாள அட்டை திருத்தப்பட்ட 2008.02.01 இற்கு முன்னர் பிறந்தவர்கள் கிராம அலுவலரை வினவவும். ec.lk/vrd

- **<u>ටැංග්ලිෂ්</u>**

  2025therunar idappukku parinthuraikapadatha; vathividam,peyar/adayalaattai thiruththapatta2008.02.01 kku mun piranthavargal kiramaaluvalarai vinavawum.ec.lk/vrd

- **<u>English</u>**

  Contact Grama Niladhari if not recommended for the 2025 electoral register; with address, name, ID changes and born before 01.02.2008. ec.lk/vrd

### 2.5. පාර්ලිමේන්තු මන්ත්‍රීධුර පුරප්පාඩු පිරවීම.

අංක 22 කෑගල්ල මැතිවරණ කොට්ඨාසයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද හපු ආරච්චිගේ කෝසල නුවන් ජයවීර මහතා මිය යාම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා රත්නායක මුදියන්සේලාගේ සමන්ත රනසිංහ මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2431/11 හා 2025.04.08 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය විසින් නාමයෝජනා කරන ලදුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද මුහම්මදු සාලි නලීම් මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා මුහම්මදු සරිපු අබ්දුල් වාහිද් මහතා මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2443/50 හා 2025.07.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් වන ජාතික ජන බලවේගය විසින් නාමයෝජනා කරන ලදුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද හර්ෂණ සූරියප්පෙරුම මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා උස්හෙට්ටිගේ දොන් නිශාන්ත ජයවීර මහතා මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2444/07 හා 2025.07.07 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පිළිගත් දේශපාලන පක්ෂයක් වන සමගි ජන බලවේගය විසින් නාමයෝජනා කරන ලදුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද මුහම්මදු ඉස්මායිල් මුත්තු මුහම්මදු මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව සඳහා නෙයිනා තම්බි මරික්කාර් මොහමඩ් තාහිර් මහතා මහතා තෝරා පත්කර ගන්නා ලද අතර ඒ පිළිබඳව අංක: 2465/09 හා 2025.12.02 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

### 2.6. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025.05.06

#### 2.6.1. පසුබිම

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38(1) (ඇ) උපවගන්තිය ප්‍රකාරව 2317/02 සිට 26 දක්වා සහ 2023.01.30 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර මගින් අදාළ දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතන සඳහා 2023.03.09 දින ඡන්ද විමසීමක් පවත්වනු ලබන බව ඒ ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ තේරීම්භාර නිලධාරීන් විසින් ප්‍රසිද්ධ කර තිබිණි.

එසේ වුව ද මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර, අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් පසුව අදාළ පරිපාලන දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් විසින් 2322/28 සිට 52 හා 2023.03.08 දිනැති ගැසට් නිවේදන මගින් නව ඡන්ද විමසීමේ දිනය 2023.04.25 දිනය ලෙස පසුව නිවේදනය කරන ලදි.

ඡන්ද විමසීම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් නිකුත් කිරීමට නොහැකි වන බවට වූ කරුණ තවදුරටත් විසඳී නොමැති හේතුව මත එකී ඡන්ද විමසීම් පැවැත්වීමට නොහැකි තත්ත්වයක් පැන නැඟීම නිසා, ඡන්ද විමසීම පැවැත්වීමට නියමිතව තිබූ ඉහත 2023.04.25 දිනය නොව, ඊට පසු දිනයක් ඡන්ද විමසීමේ දිනය ලෙස නම් කිරීමට කටයුතු කරනු ලබන බව අදාළ පරිපාලන දිස්ත්‍රික්කවල තේරීම්භාර නිලධාරීන් විසින් 2327/08 සිට 32 හා 2023.04.11 දිනැති ගැසට් පත්‍ර මගින් තවදුරටත් නිවේදනය කරන ලදි.

එලෙස දින නියමයක් නොමැතිව කල් තබන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2024 ඡන්ද හිමි නාමලේඛනය පදනම් කර ගනිමින් කඩිනමින් නැවත පැවැත්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවට බලය ලබා දීම පිණිස 2023 වර්ෂයේ දී කැඳවන ලද නාමයෝජනා ආපසු කැඳවීමට පනත් කෙටුම්පතක් සකස් කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක වෙත උපදෙස් ලබා දීම සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් PA/PCLA-31/99/2024 හා 2024.12.01 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය.

ඒ අනුව ඒ වන විට ඡන්ද විමසීම් කැඳවනු ලැබ ඇති සහ කල් තබා ඇත්තා වූ ඇතැම් පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා සහ එම පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සලස්වමින් 2025 අංක 1 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත 2025.02.17 දින සහතික කරන ලදි.

ඒ අනුව එකී සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වැනි වගන්තිය ප්‍රකාරව අදාළ නාමයෝජනා දැන්වීම් මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන හා එම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වූ 2025.02.17 දින සිට මාස තුනක කාලයක් ඉක්ම යාමට මත්තෙන් වූ දිනයක ප්‍රසිද්ධ කළ යුතු විය.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් තරග කරනු ලබන එක් එක් පළාත් පළාත් පාලන ආයතනය වෙනුවෙන් පළමු නාමයෝජනා පත්‍රයේ හා දෙවන නාමයෝජනා පත්‍රයේ නාමයෝජනා කළ යුතු අපේක්ෂකයන් ගණන, ඇතුළත් විය යුතු අවම තරුණ හා කාන්තා අපේක්ෂකයන් ගණන හා තැන්පත් කළ යුතු ඇප මුදල් පිළිබඳ තොරතුරු අංක 2425/70 හා 2025.03.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලදි.
මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුනෙයි මහ නගර සභාව හා දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය සභාව, කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පූනාකරි ප්‍රාදේශීය සභාව සහ 2024.10.26 දින ඡන්ද විමසීම පවත්වා අවසන් කරන ලද ඇල්පිටිය ප්‍රාදේශීය සභාව යන ආයතන හැර දිවයිනේ මහ නගර සභා 28ක්, නගර සභා 36ක් හා ප්‍රාදේශීය සභා 272 ක් වශයෙන් පළාත් පාලන ආයතන 336 ක් වෙනුවෙන් නාමයෝජනා බාර ගැනීමේ දැන්වීම 2025.03.03 දිනැතිව ප්‍රසිද්ධ කරන ලදි. ඒ අනුව 2025.03.17 දින සිට 2025.03.19 දින මධ්‍යාහ්න 12.00 දක්වා නාමයෝජනා භාර ගැනීම ඒ ඒ දිස්ත්‍රික්කයේ පිහිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දී සිදු කරන ලදි.

ඉහත පළමු අදියරේ දී නාමයෝජනා කැඳවීම සිදු නොකරන ලද දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව, මන්නාරම ප්‍රාදේශීය සභාව හා පූනාකරි ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතන සඳහා වූ නාමයෝජනා දැන්වීම 2025.03.10 දිනැතිව ප්‍රසිද්ධ කරන ලද අතර 2025.03.24 දින සිට 2025.03.27 දින මධ්‍යාහ්න 12.00 දක්වා නාමයෝජනා භාර ගැනීම ඒ ඒ දිස්ත්‍රික්කයේ පිහිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දී සිදු කරන ලදි.

ඒ අනුව ඉහත සියලුම පළාත් පාලන ආයතන සඳහා ඡන්ද විමසීමේ දිනය 2025.05.06 දිනය ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් නිවේදනය කරනු ලැබීය.

මෙම ඡන්ද විමසීම තරග කිරීම සඳහා දිවයිනේ පළාත් පාලන ආයතන 339 ක් වෙනුවෙන් පිළිගත් දේශපාලන පක්ෂ 55 ක් සහ ස්වාධීන කණ්ඩායම් 360 ක් ඇප මුදල් තැන්පත් කර තිබිණි. ඒ අනුව පක්ෂ සහ කණ්ඩායම් විසින් තැන්පත් කරන ලද මුළු ඇප සංඛ්‍යාව 2806 ක් විය.

2025.05.06 දින පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා පිළිගත් දේශපාලන පක්ෂ 49 ක් සහ ස්වාධීන කණ්ඩායම් 257 ක් තරග කරන ලද අතර ඉදිරිපත් වූ මුළු අපේක්ෂක සංඛ්‍යාව 75,589 ක් විය. 2024 වර්ෂයේ සහතික කරන ලද ඡන්ද හිමි නාලේඛනය ද 1 වැනි, 2 වැනි හා 3 වැනි පරිපූරක ද ඇතුළත් ඒකාබද්ධ ඡන්ද හිමි නාමලේඛනයේ කොට්ඨාස 4,877 කට අදාළව ඡන්ද මධ්‍යස්ථාන 13,759 ක් මෙම ඡන්ද විමසීමේ කාර්යය සඳහා යොදා ගත් අතර දිවයින තුළ මුළු ලියාපදිංචි ඡන්දදායකයින් සංඛ්‍යාව 17,156,338 ක් විය.

ස්වකීය පදිංචි ස්ථානය සායින්දමරුදු නගර සභාව යැයි හඳුන්වා ගන්නා ලද පළාත් පාලන ආයතනයකට අයත් වුව ද එය කල්මුනෙයි මහ නගර සභාවේ කොටසක් ලෙස ගැසට් කර ඇතැයි සඳහන් කරමින් ප්‍රදේශවාසීන් දෙදෙනකු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති අංක SC/FR/7/23 දරන මූලික අයිතිවාසිකම් පෙත්සමට අදාළව පනවා ඇති අතුරු තහනම් නියෝග හේතුවෙන් 2025.09.30 දින වන විට ද කල්මුනෙයි මහ නගර සභාවේ ඡන්දය විමසීම වෙනුවෙන් නාමයෝජනා දැන්වීම් පළ කිරීමට නොහැකි වී ඇත.

### 2.6.2. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරනු ලැබූ ගැසට් නිවේදන

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නිකුත් කරන ගැසට් නිවේදන පිළිබඳ තොරතුරු සටහන 21 හි ඇතුළත් කර ඇත.

### 2.6.3. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත නිකුත් කරනු ලැබූ චක්‍රලේඛ

2025 වර්ෂයේ දී දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත නිකුත් කරන ඇති චක්‍රලේඛ පිළිබඳ තොරතුරු සටහන 22 හි ඇතුළත් කර ඇත.

### 2.6.4. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව රජයේ මුද්‍රණාලය මඟින් මුද්‍රණය කරන ලද ලේඛන.

2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වෙනුවෙන් මුද්‍රණය සඳහා මුද්‍රණාලය වෙත ලබාදී ඇති ලිපි ලේඛන, ආකෘති පත්‍ර, ලිපි කවර, ජර්නල්, උපදෙස් පොත් සහ අනෙකුත් ලේඛන පිළිබඳ තොරතුරු සටහන 23 හි ඇතුළත් කර ඇත.

### 2.6.5 පළාත් පාලන ඡන්ද විමසීමට අදාළ නඩු කටයුතු

මෙම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සම්බන්ධයෙන් විවිධ පාර්ශ්ව විසින් මැතිවරණ කොමිෂන් සභාවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු කෘත්‍ය සංඛ්‍යාව 68 කි. ඒවා පහත ආකාරයෙන් විය.

| නඩු කෘත්‍ය වර්ගීකරණය | පෙත්සම් සංඛ්‍යාව |
|---|---|
| මූලික අයිතිවාසිකම් කඩවීම | 11 |
| රිට් පෙත්සම් | 49 |
| පළාත් පාලන සංශෝධන පනත් පිළිබඳ පෙත්සම් | 4 |
| නාමයෝජනා ප්‍රතික්ෂේප වීම නිසා ගොනු කරන ලද නඩුකර | 4 |

තව ද අභියාචනාධිකරණයේ නඩු කෘත්‍ය 214 ක් ද, මාතර දිසා අධිකරණයේ නඩු කෘත්‍ය 1 ක් ද, මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කෘත්‍ය 1 ක් ද වශයෙන් ගොනු කර තිබිණි.

2025.09.30 දින වන විට ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරන ලද නඩු 68 න් 66 ක් සම්බන්ධයෙන් අවසන් තීන්දු ලබා දී ඇත. අභියාචනාධිකරණයේ විභාග වූ නඩු කටයුතු අතුරින් 205 ක් අවසන්ව ඇත. ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩු කටයුතු 2 ක්, අභියාචනාධිකරණයේ පරන ලද නඩු 9 ක් හා දිසා හා මහේස්ත්‍රාත් අධිකරණවල නඩු කටයුතු 1 බැගින් තවදුරටත් විභාග වෙමින් පවතී.

### 2.6.6. තැපැල් ඡන්ද

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ තැපැල් ඡන්ද අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනය 2025.03.17 දින මධ්‍යම රාත්‍රියෙන් අවසන් වූ අතර, පසුව නාමයෝජනා කැඳවන ලද දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව, මන්නාරම ප්‍රාදේශීය සභාව හා පූනාකරි ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතනවලට අදාළ තැපැල් ඡන්ද අයදුම්පත්‍ර පමණක් 2025.03.19 දින මධ්‍යම රාත්‍රිය දක්වා භාර ගන්නා ලදී.

මෙම ඡන්ද විමසීමේ නාමයෝජනා සම්බන්ධයෙන් බාහිර පාර්ශ්වයන් විසින් ගොනු කරන ලද නඩු කටයුතු හේතුවෙන් 2025.04.11, 2025.04.15, 2025.04.17 හා 2025.04.21 යන දින 4 ක දී වෙන් වෙන් වශයෙන් තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම සිදු විය. ඒ අනුව නිකුත් කරන ලද මුළු තැපැල් ඡන්ද පත්‍රිකා ප්‍රමාණය 648,495 ක් විය.

#### 2.6.6.1. තැපැල් ඡන්ද සලකුණු කිරීම

සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවල දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව විසින් දින 03 ක් වෙන් කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාල, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල , මැතිවරණ මහලේකම් කාර්යාලය, පොලිසිය, පොලිස් විශේෂ කාර්ය බලකාය සහ ත්‍රිවිධ ආරක්ෂක කොට්ඨාසවල තැපැල් ඡන්ද සලකුණු කිරීම 2025.04.22 දිනයේ ද සෙසු සියළුම රජයේ කාර්යාල, සියළුම ආරක්ෂක හමුදා කඳවුරු, සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල හා සියලුම පාසැල්වල තැපැල් ඡන්දය සලකුණු කිරීම 2025.04.23 හා 24 දිනවල දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට හා එම දිනවල තැපැල් ඡන්දය සලකුණු කිරීමට නොහැකිවන තැපැල් ඡන්ද හිමියන් සඳහා 2025.04.28 හා 29 දිනවල දී ඒ ඒ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට

නියමිතව තිබුණි. එසේවුවද, අධිකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් තැපැල් ඡන්ද නිකුත් කිරීම ප්‍රමාද වීම මත තැපැල් ඡන්ද සලකුණු කිරීමේ දින සංශෝධනය කිරීමට 2025.04.17 දින මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලද අතර ඒ අනුව සියළුම රාජ්‍ය ආයතන හා හමුදා කඳවුරු, පොලිස් ස්ථාන, පාසැල්, ව්‍යවස්ථාපිත මණ්ඩලවල තැපැල් ඡන්ද සලකුණු කිරීම අදාළ සහතික කිරීමේ නිලධාරීන්ගේ කාර්යාලවලදී 2025.04.24,25, 28 හා 29 දිනවල දී සිදු කරන ලදී. 2025.04.28 හා 29 දිනවල දී සලකුණු කරන ලද තැපැල් ඡන්ද අඩංගු A කවර තැපැල් දෙපාර්තමේන්තුව වෙත භාර නොදුන් අතර, 2025.05.01 දින සරණ මාවත, රාජගිරිය ලිපිනයේ පිහිටි මුදල් කොමිෂන් සභා කාර්යාලයේ දී එක් එක් දිස්ත්‍රික්ක අතර A කවර හුවමාරු කර ගැනීමේ වැඩසටහනක් පැවැත්විණි. සුපුරුදු පරිදි සියළුම රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන ආවරණය වන පරිදි තැපැල් ඡන්ද සලකුණු කිරීමේ කටයුතු අධීක්ෂණය සඳහා මෙවර ද කටයුතු සම්පාදනය කරන ලදී.

මෙම කාල සීමාව අතරතුර පැවති මහනුවර දළදා දැක්මේ විශේෂ රජකාරි සඳහා යොදවන ලද දසදහසකට (10,000) ආසන්න පොලිස් නිලධාරීන්ට මහනුවර දී අදාළ තැපැල් ඡන්දය සලකුණු කිරීමට පහසුකම් ලබා දෙන ලෙස පොලිස් දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙතින් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව දළදා දැක්මේ රාජකාරි සඳහා අනුයුක්ත කරන ලද පොලිස් නිලධාරීන්ගේ ඒ ඒ පොලිස් ස්ථාන වෙත ලැබී තිබූ තැපැල් ඡන්ද පත්‍රිකා අඩංගු D කවර අදාළ පොලිස් ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ගෙන්වා ගෙන විශේෂ ආරක්ෂක හා ප්‍රවාහන සැලැස්මක් යටතේ මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත 2025.04.20 දින රැගෙන යාමට කටයුතු කරන ලදී. එම පොලිස් නිලධාරීන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීම 2025.04.24,25, 28 හා 29 දිනවල දී මහනුවර උසස් බාලිකා විදුහල් පරිශ්‍රයේ පිහිටුවන ලද විශේෂ මධ්‍යස්ථානයේ දී සිදු කරන ලදී. එම දළදා දැක්මේ විශේෂ රාජකාරී සඳහා අනුයුක්ත කරන ලද ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ නමින් තමාගේ නිත්‍ය හමුදා කඳවුරට ලැබී ඇති D කවර ද අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය වෙත දැනුම් දී ආරක්ෂිතව මහනුවරට රැගෙන විත් මහනුවර එම නිලධාරීන් අනුයුක්ත කරන ලද කඳවුරේ දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමට සහතික කිරීමේ නිලධාරීන්ට අනුමැතිය ලබා දී තිබුණි. මෙම වැඩපිළිවෙළ අධීක්ෂණය සඳහා මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය විසින් සහකාර තේරීම් භාර නිලධාරීවරුන් යොදවා තිබූ අතර නිරීක්ෂණ කටයුතු සඳහා මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV) සහ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL) කටයුතු යොදා තිබුණි.

**2.6.6.2. තැපැල් ඡන්ද හිමියන් සඳහා ඉ - සේවාවන්**

තැපැල් ඡන්ද හිමියන්ට QR කේතයක් පරිලෝකනය කිරීම මගින් ස්වකීය ඡන්දයට අදාළ සහතික කිරීමේ නිලධාරියා සහ ඡන්දය ප්‍රකාශ කිරීමට නියමිත තැපැල් ඡන්ද මධ්‍යස්ථානය පහසුවෙන් දැන ගැනීම සඳහා ඉ - සේවාවක් හඳුන්වා දෙනු ලැබිණි. එසේම මෙම සේවාවෙහි ඇතුළත්ව තිබූ "ඔබගේ අපේක්ෂකයා හඳුනාගන්න" යන යෙදවුම මගින් ඡන්ද විමසීමට ඉදිරිපත් වූ පක්ෂ, කණ්ඩායම් හා අපේක්ෂකයන් පිළිබඳ තොරතුරු පහසුවෙන් ලබා ගත හැකි විය.

### 2.6.7. මැතිවරණ ආරවුල් කළමනාකරණ හා නීති බලාත්මක කිරීම

#### 2.6.7.1. නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා මැතිවරණ නීතිය බලාත්මක කිරීම සම්බන්ධයෙන් මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකයේ ක්‍රියාකාරිත්වය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ(4)(අ) හා 104ආ(5)(අ) වගන්ති ප්‍රකාරව රාජ්‍ය දේපල හා රාජ්‍ය මාධ්‍ය මැතිවරණ ප්‍රවර්ධනයට යෙදවීම වැළැක්වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව විසින් විධාන හා මාධ්‍ය උපමාන සාදන ලද අතර මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන, අන්තර්ජාල වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය වේදිකා විසින් මෙම ඡන්ද විමසීම පිළිබඳ වාර්තා කිරීමේ දී මධ්‍යස්ථ සහ අපක්ෂපාතී වීම ඇතුළුව ඡන්ද විමසීම තරග කරනු ලබන යම් දේශපාලන පක්ෂයකට හෝ කණ්ඩායමකට හෝ අපේක්ෂකයකුට අගතියක් හෝ ප්‍රවර්ධනයක් සිදු නොවන ආකාරයට මාධ්‍ය අවකාශය වෙන් කර දීම මෙමගින් අපේක්ෂා කරන ලදි. අදාළ උපමාන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2426/07 හා 2025.03.03 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලදි.

තව ද ඡන්ද විමසීම තරග කරන අපේක්ෂකයන් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම නිකුත් කිරීම, ඡන්ද විමසීමට අදාළව පනත් මගින් තහනම් කර ඇති වැරදි, දූෂණ ක්‍රියා හා නීති විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ජන සමාජය දැනුවත් කිරීම, ඡන්ද විමසීම් නීති බලාත්මක කිරීමට අවශ්‍ය නියෝග හා නිර්දේශ ශ්‍රී ලංකා පොලීසිය වෙත ලබා දීම හා එම කටයුතු සම්බන්ධීකරණය කිරීම, සමාජ මාධ්‍ය මගින් ප්‍රචාරණය වන දුෂ්ප්‍රචාර හා වෛරී ප්‍රකාශ සමාජගත වීම වළක්වාලීම හා පැමිණිලි කළමනාකරණය සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද භාවිතා කරමින් ක්ෂණිකව විසඳුම් ලබා දිය හැකි යාන්ත්‍රණයක් සකස් කිරීම යන කරුණු මෙම ඡන්ද විමසීම සඳහා ස්ථාපනය කරන ලද මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකයේ අරමුණු අතර විය.

ඒ අනුව මෙම ඡන්ද විමසීම ප්‍රකාශයට පත් කරන ලද 2025.03.03 දින සිට ජාතික පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානය සක්‍රිය ලෙස ක්‍රියාත්මක වූ අතර උප කාර්යාල 25 ක් දිස්ත්‍රික් වශයෙන් ස්ථාපනය කරන ලදි. ඒ සඳහා පැමිණිලි කළමනාකරණ ජාතික මධ්‍යස්ථානය භාර ප්‍රධාන නිලධාරියකු යටතේ පැමිණිලි නිරීක්ෂණය, ස්ථානීය පරීක්ෂා, හදිසි සෝදිසි පරීක්ෂා සහ වාර්තා ලබා ගැනීම සඳහා අත්දැකීම් සහ සමාජ මාධ්‍ය සංවිධාන සම්බන්ධීකරණය කරගැනීමට ප්‍රමාණවත් කුසලතා සහ තාක්ෂණික දැනුම ඇති නිලධාරීන් අනුයුක්ත කර ගනු ලැබීය. මෙහි දී ජාතික පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ආකෘති 4 ක් මගින් පැමිණිලි ලබා ගන්නා ලද අතර ඒවා නීති උල්ලංඝනය කිරීම් හා ප්‍රචන්ඩ ක්‍රියා වශයෙන් වර්ගීකරණය කොට හඳුනා ගන්නා ලදි.

මීට අමතරව පොලිස් ස්ථානවල ඡන්ද විමසීම් රාජකාරි සඳහා අනුයුක්ත කර ඇති නිලධාරීන් පුහුණු කිරීම, පැමිණිලි කළමනාකරණය සඳහා යොදවාගත් රාජ්‍ය නිලධාරීන් පුහුණු කිරීම සහ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ආයතන ප්‍රධානින් හා එම අයිතිකරුවන් දැනුවත් කිරීම සඳහා මෙම ඒකකය තවදුරටත් ක්‍රියාකාරී දායකත්වය සපයන ලදි.

මාධ්‍ය උපමාන නිත්‍ය නියෝජිත කමිටුව ස්ථාපනය කිරීම සහ පළාත් පාලන ආයතන හා පළාත් පාලන කොමසාරිස් කාර්යාල ඇතුළුව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ජනමාධ්‍ය අමාත්‍යාංශය හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යන ආයතන සමග ඡන්ද විමසීම් පැමිණිලි කළමනාකරණය සම්බන්ධයෙන් සම්බන්ධීකරණය පවත්වා ගනිමින් දෛනික පැමිණිලි සංඛ්‍යා සටහන් ඇසුරින් 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් පැමිණිලි පිළිබඳ අවසන් වාර්තාව සකස් කිරීම මැතිවරණ ආරවුල් නිරාකරණ ඒකකය විසින් සිදු කරන ලදි.

මෙම ඡන්ද විමසීමේ දී මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සහ ප්‍රචණ්ඩ ක්‍රියා ක්ෂනිකව වාර්තා කිරීම සහ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමේ මෙන්ම විසඳුම් සහතික කිරීමේ ක්‍රියාවලිය විනිවිදභාවයකින් සිදු කිරීම තුළින් පුරවැසියන් බල ගැන්වීම සඳහා EC-EDR නමින්, සාක්ෂි සහිතව පැමිණිලි යොමු කිරීමේ පහසුකම් සහිත ජංගම යෙදුමක් ප්‍රථම වරට හඳුන්වා දෙන ලදි.

### 2.6.7.2. මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටු වීම.

2025.05.06 දින පවත්වනු ලැබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.17 දින සිට බලපැවැත්වෙන පරිදි ඡන්ද විමසීමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කර සතියක කාලයක් ගතවන තෙක් ක්‍රියාත්මක වන පරිදි ජාතික මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථානය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍ර තුළ දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් කළමනාකරණ මධ්‍යස්ථාන පිහිටුවීම සිදුකරන ලදී.
විවිධ පාර්ශ්ව විසින් ඡන්ද විමසීම් නීති උල්ලංඝණය කිරීමක් හෝ ඡන්ද විමසීම් කටයුතුවලට බාධා ඇති කිරීමක් පිළිබඳව යොමු කරන පැමිණිලි සඳහා කඩිනමින් ක්‍රියා කිරීම නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමට ඇති වන බාධා වළකාලීමටත් ඒවා තවදුරටත් ඇති වීමට ඉඩ නොදීමටත්, ඡන්ද විමසීම නීත්‍යානුකූලව පැවැත්වීමට හා පැමිණිලිවලට අදාළ සිද්ධීන්ගෙන් අගති සිදුවන පාර්ශ්වයන්ට සහන සැලසීමත්, තරග කරනු ලබන පාර්ශ්වයන්ට සම අවස්ථා ලබාදීමත් යන කටයුතු සිදු කිරීම මෙහි ප්‍රධාන අරමුණ විය.

මීට සමගාමීව,

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා සියලු දිස්ත්‍රික්කවල පිහිටුවීමට නියමිත මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානවල කටයුතු පහසු කිරීම සඳහා සකස් කරන ලද EDR මෘදුකාංගය පිළිබඳව සහ පැමිණිලි කළමනාකරණය පිළිබඳව දිස්ත්‍රික් මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථානවල නිලධාරීන් සහ පොලිස් නිලධාරීන් දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන 2025.03.07 දින වැල්ලවත්ත විලාසිතා නිවසේ පරිඝණක පුහුණු මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

- තවද, මැතිවරණ ආරවුල් කළමනාකරණ මෘදුකාංගය පුරවැසියන් වෙත හඳුන්වාදීමේ සමාරම්භක වැඩසටහන 2025.03.22 දින මැතිවරණ කොමිෂන් සභාවේ ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද අතර පොලිස් නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන 2025.03.27 දින මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පැවැත්වීම සිදු කරන ලදී. එමඟින් මහජනතාවට මැතිවරණ නීති උල්ලංඝනය වූ අවස්ථාවේ දීම ඒ සම්බන්ධයෙන් පැමිණිලි කිරීමටත්, පැමිණිලි සම්බන්ධයෙන් වන ප්‍රගතිය නිරීක්ෂණය කිරීමටත් අවස්තාව උදා විය.

- මීට අමතරව සමාජ මාධ්‍ය හා අන්තර්ජාලයේ ව්‍යාප්ත වන දූස් තොරතුරු හා හානිකර අන්තර්ගත ව්‍යාජ පුවත් නිරීක්ෂණය කිරීම සඳහා වූ ඒකකයක් පිහිටුවීමට හා ඒ සඳහා සුදුසුකම්ලත් නිලධාරී මණ්ඩලයක් පත්කිරීම සිදු කරන ලද අතර එමඟින් සමාජ මාධ්‍ය හරහා මැතිවරණ නීති උල්ලංඝනය වන අයුරින් සිදුකරනු ලබන ද කටයුතු වැළැක්වීම සිදු කරන ලදී.

### 2.6.7.3. මැතිවරණ ආරවුල් කළමනාකරණය සම්බන්ධව පුහුණු වැඩසටහන් පැවත්වීම

මැතිවරණ ආරවුල් කළමනාකරණය සම්බන්ධව සහකාර තේරීම්භාර නිලධාරීන් හා පොලිස් නිලධාරීන් දැනුම්වත් කිරීමේ පුහුණු වැඩසටහන් සියලුම දිස්ත්‍රික්ක හා පොලිස් කොට්ඨාස ආවරණය කරමින් 2025.03.24 සිට 2025.04.28 දින දක්වා වූ කාල සීමාව තුළ පැවැත්වීමට කටයුතු කරන ලදී.

2025.03.24 - කිලිනොච්චිය, වවුනියාව, මන්නාරම, මුලතිව්, යාපනය, කන්කසන්තුරය

2025.03.24 - අනුරාධපුරය, පොළොන්නරුව, කැබිතිගොල්ලෑව

2025.04.01 - මහනුවර, මාතලේ, තෙල්දෙණිය, ගම්පොළ

2025.04.02 - අම්පාර, මඩකලපුව

2025.04.03 - බණ්ඩාරවෙල, බදුල්ල, නුවරඑළිය, හැටන්, මොණරාගල

2025.04.04 - රත්නපුර, ඇඹිලිපිටිය, කෑගල්ල, සීතාවකපුර

2025.04.09 - කුරුණෑගල, පුත්තලම, හලාවත, නිකවැරටිය, කුලියාපිටිය,

2025.04.10 - කොළඹ උතුර, කොළඹ මධ්‍යම, කොළඹ දකුණ, නුගේගොඩ, ගම්පහ, කැළණිය, මීගමුව

2025.04.26 - ගාල්ල, මාතර, ඇල්පිටිය, තංගල්ල

2025.04.26 - කළුතර, පානදුර, ගල්කිස්ස

2025.04.28 - කන්තලේ, ත්‍රිකුණාමලය

**2.6.7.4. මැතිවරණ නීති බලාත්මක කිරීම සඳහා නිකුත් කරන ලද ගැසට් නිවේදන**

2025.01.12 - 2025.01.12 දිනැති අංක 2418/50 දරණ විධාන ගැසට් පත්‍රය මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ විධාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක් දක්වා බලාත්මක කිරීමට අදාළ ගැසට් නිවේදනය මුද්‍රණය.

2025.01.16 – 2025.01.16 දිනැති අංක 2419/25 දරණ 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4)(ආ) වගන්තියේ විධිවිධාන යටතේ මැතිවරණ කාර්යයන් සඳහා පිළිගත් දේශපාලන පක්ෂ ලෙස සැළකීමට හිමිකම් ලබා ඇති දේශපාලන පක්ෂවල නම් ඇතුළත් ගැසට් නිවේදනය මුද්‍රණය.

2025.01.16 – 2025.01.16 දිනැති අංක 2419/26 දරණ මාධ්‍ය උපමාන ගැසට් පත්‍රය මගින් පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2023 ට අදාළ මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය ඉදිරි මාස 03 ක් දක්වා බලාත්මක කිරීම .

2025.02.13 – 2025.02.13 දිනැති අංක 2423/15 දරණ 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 6(3) වගන්තිය යටතේ වූ නියමය ඇතුළත් ගැසට් නිවේදනය මුද්‍රණය.

2025.03.03 – 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.03 දිනැති අංක 2426/06 දරන ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී රජයට හෝ රාජ්‍ය සංස්ථාවලට හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවලට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළ පක්ෂ, කණ්ඩායම්, අපේක්ෂක ප්‍රවර්ධනයට නැතහොත් අගතියට හේතුවන පරිදි හෝ නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීමේ කාර්යයට බාධාවන පරිදි ඍජුව හා වක්‍ර ලෙස හෝ යොදා ගැනීම වැළැක්වීම සඳහා වූ විධාන ගැසට් නිවේදන මුද්‍රණය.

2025.03.03 – 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.03 දිනැති අංක 2426/07 දරන 104ආ.(5)(අ) අනුව්‍යවස්ථාව යටතේ වන මාධ්‍ය උපමාන ගැසට් නිවේදනය මුද්‍රණය.

2025.03.03 – 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.03 දිනැති අංක 2426/08 දරන ඡන්ද විමසීම්වල දී තරග කරනු ලබන දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම්වල අපේක්ෂකයන් විසින් අනුගමනය කළ යුතු ආචාර ධර්ම පද්ධතිය ඇතුළත් ගැසට් නිවේදන මුද්‍රණය.

2025.03.03 – 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.03 දිනැති අංක 2426/10 දරන 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7 වන වගන්තිය අනුව මැතිවරණ කාර්යයන් සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල නම් ඇතුළත් ගැසට් නිවේදනය මුද්‍රණය.

2025.03.03 – 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.03 දිනැති අංක 2426/11 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 27අ වගන්තිය අනුව පළාත් අනුව මැතිවරණ කාර්යයන් සඳහා පිළිගත් දේශපාලන පක්ෂවල සලකුණු ඇතුළත් ගැසට් නිවේදනය මුද්‍රණය.

2025.03.17 – 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.17 දිනැති අංක 2428/02 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 වන අධිකාරය) 76අ වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා තරඟ කරනු ලබන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්/බලයලත් නියෝජිතයින් සහ ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත නිකුත් කරනු ලබන මැතිවරණ ප්‍රචාරණ කටයුතු වලදී අනුගමනය කළ යුතු ප්‍රචාරක සීමා ඇතුළත් ගැසට් නිවේදනය මුද්‍රණය

2025.03.23 - 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.23 දිනැති අංක 2428/72 දරන 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වගන්තිය ප්‍රකාරව එකී ඡන්ද විමසීමේ දී තරග කරනු ලබන එක් එක් පළාත් පාලන ආයතනයේ එක් එක් ඡන්ද කොට්ඨාසයේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කළ හැකි වියදම් සීමා ඇතුළත් ගැසට් නිවේදනය මුද්‍රණය

2025.03.28 - 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.28 දිනැති අංක 2429/47 දරන 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වගන්තිය ප්‍රකාරව පූනකරි ප්‍රාදේශිය සභාව, මන්නාරම ප්‍රාදේශිය සභාව සහ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශිය සභාව සඳහා තරග කරනු ලබන අපේක්ෂකයන් එක් එක් පළාත් පාලන ආයතනයේ එක් එක් ඡන්ද කොට්ඨාසයේ මැතිවරණ ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් වැය කළ හැකි වියදම් සීමා ඇතුළත් ගැසට් නිවේදනය මුද්‍රණය

2025.04.07 - 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.03.28 දිනැති අංක 2428/72 දරන ගැසට් නිවේදනයේ සඳහන් ගම්පහ පරිපාලන දිස්ත්‍රික්කයේ මීගමුව මහ නගර සභා බලප්‍රදේශ අංක 13 දරන වැල්ලවීදිය - උතුර කොට්ඨාසයේ නම වැල්ලවීදිය - නැගෙනහිර ලෙස සංශෝධනය වීමට අදාළ ගැසට් නිවේදනය මුද්‍රණය

2025.04.09 - 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව 2025.04.09 දිනැති අංක 2431/02 දරන2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ 03 වගන්තිය යටතේ වූ නියමය

**2.6.7.5. ඡන්ද විමසීමේ කාලසීමාව තුළ අපේක්ෂකයන් ප්‍රවර්ධනය කිරීමේ හෝ අගතියට පත්වන ආකාරයේ කටයුතුවලින් වැලකිය යුතු බව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වැනි ව්‍යවස්ථා සංශෝධනයේ 104(ආ)4(අ) ව්‍යවස්ථාව අනුව මැතිවරණයක් පවත්වනු ලබන කාලසීමාව, එනම් නාමයෝජනා කැඳවීමේ දැන්වීම ප්‍රසිද්ධ කර ඡන්ද විමසීම පවත්වා ප්‍රතිඵල ප්‍රකාශයට පත් කර අවසන් වන තෙක් වූ කාල සීමාව තුළ රජයට අයත් යම් නිශ්චල හෝ චංචල දේපලක්, කිසියම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් තෝරාපත් කර ගැනීම, ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා කිසියම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් භාවිතා නොකරන බව සහතික කිරීම සඳහා අංක 2426/06 හා 2025.03.03 දිනැති ගැසට් පත්‍රය හා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 06 මගින් රාජ්‍ය දේපල භාරව සිටින අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින් ඇතුළු සියලු රාජ්‍ය නිලධාරින්ගේ ප්‍රමුඛ අවධානය යොමු කරවන ලදි.

**2.6.7.6. ඡන්ද විමසීම තරග කරන සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම, ස්වාධීන කණ්ඩායමකටම හා අපේක්ෂකයකුටම ඡන්ද විමසීම වෙනුවෙන් වැය කළ හැකි උපරිම වියදම් සීමාව හෙවත් අවසරලත් මුදල**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම තරග කරන සියලු අපේක්ෂකයින් සඳහා සම තරග බිමක් ස්ථාපනය කිරීම සහ විනිවිදභාවයකින් යුතු වියදම් රටාවක් නිරීක්ෂණය කරනු පිණිස 2023 අංක 3 දරන මැතිවරණ වියදම් පනතෙහි දක්වා ඇති ප්‍රතිපාදන 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා බලාත්මක කරන ලදි.

මෙම ඡන්ද විමසීම තරග කරනු ලබන සියලුම පිළිගත් දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් විමසීමෙන් අනතුරුව සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම, ස්වාධීන කණ්ඩායමකටම හා අපේක්ෂකයකුටම ඉහත වියදම් නියාමනය කිරීමේ පනතේ 3 වැනි වගන්තිය පරිදි මැතිවරණ කොමිෂන් සභාව විසින් විද්‍යාත්මක ක්‍රමවේද අනුව ගණනය කරන ලද උපරිම වියදම් සීමාවන් අංක 2428/72 හා 2025.03.28 දිනැතිව ගැසට් පත්‍රයේ පළ කරන ලදි. ඒ අනුව ඡන්ද විමසීමේ කාර්යය සඳහා එක් ඡන්ද හිමියකු සඳහා වෙන් කරන ලද මුදල රු. 74 සිට රු. 160 දක්වා පරාසයක විය. අපේක්ෂකයන්ට අදාළව ස්වකීය ප්‍රචාරණ කටයුතු පිලිබඳ ආදායම් හා වියදම් වාර්තා භාරදීම පහසු කරවනු පිණිස දේශපාලන පක්ෂ ලේකම්වරුන් හා ස්වාධීන කණ්ඩායම් නායකයන් වෙනුවෙන් වෙබ් සබැඳියක් ද මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙහි දී හඳුන්වා දෙන ලදි.

**2.6.8. නිල ඡන්ද දැන්වීම්පත්**

ඡන්ද විමසීම් පැවැත්වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන 339 ක් වෙනුවෙන් සියලුම ඡන්ද හිමියන් වෙත බෙදා හැරීම සඳහා නිල ඡන්ද දැන්වීම්පත් 2025.04.16 දින තැපැලට භාර දෙන ලදි. අදාළ දැන්වීම්පත් බෙදීමේ විශේෂ දින ලෙස 2025.04.20 හා 2025.04.27 දින නම් කරන ලද අතර 2025.04.29 දින අවසන් බෙදීම සිදු කරන ලදි. ඒ අනුව සියලුම නිල ඡන්ද දැන්වීම්පත් 2025.04.29 දින වන විට සැලසුම් කළ පරිදි අදාළ ගෘහයන් වෙත ලැබීමට සලස්වන ලදි.

කිසියම් ඡන්දදායකයකු වෙත එදිනට ද නිල ඡන්ද දැන්වීම්පත් නොලැබුනේ නම් මැතිවරණ ඉ - සේවාව වෙත පිවිස ගෘහයට අදාළ නිල ඡන්ද දැන්වීම්පත් බාගත කර ගත හැකි පහසුකම් මැතිවරණ කොමිෂන් සභාව විසින් ඡන්දදායකයන් වෙත ලබා දෙන ලදි.

කෙසේ වුව ද ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිලඡන්ද දැන්වීම්පත අනිවාර්ය අවශ්‍යතාවක් නොවන අතර නියමිත ඡන්දහිමි නාමලේඛනයේ ස්වකීය නම සඳහන් හා වලංගු අනන්‍යතා පත්‍රයක් සහිත ඕනෑම ඡන්දදායකයකුට අදාළ ඡන්පොළට ගොස් අනන්‍යතාව සනාථ කර ඡන්දය පාවිච්චි කිරීම සඳහා බාධාවක් නොමැති බව ද කොමිෂන් සභාව විසින් තවදුරටත් අවධාරණය කරන ලදි.

**2.6.9. මැතිවරණ නිරීක්ෂණ කටයුතු**

**2.6.9.1. දේශීය නිරීක්ෂණ සංවිධාන**

2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව දේශීය නිරීක්ෂණ සංවිධාන 07 ක් නිරීක්ෂණ කටයුතුවල නිරත වන ලදී.

- නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය (PAFFREL)
- මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV)
- නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා වූ ජනතා ව්‍යාපාරය (CaFFE)
- මැතිවරණ විමසුම සඳහා වූ ස්වේච්ඡා මුලපිරුම (VIEW)

- ලක්බිමේ මව්වරු සහ දියණියෝ (MDL)
- ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානය (NPOC)
- ප්‍රජාතන්ත්‍රීය ප්‍රතිසංස්කරණ හා මැතිවරණ අධ්‍යයන ආයතනය (IRES)

**2.6.10. අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමට අදාළ ආකෘති පත්‍ර සකස් කිරීම**

2025.05.06 දින පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ඡන්ද ගණන් කිරීමෙන් පසු ප්‍රතිඵල සටහන් කළ යුතු ආකෘතිය; එනම් ඡන්ද මධ්‍යස්ථාන මට්ටමින් ප්‍රතිඵලය, තැපැල් ඡන්ද ප්‍රතිඵලය, කොට්ඨාස මට්ටමේ ප්‍රතිඵලය හා ප්‍රතිඵල මධ්‍යස්ථානයේ භාවිතා වන සාරාංශ පත්‍ර හා පළාත් පාලන ආයතනයේ සමස්ත ප්‍රතිඵලය දැක්වෙන ආකෘති පත්‍ර සකස් කර මුද්‍රණය කර අදාළ තේරීම්භාර නිලධාරීන් වෙත බෙදා හැරීමට කටයුතු කරන ලදී.

**2.6.11. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් ඇති වගකීම.**

**2.6.11.1. ආබාධ සහිත තැනැත්තන්ගේ ඡන්ද අයිතිය සුරැකීම වෙනුවෙන් ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්**

මැතිවරණ කොමිෂන් සභාවේ සහභාගීත්ව උපායමාර්ගික සැලසුම 2022- 2025ට අනුව දැනුම්වත් කිරීම් හා සජීවිකරණය යටතේ පුරවැසියන් සහ ඡන්ද හිමියන් යන දෙපාර්ශය ඡන්දයේ බලය හා ප්‍රජාතන්ත්‍රීය අයිතිය පිළිබඳ ව ප්‍රමාණවත් ලෙස දැනුම්වත් ව සිටිති යන්න පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා, පහත වැඩසටහන් පැවැත්වීමට කටයුතු කරන ලදී.

**(I) ආබාධිත හා ආන්තික ජන කණ්ඩායම් සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වා, ඔවුන් ක්‍රියාකාරී ලෙස මැතිවරණ ක්‍රියාවලියට සම්බන්ධ කර ගැනීම.**

පුහුණු වැඩසටහන් හා මාර්ගගත ක්‍රම ඔස්සේ දැනුවත් කිරීම් සිදු කිරීම.

පළාත් පාලන මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම් සිදු කිරීම.

ඡන්ද පත්‍රිකාව මඟපෙන්වන ස්පර්ශක රාමුව භාවිතය පිළිබඳ දැනුවත් කිරීම/ පුහුණු කිරීම සිදු කිරීම.

**(II) වර්ෂ 2025 දී ආබාධ සහිත හා ආන්තික ජන කොටස් මැතිවරණ ක්‍රියාවලියට ක්‍රියාකාරීව සහභාගීවීම වළකාලන සියලු ප්‍රධාන බාධක විසඳාලීම**

පළාත් පාලන මැතිවරණයේ දී ඡන්ද මධ්‍යස්ථාන 441ක ප්‍රවේශ පහසුකම් සැපයීම.

පළාත් පාලන මැතිවරණය අවස්ථාවේ දී, දෘශ්‍යාබාධිත ඡන්ද දායකයන් වෙනුවෙන් ඡන්ද පත්‍රිකාව මඟපෙන්වන ස්පර්ශක රාමුව හා ශ්‍රවණාබාධිත ඡන්ද දායකයන් වෙනුවෙන් සංඥා භාෂාවෙන් ඡන්ද පොළ දැන්වීම් ප්‍රදර්ශනය

ඡන්ද මධ්‍යස්ථාන තුළ පෞද්ගලික ප්‍රවාහන පහසුකම් සැලසීම හා පිවිසුමේ සිට ඡන්ද මධ්‍යස්ථානය වෙත 100m වඩා වැඩි ඡන්ද පොළවල ත්‍රී රෝද රථ මගින් ප්‍රවාහන පහසුකම් සැපයීම.

**2.6.11.2. කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් විසින් විශේෂ ප්‍රවාහන පහසුකම් සඳහා ඉල්ලුම් කිරීම සහ අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට ඡන්ද පත්‍රිකාව සලකුණු කිරීම සඳහා සහායකයකු කැටුව යාමට අවසරය**

2002 අංක 01 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 82 උ (4)(ඇ) වැනි වගන්තිය අනුව ආබාධ සහිත ඡන්ද හිමියන් ඡන්ද විමසීම් ක්‍රියාවලියට අන්තර්කරණය කිරීම සහතික කිරීම සඳහා කායික දුබලතාවයෙන් යුතු තැනැත්තන් විසින් විශේෂ ප්‍රවාහන පහසුකම් සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව සලසා දෙන ලදි. ඒ අනුව වෛද්‍ය සහතිකයක් මගින් අයදුම්පත සනාථ කිරීමෙන් හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් ආබාධ සහිත තැනැත්තන් සඳහා නිකුත් කර ඇති හැඳුනුම්පත මගින් විශේෂ ප්‍රවාහන පහසුකම් ඉල්ලුම් කළ හැකි විය.

තව ද 2011 අංක 28 දරන මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 54(2) වගන්තිය අනුව කිසියම් ශරීර අශක්නුතාවට පත් ඡන්ද හිමියකුට ඡන්ද පොළෙහි දී ස්වකීය ඡන්ද පත්‍රිකාව සලකුණු කර ගැනීම සඳහා සහයකයකු කැටුව යාමට ඇති නීතිමය ප්‍රතිපාදන මෙම ඡන්ද විමසීම සම්බන්ධයෙන් ද බලාත්මක කරන ලදි.

**2.6.12. ඡන්දය ප්‍රකාශ කරන ආකාරය පිළිබඳ සියලුම ඡන්ද හිමියන් දැනුවත් කිරීම**

මෙම ඡන්ද විමසීමේ දී ඡන්දය ප්‍රකාශ කරන ආකාරය පිළිබඳව ආදර්ශ ඡන්ද පත්‍රිකාවක් මගින් ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් ඇති සියලුම ඡන්දදායකයන් හා තැපැල් ඡන්දදායකයන් වෙත ප්‍රමාණවත් දැනුවත් කිරීම් භාෂාත්‍රයෙන්ම සිදු කරන ලදි.

**2.6.13. සේවා නියුක්තිකයන්ට ස්වකීය ඡන්දය දීමට හැකි වනු පිණිස නිවාඩු දීම**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 84අ(1) වැනි වගන්තියේ දක්වා ඇති විධිවිධාන පරිදි කිසියම් ඡන්දදායකයකු විසින් ඉල්ලීම් කළහොත් ඒ ඡන්දදායකයාට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා සේවායෝජකයකු විසින් පැය දෙකකට නොඅඩු අඛණ්ඩ කාලසීමාවක් සඳහා නිවාඩු ලබා දිය යුතු බව ද, මෙම කාර්යය සඳහා ලබා දිය යුතු නිවාඩු කාල සීමාව කාර්යස්ථානය හා ඡන්දපොළ අතර ඇති දුර අනුව සේවායෝජකයා විසින් යථායෝග්‍ය ලෙස නිගමනය කළ යුතු බවට ද මැතිවරණ කොමිෂන් සභාව මගින් සේවායෝජකයන් දැනුවත් කරන ලදි.

**2.6.14. ඡන්දය පාවිච්චි කිරීමට පැමිණීමේ දී ඡන්දදායකයන් විසින් ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව**

මෙම ඡන්ද විමසීම සඳහා ඡන්දය පාවිච්චි කිරීම පිණිස ඡන්දදායකයා විසින් පහත දක්වා ඇති අනන්‍යතා ලේඛන 10 න් එකක් ඡන්ද පොළ නිලධාරීන් වෙත අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු බවට සියලු ඡන්දදායකයන් දැනුවත් කරන ලදි.

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති පැරණි හෝ නව හැඳුනුම්පත
- වලංගු විදේශ ගමන් බලපත්‍රය
- වලංගු රියදුරු බලපත්‍රය
- විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය සේවා විශ්‍රාමික හැඳුනුම්පත (පැරණි හෝ නව ඉ - හැඳුනුම්පත)
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිකුත් කරන ලද වැඩිහිටි හැඳුනුම්පත
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති පැරණි හෝ නව පූජ්‍ය/ පූජක හැඳුනුම්පත

- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ජාතික හැඳුනුම්පත් තොරතුරු තහවුරු කිරීමේ ලිපිය
- මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන තාවකාලික හැඳුනුම්පත
- මැතිවරණ කොමිෂන් සභාව විසින් පූර්ණ ආබාධ සහිත තැනැත්තන් සඳහා නිකුත් කර ඇති තාවකාලික හැඳුනුම්පත
- මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන ඡායාරූප සහිත තාවකාලික රියදුරු බලපත්‍රය

**2.6.15. ඡන්ද විමසීම් සම්බන්ධයෙන් ප්‍රචාරක කටයුතු තහනම් කරන ලද නිහඬ කාලසීමාව**

2025.05.03 දින මධ්‍යම රාත්‍රියෙන් පසු පළාත් පාලන ආයතන ඡන්ද විමසීම තරග කරනු ලබන සියලු පක්ෂ, කණ්ඩායම් හා අපේක්ෂකයන් විසින් ඡන්ද විමසීමට අදාළ සියලු ප්‍රචාරක කටයුතු අවසන් කළ යුතු බව මැතිවරණ කොමිෂන් සභාව විසින් නිවේදනය කරන ලදි.

එසේම 2025.05.05 හා 06 දිනවල පුවත්පත් සිරස්තල ඉදිරිපත් කිරීමේ දී හෝ වෙනත් ආකාරයකින් හෝ කිසියම් දේශපාලන පක්ෂයක්, කණ්ඩායමක් හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනයට හෝ අගතියට හෝ ලක් කෙරෙන ආකාරයේ ප්‍රවෘත්ති, අදහස් හෝ යෝජනා ඉදිරිපත් කිරීමෙන් සපුරා වැළකිය යුතු බව සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය නාලිකා ප්‍රධානින් හා සියලුම සමාජ මාධ්‍ය පරිපාලකයින් වෙත මැතිවරණ කොමිෂන් සභාව විසින් වැඩිදුරටත් නිවේදනය කරන ලදි.

**2.6.16. ඡන්දය ගණන් කිරීම, ප්‍රතිඵල ප්‍රකාශයට පත් කිරීම හා ධූර සඳහා පත් කිරීම්**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 59 අ වගන්තිය අනුව මැතිවරණ කොමිෂන් සභාවේ විධිවිධානවලට යටත්ව දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් විසින් ඡන්ද ගණන් කිරීම සඳහා ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන්, ගණන් කිරීමේ නිලධාරීන් හා ගණන් කිරීමේ කාර්ය මණ්ඩල පත් කරන ලදි.

මෙම ඡන්ද විමසීමේ දී ඒ ඒ දිස්ත්‍රික්කයට අදාළව ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරුන් වෙතින් ඡන්ද පෙට්ටි, ඡන්ද පත්‍රිකා ඇතුළු බඩුබාහිරාදිය නිකුත් කිරීම හා ආපසු බාර ගැනීම සඳහා දිවයින පුරා නිකුත් කිරීමේ හා භාර ගැනීමේ මධ්‍යස්ථාන 32 ක් වූ අතර පිහිටුවන ලද ගණන් කිරීමේ මධ්‍යස්ථාන ගණන 5,783 ක් විය.

ඡන්ද විමසීමෙන් අනතුරුව එක් එක් කොට්ඨාසයකට අදාළ ඡන්ද මධ්‍යස්ථානවල ප්‍රතිඵල ඒ ඒ ඡන්ද මධ්‍යස්ථානයේ දී හෝ හඳුනාගත් වෙනත් ගණන් කිරීමේ මධ්‍යස්ථානයක දී ගණන් කරනු ලැබූ අතර එහි දී කොට්ඨාස ප්‍රතිඵලය නිකුත් කරන ලදි. එක් එක් පළාත් පාලන ආයතනයට අදාළව වෙන් වෙන්ව පිහිටවනු ලැබූ ප්‍රතිඵල සකස් කරන ස්ථානවල දී අදාළ පළාත් පාලන ආයතනය සඳහා වූ ප්‍රතිඵලය සකස් කරනු ලැබීය. ඒ අනුව (262 අධිකාරිය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 65 වගන්තිය අනුව කොට්ඨාසයේ වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබාගත් දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ අපේක්ෂකයා, අදාළ විට බහු ආසන ද ඇතුළත්ව, එකී පනතේ 65(1) වගන්තිය අනුව ප්‍රධාන ගණන් කිරීමේ නිලධාරීන් විසින් ප්‍රකාශයට පත් කරනු ලැබීය.

කිසියම් පළාත් පාලන ආයතනයක 25% කාන්තා නියෝජනය සාක්ෂාත් කිරීම සඳහා එම පළාත් පාලන ආයතනය වෙනුවෙන් එක් එක් පක්ෂය හෝ කණ්ඩායම විසින් ලබා දිය යුතු කාන්තා සභික සංඛ්‍යාව ගණනය කිරීමෙන් අනතුරුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66(2) වගන්තිය අනුව එකී පළාත් පාලන ආයතනයේ එක් එක් කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගත් සභිකයින් සහ අදාළ පළාත් පාලන ආයතනය සඳහා තෝරා එවා ඇති සභිකයින් මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරන ලදි.

එහි දී කිසියම් පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් විසින් අදාළ පළාත් පාලන ආයතනයේ මුළු සභික සංඛ්‍යාවෙන් අඩකට වඩා ලබාගෙන ඇති විට එම සභාවේ නගරාධිපති/ සභාපති, නියෝජ්‍ය නගරාධිපති/ උප සභාපති එකී පනතේ 66ආ(1) වගන්තිය අනුව ගැසට් පත්‍රයේ පළ කරන ලදි. එලෙස මුළු සභික සංඛ්‍යාවෙන් අඩකට වඩා ලබා නොගත් අවස්ථා සම්බන්ධයෙන් එකී පනතේ 66(ඇ)1 හා 66(ඇ)2 වගන්ති ප්‍රකාරව අදාළ පළාත් පාලන අයත් පළාතේ, පළාත් පාලන කොමසාරිස් විසින් නගරාධිපති/ සභාපති, නියෝජ්‍ය නගරාධිපති/ උප සභාපති ධූර ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු කරවන ලදි.

### 2.6.17. පළාත් පාලන ආයතනවල සභිකධූර පුරප්පාඩු පිරවීම

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරය) අනුව මියයාම, ඉල්ලා අස්වීම, නියමිත කාලසීමාවට අදාළව හෝ නියමිත සංඛ්‍යාවට අදාළව අවසරය ලබා නොගෙන සභා රැස්වීම්වලට සහභාගී නොවීම, අදාළ විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 හා 7 උපලේඛනවලට අනුව සභික ධූරයේ දිවුරුම් නොදීම, පළාත් සභාවට තේරී පත්වීම, පාර්ලිමේන්තුවට තේරී පත්වීම, පක්ෂ සාමාජිකත්වය අහෝසි වීම, ධූරයෙන් ඉවත් කිරීම, අදාළ සභාවේම වෙනත් ධූරයකට පත්වීම යන කරුණු මත කිසියම් පළාත් පාලන ආයතනයක ධූර පුරප්පාඩු සිදු වීමට අවකාශ ඇත. එම ධූර පුරප්පාඩු පිරවීම සඳහා අනුගමනය කළ යුතු නීතිමය ක්‍රියාවලිය මැතිවරණ කොමිෂන් සභාවේ පළාත් පාලන ඡන්ද විමසීම් අංශය විසින් දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරගනිමින් බලාත්මක කරනු ලැබේ.

මෙම කරුණට අදාළව පළාත් පාලන ඡන්ද විමසීම් අංශය විසින් විස්තරාත්මක උපදෙස් හා මගපෙන්වීම් සහිත චක්‍රලේඛ ලිපි 4 ක් නිකුත් කර ඇත.

ඒ අනුව තත්කාලයේ බලපවත්වන පළාත් පාලන ආයතන සම්බන්ධයෙන් 2025 වර්ෂයේ අවසන් වන විට ධූර පුරප්පාඩු 58ක් පුරවා අවසන් කර ඇති අතර ඒ ඒ පළාත් පාලන ආයතනයේ තේරීම්භාර නිලධාරීන් විසින් නිකුත් කරන ලද අදාළ නිවේදන ගැසට් පත්‍රයේ පළ කර තිබේ. තවත් සභික ධූර පුරප්පාඩු 22ක් පිරවීමට නියමිතව ඇත.

2025 වර්ෂයේ අවසන් වන විට සම්පූර්ණ කර ඇති සභික ධූර පුරප්පාඩු සාරාංශය සටහන 24 ලෙස දක්වා ඇත.

## 2.7. පළාත් සභා ඡන්ද විමසීම.

මේ වන විට සියලුම පළාත් සභාවල නිල කාලය අවසන් ව ඇති අතර, අවසන් වරට පවත්වන ලද ඌව පළාතේ පළාත් සභාවේ නිල කාලය 2019 වර්ෂයේ සැප්තැම්බර් මස අවසන් විය. 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත සංශෝධනය කිරීමට අදාළ 2017 අංක 17 දරන සංශෝධන පනත සම්මත වුවද, පළාත් සභා කොට්ඨාස ක්‍රමය යටතේ පැවැත්වීම සඳහා පළාත් සභා සීමා නීර්ණය කරමින් සකස් කර ඇති සීමා නීර්ණ වාර්තාව පාර්ලිමේන්තුවේ සම්මත නොවීම හේතුවෙන් පළාත් සභා මැතිවරණ පැවැත්වීම සඳහා අවශ්‍ය පැහැදිලි හා ක්‍රියාත්මක කළ හැකි නීතිමය රාමුවක් ස්ථාපිත නොවීය. මේ සම්බන්ධයෙන් පසුගිය ආණ්ඩු සහ පාර්ලිමේන්තුව විසින් විවිධ උත්සාහයන් ගෙන තිබුණද, අනුගමනය කළ යුතු මැතිවරණ ක්‍රමය පිළිබඳ එකඟතාවකට පැමිණීමට නොහැකි වී ඇත. එබැවින්, අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන පාර්ලිමේන්තුව විසින් සම්මත කරන තුරු පළාත් සභා මැතිවරණ පැවැත්වීමට තමන්ට හැකියාවක් නොමැති බව මැතිවරණ කොමිෂන් සභාව නිරන්තරයෙන් පක්ෂ ලේකම් රැස්වීම්වලදී මෙන්ම මාධ්‍යය මඟින් ද ප්‍රකාශ කර ඇත.

නිල කාලය අවසන් ව ඇති සියලුම පළාත් සභා ඒ ඒ ආණ්ඩුකාරවරුන්ගේ පාලනය යටතේ පවතී.

### 2.8. විශේෂ ව්‍යාපෘති

#### 2.8.1. වාර්ෂික පර්යේෂණ සැසිය - 2025

මැතිවරණ කොමිෂන් සභාව රට තුළ මැතිවරණ ක්‍රියාවලියේ අඛණ්ඩභාව, නිදහස් සහ සාධාරණභාවය සහතික කරන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වේ. විනිවිදභාවය, අපක්ෂපාතීභාවය සහ වගකීම පිළිබඳ අසමසම කැපවීම සමග මෙම කොමිෂන් සභාව ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියට නිදහස් සහ සාධාරණ ලෙස සහභාගී විය හැකි වනු පිණිස පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සුදුසු භූමිය සකසා ඇත.

ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සහභාගිත්ව උපාය මාර්ගික ඉලක්ක අංක 1.4.4.3 ප්‍රකාරව මහජනතාව අතර මැතිවරණ කාර්යයන් පිළිබඳ උනන්දුව ඇති කිරීමේ අරමුණ ඇතිව මැතිවරණ හා ඡන්ද විමසීම් පරිචයන් පිළිබඳ විද්වතුන් පෙළඹවීම සඳහා වූ මුලපිරීමක් ලෙස පළාත් පාලන ඡන්ද විමසීම් අංශය විසින් වාර්ෂික පර්යේෂණ සැසි සංවිධානය කරනු ලැබේ.

මෙම පර්යේෂණ සැසිය මැතිවරණ කළමනාකරණ ක්ෂේත්‍රයේ නීතිමය අධ්‍යයනය ඉදිරියට ගෙන යාමට හේතුවන අතර ගවේෂකයන්, ශාස්ත්‍රවේදීන් සහ සමාජ ක්‍රියාකාරීන් එක් රැස් වී අවබෝධය බෙදාගැනීමට, බුද්ධි කලම්භනයට සහ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ නවෝත්පාදන මාර්ග ගවේෂණය සඳහා වූ වේදිකාවක් නිර්මාණය කර ඇත.

ඒ අනුව දෙවන වරට 2024 වර්ෂය සඳහා පර්යෙෂණ සැසිය සංවිධානය කල නමුත් එම වර්ෂයේ ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම හේතුවෙන් එහි කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදී.

ඒ අනුව එම අවස්ථාවේ ලද පර්යේෂණ පත්‍රිකා 34 ද ඇතුළත්ව තෙවන වරට 2025 වර්ෂය සඳහා පර්යේෂණ සැසිය පැවැත්වීමට කටයුතු සැලසුම් කරන ලදී. අදාළ පර්යේෂණ වාර්තා ලබා ගැනීම සඳහා ත්‍රෛභාෂාවෙන් පුවත්පත් දැන්වීම් පළ කරන ලද අතර මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙහි හා නිල ෆේස්බුක් ගිණුමෙහි ප්‍රසිද්ධ කිරීම තුළින් ජාතික හා අන්තර්ජාතික වශයෙන් ද පුළුල් ප්‍රසිද්ධියක් ලබා දීමට තවදුරටත් ක්‍රියා කර තිබේ.

මෙම වර්ෂයේ දී පර්යේෂණ වාර්තා සම්බන්ධයෙන් මහජනතාව සහ විශ්වවිද්‍යාල ප්‍රජාව තුළින් ඉහළ ප්‍රතිචාරයක් ලැබී ඇත. **"ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලීන් බලගැන්වීම: ඡන්දදායක සහභාගීත්වය සහ ශ්‍රී ලංකාවේ මැතිවරණ අඛණ්ඩතාව වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ග"** යන ප්‍රධාන තේමාව පදනම් කර ගනිමින් පහත දැක්වෙන අනු තේමාවන් 10 යටතේ, විවිධ රටවල මැතිවරණ කොමිෂන් සභාවන්හි සාමාජිකයන්, රාජ්‍ය ආයතනයන්හි ප්‍රධානීන්, විශ්ව විද්‍යාල අචාරවරුන්, විද්‍යාර්ථයන්, උපාධි අපේක්ෂකයන් මෙන්ම විවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීනයන් විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන ත්‍රෛභාෂා නියෝජනය කරමින් පර්යේෂණ පිළිබඳ සාරාංශ වාර්තා 256 ක් ලබා දෙන ලදී.

1. ඡන්දදායක අධ්‍යාපනය, දැනුවත්භාවය සහ සහභාගීත්වය
2. මැතිවරණ තාක්ෂණය සහ නවෝත්පාදනය
3. මැතිවරණ වංචා වැළැක්වීම සහ විනිවිදභාවය සහතික කිරීම
4. අන්තර්කරණය සහ ප්‍රවේශ්‍යතාව
5. මැතිවරණ කෙරෙහි විශ්වාසය සහ විශ්වාසය වර්ධනය කිරීම
6. සිවිල් සමාජයේ සහ මාධ්‍යයේ කාර්යභාරය
7. නීතිමය සහ නියාමන රාමු

8. මැතිවරණවලදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීම

9. ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලිය සඳහා තරුණයින් සම්බන්ධ කර ගැනීම

10. මැතිවරණ සැකසුම් තුළ ආබාධිත අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීම

පර්යේෂණ ලිපි ඇගයීම් කටයුතු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය සහිතව විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගෙන් සමන්තවිත විද්වත් කමිටුවක් විසින් සිදු කරන ලද අතර, සියලු පර්යේෂණ පත්‍රිකා අතුරින් ප්‍රශස්ථ පර්යේෂණ වාර්තා 157ක් තේරීපත් විය.

**පර්යේෂණ ලිපි ඇගයීම් කටයුතු සිදු කරන ලද විද්වත් කමිටුව**

1. ආචාර්ය අජන්ත අතුකෝරාල මහතා, අධ්‍යක්ෂ, පරිගණක අධ්‍යයනායතය, කොළඹ විශ්ව විද්‍යාලය
2. ආචාර්ය රමේෂ් රාමසාමි මහතා, ජොෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
3. ආචාර්ය අතුල විතානවසම්,දේශපාලන විද්‍යාව පිළිබඳ මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය

මැතිවරණ හා ඡන්ද විමසීම් පරිචයන් පිළිබඳ විද්වතුන් පෙළඹවීම වස් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්, විශ්ව විද්‍යාල අංශාධිපතිවරුන්, මහාචාර්යවරුන් සහ අචාරවරුන්, දේශීය හා විදේශීය මැතිරණ නිරීක්ෂණ සංවිධාන සාමාජිකයන්, විද්‍යාර්ථයන් සහ මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයෙහි සහ දිස්ත්‍රික් කාර්යාලයන්හි ප්‍රධානීන්, තේරීපත් වූ පර්යේෂණ වාර්තාවන් ඉදිරිපත් කරන ලද පර්යේෂකයන් ඇතුළුව 300කට ආසන්න පිරිසකගේ සහභාගීත්වයකින් 2025 නොවැම්බර් මස 05 වන දින කොළඹ මොනාජ් ඉම්පීරියල් හෝටල් පරිශ්‍රයෙහි පර්යේෂණ සැසිය පවත්වන ලදී.

ඒ අනුව එදින, ප්‍රශස්ථ පර්යේෂණ වාර්තා ඇතුලත් ග්‍රන්තයක් ප්‍රකාශයට පත් කරන ලද අතර එය පරිශීලකයන්ගේ පහසුව පිණිස මැතිවරණ කොමිෂන් සභා නිල වෙබ් අඩවිය හරහා පරිශීලනය කල හැකි පරිදි විද්‍යුත් පිටපතක් **(e – Version)** ලෙසද ප්‍රකාශයට පත් කරන ලදී. එමෙන්ම පර්යේෂණ සංක්ෂිප්ත අතරින් තෝරාගත් පර්යේෂණ 7ක් පර්යේෂකයන් විසින් ඉදිරිපත් කරන ලදී. එසේම එහි දී තේරීපත් වූ පර්යේෂණ වාර්තා අතුරින් රුසියාවෙහි සහ මාලදිවයිනෙහි මැතිවරණ කොමිෂන් සභාවන්හි සමාජිකයන්ගේ පර්යේෂණ වාර්තා, ඔවුන් විසින් මාර්ගගතව ඉදිරිපත් කරන ලද අතර එය 2025 පර්යේෂණ සැසියට ජාත්‍යන්තර සහභාගීත්වය පිළිබිඹු කරන සුවිශේෂී අවස්ථාවක් විය.

2025 පර්යේෂණ සැසියේ ඉදිරිපත් කිරීම් පිළිබඳ තොරතුරු සටහන් 25 ලෙස ඇතුළත් කර ඇත**.**

තවද එදින ආරාධිත දේශනය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙහි සහ කොළඹ විශ්වවිද්‍යාලයෙහි නීති පීඨයෙහි පීඨාධිපති ලෙස සේවය කරන ලද ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය විසින් සිදු කරන ලදී.

බුද්ධි කලම්භනයට සහ මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ නවෝත්පාදන මාර්ග ගවේෂණය සඳහා වූ වේදිකාවක් ලෙස නිර්මාණය වූ මෙම වැඩ සටහනෙහි තවත් එක් පියවරක් ලෙස විද්වත් කමිටු දෙකක් විසින් මැතිවරණ ක්‍රියාවලියෙහි නව මානයන් සම්බන්ධව පුළුල් සාකච්ඡාවන් පැවැත් වූ අතර ඔවුන් හා

සාකච්ඡා කිරීමට, නව අදහස් ලබා දීමට ප්‍රේක්ෂකයන්ට ද අවස්ථාව ලබා දෙන ලදී. එමගින් මැතිවරණ ක්‍රියාවලිය සඳහා නව අදහස් නව මානයන් රැසකින් නිර්මාණය විය.

**සංවාද කණ්ඩායමේ සාමාජිකයන්ගේ විස්තර (Fireside Chat Panelists details)**

සංවාද කණ්ඩාය මෙහෙය වීම මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක විසින් මෙහෙය වූ අතර සංවාද කණ්ඩායමේ සාමාජිකයන්ගේ තොරතුරු සටහන 26 ලෙස ඇතුළත් කර ඇත.

"මෙහෙයුම් සැලසුම්කරණය සහ අවදානම් කළමනාකරණය තුළින් මැතිවරණ සූදානම ශක්තිමත් කිරීම" ( Operational Planning and Risk Management in Strengthening Electoral Readiness) යන තේමාව යටතේ මැතිවරණ පද්ධති සඳහා වූ ජාත්‍යන්තර පදනමෙහි (International Foundation for Electoral Systems - IFES) වැඩසටහන් නිලධාරී රමෝනා ස්ටීවන් මහත්මියගේ මෙහෙයවීම මත පහත නම් සඳහන් විද්වතුන්ගේ සහභාගීත්වයේ දෙවන විද්වත් කමිටු සාකච්ඡාව පැවැත්විනි.

1. සීලියා පාසිලින්නා මහත්මිය, ජ්‍යෙෂ්ඨ දේශීය අධ්‍යක්ෂ, මැතිවරණ පද්ධති සඳහා වූ ජාත්‍යන්තර පදනම (International Foundation for Electoral Systems - IFES)
2. ලක්ෂිත ජයනායක මහතා, සහකාර මැතිවරණ කොමසාරිස් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, පුත්තලම
3. පුලස්ති පතිරණ මහතා, සහකාර මැතිවරණ කොමසාරිස් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, මාතර

ඒ අනුව මැතිවරණ ක්‍රියාවලිය සම්බන්ධව සමස්ථ ප්‍රජාවගේ ම අවධානය ලබා ගැනීම සඳහා 2025 පර්යේෂණ සැසිය සඳහා එදින සහභාගී වූ විද්වතුන්ට අමතරව, මේ සම්බන්ධව උනන්දු සියලු පාර්ශකරුවන්ගේ පරිශීලනයේ පහසුව පිණිස සමාජ මාධ්‍ය හරහා ද එදින වැඩසටහන ප්‍රසිද්ධ කිරීම සිදු විය.

මැතිවරණ කාර්යයන් පිළිබඳ උනන්දුව ඇති කිරීම සඳහා මැතිවරණ හා ඡන්ද විමසීම් පරිචයන් පිළිබඳ විද්වතුන් පෙළඹවීමේ අරමුණින්, දත්ත හා තොරතුරු සාක්ෂි පදනම්ව විද්‍යාත්මක ක්‍රමවේද ඔස්සේ සිදු කරන ලද පර්යේෂණ අතුරින් තේරීපත් වූ ප්‍රශස්ථ පර්යේෂණ වාර්තා 157හි හිමිකාරත්වය දරන සියලු පර්යේෂකයන් සඳහා වටිනා සහතික පත්‍රයක් ලබා දීම මගින් ඔවුන් ඇගයීමට ලක් කරන ලදී.

**2.8.2. වතු අංශයේ සහ ආන්තික ජන කොටස් සඳහා විශේෂිත පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

2025 වර්ෂය සඳහා වූ මැතිවරණ කොමිෂන් සභාවේ ක්‍රියාකාරී සැලැස්මේ යෝජිත ක්‍රියාකාරකම් අනුව ආන්තික සහ විශේෂ ජන කොටස් මැතිවරණ හා ඡන්ද විමසීම් ක්‍රියාවලියට සක්‍රිය ලෙස සහභාගී කරවා ගැනීමට හා ඔවුන් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කරවා ගැනීම පිණිස එම කණ්ඩායම් මුහුණ දෙන ගැටළු සහ ඔවුන්ගේ දැනුවත්භාවය පිළිබඳ පෙර හඳුනා ගැනීමේ කාර්යය 2022-2025 උපායමාර්ගික සැලැස්මේ 'දැනුවත් කිරීම හා සජීවීකරණය' යනුවෙන් දක්වා ඇති පළමු අවධාරිත ක්ෂේත්‍රයෙන් ආවරණය කර ඇත.

ඒ අනුව 'පුරවැසියන් සහ ඡන්ද හිමියන් යන දෙපාර්ශ්වයම ඡන්දයේ බලය සහ ප්‍රජාතාන්ත්‍රීය අයිතීන් පිළිබඳව ප්‍රමාණවත් ලෙස දැනුවත්ව සිටීම අවශ්‍ය යැයි යන අරමුණ පෙරදැරිව 2025 වර්ෂයේ මුල් කාර්තු හතර තුළ පවත්වන ලද වැඩසටහන් පිළිබඳ තොරතුරු සටහන 27 හි සඳහන් කර ඇත .

### 2.8.3. ශිෂ්‍ය පාර්ලිමේන්තු සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

මැතිවරණ කොමිෂන් සභාවේ 2022 – 2025 සහභාගිත්ව උපාය මාර්ග සැලැස්මෙහි යෝජිත ක්‍රියාකාරකම් අංක 1.2.1.3 හා 1.2.1.4 අනුව ජනතා පරමාධිපත්‍ය බලය, ප්‍රජාතාන්ත්‍රවාදය, සර්වජන ඡන්ද බලය ආදී සංකල්ප මෙන්ම දේශපාලන සාක්ෂරතාව වැඩිදියුණු කිරීම හා පවත්නා මැතිවරණ හා ඡන්ද විමසීම් ක්‍රම පිළිබඳව ප්‍රමුඛතම ඉලක්කගත කණ්ඩායම වශයෙන් පාසල් ගුරුවරුන් හා ශිෂ්‍ය ප්‍රජාව දැනුවත් කිරීම සම්බන්ධව ක්‍රියාකාරකම් ඇතුළත්ව ඇත.

සර්වජන ඡන්ද බලය සුරකින ප්‍රජාතාන්ත්‍රවාදී දේශයක් ගොඩනැගීමේ පදනම ලෙස ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන් සංවිධානය කිරීම සඳහා සහය වීම, පාසල් තුළ මැතිවරණ සාක්ෂරතා සමාජ පිහිටුවීම හා පාසල් මට්ටමින් කථික, රචනා, චිත්‍ර තරග ආදිය පැවැත්විය යුතු යැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල, කලාප අධ්‍යාපන කාර්යාල හා පාසල් සම්බන්ධීකරණය කිරීම මගින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව 2025 වර්ෂයේ තුළ පහත දක්වා ඇති පරිදි ශිෂ්‍ය පාර්ලිමේන්තු සම්බන්ධයෙන් වැඩසටහන් පවත්වන ලදි.

| 2025 වර්ෂයේ ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන් තොරතුරු (ශිෂ්‍ය ශිෂ්‍යාවන්) | | |
|---|---|---|
| **දිස්ත්‍රික්කය** | **වැඩසටහන් දිනය** | **පවත්වන ලද ස්ථානය** |
| කොළඹ - නාගරික | 2025-02-11 | වේලුවන විද්‍යාලය කොළඹ 09 |
| | 2025-05-28 | ආනන්ද විද්‍යාලය |
| කොළඹ - දිස්ත්‍රික් | 2025-10-22 | ජය ආදර්ශ පිරිමි විද්‍යාල මාලබේ |
| කළුතර | 2025-07-07 | ඥානේස්වර මහා විද්‍යාලය, ධර්ගා නගරය |
| | 2025-07-14 | පරගස්තොට විද්‍යාලෝක මහා විද්‍යාලය |
| නුවරඑළිය | 2025-09-29 | රාවණාගොඩ මහා විද්‍යාලය |
| හම්බන්තොට | 2025-10-17 | මිරිජ්ජවිල මහ විද්‍යාලය - හම්බන්තොට |
| | 2025-10-27 | උඩමලල මහ විද්‍යාලය - හම්බන්තොට |
| මඩකලපුව | 2025-08-20 | තාලංකුඩා කාර්මික විද්‍යාලය |
| අනුරාධපුරය | 2025-08-04 | සහිරා විද්‍යාලය - අනුරාධපුර |
| බදුල්ල | 2025-05-30 | බ/ භාරතී මහ විද්‍යාලය |

| 2025 වර්ෂයේ ශිෂ්‍ය පාර්ලිමේන්තු වැඩසටහන් තොරතුරු (ගුරුවරුන්) | | |
|---|---|---|
| **දිස්ත්‍රික්කය** | **වැඩසටහන් දිනය** | **පවත්වන ලද ස්ථානය** |
| මාතලේ | 2025-12-16 | මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| නුවරඑළිය | 2025-12-22 | හඟුරන්කෙත කලාප අධ්‍යාපන කාර්යාල |
| ගාල්ල | 2025-12-08 | දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය - මාර්ගගතව |
| අම්පාර | 2025-12-17 | දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය |
| පොළොන්නරුව | 2025-12-10 | දිඹුලාගල කලාප අධ්‍යාපන කාර්යාලය |
| බදුල්ල | 2025-12-09 | මහියංගණය ජාතික පාසල * |
| | 2025-12-11 | බණ්ඩාරවෙල ධර්මපාල විද්‍යාලය * |
| * අයහපත් කාලගුණය නිසා ඉදිරියේදී පවත්වනු ලැබේ. වියදම් අනුමත කර ඇත. | | |

### 2.8.4. පුහුණුකරුවන් පුහුණු කිරීමට අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා ප්‍රජා නායකයන් / සිවිල් සංවිධාන හා ග්‍රාමීය ජන සංවිධාන සඳහා "ඡන්ද බලය අන්සතු කළ නොහැකි අයිතියකි" යන තේමාව යටතේ පුහුණුකරුවන් සංචිතයක් ස්ථාපනය කිරීම, පුහුණු කිරීම හා නායකයන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් බොහෝ දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ඉටු කර ඇති අතර දළ සහභාගීත්වය 6480 දෙනෙකි. එම තොරතුරු සටහන 28 හි ඇතුළත් කර ඇත.

### 2.8.5. දේශපාලනික වශයෙන් කාන්තාවන් සවිබල ගැන්වීම.

මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳව කාන්තාවන් බල ගැන්වීම සම්බන්ධයෙන් සියලුම දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි 3936 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පුහුණු වැඩමුළු 51 ක් පැවැත්වීමට ක්‍රියා කර ඇත. එම තොරතුරු සටහන 29 හි ඇතුළත් කර ඇත.

### 2.9. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

මැතිවරණ කොමිෂන් සභාවේ එක් එක් අංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරකම් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම, වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව කාර්තුමය වශයෙන් ප්‍රගතිය සමාලෝචනය කොට ප්‍රගති වාර්තා සකස් කිරීම හා එම වාර්තා මුදල් අමාත්‍යාංශයට යොමු කිරීම කරනු ලබයි. මෙම වර්ෂයේ දී ද ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම්වල ප්‍රගතිය විමර්ශනය කිරීම හා නියමිත ඉලක්ක සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

### 2.10. 2022 - 2025 සහභාගීත්ව උපාය මාර්ග සැලැස්ම

මැතිවරණ කොමිෂන් සභාවේ 2022-2025 කාලය සඳහා සකස් කරන ලද සහභාගීත්ව උපාය මාර්ග සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කොට ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදි.

2025.12.31 දින වන විට 2022-2025 උපාය මාර්ග සැලැස්මේ ක්‍රියාකාරකම් අවසන් වීමට නියමිත බැවින්, 2026 -2029 කාලරාමුව සඳහා නව උපාය මාර්ග සැලැස්මක් සකස් කිරීමේ කටයුතු ආරම්භ කරන ලදි. මෙම උපාය මාර්ග සැලැස්ම සකස් කිරීමේ සැලසුම්කරණ ක්‍රියාවලියේ දී මූලික සැලසුම් සම්පාදක කමිටුවක් ස්ථාපිත කොට කොමිෂන් සභාවේ සැලසුම් අංශයේ සම්බන්ධීකරණය යටතේ කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ සාමාජිකයන් මෙන්ම මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා ද ඇතුළුව කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්ගේ සහභාගීත්වය ඇතිව වැඩමුළු හා සාකච්ඡා පවත්වන ලදී. තවද අබාධිත, තරුණ, කාන්තා, ආන්තික ජන කොටස්, සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් හා නිරීක්ෂණ සංවිධාන සමග මැතිවරණ මහලේකම් කාර්යාලයේදී ද දිස්ත්‍රික්ක 25 ම ආවරණය වන පරිදි පාර්ශ්වකාර කණ්ඩායම් වූ දේශපාලන පක්ෂ, නිරීක්ෂණ සංවිධාන, මැතිවරණ කොමිෂන් සභාවේ විශ්‍රාමික නිලධාරීන් හා හිටපු නිලධාරීන්, රාජ්‍ය නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම්වරුන්, කාන්තා, තරුණ, ආබාධිත කණ්ඩායම්, මාධ්‍ය හා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීන් ඇතුළු සියලුම පාර්ශ්වකාර කණ්ඩායම් සඳහා රැස්වීම්/ සාකච්ඡා දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වා ඔවුන්ගේ අදහස් හා යෝජනා ලබාගැනීම හා දේශපාලන පක්ෂ හා මාධ්‍ය ආයතන වෙතින් ලිඛිතව තොරතුරු ලබාගැනීමට ක්‍රියාකරන ලදී.

ඒ අනුව, එම කණ්ඩායම් වෙතින් මෙම සැලැස්ම සඳහා වූ ක්‍රියාකාරකම් හඳුනාගැනීම සිදු කළ අතර, එම යෝජනා සියල්ල ඒකාබද්ධ කොට ප්‍රමුඛතා අනුව පෙළගස්වා සැලසුම් කමිටුවේ සාමාජිකයන් සහ කොමිෂන් සභාවේ සමාජිකයන් සමග අවස්ථා කිහිපයකදී ඒ පිළිබඳව සාකච්ඡා කොට කොමිෂන් සභාවේ උපදෙස් මත සැලසුමේ ආකෘතිය සහ පූර්ව සැලැස්මේ සඳහන් වන ඉවත් කළ යුතු ක්‍රියාකාරකම්, තවදුරටත් ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් හා නව ක්‍රියාකාරකම් හඳුනා ගන්නා ලදී. මේ වන විට මෙම නව උපාය මාර්ග සැලැස්ම සකස් කිරීමේ කටයුතු අවසන් අදියරේ පවතී.

### 2.11. මාධ්‍ය සම්බන්ධීකරණ කටයුතු.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ ව්‍යවස්ථාපිත හා අත්‍යාවශ්‍යයෙන්ම දැනුම්වත් කළ යුතු කරුණු පිළිබඳව මහජනයා දැනුම්වත් කිරීම පිණිස භාෂාත්‍රයෙන්ම ප්‍රසිද්ධ දැන්වීම් 03 ක් දිනමිණ, තිනකරන් හා ඩේලි නිව්ස් පුවත්පත්වල පළ කරන ලදී.

තවද ඉහතින් දක්වා ඇති පුවත්පත් දැන්වීම්වලට අමතරව පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ තොරතුරු අළලා මාධ්‍ය නිවේදන 103 ක් ද නිකුත් කර ඇත. මෙම මාධ්‍ය නිවේදන ද භාෂාත්‍රයෙන්ම නිකුත් කරනු ලැබූ අතර, සියලුම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය ආයතන වෙත ඒවා යොමු කරන ලදී. එම ආයතන මගින් නිවේදනයේ සඳහන් කරුණු පිළිබඳව මහජනතාව දැනුම්වත් කිරීමට කටයුතු සම්පාදනය කර තිබුණි. එසේම මෙම මාධ්‍ය නිවේදන මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියේ (www.elections.gov.lk) ද පළ කරන ලදී.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම (2025.05.06) අදාළව නිකුත් කරන ලද මාධ්‍ය නිවේදන පිළිබඳ සාරාංශ සටහන 30 හි දක්වා ඇත.

එමෙන්ම ඡන්ද විමසීම් සහ මැතිවරණ කටයුතු පිළිබඳව සියලුම මාධ්‍ය ප්‍රධානීන්, මාධ්‍යවේදීන් සමග සාකච්ඡා කිහිපයක් පවත්වන ලද අතර, එම සාකච්ඡා මැතිවරණ කොමිෂන් සභාවේ දී සහ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දී පවත්වන ලදී.

සියලුම මාධ්‍ය ආයතනවල ප්‍රධානීන්, ප්‍රධාන කර්තෘවරු, ප්‍රවෘත්ති සංස්කාරකවරුන් සහ මාධ්‍යවේදීන් ඇතුළත් WhatsApp සමූහයක් හරහා අදාළ සියලුම තොරතුරු ලබා දීමේ ක්‍රමවේදයක් ද ස්ථාපිත කොට ක්‍රියාත්මක කරන ලදී.

### 2.12. ලේඛනාගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ ලේඛනාගාරයේ කාර්යයන් වඩාත් සංවිධිත අයුරින් පවත්වාගෙන යාමට ක්‍රියා කර ඇත. එහි ඇති ලිපි ලේඛන වඩාත් සුරක්ෂිත කර ගැනීම හා ඒවා අවශ්‍ය වන පරිදි ඕනෑම පාර්ශ්වයකට පහසු පරිශීලනය කිරීම සඳහා නිසි පරිදි ගබඩා කර තබා ගැනීමේ වැඩපිළිවෙලක් ආරම්භ කර ඇත.

## 2.13. දැනුම් කළමනාකරණ ඒකකය හා කෞතුගාරය

මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යන් පිළිබඳව තොරතුරු ලබාගැනීම හා ඒ සඳහා ලැබෙන ඉල්ලීම් ප්‍රමාණය දෛනිකව වර්ධනය වෙමින් පවතී. මෙම විෂය පිළිබඳව අධ්‍යයන කටයුතුවල යෙදෙන විද්‍යාර්ථීන් පර්යේෂකයින් හා දේශපාලන පක්ෂ නියෝජිතයින්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඒ අතරින් ප්‍රධාන වේ. එබැවින් මෙම තොරතුරු ගවේෂකයින්ගේ කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් ඉටු කරලීම පිණිස මැතිවරණ කොමිෂන් සභාව විසින් දැනුම් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කරන ලදී. ඒ සඳහා පවත්නා මැතිවරණ නීති රීති, අණ පනත් වාර්තා හා ලේඛන ගබඩා කිරීම හා පරිශීලනය පහසු කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කොට ඇත. මෙයට අමතරව ඡන්ද විමසීම් ක්‍රියාවලිය හා සබැඳී සියලුම තොරතුරු ලබා දීම සඳහා ද කටයුතු සම්පාදනය කොට ඇත. ඉදිරියේ දී මෙම කාර්යයන් වඩාත් පහසුකරලීම සඳහා පැමිණෙන පරිශීලකයන් සඳහා රැඳී සිටීමේ ස්ථාන, පරිගණක, මල්ටි මීඩියා පහසුකම් හා ඉ - තොරතුරු ලබා ගැනීම දක්වා වූ පහසුකම් ලබාදීමට කොමිෂන් සභාව කටයුතු කරමින් පවතී.

## 2.14. මාධ්‍ය ඒකකය පවත්වාගෙන යාම

කොමිෂන් සභාවේ විශේෂ අවස්ථා ඡායාරූපගත කිරීම, වීඩියෝගත කිරීම, වීඩියෝ සංස්කරණය, ග්‍රැෆික් නිර්මාණ කටයුතු හා ඒවා සංරක්ෂණය කිරීම, කොමිෂන් සභාවේ ප්‍රකාශන සංස්කරණය කිරීම හා ප්‍රකාශන වල පරිගණක පිටු සැකසුම් කිරීම මාධ්‍ය ඒකකය මගින් සිදු කරනු ලබයි.

## 2.15. සමාජ මාධ්‍ය වේදිකා පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම

මැතිවරණ කොමිෂන් සභාවේ නිල සමාජ මාධ්‍ය වේදිකා (Facebook, You Tube, Tik Tok, Instagram, WhatsApp) සියල්ල මධ්‍යගත කොට ප්‍රේක්ෂක ආකර්ශණය ලබා ගත හැකි අයුරින් වඩාත් ආකර්ශණීය ලෙස පවත්වාගෙන යාම සිදු කර ඇත. නිල සමාජ මාධ්‍ය වේදිකා හරහා පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම වෙනුවෙන් කොමිෂන් සභාවේ නිල නිවේදන තොරතුරු හා සංඛ්‍යා සම්පාදනය කිරීම, නිර්මාණය කිරීම, උඩුගත කිරීම ද සිදුකොට ඇති අතර, එමගින් විශාල පරිශීලකයන් පිරිසක් ආවරණය කරන ලදී.

මෙම සමාජ මාධ්‍ය වේදිකා අතරින් You Tube වේදිකාව හරහා සිදු කරන ලද ප්‍රචාරක කාල සීමා පුළුල් වී ඇති අතර, ඒ තුළින් මුදල් ඉපයීමට හැකි වේදිකාවක් ( Monatization ) බවට පරිවර්තනය වි තිබීම අගය කළ යුතුය.

පූර්වයේදී කොමිෂන් සභා නිල සමාජ මාධ්‍ය වේදිකා පරිශීලනය සීමිත පිරිසකට පමණක් සීමා වි තිබූ අතර, ඉහත වැඩ පිළිවෙල මගින් සමාලෝචිත කාල සීමාව තුළදී එය අඛණ්ඩව පරිශීලනය කරන පිරිස වර්ධනය වී ඇත. එහි තොරතුරු මතු දැක්වේ.

| අනු අංකය | සමාජ මාධ්‍යය | මාධ්‍ය ඒකකය ආරම්භ කිරීමට ප්‍රථම පරිශීලකයන් සංඛ්‍යාව | දින වන විට සමස්ත 2025.12.31 වපරිශිලකයන් සංඛ්‍යා |
|---|---|---|---|
| 01 | YouTube | 900 | 6029 |
| 02 | Facebook | 38000 | 77026 |
| 03 | WhatsApp | - | 4166 |

**2.15.1. මැතිවරණ කොමිෂන් සභාවේ සමාජ මාධ්‍ය වේදිකා පාර්ශ්වකරුවන්/ පරිශීලකයන් අතර ප්‍රචලිත වීම සඳහා හේතු පාදක වූ කරුණු**

- මැතිවරණවලට අදාළ තොරතුරු හා දත්ත ඉතා සරලව ඡායාරූප හා ප්‍රස්ථාර සහිතව ඉදිරිපත් කිරීම.
- පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ ප්‍රතිඵල හා ඡන්දදායක සංඛ්‍යාලේඛන ඉදිරිපත් කිරීම.
- මහජනතාවට සහ මාධ්‍යවේදීන්ට ක්ෂණික නිල තොරතුරු හා නිවේදන ලබා ගැනීමට නිල WhatsApp නාලිකාවක් ආරම්භ කිරීම.
- කොමිෂන් සභාව විසින් සමාජ මාධ්‍ය වේදිකා තුළින් ඉදිරිපත් කරන තොරතුරු, දත්ත, ඡායාරූප ආදිය කොපමණ ග්‍රාහක පිරිසක් පරිශීලනය කළේද යන්න විමසා බැලීම.
- ත්‍රෛභාෂා සන්නිවේදනය - සෑම නිවේදනයක්ම/ තොරතුරක්ම සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම එකවර නිකුත් කිරීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම.

## 2.16. 2025 වසර තුළ එළි දක්වන ලද ප්‍රකාශන

මැතිවරණ කොමිෂන් සභාවේ 2017-2020 දක්වා වූ සිවු අවුරුදු සහභාගීත්ව උපාය මාර්ගික සැලැස්මේ හඳුනාගන්නා ලද අවධාරිත ක්ෂේත්‍ර යටතේ කොමිෂන් සභාවේ කාර්යයන් හා කර්තව්‍යයන් අළලා කාර්තුමය වශයෙන් කතිරයේ බලය නමින් (News Letter) පුවත් සඟරාවක් එළි දක්වන ලදී. එහි කතිරයේ බලය පුවත් සඟරාවේ නවවන වෙළුමේ පළමු කලාපය (ජනවාරි - අප්‍රියෙල් 2025) සහ නවවන වෙළුමේ දෙවන කලාපය (මැයි - අගෝස්තු 2025) මුද්‍රණය කර ඇත.







2026 අයවැය කාරක සභා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ 205.01.01 දින සිට 2025.09.30 දින දක්වා ඉටු කරන ලද කාර්යභාරය සහ ක්‍රියාකාරකම් ඇතුළත් 2025 ප්‍රගති වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර සභා ගත කර ඇත.




**2.17. නීති කටයුතු**

2025 වර්ෂයේ මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ සාමාජික මහතුන් ද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් ද වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් අලුතින් ගොනු කරන ලද නඩු කටයුතු 296 ක් මැතිවරණ කොමිෂන් සභාව වෙත වාර්තා වී ඇත.

**2.17.1. ශ්‍රේෂ්ඨාධිකරණය**

මැතිවරණ කොමිෂන් සභාවට එරෙහිව මූලික අයිතිවාසිකම් කඩවීම සම්බන්ධයෙන් පෙත්සම් 11 ද, රිට් පෙත්සම් 50 ක් හා පළාත් පාලන සංශෝධන පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ තීරණ ලබා ගැනීම වෙනුවෙන් ගොනු කරන ලද පෙත්සම් 4ක් හා නාමයෝජනා ප්‍රතික්ෂේප වීම සම්බන්ධයෙන් ගරු අභියාචනාධිකරණයේ දෙනු ලැබූ තීරණයන්ට එරෙහිව අභියාචනා කරමින් ගොනුකරන ලද විශේෂ නඩු 4 ක්, ගරු අභියාචනාධිකරණයේ තීන්දුවකට එරෙහිව ගොනු කරන ලද විශේෂ නඩු 4 ද වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කරන ලද නඩු කටයුතු සංඛ්‍යාව 73 ක් වේ.

2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නාම යෝජනා ප්‍රතික්ෂේප වීම තුළින් සිය මූලික අයිතිවාසිකම් කඩවී ඇති බව සඳහන් කරමින් SC/FRA/59/2025, SC/FRA/60/2025, SC/FRA/63/2025, SC/FRA/65/2025, SC/FRA/68/2025, SC/FRA/69/2025, හා SC/FRA/72/2025 අංක දරන නඩු ද, ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා නිවාඩු ලබා නොදීම තුළින් සිය මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවට SC/FRA/15/2025 අංක දරන නඩුවද, ජනාධිපතිවරණ කාලසීමාව තුළ නීතිවිරෝධී අයුරින් මත්පැන් බලපත්‍ර නිකුත් කිරීම තුළින් සිය මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වූ බවට SC/FRA/30/2025 නඩුවද, දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමෙන් තොරව 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්වීම තුළින් සිය මූලික අයිතිවාසිකම් කඩවී ඇති බවට ගොනුකරන අංක SC/FRA/87/2025 දරන නඩුව ද හා පඬුවස්නුවර ප්‍රාදේශීය සභාව සඳහා තේරී පත්වූ දොලවත්තගේ දොන් ශිරන්ත පද්මලාල් මහතාට 2025.06.13 දින පැවති රැස්වීම සඳහා සහභාගීවීමට අවස්ථාව ලබා නොදීම තුළින් මූලික අයිතිවාසිකම් කඩ වූ බවට ගොනුකරන ලද SC/FRA/135/2025 අංක දරන නඩුව ද වශයෙන් මූලික අයිතිවාසිකම් නඩු 11 ගොනු කර ඇත.

එසේම 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නාම යෝජනා ප්‍රතික්ෂේප වීම සම්බන්ධයෙන් රිට් පෙත්සම් 46 ක් ද, 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව කැස්බෑව නගර සභාව සඳහා ජාතික ජන බලවේගය පක්ෂයේ නාමයෝජනා පත්‍රයේ එම නගර සභාවේ සේවකයෙකුගේ නම ඇතුළත් කිරීම සම්බන්ධව නඩු 1 ක් ද, (නඩු අංක SC/WRIT/65/2025) 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී වාවකච්චේරිය නගර සභාව සඳහා අකිල ඉලංගෙයි තමිල් කොංග්‍රස් පක්ෂයේ යසෝකුමර් තුෂ්‍යා මහත්මිය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 8 වන වගන්තිය ප්‍රකාරව සභිකත්වය සඳහා නුසුදුස්සෙකු බවට සඳහන් කරමින් නඩු 1

ක් ද, (නඩු අංක SC/WRIT/68/2025) 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී වාවකච්චේරිය ප්‍රාදේශීය සභාව සඳහා අකිල ඉලංගෙයි තමිල් කොංග්‍රස් පක්ෂයේ යෝගනාදන් කලාාණි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ (262 අධිකාරය) 8 වන වගන්තිය ප්‍රකාරව සභිකත්වයට නුසුදුස්සෙකු බවට සඳහන් කරමින් SC/WRIT/69/2025 නඩුව ගොනුකර ඇත. තවද ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය සහ සමගි ජන බලවේගය යන පක්ෂ අතර 2024 පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඇතිකරගන්නා ලද සංධානය පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාව විසින් පාර්ලිමේන්තු මහ ලේකම්වරිය දැනුම්වත් නොකිරීම සම්බන්ධව රවුෆ් හකීම් සහ නිසාම් කාරියප්පර් යන අයවලුන් විසින් SC/WRIT/70/2025 ද යන නඩුවද ගොනුකර ඇත.

එසේම පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සංශෝධන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණ තීරණයක් ලබා ගැනීම සම්බන්ධයෙන් SC/SD/1/2025, SC/SD/2/2025, SC/SD/3/2025, SC/SD/4/2025 වශයෙන් නඩු 4 ක් ද ගොනුකර ඇත.

තවද, 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නාම යෝජනා ප්‍රතික්ෂේප වීම සම්බන්ධයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ SC/SPL/LA/105/2025, SC/SPL/LA/107/2025, SC/SPL/LA/108/2025, SC/SPL/LA/110/2025 අංක දරන නඩු ද ගොනුකර ඇත.

එසේම වවුනියාව මහා නගර සභාවේ නගරාධිපති හා උප නගරාධිපති පත් කිරීමට එරෙහිව කන්දයියා විජයකුමාර් සහ සිවසුබ්‍රමනියම් ප්‍රේමදාස් යන අයවලුන් විසින් CA/WRIT/708/2025 නඩු අංකය යටතේ රිට් පෙත්සම අදාළව ගරු අභියාචනාධිකරණ විසින් 2025.10.21 දිනැතිව නිකුත් කරන ලද අතුරු තහනම් නියෝගය සම්බන්ධයෙන් ගරු ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ SC/SPL/LA/356/2025 හා SC/SPL/LA/357/2025 දරන නඩු ද, ගරු අභියාචනාධිකරණ විසින් CA/WRIT/607/25 හා CA/WRIT/586/25 දරන නඩු සම්බන්ධයෙන් දෙන ලද තීන්දුවලට එරෙහිව SC/SPL/LA/386/2025 හා SC/SPL/LA/387/2025 දරන අභියාචනා පෙත්සම් මැතිවරණ කොමිෂන් සභාව විසින් ගොනු කරන ලදී.

### 2.17.2. අභියාචනාධිකරණය

ගරු අභියාචනාධිකරණයේ මැතිවරණ කොමිෂන් සභාවට එරෙහිව නඩු කටයුතු 219 ක් ගොනුකර ඇති අතර, එම නඩු අතරින් 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව නාම යෝජනා ප්‍රතික්ෂේප වීම සම්බන්ධයෙන් නඩු කටයුතු 203ක් ද, 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව මහනුවර මහා නගර සභාව සඳහා ස්වාධීන කණ්ඩායම් 2 යටතේ තරග කළ ආර්.එම්.යාසින් යන අයගේ සභිකධූරය සම්බන්ධයෙන් නඩු 1ක් ද, (නඩු අංක CA/Writ/576/2025), කැකිරාව ප්‍රාදේශීය සභාවේ කාන්තා නියෝජනය පිළිබඳව සමගි ජන බලවේගය පක්ෂය විසින් ගොනුකරන ලද නඩු 1 ක් ද, (නඩු අංක CA/Writ/586/2025), ගල්නෑව ප්‍රාදේශීය සභාවේ සමගි ජන බලවේගයෙන් තේරී පත්වූ සභිකයින් සඳහා කාන්තාවන් නම් කිරීමට එරෙහිව ගොනුකරන ලද නඩු 1ක් ද, (නඩු අංක CA/Writ/607/2025) හා 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී කෝරළේ පත්තු බටහිර ප්‍රාදේශීය සභාව සඳහා සමගි ජන බලවේගය පක්ෂයෙන් තරග කළ මොහොමඩ් තම්බි මොහොමඩ් අන්වර් මහතා සභිකත්වයට නුසුදුස්සෙකු සඳහන් කරමින් අංක CA/Writ/611/2025 නඩුව ද ගොනුකර ඇත.

එසේම 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමෙන් අනතුරුව විධිමත් අන්දමින් තොරව බේරුවල නගර සභාවේ පළමු රැස්වීම පැවැත්වීමට එරෙහිව අංක CA/Writ/661/2025 නඩුව ද, 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාවේ සභිකයින් සඳහා කාන්තාවන් පත්කිරීමට එරෙහිව නඩු 1 ක්ද, (නඩු අංක CA/Writ/672/2025) 2025 පළාත් පාලන ආයතන ඡන්ද

විමසීමේ දී සීතාවක ප්‍රාදේශීය සභාව සඳහා තේරී පත්වූ සභිකයින් අතුරින් සභාපතිවරයා සහ උප සභාපතිවරයා පත් කිරීමට අදාළව පවත්වන ලද ඡන්ද විමසීම සම්බන්ධයෙන් නඩු 1ක් (නඩු අංක CA/Writ/700/2025) ද හා 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව වවුනියාව මහා නගර සභාවේ නගරාධිපති හා උපනගරාධිපති පත් කිරීමට එරෙහිව අංක CA/Writ/708/2025 දරන නඩුව ගොනුකර ඇත.

2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී කල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා තේරී පත්වූ සභිකයින් අතුරින් සභාපතිවරයා සහ උප සභාපතිවරයා පත් කිරීමට අදාළව පවත්වන ලද ඡන්ද විමසීම සම්බන්ධයෙන් CA/Writ/714/2025 අංක දරන නඩුව ද, 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී පාතහේවාහැට ප්‍රාදේශීය සභාව සඳහා තේරී පත්වූ සභිකයින් අතුරින් සභාපතිවරයා සහ උප සභාපතිවරයා පත් කිරීමට අදාළව පවත්වන ලද ඡන්ද විමසීම සම්බන්ධයෙන් නඩු 1 ක් (නඩු අංක CA/Writ/735/2025) ද හා 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී හොරණ නගර සභාව සඳහා එක්සත් ජාතික පක්ෂයෙන් තේරී පත්වූ සන්දනම් ජොන්සන් පෝල් මහතාගේ ඉල්ලා අස්වීම හේතුවෙන් පුරප්පාඩු වූ සභික ධූරයට වෙනත් අයෙකු පත් කිරීමට එරෙහිව CA/Writ/833/2025 අංක දරන නඩුවද ඇතුළු නඩු කටයුතු ගොනුකර ඇත.

එසේම අහිල ඉලංගෙයි මහජන කොංග්‍රස පක්ෂයේ පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ආදම් බාවා අස්ෆර් යන අය විසින් CA/WRIT/981/25 අංක දරන නඩුව ද, අහිල ඉලංගෙයි මහජන කොංග්‍රස පක්ෂයේ පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් මොහොමඩ් හනීෆා මොහොමඩ් ෆයිරූස් යන අය විසින් CA/WRIT/982/25 අංක දරන නඩුව ද, තමිල් මක්කල් විඩුතලෙයි පුලිකල් පක්ෂයේ පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් ධර්මරත්නම් සුදාකරන් යන අය විසින් CA/WRIT/985/25 අංක දරන නඩුව ද වශයෙන් නඩු තුනක් ගොනුකර ඇත. තවද, සර්ව ජන බලය පක්ෂයේ පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් මොහම්මදූ ජෙන්නත් බීවි යන අය විසින් සහ සර්වජන බලය පක්ෂය නියෝජනය කරමින් කල්පිටිය ප්‍රාදේශීය සභාව සඳහා තේරීපත්වූ අබූබකර් මුහම්මදූ ඉන්පාස් යන අය පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් පිළිවෙලින් CA/INJ/3/2025 හා CA/INJ/5/2025 දරන නඩු කටයුතු ද ගරු අභියාචනාධිකරණය ඉදිරියේ ගොනු කර ඇත.

### 2.17.3. මහාධිකරණය

2025 වසරේ මැතිවරණ කොමිෂන් සභාව පාර්ශ්වකරුවකු ලෙස නම් කරමින් මහාධිකරණයේ කිසිදු නඩුකරයක් ගොනු කර නොමැත.

### 2.17.4. දිසා අධිකරණය

දිසා අධිකරණයේ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව 3ක් වන අතර, එම නඩුව 2023 ඡන්දහිමි නාමලේඛණයේ තම පදිංචි ලිපිනයට ඡන්දදායකයෙකු වශයෙන් තමාගේ නම ඇතුළත් නොකිරීම සම්බන්ධයෙන් ගොනුකර ඇත. (මාතර දිසා අධිකරණ නඩු අංක MC/20383/ මාතර) තවද, සමගි ජන බලවේගය පක්ෂයේ පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සේනානායකගේ අනුරුද්ධිකා සේනානායක යන අය විසින් කොළඹ දිසා අධිකරණයේ DSP 335/2025 සහ ශ්‍රී ලංකා කම්කරු පක්ෂයේ පක්ෂ සාමාජිකත්වයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සේවියර් ජෝන්ස් පොලිංටන් යන අය විසින් මන්නාරම දිසා අධිකරණයේ SP 166/2025 යන නඩු කටයුතු ගොනු කර ඇත.

**2.17.5. මහේස්ත්‍රාත් අධිකරණය**

2015 පාර්ලිමේන්තු මැතිවරණ සමයේදී මඩකලපුව සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් කටයුතු කළ ආර්. සසීලන් මහතා සහ තවත් නිලධාරීයෙකු කාත්තන්කුඩි ප්‍රදේශයේ මැතිවරණ රාජකාරිවල නිරතව සිටින අවස්ථාවේ දී, රාජකාරියට බාධා කිරීම සම්බන්ධව මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයේ PC/6653/25-මඩකලපුව අංක දරන නඩුව ගොනුකර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරනු ලැබූ ඉහත කී නඩු අතුරින් නඩු 76 ක් ගරු අධිකරණය විසින් අවසන් තීන්දු ලබාදීමෙන් සහ පෙත්සම්කරුවන් විසින් ඉල්ලා අස්කර ගැනීම හේතුවෙන් අවසන්ව ඇති අතර නඩු 06 ක් මේ වන විටත් ගරු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී. අභියාචනාධිකරණයේ ගොනුකර ඇති නඩු 219 අතුරින් නඩු 211 ක් මේ වන විට අවසන්ව ඇති අතර නඩු 08 ක් පමණක් විභාග වෙමින් පවතී. දිසා අධිකරණයේ පවරා ඇති නඩු 3 හා මහේස්ත්‍රාත් අධිකරණයේ පවරා ඇති නඩුව තවදුරටත් ගරු අධිකරණය ඉදිරියේ විභාග වෙමින් පවතී.

**2.17.6. නීතිපති උපදෙස් විමසීම්**

නෛතික තත්ත්ව පිළිබඳ නීතිපති උපදෙස් විමසීම් 06 ක් යොමු කර ඇති අතර, එම සියලුම විමසීම් සම්බන්ධයෙන් ගරු නීතිපතිතුමා විසින් උපදෙස් ලබා දී ඇති අතර එම ලබාදුන් උපදෙස් පිළිබඳව අදාළ පාර්ශ්ව දැනුම්වත් කර ඇත .

**2.17.7. මානව හිමිකම් කොමිෂන් සභාවට අදාළ පැමිණිලි, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන**

මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් ලැබුණු පැමිණිලි 03 ක් සඳහා අදාළ පාර්ශ්ව වෙතින් තොරතුරු විමසීම් සහ අවශ්‍ය ක්‍රියාමාර්ග මේ වන විට සිදු කර ඇත. එමෙන්ම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට අදාළ විමර්ශන 09 ක් සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම හා වෙනත් පාර්ශ්ව සම්බන්ධ කිරීම් ද සිදු කර ඇත.

**2.17.8. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ නෛතික කටයුතු සහ ඡන්ද හිමියන් ගණන් ගැනීමට අදාළ ලේඛණ අපහරණය**

ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන 2025 ට අදාළව සිරදඬුවම් විඳින තැනැත්තන් 71 දෙනෙකු අසාධු ලේඛන ගත කිරීමට උපදෙස් ලබා දී ඇත. ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන 2025 ට අදාළව ඉදිරිපත් කරන ලද හිමිකම් ඉල්ලීම් සහ විරෝධතා දැක්වීම්වලට අදාළව උපදෙස් ලබාදීම් 42 ක් සිදු කර ඇත.

**2.18. මැතිවරණ නීති සංශෝධන**

මැතිවරණ/ ඡන්ද විමසීම් සඳහා ඇප තැන්පත් මුදල් විධිමත් කිරීම සඳහා වූ නීති සංශෝධනය, විශේෂ ඡන්ද මධ්‍යස්ථාන සහ ජංගම ඡන්ද මධ්‍යස්ථාන පිහිටුවීම හා පූර්ව ඡන්ද ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් වූ නීතිමය ප්‍රතිපාදන හා මාධ්‍ය උපමාන හා ආචාර ධර්ම ඇතුළත් මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සහ නොමැකෙන තීන්ත භාවිත කරමින් ඡන්දදායකයන් "උචිත ලකුණින්" සලකුණු කිරීමේ අවශ්‍යතාව සියලුම මැතිවරණ/ ඡන්ද විමසීම් පනත්වලින් ඉවත් කිරීම සඳහා වූ නීති සංශෝධනය යෝජනා ඇතුළත් පනත් කෙටුම්පත් සම්මත කරගැනීම පිළිබඳව අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කිරීම සඳහා 2025.08.20 සහ 2025.09.15 දින ජනාධිපති ලේකම් දැනුම්වත් කිරීමට කටයුතු කර ඇත.

දැනට පවත්නා මැතිවරණ/ ඡන්ද විමසීම් නීතිවල අත්‍යාවශයෙන් සිදුවිය යුතු සංශෝධන පිළිබඳව වූ යෝජනා සම්බන්ධයෙන් මූලික සාකච්ඡාවක් (1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත) මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් සමඟ 2025.08.04, 2025.08.06, 2025.08.13. 2025.09.02 සහ 2025.09.10 යන දිනවල පවත්වන ලදී.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරය) ට අදාළව සිදුවිය යුතු සංශෝධන පිළිබඳව වූ යෝජනා සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ නීති සංශෝධන කමිටුවේ නිලධාරීන් සමඟ සාකච්ඡාව 2025.12.17 වන දින පවත්වන ලදී.

දේශපාලන පක්ෂ පිළිගැනීම/ ලියාපදිංචියට අදාළ නීති සංශෝධනය සඳහා සකස් කිරීමට නියමිත ගැසට් නිවේදනය සම්බන්ධයෙන් මූලික සාකච්ඡාවක් මැතිවරණ කොමිෂන් සභාවේ නීති සංශෝධන කමිටුවේ නිලධාරීන් සමඟ 2025.09.10 සහ 2025.10.17 දිනවල දී පවත්වන ලදී.

විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි වන ආකාරයෙන් නීති කෙටුම්පත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව අමාත්‍ය මණ්ඩලය දැනුම්වත් කිරීම යන ශීර්ෂයෙන් යුතු 2025.09.23 දිනැති අංක අමප/25/1692/816/073 දරන අමාත්‍ය මණ්ඩල තීරණය කොමිෂන් සභාවේ උපදෙස් හා නියෝග සඳහා ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ඒ සම්බන්ධයෙන් වන ප්‍රගතිය පහත පරිදි වේ.

- 2025.10.08 දින විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන ආකාරයෙන් නීති කෙටුම්පත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව සභාපතිතුමා ඇතුළු මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ අංශ ප්‍රධානීන් සමඟ සාකච්ඡාව සභාපතිතුමන්ගේ නිල කාමරයේ දී පවත්වන ලදී.

- 2025.10.30 දින විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි වන ආකාරයෙන් නීති කෙටුම්පත් සකස් කිරීම පිළිබඳ මැතිවරණ කොමිෂන් සභාවේ නීති සංශෝධන කමිටුවේ නිලධාරීන් සමඟ සාකච්ඡාව පවත්වන ලදී.

- 2025.11.06 දින විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි වන ආකාරයෙන් නීති කෙටුම්පත් සකස් කිරීම පිළිබඳ විදේශ කටයුතු සහ විදේශ රැකියා අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍යතුමා ඇතුලු එම අමාත්‍යාංශයේ නිලධාරීන් සහ කොමිෂන් සභාවේ නිලධාරීන් සමග සාකච්ඡාව පවත්වන ලදී.

- විදේශගත ශ්‍රී ලාංකිකයින්ට ඡන්දය ප්‍රකාශ කිරීමට හැකිවන ආකාරයෙන් ප්‍රතිපාදන සැලසීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මත රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය මගින් අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන) බී.පී.සී. කුලරත්න මහතාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් 2025.12.15 දින පත්කරන ලදී.

### 2.19. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට අදාළ කටයුතු

2025 වර්ෂයට අදාළව 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ප්‍රකාරව ඉල්ලීම් 170 ක් ලැබී ඇති අතර එම සියලුම ඉල්ලීම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දීම සිදුකර ඇත. තවද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනා 7ක් අභියචනාකරුවන් විසින් යොමු කර ඇති අතර, එම කොමිෂන් සභාවේ තීරණ ප්‍රකාරව එම තොරතුරු ද ලබා දීම සිදු කර ඇත.

### 2.20. මැතිවරණ කාර්යය සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීම

#### 2.20.1. 2025 වර්ෂය සඳහා දේශපාලන පක්ෂ පිළිගැනීමේ කටයුතු

2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4) වගන්තිය ප්‍රකාරව හා අංක 2263/23 හා 2022.01.21 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව 2025 වර්ෂය සඳහා දේශපාලන පක්ෂයක් ලෙස පිළිගැනීම සඳහා පුවත්පත් දැන්වීම් (භාෂා ත්‍රිත්වයෙන්) පල කිරීම හා නිල වෙබ් අඩවියේ පල කිරීම සිදු කරන ලදී. මේ සම්බන්ධයෙන් පහත කටයුතු මේ වන විට සිදු කර ඇත.

**අයදුම්පත් කැඳවීම**

I. 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධන) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ අංක 7(4) (අ) වගන්තිය අනුව මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම සඳහා වූ අයදුම්පත් 2025.02.28 වන දින සිට 2025.03.28 දින දක්වා භාර ගන්නා ලදී.

II. දේශපාලන පක්ෂ 83ක් විසින් අයදුම්පත් ඉදිරිපත් කරන ලදී.

**මූලික පරීක්ෂණය**

I. මූලික පරීක්ෂණය 2025.06.26 දින පවත්වන ලද අතර එහි දී පළමු වටය සඳහා දේශපාලන පක්ෂ 47 ක් තේරී පත් වූ අතර, දේශපාලන පක්ෂ 36 ක් ප්‍රතික්ෂේප විය.

**පළමු සම්මුඛ පරීක්ෂණය**

I. 2025 දේශපාලන පක්ෂ පිළිගැනීම සඳහා (තේරී පත් දේශපාලන පක්ෂ 47 සඳහා)වූ පළමු සම්මුඛ පරීක්ෂණය 2025.08.12 , 14, 15, 16, 17, 22, 25, 26, 27, 28 යන දිනවල දී මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

**දෙවන සම්මුඛ පරීක්ෂණය**

I. පළමු සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ දේශපාලන පක්ෂ 47න් දේශපාලන පක්ෂ 14ක් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා තේරී පත් විය. පක්ෂ 33ක් ප්‍රතික්ෂේප විය.

II. දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා තේරී පත් වූ පක්ෂ 14 සඳහා ස්ථානීය පරීක්ෂණය සිදු කිරීමෙන් අනතුරුව දෙවන සම්මුඛ පරීක්ෂණය 2025.10.08, 09, 16 යන දිනයන්හි මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

III. දෙවන සම්මුඛ පරීක්ෂණයෙන් පක්ෂ 5ක් 2025 පිළිගත් දේශපාලන පක්ෂ ලැයිස්තුවට ඇතුළත් විය.

### 2.20.2 දැනටමත් පිළිගෙන ඇති දේශපාලන පක්ෂ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීම

මේ වන විටත් මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගෙන ප්‍රකාශයට පත්කර ඇති සියලුම දේශපාලන පක්ෂවලට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම හා මැතිවරණ /ඡන්ද විමසීම් අවස්ථාවක දී දේශපාලන පක්ෂ රැස්වීම් කැඳවීම, සටහන් තබා ගැනීම හා ඒ සම්බන්ධ සියලු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

දැනටමත් මැතිවරණ කොමිෂන් සභාව විසින් පිළිගත් දේශපාලන පක්ෂ අතරින් පක්ෂ 3ක් නියමිත දිනට ගිණුම් ප්‍රකාශ ලබා නොදීම හේතුවෙන් එම පක්ෂවල පිළිගැනීම අවසන් කර ඇත.

### 2.21. වත්කම් බැරකම් ප්‍රකාශ භාරගැනීම

2023 අංක 9 දරණ දූෂණ විරෝධී පනතේ 80(1)(ද) උප වගන්තිය ප්‍රකාරව 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරණ පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම පනත, පළාත් පාළන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 වන අධිකාරිය) හෝ වෘත්තීය සමිති ආඥා පනතේ (138 වන අධිකාරිය) කාර්යය සඳහා වන පිළිගත් දේශපාලන පක්ෂවල තනතුරු දරන්නන් විසින් භාර දිය යුතු වත්කම් බැරකම් ප්‍රකාශ භාරගෙන එම ලේඛන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත භාර දීම සිදු කරන ලදී.

### 2.22. මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනත හා මැතිවරණ නීති බලාත්මක කිරීමට ආදාල දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

සියලු අපේක්ෂකයින් සඳහා සම තරග බිමක් ස්ථාපිත කිරීම හා විනිවිදභාවයකින් යුතු මැතිවරණ වියදම් රටාවක් ඇති කිරීම උදෙසා 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමන පනත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වෙනුවෙන් බලාත්මක කරන ලදි. ඒ අනුව පසුගිය ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණයේ දී ප්‍රචාරණ වියදම් සීමාව තීරණය කිරීම සඳහා භාවිතා කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික ලක්ෂ්මන් දිසානායක මහතා විසින් හඳුන්වාදෙන ලද විද්‍යාත්මක ක්‍රමවේදය මේ සඳහා භාවිතා කරන ලදී.

එසේම අපේක්ෂකයින්, දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් සඳහා මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් සඳහා පොදු ආකෘතියක් හඳුන්වා දීම මෙම ඡන්ද විමසීමේ දී සිදුකරන ලදී. තවද මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් වාර්තා භාරදෙනු ලබන අපේක්ෂකයින්ගේ, අපේක්ෂකයන් නියෝජනය කරන ලද පක්ෂවල ලේකම්වරුන්ගේ හා ස්වාධීන කණ්ඩායම් නායකයන්ගේ පහසුව උදෙසා මැතිවරණ කොමිෂන් සභාව විසින් https://cf.elections.gov.lk වෙබ් සබැඳියක් ද හඳුන්වා දීම සිදුකරන ලදී.

2024.11.14 දින පවත්වනු ලැබූ පාර්ලිමේන්තු මැතිවරණයේ දී 10 % පමණ අපේක්ෂකයින්, දේශපාලන පක්ෂ හෝ ස්වාධින කණ්ඩායම් නායකයින් ප්‍රමාණයක් සිය මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් වාර්තා භාර දීම සිදු නොකරන ලදී. ඒ අනුව 2023 අංක 3 දරන මැතිවරණ වියදම් නියාමනය කිරීමේ පනතේ කාර්යයන් සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට ඉදිරිපත්වන අපේක්ෂකයින් දැනුම්වත් කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් මාලාවක් මැතිවරණ කොමිෂන් සභාව විසින් සංවිධානය කරන ලදී. ඒ අනුව මුළු දිවයිනම ආවරණය වන අයුරින් වැඩසටහන් 09 ක් පවත්වන ලද අතර එම පුහුණුකරුවන් මඟින් මුළු දිවයිනම ආවරණය වන අයුරින් පළාත් පාලන ආයතන වශයෙන් 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා තරග කිරීමට ඇල්මක් දක්වන පාර්ශව දැනුම්වත් කිරීම් සිදු කරන ලදී.

එසේම මෙම පුහුණු වැඩසටහනට සමගාමීව පාර්ශ්වකාරී ආයතන හා 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට සඳහා නාමයෝජනා භාර දුන් සියලුම දේශපාලන පක්ෂ දැනුම්වත් කිරීම ද සිදු කරන ලදී.

එම පුහුණු වැඩසටහන්වල ප්‍රතිඵලයක් වශයෙන් 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී ඒ සඳහා තරග කරන ලද අපේක්ෂකයින් 75775 ක් අතුරින් අපේක්ෂකයින් 74275 ක් ප්‍රමාණයක් සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේදී තරඟ කළ දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් 2650 ක් අතුරින් 2579 ක් සිය මැතිවරණ ප්‍රචාරණ ආදායම් වියදම් වාර්තා භාර දී ඇත.

## 2.23. ද්‍රව්‍ය මිළදී ගැනීම, යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම /අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම

### 2.23.1. ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම

වාර්ෂිකව පවත්වනු ලබන ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා බීසී ආකෘති පත්‍ර වෙනුවට "අ" හා "ආ" තොරතුරු පමණක් රැස්කිරීමට අදාළව ER ආකෘති පත්‍ර මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී. ER ආකෘති පත්‍ර ලක්ෂ 20 ක් පමණ රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කිරීමෙන් පසුව දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදාහැරීමට කටයුතු කරන ලදී. 2022 වර්ෂයේ සිට හඳුන්වාදුන් පරිපූරක නාම ලේඛනයක් සකස් කිරීමට අදාළව YC ආකෘති පත්‍ර ලක්ෂ 10 ක් පමණ මුද්‍රණය කර දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදාහැරීමට කටයුතු කරන ලද අතර හිමිකම් විරෝධතා ආකෘති පත්‍ර හා දැන්වීම ද මුද්‍රණය කර බෙදාහැරීමට කටයුතු කරන ලද අතර ඒ වෙනුවෙන් රුපියල් මිලියන 4.78ක පමණ වැය කර ඇත.

### 2.23.2. ඡන්දහිමි නාමලේඛන මුද්‍රණය

2025 ඡන්දහිමි නාමලේඛනය මෙවර පුද්ගලික ආයතනවලින් මුද්‍රණය කිරීමට කටයුතු කර ඇති අතර එම මුද්‍රණ කටයුතු අවසන් කිරීමෙන් පසුව අදාළ දිස්ත්‍රික් කාර්යාලවලට බෙදාහැරීමට කටයුතු කරන ලදී. ඒ සඳහා වූ වියදම වශයෙන් රු. මිලියන 18.08 ක් පමණ ගෙවීම් කිරීමට කටයුතු කර ඇත.

### 2.23.3. යන්ත්‍ර උපකරණ මිලදී ගැනීම / අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම

ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා පරිගණක යන්ත්‍ර,ලැප්ටෝප්, සහ යූපීඑස් යන්ත්‍ර වැනි භාණ්ඩ මිලදීගැනීමට කටයුතු කරන ලදී. ඒ සඳහා රු. මිලියන 29.64 ක් වියදම් කරන ලදී.

කාර්යාලවල භාවිතා කරන පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර් හා ඩ්‍රම් යූනිට් සහ අනුපිටපත් යන්ත්‍ර සඳහා තීන්ත සහ මාස්ටර් රෝල් මිලදී ගැනීමට රු. මිලියන 21.52ක මුදලක් වැය කර ඇත. මෙම වියදම ඡන්ද විමසීමට අදාළ කාර්යයන් සඳහා හා අනෙකුත් කාර්යාල කටයුතු වෙනුවෙන් මිලදී ගැනීමට සිදුවීමෙන් ඇති වූ වියදමකි.

### 2.23.4. ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීම

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවලට අවශ්‍ය ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ මිලදී ගැනීමට අදාළව රු. මිලියන 8 පමණ ප්‍රතිපාදන පමණක් ලැබී තිබූ නිසා කෙටුම්පත් අයවැය ඇස්තමේන්තුවට ඉදිරිපත් කර තිබුණු අවශ්‍යතාවය මත දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලට හැකි පමණින් ප්‍රතිපාදන බෙදා දී අවශ්‍යතාවය සපයා ගැනීමට හැකිවිය. ඒ අනුව රු.මිලියන 7.54 ක මුදල වැයකර කාර්යාල භාණ්ඩ මිලදීගෙන තිබුණි.

### 2.23.5. පොදු

ඡන්දහිමි නාමලේඛන මුද්‍රණය, ඡන්දදායකයින් ලියාපදිංචි කිරීමේ කටයුතු සහ කාර්යාලයේ අනෙකුත් ලිපිද්‍රව්‍ය අවශ්‍යතාවය සඳහා සහ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව ලිපිකවර හා නොමැකෙන තීන්ත පෑන් ඇතුලු ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමට ද සිදුවිය. ඒ සඳහා රු. මිලියන 97.62ක පමණ වියදම් කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ ජල අවශ්‍යතාවය සඳහා රු.813,870.40 ක් වියදම් කරන ලද අතර දුරකථන, අන්තර්ජාල සහ වීපීඑන් සම්බන්ධතාව සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට රු.මිලියන 23.03ක පමණ වියදම් කරන ලදී.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වාහනවලට අවශ්‍ය ටයර් මිලදී ගැනීමේ කටයුතු ප්‍රාදේශිය මට්ටමින් සිදුකිරීමට අනුමැතිය ලබාදීමේ පදනම මත කටයුතු කරන ලද අතර දිස්ත්‍රික්කය තුළ දී මිලදී ගැනීමට නොහැකි වූ කාර්යාලවලට සහ මැතිවරණ මහලේකම් කාර්යාලයේ වාහන සඳහා අවශ්‍යතාව මත ටයර් මිලදී ගෙන සැපයීමද සාර්ථකව ඉටු කරන ලද අතර එම වාහන සඳහා අවශ්‍ය බැටරි ද මිලදී ගැනීමට කටයුතු කරන ලදී. ඒ සඳහා ප්‍රසම්පාදන ක්‍රම අනුගමනය කරමින් රු. මිලියන 2.83 ක් පමණ වියදම් කරන ලදී.

ඡන්ද විමසීම්වලට අදාළව නිලඡන්ද දැන්වීම් පත්‍රිකා ද  පුද්ගලික ආයතන තුනකින් මුද්‍රණය කිරීමට සිදු වූ අතර ඊට අදාළ ලිපිලේඛන ඇතුළු මුද්‍රණ කටයුතු සඳහා රු.මිලියන 84.64 ක් පමණ වැය කර ඇත.

ඡන්ද විමසීමට අදාළව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල තිබෙන යන්ත්‍රසූත්‍රවල හිඟතාවය මත පරිගණක යන්ත්‍ර, ලැප්ටොප් යන්ත්‍ර, පරිගණක මුද්‍රණ යන්ත්‍ර සහ ඡායාපිටපත් යන්ත්‍ර කුලී පදනම මත ලබාගැනීමට ද සිදුවිය. ඒ සඳහා රුපියල් මිලියන5.65 ක මුදල වැය කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ ගිනි ආරක්ෂණ පද්ධතිය නවීකරණය කිරීමේ කටයුතු මෙම වර්ෂයතුළ ආරම්භ කරන ලද අතර ප්‍රසම්පාදන කටයුතු අවසන් කර ජාතික ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත භාරදෙන ලදී. එම කටයුතු සඳහා රු. මිලියන 9.6ක පමණ ප්‍රතිපාදන අදාළ දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර ඇති අතර එම කටයුත්ත මේවන අවසන් වීමෙන් අනතුරුව ඒ සඳහා වියදම ලෙස  රු.මිලියන 8.06 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් අයකරගෙන ඇත. ( මේ සඳහා 2024 වර්ෂයේ වෙන්කළ ප්‍රතිපාදනද සමඟ සම්පූර්ණ වියදම රු මිලියන 17.42 කි).

## 2.24. තොරතුරු තාක්ෂණික කටයුතුවල ප්‍රගතිය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු නව්‍යකරණයට ලක්කිරීම මඟින් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ආයතනයේ නිලධාරීන්ට තොරතුරු තාක්ෂණ යෙදුම් සකස් කර දීම සහ අදාළ පාර්ශවකරුවන්ට අවශ්‍ය තොරතුරු තාක්ෂණ සේවාවන් ආරක්ෂාකාරී ලෙස ලබාදීම මෙම අංශයේ මූලික කාර්ය භාරය වේ. නව්‍ය තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යයනය සහ සැලසුම් කිරීම, ව්‍යාපෘති වාර්තා සැකසීම හා අනුමත කර ගැනීම, ව්‍යාපෘති පරීක්ෂාව, ස්ථාපනය කිරීම සහ  නිලධාරීන් පුහුණුව මෙන්ම මැතිවරණ කොමිෂන් සභාවේ සියළුම තොරතුරු ආරක්ෂණ කටයුතු  සිදු කිරීම මෙහි දී ඉටු කරනු ලැබේ.

**2.24.1. තොරතුරු තාක්ෂණ අවශ්‍යතා අධ්‍යයනය, මෘදුකාංග නිර්මාණය, සංවර්ධනය හා නඩත්තු කිරීම**

2025 මැයි මස 06 දින පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ ප්‍රතිඵල වගුගත කිරීම සහ මාධ්‍ය වෙත නිකුත් කිරීම සඳහා ඊ ප්‍රතිඵල සැකසුම් පද්ධතියක් සකස් කරන ලදි. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභාව මගින්ම සංවර්ධනය කරන ලද ප්‍රතිඵල පද්ධතියක් හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හැකියාව ලැබුණු අතර මෙම ඊ ප්‍රතිඵල පද්ධතිය පළාත් පාලන ආයතන මට්ටමින් ක්‍රියාත්මක වන ප්‍රතිඵල වගුගත කිරීමේ පද්ධතිය, ප්‍රතිඵල එසැනින් මාධ්‍ය වෙත නිකුත් කිරීමේ පද්ධතිය, උපස්ථ ප්‍රතිඵල පද්ධතියකින් ද සමන්විත වූ අතර නිකුත් කරන ප්‍රතිඵල ජනතාවට පහසුවෙන් ලබා ගත හැකි සහ අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යා හැකි ප්‍රතිඵල වෙබ් අඩවියකින්ද සමන්විත විය.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගේ නාමයෝජනා කළමනාකරණය කිරීම සඳහා නාමයෝජනා කළමණාකරන පද්ධතිය වැඩි දියුණු කරන ලද අතර මැතිවරණයට ඉදිරිපත් වූ අපේක්ෂකයන්ගේ තොරතුරු ඊ සේවාව හරහා පරිශීලනයට හැකිවන පරිදි ලබා දීම සිදුකරන ලදි. මැතිවරණයේ ඉදිරි කටයුතු සඳහා මුද්‍රණ කටයුතු, වාර්තා ලබා ගැනීම, සංඛ්‍යා දත්ත ලබා ගැනීම, නාමයෝජනා පරික්ෂා කිරිම ඇතුලු නාමයෝජනා මගින් සිදුකරනු ලබන ඉදිරි කටයුතු සිදු කළ හැකි වන පරිදි වැඩි දියුණු කොට අදාළ කාර්යන් සිදු කරන ලදි.

නිලධාරි සංගණනය සඳහා මුද්‍රිත දත්ත පත්‍රිකා වෙනුවට සම්පූර්ණයෙන්ම ඊ සේවාව භාවිතා කිරීම සිදුකළ හැකි වන පරිදි මාර්ගගත නිලධාරි සංගණනය සඳහා වන ඊ සේවාව වැඩි දියුණු කරන ලදි. ඒ අනුව 2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී දිස්ත්‍රික්ක 09 ක් සඳහා ඊ සේවා හරහා සම්පූර්ණයෙන්ම නිලධාරි සංගණනය සිදුකරන ලදි.

මැතිවරණ රාජකාරි සඳහා නිලධාරින්ට පුහුණු පන්ති පිළිබඳ තොරතුරු, පත්වීම් පිළිබඳ තොරතුරු, මාර්ග විස්තරය ආදී මැතිවරණ රාජකාරි සඳහා අවශ්‍ය තොරතුරු මාර්ග සිතියම් ද සහිතව ලබා ගැනීමට ඊ මැතිවරණ රාජකාරි (My eDuty) ඊ සේවාව හඳුන්වා දෙන ලදී.

මාර්ගගත ක්‍රමයට තැපැල් ඡන්ද අයදුම් කිරීමේ වැඩසටහන වැඩි දියුණු කරන ලද අතර ස්වයං මාර්ගගත අයදුම් කිරීම (Self-Online Applying), ආයතනික මාර්ගගත අයදුම් කිරීම (Certifying Officer Online Applying) සහ දත්ත මුද්‍රණය කර ගැනීමේ ක්‍රමය (අර්ධ මාර්ගගත ක්‍රමය) ( Semi Online Data Printing Applying) යන ක්‍රම 03 මගින් මාර්ගගත තැපැල් ඡන්ද අයදුම් කිරීමේ පහසුකම් ලබා දෙන ලදි. එමෙන්ම තැපැල් ඡන්ද කළමණාකරන පද්ධතිය වැඩි දියුණු කිරීම මගින් තැපැල් ඡන්ද ක්‍රියාවලිය වඩාත් පහසු කිරීම සිදුකරන ලදි.

සුහුරු ඡන්ද ප්‍රකාශ කිරීමේ ක්‍රමවේදයෙහි මූලික පියවර ලෙස නියමු ව්‍යාපෘතියක් ලෙස ඊ-ඡන්ද පොත (E Poll Book) හඳුන්වා දීම සිදු කරන ලදී.

දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සහ පක්ෂ තොරතුරු පරිගණක ගත කොට පක්ෂ පැතිකඩ නිර්මාණය සඳහා වන පරිගණක වැඩසටහන සම්පූර්ණ කිරීම සිදු කරන ලදී.

මැතිවරණ ආරවුල් නිරාකරණ කළමනාකරන පද්ධතිය (Electoral Dispute Resolution Management System) වැඩිදියුණු කරමින් භාවිතා කිරීම හා එය භාවිතය පිළිබඳ සියළුම තාක්ෂණික උපදෙස් අදාළ පාර්ශව වෙත ලබා දීම සිදුකරන ලදී. මෙම පද්ධතිය වඩා පහසුවෙන් භාවිතා කිරීම සඳහා ජංගම දුරකථන සඳහා ද භාවිතා කළ හැකි පරිදි EDR App යෙදවුම හඳුන්වා දීම සිදු කරන ලදී. එය පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025 දී සාර්ථක අන්දමින් භාවිතා කරන ලදී.

මෙරට ප්‍රමුඛතම තොරතුරු තාක්ෂණ සම්මාන උළෙල වන බ්‍රිතාන්‍ය පරිගණක සංගමයෙහි (BCS) ශ්‍රී ලංකා අංශය මගින් 26 වන වරට සංවිධානය කරන ලද ජාතික තොරතුරු තාක්ෂණ සම්මාන - 2024 (National ICT Awards – NBQSA 2024) සම්මාන උළෙලේ දී මහජනතාව සඳහා වැඩිදියුණු කළ රාජ්‍ය සේවාවන් සැපයීම හෝ මහජන සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා වන ඩිජිටල් මුලපිරීම් සඳහා කැප වූ අසමසම තොරතුරු තාක්ෂණ නවෝත්පාදනයන් සඳහා වන Digital Government in Public Sector and Government අංශය යටතේ පිරිනමන ලද රිදී සම්මානය මැතිවරණ කොමිෂන් සභාව මගින් හඳුන්වා දෙන ලද මැතිවරණ EDR පද්ධතිය සඳහා පිරිනමන ලදී.

එමෙන් ම, දේශපාලන පක්ෂ හා ස්වාධීන කණ්ඩායම් වල වත්කම් බැරකම් ප්‍රකාශ කිරීම සඳහා පද්ධතියක් සකස් කර පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025 සඳහා භාවිතා කරන ලදී.

පසුගිය වර්ෂවල දී ඉටු කළ ආකාරයට ම 2025 වර්ෂයේ සාමාන්‍ය ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට හා පරිපූරක නාමලේඛන වලට අදාළ ව වැඩසටහන් හඳුන්වා දීම හා යාවත්කාලීන කිරීම සිදු කරන ලද අතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන්ගේ කටයුතු පහසු කිරීම සඳහා පරිගණක වැඩසටහන් සකස් කිරීම/ වැඩිදියුණු කිරීම සිදු කරන ලදී.

ප්‍රධාන ඡන්ද හිමි නාමලේඛනය සහ සහතික කළ පරිපූරක නාම ලේඛන භාවිතා කරමින් ඉදිරි ප්‍රතිශෝධන කටයුතු සහ මැතිවරණ වලදී ඒකාබද්ධ ඡන්ද හිමි නාමලේඛන සකස් කර ගැනීමට සකස් කළ පරිගණක වැඩසටහන යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

ප්‍රතිශෝධන කටයුතු සඳහා ඒකාබද්ධ නාම ලේඛන භාවිතයෙන් නව දත්ත මුද්‍රිත ගණන් ගැනීමේ ආකෘති පත්‍ර, බහු ලියාපදිංචි ලැයිස්තු ආදිය මුද්‍රණය සඳහා සකස් කළ පරිගණක වැඩසටහන යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම සිදු කරන ලදී.

දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයීය නිලධාරීන්ට පරිගණක වැඩසටහන මගින් ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනයේ කටයුතු සිදු කිරීමේදී අවශ්‍ය තාක්ෂණික උපදෙස් හා මග පෙන්වීම් ලබා දීමත්, ඡන්ද හිමි නාමලේඛන උපුටන ලබා ගැනීමේදී අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීමත් වර්ෂය පුරා අදාළ කාලවලදී අඛණ්ඩව සිදු කරන ලදී.

මීට අමතරව මැතිවරණ කොමිෂන් සභාවේ අභ්‍යන්තර පරිපාලන කටයුතු පහසු කිරීම සඳහා පහත සඳහන් පරිගණක වැඩසටහන් නිර්මාණය කරන ලද අතර ඒවා 2025 වසර තුළ දී වැඩිදියුණු කරමින් පවත්වාගෙන යන ලදී.

- ❖ ප්‍රධාන කාර්යාලයේ සියළුම නිලධාරීන්ට මාර්ගගතව නිවාඩු අයදුම් කිරීම සඳහා නිවාඩු කළමනාකරණ පද්ධතියක් (Leave Management System) පවත්වා ගෙන යාම. 2026 වර්ෂය තුල දී නිවාඩු කළමනාකරණ පද්ධතිය සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා ද භාවිතා කළ හැකි පරිදි වැඩි දියුණු කර ඇත.
- ❖ මැතිවරණ කොමිෂන් සභාවේ රථවාහන කළමනාකරණ පද්ධතිය (Vehicle Management System) සංවර්ධනය කරමින් පවත්වා ගෙන යාම.
- ❖ ගිණුම් කටයුතු සිදු කිරීම සඳහා වියදම් කළමනාකරණ පද්ධතිය (Expenditure Management System) සංවර්ධනය කරමින් පවත්වා ගෙන යාම.
- ❖ උපාය මාර්ග අධීක්ෂණ පද්ධතිය (Strategic Plan Monitoring System) සංවර්ධනය කරමින් පවත්වාගෙන යාම.

- ❖ ප්‍රසම්පාදන සැලැස්ම අධීක්ෂණ පද්ධතිය (Procurement Plan Monitoring System) සංවර්ධනය කිරීම.
- ❖ පෞද්ගලික දත්ත ගබඩා කිරීමේ වැඩසටහන (HRIM) සංවර්ධනය කරමින් පවත්වාගෙන යාම.
- ❖ අභ්‍යන්තර පද්ධති සකස් කිරීම හා ඒවා නඩත්තුව පහසු කිරීම සඳහා EC System Development Frame Work සකස් කිරීම.
- ❖ අනෙකුත් සියළුම අභ්‍යන්තර පද්ධති වල පරිශීලකයන් කළමනාකරණයට අවශ්‍ය අභ්‍යන්තර පද්ධති පරිපාලන කළමනාකරණ පද්ධතිය සකස් කිරීම.
- ❖ මැතිවරණ කොමිෂන් සභාවේ සිදු කරන කොන්ත්‍රාත් කටයුතු අධීක්ෂණ පද්ධතිය (Contract Program Monitoring System) සංවර්ධනය කර අවසන් කිරීම.
- ❖ වත්කම් කළමනාකරණ පද්ධතියේ (Assets Management System) පලමු අදියර සංවර්ධනය කර අවසන් කිරීම.
- ❖ මැතිවරණ කොමිෂන් සභාවේ රැස්වීම් කළමනාකරණය පද්ධතිය (Meeting Management System) පද්ධතිය හඳුන්වා දීම.
- ❖ ආයතනයේ පවතින සම්පත් වෙන් කරවා ගැනීම් සිදු කර ගැනීම සඳහා පද්ධතියක් (Resource Booking System) සංවර්ධනය කර අවසන් කිරීම.
- ❖ නිලධාරීන් වෙත රාජකාරි යොමු කිරීම සඳහා වූ Task Assign පද්ධතිය සංවර්ධනය කර අවසන් කරන ලදී.
- ❖ ආයතනයේ මාණ්ඩලික නිලධාරීන් සඳහා වන Diary Management පද්ධතිය සංවර්ධනය කර අවසන් කිරීම.
- ❖ මැතිවරණ කොමිෂන් සභාව සඳහා ඉගෙනුම් කළමණාකරන පද්ධතියක් (Learn Management System - Moodle LMS) ස්ථාපිත කිරීම.
- ❖ පරිගණක හා පරිගණක උපාංග වල මතු වන ගැටළු නිරාකරණය පහසු කිරීම සඳහා වූ Issue Tracking Management පද්ධතිය සංවර්ධනය කර අවසන් කිරීම.
- ❖ දේශපාලන පක්ෂ කළමණාකරණ පද්ධතියේ පළමු අදියර සංවර්ධනය කර අවසන් කිරීම.

### 2.24.2. මැතිවරණ ක්‍රියාවලියට අදාළ පාර්ශවකරුවන්හට ඊ සේවා සැපයීම

ග්‍රාම නිලධාරී ඊ සේවාව වැඩි දියුණු කිරීම හා භාවිතය ඉහල නැංවීම සිදු කරන ලදී. මෙහි දී එක් දිස්ත්‍රික්කයක (යාපනය දිස්ත්‍රික්කය) ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සම්පූර්ණයෙන්ම (100%) ග්‍රාම නිලධාරි ඊ සේවාව හරහා සිදු කිරීම හා අනෙකුත් දිස්ත්‍රික්කයන්හි ග්‍රාම නිලධාරී ඊ සේවාව භාවිතා කරන ග්‍රාම නිලධාරීන් සංඛ්‍යාව ඉහල නැංවීම.

පාසල් සිසුන් මාර්ගගත ක්‍රමයට ලියාපදිංචි වීම සඳහා පාසල් සම්බන්ධීකරණ ගුරුවරුන් වෙනුවෙන් "යොවුන් පුරවැසි ගුරු සේවා ද්වාරය" ඊ සේවාව හඳුන්වා දීම හා පාසල් සිසුන් යොවුන් පුරවැසියන් ලෙස ලියාපදිංචි කිරීමට අදාළ පරිගණක වැඩසටහන වැඩි දියුණු කරන ලදී.

ඊ සේවා භාවිතය සඳහා තාක්ෂණික ශක්‍යතාව අල්ප ප්‍රජාවට සහාය වීම සඳහා ඊ සේවා අවධිකරුවන් (Eservices Awaker) ලෙස කටයුතු කිරීම වෙනුවෙන් පුහුණු කරුවන් ලෙස පුහුණු කිරීම සඳහා ඊ සේවා අවධිකරුවන් (Eservices Awaker) පුහුණු කිරීමේ වැඩසටහන හඳුන්වා දෙන ලදී.

ආන්තික ප්‍රජාව (වැදි ජනතාව, කඳුකර දෙමළ ප්‍රජාව, දූපත් වාසීන්) වෙත මැතිවරණ ඊ සේවා භාවිතා කිරීමට සහාය වීම සඳහා එම ප්‍රජාව නියෝජනය කරන තරුණ තරුණියන් ඊ සේවා අවධිකරුවන් ලෙස (Eservices Awaker) පුහුණු කිරීමේ වැඩසටහන හඳුන්වා දෙන ලදී.

පාසල් සිසුන් මැතිවරණ ඊ සේවාව හරහා යොවුන් පුරවැසියන් ලෙස ලියාපදිංචිය සඳහා පාසල් මට්ටමින් වැඩසටහනක් සංවිධානය කරන ලදී.

යොවුන් පුරවැසියන් ලෙස මැතිවරණ ඊ සේවාව හරහා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කිරීමට පාසල් සිසුන්ට සහාය වීම සඳහා පුහුණු කරුවන් නිර්මාණය සඳහා වැඩසටහනක් හඳුන්වා දෙන ලදී.

බිහිරි පුද්ගලයන් හට මැතිවරණ කොමිෂන් සභාව මගින් ලබා දෙන සේවාවන් සංඥා භාෂාවෙන් ලබා දීම සඳහා අංකිත (Digital) සංඥා භාෂා උපකාරක සේවය හඳුන්වා දෙන ලදී.

ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි පුරවැසියන් හට තමාගේ පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කිරීමට 2015 වසරේ සිට මේ දක්වා සහතික කළ ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි තොරතුරු ඇතුළත් ඡන්දහිමි ලියාපදිංචි ප්‍රකාශය දවසේ ඕනෑම අවස්ථාවක අන්තර්ජාල පහසුකම් සහිත සුහුරු ජංගම දුරකතනයක්, පරිගණකයක් හෝ වෙනත් එවැනි උපකරණයන් හරහා මෙම සේවාව මුදල් ගෙවීමකින් තොරව ලබා ගැනීමට සේවා සපයන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය භාෂා ත්‍රිත්වයෙන්ම යාවත්කාලීන කර අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ විශේෂයෙන් ම දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීම සම්බන්ධ තොරතුරු, දේශපාලන පක්ෂ ලැයිස්තුව, මාධ්‍ය නිවේදන, මාධ්‍ය උපමාන , ගැසට් හා චක්‍රලේඛ ආදී තොරතුරු වර්ෂය පුරා භාෂා ත්‍රිත්වයෙන් මැතිවරණ නිල වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

එසේම පුළුල් ලෙස සමාජය තුළ ව්‍යාප්ත වූ සමාජ මාධ්‍ය ජාල භාවිතා කරමින් මහජනතාව වෙත යාවත්කාලීන තොරතුරු කඩිනමින් ලබා දීම මගින් මැතිවරණ ක්‍රියාවලිය කාර්යක්ෂම කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ භාවිතය ඉවහල් කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය හා නිල සමාජ මාධ්‍යජාල ආබාධිත පුද්ගල හිතකාමී ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා කටයුතු කරන ලදී.

රජයේ පාසල් සඳහා පළමු වසරට ළමුන් ඇතුළත් කිරීමේ දී අවශ්‍ය ඡන්දහිමි නාමලේඛන විස්තර මැතිවරණ කොමිෂන් සභාව අනුමත කළ මිල ගණන් යටතේ මාර්ගගත ක්‍රමයට ආරක්ෂාකාරී ලෙස පාසල් වෙත ලබා දීම සිදු කරන ලදී. එසේම මෙම පහසුකම කොට්ඨාස අධ්‍යාපන කාර්යාල හා කලාප අධ්‍යාපන කාර්යාල වෙත නොමිලේ ලබා දීම සිදු කරන ලදී.

එයට අමතරව පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යනාදියට ඡන්දහිමි නාමලේඛන ලියාපදිංචි තොරතුරු මාර්ගගත ක්‍රමයට ලබා දීමට අදාළ තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ සියළු පාර්ශවකරුවන් මැතිවරණ ක්‍රියාවලිය හා සම්බන්ධිත කරුණු පිළිබඳව දැනුම හා අධ්‍යාපනය ලබා දීම සඳහා අධ්‍යාපනය සහ මැතිවරණ දායකත්වය සඳහා වන පද්ධතිය (VEEE) පවත්වාගෙන යාම හා සංවර්ධනය කිරීම සිදු කරන ලදී.

මාර්ගගත ලියා පදිංචිය ඇතුළු මැතිවරණ ඊසේවා භාවිතයේදී ජනතාවට මතුවන ගැටළු විසඳා ගැනීමට අදාළ නිලධාරීන් සම්බන්ධ කර ගැනීම සඳහා වට්ස් ඇප් හා ඊ මේල් ගිණුමක් සකස් කර පවත්වා ගෙන යාම 2025 වර්ෂයේ දී ද සිදු කරන ලදී.

වෙබ් අඩවිය හා සමාජ මාධ්‍ය ජාලා හරහා ලැබෙන මහජන පැමිණිලි නියමිත පාර්ශව වෙත යොමු කර ඒ සඳහා පිළිතුරු ලබා දීම වැනි කටයුතු ද වර්ෂය පුරා අඛණ්ඩව සිදු කරන ලදී.

ඊ සේවා භාවිතාකරුවන් හට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම සන්නිවේදන මෘදුකාංග භාවිතයෙන් වඩාත් කාර්යක්ෂම ලෙස සිදුකරන ලදි.

ජනතාවට වඩාත් හොඳ සේවාවක් ලබා දීම සඳහා මැතිවරණ ඊ සේවා පිළිබඳ නව සුහුරු අත් පත්‍රිකාවක් හඳුන්වා දීම සිදුකරන ලදි.

මීට අමතරව ප්‍රධාන කාර්යාලයේ හා සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කාර්යාලයීය ඊ මේල් සේවාව ආරක්ෂිත ක්‍රමවේදයන්ට යටත්ව පවත්වාගෙන යාම සිදු කරන ලදී.

### 2.24.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කටයුතු

ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල පවතින තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම වර්ෂය පුරා අඛණ්ඩව සිදු කරන ලදී. එහිදී ප්‍රධාන කාර්යලයේ පිහිටුවා ඇති දත්ත මධ්‍යස්ථානයේ සේවා පවත්වා ගැනීම, උපස්ථ ලබා ගැනීම ආදී කටයුතු ඉටුකිරීම සහ නඩත්තු කටයුතු අදාළ ආයතන මඟින් ඉටු කරවා ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ අංශ ඇතුළු දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල පරිගණක, පරිගණක උපාංග, පරිගණක ජාල, VPN ජාලය, ෆයර්වෝල් සහ ADSL අන්තර්ජාල පද්ධති ආරක්ෂාකාරී ලෙස පවත්වා ගෙන යාම හා නියමිත පරිදි නඩත්තු කටයුතු සිදු කිරීම වසර පුරා අඛණ්ඩව ඉටු කරන ලදී.

මාර්ගගත ක්‍රමවේදයන් භාවිතා කරමින් ප්‍රධාන කාර්යාලය, සියළුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හා බාහිර පාර්ශවයන් සඳහා රැස්වීම් පැවැත්වීම සඳහා වූ Video Conferencing තාක්ෂණික සහය ලබා දීම සිදු කරන ලදී.

ප්‍රධාන කාර්යාලයේ ආරක්ෂක කැමරා පද්ධතිය (CCTV) පුළුල් කිරීම හා ඒ සම්බන්ධ කටයුතු වර්ෂය තුළ අඛණ්ඩව සිදු කරන ලදී.

### 2.25. මූල්‍ය හා විගණන තොරතුරු

2025 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව වැය ශීර්ෂ 020 යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත රු. මිලියන 21,487ක ප්‍රතිපාදන වෙන් කර දී ඇති අතර පළාත් පාලන සහ පළාත් සභා ඡන්ද විමසීම වෙනුවෙන් 7-1409 වැය විෂයය යටතේ රු. මිලියන 20,000 ක් වෙන්කර තිබූ අතර පළාත් සභා ඡන්ද විමසීම නොපැවැත්වීම හේතුවෙන් රු. මිලියන 9,000ක් අංක EH/F9/ප්‍ර.නැප.(පොදු)/2025 හා 2025.12.11 දිනැති ලිපියෙන් ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නැවත පවරා දෙන ලදී. ඒ අනුව 020 වැය ශීර්ෂය යටතේ වියදම් දැරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත රු. මිලියන 12,487ක් ප්‍රතිපාදන වෙන් විය. ඉන් රු. මිලියන 12,278ක් පුනරාවර්ථන වියදම වෙනුවෙන් ද රු. මිලියන 209ක්

ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ද වෙන්කර දී ඇත. 2025 වර්ෂයේ පුනරාවර්ථන වියදම රු. මිලියන 10,452ක් වූ අතර, ප්‍රාග්ධන වියදම රු. මිලියන 125ක් විය. ප්‍රතිශතයක් ලෙස පුනරාවර්ථන වියදම 85.12%ක් වූ අතර ප්‍රාග්ධන වියදම 60% ක් විය. 2025 වර්ෂයේ 7-1409 වැය විෂය යටතේ මැතිවරණ පැවැත්වීම් වෙනුවෙන් රු. මිලියන 11,000ක ප්‍රතිපාදනවලින්, 2024 වර්ෂයේ පැවති ජනාධිපතිවරණය, පාර්ලිමේන්තු මැතිවරණය සහ ඇල්පිටිය ප්‍රාදේශීය සභා ඡන්ද විමසීමට අදාළ වියදම් ද, 2025 වර්ෂයේ පැවති පළාත් පාලන ආයතන ඡන්ද විමසීම වෙනුවෙන් දරන ලද වියදම් ද සඳහා රු. මිලියන 9,297 ක් ලෙස වියදම් දර ඇත. එය ප්‍රතිශතයක් ලෙස 84.5% වේ. 2024 වර්ෂය සමඟ සසඳා බලන විට 2024 වර්ෂයේ පුනරාවර්ථන වියදම රු. මිලියන 14,338ක් ද, ප්‍රාග්ධන වියදම රු. මිලියන 89.6ක් ද විය.

2025 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන පිළියෙල කිරීමට හා ප්‍රතිශෝධනය කිරීමට අදාල කටයුතු සඳහා රු. මිලියන 198.4 ක් වැය වූ අතර, තව දුරටත් ගෙවීමට ඇති රු. 812,000 කට ආසන්න මුදල ද එකතු වූ විට වැය වී ඇති මුළු මුදල දළ වශයෙන් රු. මිලියන 199.2 ක් වේ. 2024 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන පිළියෙල කිරීමට අදාල කටයුතු වෙනුවෙන් රු. මිලියන 236.2 සමඟ සසඳා බැලීමේ දී 2025 වර්ෂය සඳහා වැය වූ වියදම සාපේක්ෂව අඩු අගයක් පෙන්නුම් කරයි. ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම සහ ප්‍රතිශෝධනය අඩු පිරිවැයකින් යුතු නව ක්‍රම උපයෝගී කර ගනිමින් සිදු කිරීම හේතුවෙන් ඒ සඳහා වැය වන ප්‍රතිපාදන අඩුකරගත හැකිවිය.

2025 වර්ෂයේ දී ආපදා ණය/ විශේෂ අත්තිකාරම්/ උත්සව අත්තිකාරම් ඉල්ලුම් කළ නිලධාරීන් හා සේවකයින් වෙනුවෙන් රු. මිලියන 31.7 ක පමණ ණය අත්තිකාරම් මුදල් ලබා දී ඇත. 2025 වර්ෂයේ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සීමාව රු. මිලියන 32කි. පසුගිය වර්ෂය හා සසඳා බලන විට 2025 වර්ෂයේ ලබා දී ඇති ණය අත්තිකාරම් ප්‍රමාණය රු. මිලියන 14ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. 2024 වර්ෂයේ උපරිම වියදම් සීමාව රු. මිලියන 18කි.

2025 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන උපුටන නිකුත් කිරීමේ ආදායම රු. මිලියන 6.65 කි. 2024 වර්ෂයේ මෙම ආදායම රු. මිලියන 6.21 ක් වූ අතර 2024 වර්ෂය හා සසඳා බැලීමේ දී 2025 වර්ෂයේ රු. මිලියන 0.44 කින් ආදායම වැඩි වී තිබේ.

ඡන්දහිමි නාමලේඛනය පොත් වශයෙන් ලබාදීම සීමාකර ඇත. සංයුක්ත තැටි වශයෙන් පිළියෙල කරනු ලබන අතර ඒවා අලෙවි කිරීමේදී 2025 වර්ෂයේ රු. මිලියන 4.28ක ආදායමක් උපයාගෙන ඇත. 2024 වර්ෂයේ මෙම ආදායම හා සසඳා බලන විට 2025 වර්ෂයේ රු. මිලියන 2.28 කින් ආදායම වැඩි වී ඇත.

2025 වර්ෂය තුළදී විවිධ විෂයයන් යටතේ විගණන විමසුම් 10 ක් ජාතික විගණන කාර්යාලයෙන් ඉදිරිපත් කර ඇත. එම විගණන විමසුම් 10 සඳහාම පිළිතුරු ලබාදී ඇත.

### 2.26. අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු

මැතිවරණ කොමිෂන් සභාවේ අධීක්ෂණය යටතේ පවතින මැතිවරණ මහලේකම් කාර්යාලයේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල අභ්‍යන්තර විගණන කටයුතු ඉටුකිරීමේදී ජාතික විගණන පනත, මුදල් රෙගුලාසි හා කළමනාකරණ විගණන චක්‍රලේඛවල දක්වා ඇති නියමයන් අනුව අභ්‍යන්තර විගණන අංශයට පැවරී තිබූ ව්‍යවස්ථාපිත රාජකාරී 2025 වර්ෂය තුළදී ඉටුකරන ලදී.

ඒ අනුව ජාතික විගණන පනතේ 41(2) වගන්තියෙහි දක්වා ඇති විධිවිධාන පරිදි 2025 වර්ෂය තුළ කළමනාකරණ විගණන කමිටු 3 ක් සංවිධානය කරන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව තුළ ඵලදායී කාර්ය සාධනයක් තහවුරු කිරීම සඳහා ඒ ඒ විගණන ක්ෂේත්‍රවලට අයත් වඩාත්ම අවදානම් සහිත ක්‍රියාකාරකම් පරීක්ෂා කිරීම සඳහා අවධානය යොමු කරන ලදී.

2025 වර්ෂය තුළ පවත්වන ලද පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සම්බන්ධයෙන් පශ්චාත් විගණන විමසුම් අවම කිරීම අරමුණු කර ගනිමින් විගණන ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය වන පරිදි චක්‍රලේඛයක් අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරන ලදී. තවද මැතිවරණ කටයුතු සඳහා ඍජු දායකත්වයක් සපයනු ලබන සහ මැතිවරණ කොමිෂන් සභාව විසින් මුදල් ප්‍රතිපාදන වෙන්කර දෙනු ලබන රජයේ ආයතන දෙකක් වන තැපැල් දෙපාර්තමේන්තුව සහ පොලිස් දෙපාර්තමේන්තුව වෙත ද වියදම් කළමනාකරණය සහ විධිමත් වාර්තාගතකරණය පිළිබඳ පූර්වෝපායයන් සහ උපදෙස් ලබා දෙන ලදී. ඒ අනුව වඩාත් පාලනයක් සහිතව මැතිවරණ වියදම් දැරීමට අවශ්‍ය මූලික මඟපෙන්වීම් මෙම අංශය විසින් සිදුකර ඇත.

2025 වර්ෂයේ පළවන සහ දෙවන කාර්තු තුළ පැවති පළාත් පාලන ඡන්ද විමසීමේ මූලික සංවිධාන සහ පශ්චාත් මැතිවරණ රාජකාරී පැවති අතර පළාත් පාලන ඡන්ද විමසීමට අදාළව මැතිවරණ ආරවුල් නිරාකරණය ඒකකයේ රාජකාරීද සමඟ 90% ක ක්‍රියාත්මක ප්‍රගතියක් අත්පත් කරගැනීමට මෙම අංශයට හැකි වී තිබේ.

මැතිවරණ මහලේකම් කාර්යාලයේ එක් එක් අංශය සම්බන්ධයෙන් විගණන පරීක්ෂා කිරීම් 01ක්, 2024 වර්ෂයේ පැවති ජාතික මැතිවරණ දෙකට අදාළව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සම්බන්ධයෙන් අතුරු විගණන පරීක්ෂණ 19 ක් සිදුකල අතර 2024 වර්ෂයේ අවසන් කාර්තුවේ සිදුකළ අතුරු විගණන පරීක්ෂා කිරීම් 6 සමඟ අතුරු විගණන වාර්තා 25 ක් 2025 වර්ෂයේදී නිකුත් කරන ලදී. එමෙන්ම එම ජාතික මැතිවරණ දෙක සම්බන්ධයෙන් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල 11 ක් පූර්ණ විගණනයට ලක්කර ඇති අතර වාර්තා 02 ක් නිකුත් කර ඇත. මීට අමතරව 2025 වර්ෂයේදී විමර්ශන 09ක් සම්බන්ධව කටයුතු කර ඇති අතර ඉන් විමර්ශන 02 ක් 2024 වර්ෂයේ අවසන් කාර්තුවේ අවසාන භාගයේ සිදුකරන ලද විමර්ශන වූ නමුත් විමර්ශන වාර්තා ඉදිරිපත් කර ඇත්තේ 2025 වර්ෂයේදීය. 2025 වර්ෂය තුළ නිකුත් කර ඇති සම්පූර්ණ විමර්ශන වාර්තා සංඛ්‍යාව 08කි. නිකුත් කරන ලද සියලුම අභ්‍යන්තර විගණන වාර්තා සම්බන්ධයෙන් ජාතික විගණන පනතේ 40(4)(3) උපවගන්තිය යටතේ කටයුතු කර තිබේ.

ඉහත සඳහන් කර ඇති විගණන නිරීක්ෂණ ඇසුරින් ඉදිරි මැතිවරණ හා ඡන්ද විමසීම් සම්බන්ධයෙන් පැන නගින විගණන විමසුම් අවම කිරීම අරමුණු කරගත් නව අභ්‍යන්තර පාලන උපක්‍රම සහ මැතිවරණ ක්‍රියාදාමයේ සාධනීය බව තහවුරු කෙරෙන පූර්වෝපායයන් පිළිබඳව යෝජනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

**2.27. ඉදිරි ඉලක්ක**

ඉදිරියේදී, ව්‍යවස්ථාපිතව පැවරී ඇති ඡන්දහිමි නාමලේඛණ ප්‍රතිශෝධනයට අදාළ කටයුතු මෙන්ම, සුදුසුකම්ලත් කිසිවෙකු අත්නොහැරෙන පරිදි, සියලු දෙනා ඇතුළත් ඡන්ද විමසීම් පැවැත්වීම.

රසික පීරිස්
මැතිවරණ කොමසාරිස් ජනරාල්

රසික පීරිස්
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාවත, රාජගිරිය

# 03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

## 3.1 මූල්‍ය කාර්යසාධනය

ඒසීඒ-එෆ්

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය**

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 | | සටහන | කතාය 2025 | 2024 | |
|---|---|---|---|---|---|
| රු. | | | රු. | රු. | |
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | **1** | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | **2** | - | - | **ඒසීඒ-1** |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | **3** | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | **4** | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 6,437,099,867 | 7,800,394,000 | **ඒසීඒ-3** |
| - | තැන්පතු | | 177,363,564 | 19,375,496 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගිණුම් | | 36,830,411 | 35,094,414 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **6,651,293,842** | **7,854,863,910** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **6,651,293,842** | **7,854,863,910** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | | | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **6,651,293,842** | **7,854,863,910** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 718,250,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 710,961,736 | 593,328,155 | |
| 11,556,750,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 9,739,052,211 | 13,742,335,691 | **ඒසීඒ-2(ii)** |
| 3,000,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 2,818,625 | 2,892,376 | |
| - | පොළී ගෙවීම් | **8** | | | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | | | |
| **12,278,000,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **10,452,832,572** | **14,338,556,222** | |
| | **මූලධන වියදම්** | | | | |
| 99,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 33,700,430 | 29,742,803 | |
| 108,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | **11** | 89,944,955 | 58,577,962 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | | | **ඒසීඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | | | |
| 2,000,000 | හැකියා වර්ධනය | **14** | 1,765,400 | 1,300,337 | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | | | |
| **209,000,000** | **මුළු මූලධන වියදම් (උ)** | | **125,410,785** | **89,621,102** | |
| | තැන්පතු ගෙවීම් | | 292,189,730 | 9,210,475 | **ඒසීඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 39,351,316 | 27,091,269 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | | | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **331,541,046** | **36,301,744** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 10,909,784,403 | 14,464,479,068 | |
| | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (4,258,490,561) | (6,609,615,158) | |
| | **ශේෂය** | | (4,258,490,561) | (6,609,615,158) | **ඒසීඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | | | **ඒසීඒ-3** |
| | | | (0) | - | |

1

## 2025 දෙසැම්බර් 31 දිනට
## මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| | සටහන | කතය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,665,346,947 | 2,463,295,691 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 92,057,327 | 89,536,422 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| මුළු වත්කම් | | **2,757,404,274** | **2,552,832,113** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 32,649,639 | (84,697,432) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,665,346,947 | 2,463,295,691 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | **ඒසීඒ-5(බී)** | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 59,407,688 | 174,233,854 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| මුළු වගකීම් | | **2,757,404,274** | **2,552,832,113** |

පිටු අංක 7 සිට 22 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 23 සිට 30 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 18 දරණ විගණන පනතේ 38(1)(ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2026 . 02. 23 | දිනය : 2026 - 02. 23 | දිනය : 26/2/23 |
| රසික පීරිස් මැතිවරණ කොමසාරිස් ජනරාල් මැතිවරණ කොමිෂන් සභාව සරණ මාවත, රාජගිරිය. | රසික පීරිස් මැතිවරණ කොමසාරිස් ජනරාල් මැතිවරණ කොමිෂන් සභාව සරණ මාවත, රාජගිරිය. | කේ. එස්. පී. පෙරේරා ප්‍රධාන මූල්‍ය නිලධාරි මැතිවරණ කොමිෂන් සභාව සරණ මාවත, රාජගිරිය |

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | තථ්‍ය | |
|---|---|---|
| | | සංශෝධිත |
| | 2025 | 2024 |
| | රු. | රු. |
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| මුළු බදු ලැබීම් | | |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | |
| ලාභ | | |
| ආදායම් නොවන ලැබීම් | 120,381,492 | 80,621,056 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | |
| අග්‍රිම ලැබීම් | 6,437,099,867 | 7,800,394,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 37,033,590 | 39,960,375 |
| තැන්පතු ලැබීම් | 177,363,564 | 19,375,496 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **6,771,878,513** | **7,940,350,927** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 6,368,247,338 | 7,826,547,036 |
| සහනාධාර සහ මාරුකිරීම් | 2,818,625 | 2,892,376 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 1,470,434 | 1,226,479 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 38,021,008 | 26,737,839 |
| තැන්පතු ගෙවීම් | 292,189,730 | 9,210,475 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **6,702,747,135** | **7,866,614,205** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **69,131,378** | **73,736,722** |
| | | |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | | |
| ලාභාංශ | | |
| භිම්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | 678,631 | 375,031 |
| උප ණය අයකර ගැනීම් | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **678,631** | **375,031** |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම | 69,810,009 | 74,111,754 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **69,810,009** | **74,111,754** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ)** | **(69,131,378)** | **(73,736,723)** |
| | | |
| **ඇ) + (ඊ)** | **-** | **(0)** |
| **<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| | | |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| | | |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල්ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

## අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය

| | | |
|---|---|---|
| **වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය** වෙනුවෙන් එකතු කරන ලද ආදායම | - | |
| **අනෙකුත් ශීර්ෂ** වෙනුවෙන් **වාර්තාකරණ ආයතනය** විසින් දරන ලද වියදම් | 1,470,434 | |
| **අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ** ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද හර කිරීම් | 4,549,673 | |
| **අනෙකුත් ශීර්ෂ** විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද බැර කිරීම් | 1,330,308 | 7,350,415 |
| **අඩු කළා :** | | |
| **අනෙකුත් ආදායම් ශීර්ෂ** වෙනුවෙන්, **වාර්තාකරණ ආයතනය** විසින් එකතු කරන ලද ආදායම් | 121,060,123 | |
| **වෙනත් ආයතන විසින්, වාර්තාකරණ ආයතනය** වෙනුවෙන් දරන ලද වියදම් | 4,137,367,385 | |
| **අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්තාකරණ** ආයතනය විසින් අත්තිකාරම් "බී" ගිණුම වෙනුවෙන් කරන ලද බැර කිරීම් | 6,083,160 | |
| **අනෙකුත් ශීර්ෂ** විසින් අත්තිකාරම් "බී" ගිණුමට කරන ලද හර කිරීම් | 1,330,308 | 4,265,840,976 |
| **2025** දෙසැම්බර් **31** දිනට අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය | | **(4,258,490,561)** |

*** ඉහත සඳහන් අයිතමවලට අමතරව අදාළ වන අයිතමයන් ගැලපීම් කළ හැක.**

**3.2** මූල්‍ය ප්‍රකාශ සටහන්

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව රු.(මිලියන) | අවසන් ඇස්තමේන්තුව රු. (මිලියන) | ප්‍රමාණය රු.(මිලියන) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % |
| 20.02.02.99 | පොලිය - අනෙකුත් | 4.50 | 4.50 | 3.97 | 88 |
| 20.03.02.99 | විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් | 0.04 | 0.04 | 0.04 | 100 |
| 20.03.99.00 | විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම් | 14.00 | 14.00 | 77.18 | 551 |
| 20.02.01.01 | නිල නිවාස කුලී | 1.44 | 1.44 | 2.13 | 147 |
| 20.04.01.00 | වැන්දඹු අනත්දරු | 20.15 | 26.22 | 32.18 | 122 |
| 20.06.02.02 | ප්‍රාග්ධන විකුණුම් (අනෙකුත්) | 1.00 | 1.00 | 0.65 | 65 |

**3.2.1.** ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

අදාළ නැත

**3.2.2.** වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ග | වෙන්කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම රු. | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන රු. | අවසාන ප්‍රතිපාදන රු. | | |
| (1) පුනරාවර්තන | 12,278,000,000 | 12,278,000,000 | 10,450,832,572 | 85 |
| | | | | |
| (2) ප්‍රාග්ධන | 209,000,000 | 209,000,000 | 125,410,785 | 60 |

**3.2.3.** මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| 1 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | | 1140 | 1140 | 1140 | 100 |

### 3.2.4. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2025.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 288,660,133 | 288,660,133 | | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 928,409,587 | 928,409,587 | | 100% |
| 9153 | ඉඩම් | 1,338,539,612 | 1,338,539,612 | | 100% |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 109,737,614 | 109,737,614 | | 100% |
| 9180 | බදු දෙනලද වත්කම් | - | - | | - |

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/EC/2/25/5

ඔබේ අංකය / உமது இல. / Your No.

04 JUN 2026

දිනය / திகதி / Date 2026 මැයි 29 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
මැතිවරණ කොමිෂන් සභාව

**ශීර්ෂය 020 - මැතිවරණ කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 020 - මැතිවරණ කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවවෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මැතිවරණ කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණතත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.



අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව මැතිවරණ කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව මැතිවරණ කොමිෂන් සභාවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර,එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්

කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්,ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීදැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබූ රු.20,648,362 ක් වූ මුද්‍රණ යන්ත්‍ර 245 ක වටිනාකම ද්විගණනය වීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2025 දෙසැම්බර් 17 දිනැති අංක 02/2025 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය 8.2 ඡේදය අනුව තවදුරටත් වාර්තා කළ යුතු මූල්‍ය නොවන වත්කම් තිබේනම් ඒවා නිසි පරිදි හඳුනාගෙන පිරිවැයට හෝ පිරිවැය හඳුනාගත නොහැකි අවස්ථාවලදී තක්සේරු කළ අගයට ගිණුම්ගත කළ යුතු වුවද වත්කම් අයිතම 09 කට අදාල වත්කම් ඒකක 317 ක වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත නොකිරීමෙන් මූල්‍ය නොවන වත්කම් අඩුවෙන් ගිණුම් වල දක්වා තිබුණි.

(ඇ) 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් අපහරණය කළ යුතු ලෙස හඳුනාගන්නා ලද මූල්‍ය නොවන වත්කම් අයිතම 57 ක පිරිවැය හඳුනාගෙන මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාලව මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම යටතේ රජයේ මුදල් රෙගුලාසි 208 මඟින් අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම වූ රු.15,770,423 ක වටිනාකම ප්‍රාග්ධනීත කර තිබුණි.

(ඉ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම යටතේ රු.678,631 ක ශේෂයක් දක්වා තිබුණද එම අපහරණය කල වත්කම් වල පිරිවැය මූල්‍ය නොවන වත්කම් වලින් ඉවත් නොකිරීමෙන් මූල්‍ය නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් ශේෂයන් Boss Report අනුව ශේෂය හා සැසඳීමේදී භාණ්ඩ අයිතම 07 ක භාණ්ඩ 5,009 ක ඌණතාවයක් නිරීක්ෂණය විය.

**1.6.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම හා මූලධන වත්කම් අත්පත් කර ගැනීම වැය විෂයයන් යටතේ රජයේ මුදල් රෙගුලාසි 208 මගින් අනෙකුත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් දැරූ වියදම් රු.55,600,776 ක් ගිණුම්ගත කර තිබුණද එම වියදම් සනාථ කර ගැනීමට අදාල කිසිදු ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

(අ) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4 ඡේදයට අනුව ඉන්ධන දීමනාව හා ප්‍රවාහන දීමනාව හිමි නිලධාරින්ට අනුමත කර ඇති අතිරේක ඉන්ධන ප්‍රමාණය දැක්වෙන ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ආ) මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ PRE/2024/16 සහ අංක PE/2024/35 දරන චක්‍රලේඛය අනුව කුරුණෑගල දිස්ත්‍රික්කයට අදාළව ඉන්ධන නිකුත්කිරීමේ ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවද, 2024 ජනාධිපතිවරණයට අදාලව රු.11,939,999 ක්හා පාර්ලිමේන්තු මැතිවරණයට අදාලව රු.11,246,845 ක් ඉන්ධන සඳහා ගෙවීම් කර තිබුණද, ප්‍රවාහන කමිටුව මගින් නිකුත්කරන ලද ඉන්ධන සඳහා නඩත්තු කළ එවැනි ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ඇ) මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ 2024 අගෝස්තු 18 දිනැති අංක PRE/2024/40 දරන චක්‍රලේඛයේ 10 වගන්තියට අනුව හා 2024 ඔක්තෝබර් 13 දිනැති අංක PRE/2024/40 දරන චක්‍රලේඛයේ කුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලය කුලී පදනම මත ලබාගත් වාහන සඳහා 2024 ජනාධිපතිවරණයට අදාලව රු.12,601,106 ක් ද පාර්ලිමේන්තු මහමැතිවරණය සඳහා රු.12,836,903 ක් ද ගෙවීම් කර තිබුණද, කුලී පදනම මත යොදාගත් වාහන සම්බන්ධ තොරතුරු ඇතුලත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඈ) මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ 2024 ඔක්තෝබර් 13 දිනැති අංක PRE/2024/38 දරන චක්‍රලේඛයට අනුවකුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය පාර්ලිමේන්තු මැතිවරණය සඳහා කුලී පදනම මත යොදාගත් වාහන සඳහා රු.12,836,903 ක් ගෙවා තිබුණද චක්‍රලේඛයේ 10 වගන්තිය ප්‍රකාරව ප්‍රවාහන කමිටුව මගින් ලේඛනයක් පිළියෙල කර නොතිබූ අතර, චක්‍රලේඛයේ 12 වගන්තියට අනුව එකී ලේඛණය නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස් භාරයේ තබාගත යුතු වුවත් එවැනි ලේඛනයක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි

**2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

(අ) රජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු නිසි පරිදි පිළියෙළ කර නොමැති වීම හේතුවෙන් වැය විෂයයන් 21 ක සියයට 05 සිට සියයට 70 දක්වා පරාසයක ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුලදී උපයෝජනය කර නොතිබුණි.

(ආ) රජයේ මුදල් රෙගුලාසි 66 මගින් එක් වැය ශීර්ෂයට මාරු කර තිබූ රු.1,000,000 ක මුළු ප්‍රතිපාදන මුදලම වර්ෂය අවසානය වන විටත් වියදම් උපයෝජනය කර නොතිබුණි.

### 3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) රජයේ මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ඇත්නම් විනා වැඩක්,සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට නොබැඳී සිටිය යුතු වුවද වැය විෂයයන් 03ක් සඳහා රු.3,109,944 ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) රජයේ මුදල් රෙගුලාසි 94(2) ප්‍රකාරව එළඹිය හැකි උපරිම බැඳීම් සීමා ලෙස වැය විෂයයන් 15 ක එකතුවරු.360,549,500ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එය රු.354,396,167ක් ලෙස නිවැරදි විය යුතු අතර ඒ අනුව රු.6,153,333 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) මෘදුකාංග නඩත්තු වැය විෂය යටතේ රු.1,706,314 ක බැරකමක් මූල්‍ය ප්‍රකාශන වල ඇමුණුම (iv) යටතේ දක්වා තිබූ අතර 2026 වර්ෂයේදී එම වියදම වාහන රක්ෂණ වැය විෂයය යටතේ දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු.12,677,717 ක් වූ බැරකම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ ඇමුණුම (iv) බැරකම් ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

### 3.3 නීති රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2008 ජුනි 26 දිනැති අංක 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 04 වගන්තිය | නිල වාහන සඳහා ඉන්ධන දීමනාව හිමි නිලධාරීන්ට අතිරේක ඉන්ධන සඳහා ප්‍රතිපාදන ලබා නොදිය යුතු බව සඳහන් වුවද ඉන්ධන දීමනාව හිමි නිලධාරීන් 08 දෙනෙකු වෙත රු.1,941,853 ක ඉන්ධන ලීටර් 7,501 ක් අතිරේකව ලබා දී තිබුණි. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 වගන්තිය | කොමිෂන් සභාව සතු වාහන 49 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. |

### 3.4 බැංකු ගිණුම් මෙහෙයවීම

2025 වර්ෂයට අදාල බැංකු සැසඳුම අනුව කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ අප්‍රේල් මාසයට අදාලව වියදම් නිර්දේශ කර අනුමත කර තිබූ රු. 307,573 ක් වටිනා වවුචර්පත් 28 ක් මුදල් පොතේ සටහන් කර තිබුණද ඒ සඳහා චෙක්පත් ලියා නොතිබුණි. එම වෙනස බැංකු සැසඳුමේ අප්‍රේල් සිට ඔක්තෝම්බර් දක්වා ඉදිරියට ගෙනගොස් තිබූ අතර ඔක්තෝම්බර් මාසයේදී සිහිවටන වවුචර්පතක් මගින් අදාල මුදල ලැබීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 මැතිවරණ වියදම්

(අ) 2024 සැප්තැම්බර් 21, නොවැම්බර් 14 සහ 2025 මැයි 06 දිනයන්හිදී පැවැත්වූ ජනාධිපතිරණය, මහ මැතිවණය හා පළාත් පාලන මැතිවරණය සඳහා වූ වියදම පිළිවෙලින් රු.මිලියන 7,447 ක්, රු.මිලියන 7,667 ක් සහ රු.මිලියන 7,393 ක් වූ අතර වියදමින් සියයට 60 ක් මැතිවරණ කොමිෂන් සභාව විසින්ද 12 ක් තැපැල් දෙපාර්තමේන්තුව විසින්ද සියයට 14 ක් පොලිස් දෙපාර්තමේන්තුව විසින්ද ඉතිරි සියයට 14 මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් ද දරා තිබුණි.

(ආ) 2024 ඔක්තෝම්බර් 09 දිනැති අංක IADV/A&MC/2024 දරන මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ ලිපිය පිරිදි 2024 ඔක්තෝබර් 14 දින පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයේදී වෙනත් දෙපාර්තමේන්තු වෙත ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන පිළිබඳ වාර්තා අදාල දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක විසින් විගණනය කරන ලද වාර්තා මැතිවරණ පවත්වා තුන් මසක කාලයක් ඉක්ම වීමට පෙර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල යුතු බව දැනුම් දී තිබුණද මූල්‍ය ප්‍රතිපාදන ලබාගත් කිසිදු දෙපාර්තමේන්තුවකින් එසේ මාස 3 ක් ඇතුලත විගණිත වියදම් වාර්තා ලබා දී නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් චක්‍රලේඛය නිකුත් කල මැතිවරණ කොමසාරිස් විසින්ද විධිමත් අවධානයක් යොමුකිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරණය, මහමැතිවරණය සහ පලාත් සභා මැතිවරණය සඳහා දරන ලද වියදමෙන් පිළිවෙලින් සියයට 59 ක්, සියයට 62 ක් හා සියයට 66 ක් දෙපාර්තමේන්තු නිලධාරීන්, අනියම් සේවකයන් විශ්‍රාම ගිය නිලධාරීන් හා අනෙකුත් රාජ්‍ය සේවකයින්ගේ වැටුප්, දීමනා අතිකාල, නිවාඩු දින වැටුප්,ගමන් වියදම්, සුබ සාධන කටයුතු සඳහා දරන ලද වියදම් විය.

(ඈ) ජනාධිපතිවරණය වෙනුවෙන් මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත මැතිවරණ කටයුතු වෙනුවෙන් ලබා දීමට ඇස්තමේන්තු කළ මුදල රු.753,560,472 ක් වුවද ලබා දී තිබූ ප්‍රතිපාදනය රු.933,473,160 ක් වීමෙන් ඇස්තමේන්තුගත මුදල ඉක්මවා රු.179,912,688 ක් වැඩියෙන් ප්‍රතිපාදන ලබා දී තිබුණි.

(ඉ) තැපැල් දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත ලබාදුන් සත්‍ය වියදම සහ තැපැල් දෙපාර්තමේන්තුව තුළ පවත්වා තිබූ සංඛ්‍යා ලේඛන අනුව දරන ලද සත්‍ය වියදම අතර ජනාධිපතිවරණය, මහා මැතිවරණය සඳහා පිළිවෙළින් රු.538,953,620 ක් හා රු.549,621,248 ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය.ඉන් රු.1,090,364,358 ක මුදලක් තැපැල් දෙපාර්තමේන්තුවේ ආදායම් ලෙස

සලකා ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව මැතිවරණය වෙනුවෙන් දරන ලද සත්‍ය වියදම අධිගණනය වී තිබුණි.

(ඊ) මැතිවරණ කටයුතු සඳහා රාජ්‍ය ආයතන වල සහාය ලබා ගන්නා අතර ඒ සඳහා එම ආයතන විසින් ලබාදෙන ඇස්තමේන්තු වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාව ප්‍රතිපාදන ලබා දේ. අනිකුත් ආයතන විසින් මැතිවරණ කටයුතු සඳහා පමණක් දරන වියදම් වෙන්ව හඳුනාගෙන එම වටිනාකම පමණක් අදාල වැය විෂයය යටතේ ගිණුම්ගත කිරීම සඳහා නිසි මාර්ගෝපදේශයන් භාණ්ඩාගාරයේද උපදෙස් මත සකස් කර අදාළ ආයතන වෙත ලබා දීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ අවධානය යොමුකර නොතිබුණි.ඒ අනුව මැතිවරණයන් සඳහා දරණ ලද සත්‍ය වියදම් නිශ්චිතව හඳුනාගැනීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(උ) ඡන්දය විමසීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව වෙත මහා භාණ්ඩාගාරයේ මැතිවරණ පැවැත්වීම වැය විෂය යටතේ විවෘත වනුයේ ඡන්දය ප්‍රකාශයට පත්කල පසු වන අතර එම වැය විෂයය අවසන් කරන කාලයක් පිළිබඳව නිශ්චිතව සඳහන් නොමැති හෙයින් 2024 සැප්තැම්බර් 21 දින පැවති ජනාධිපතිවරණය 2024 නොවැම්බර් මහමැතිවරණය 2025 මැයි 06 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පවත්වා තිබුණද විගණිත දිනය වන 2026 මාර්තු වන තෙක්ම මෙම වැය විෂයය පියවීමට කටයුතුකර නොතිබුණි.

(ඌ) 2015 වර්ෂයේදී මැතිවරණ කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසු ජනාධිපතිවරණ 03 ක් මහ මැතිවරණ 03 ක් හා පලාත් පාලන ඡන්ද විමසීම් 02 ක් වශයෙන් මැතිවරණ 08 ක් පවත්වා තිබූ අතර ඒ අනුව ලබාගත් දැනුම පළපුරුද්ද හා අත්දැකීම් භාවිතා කරමින් මැතිවරණ වියදම් තවදුරටත් අවම කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් හඳුනාගැනීම කෙරෙහි තවදුරටත් කොමිෂන් සභාවේ අවධානය යොමු විය බව නිරීක්ෂණය විය.

(එ) ඡන්ද විමසීම් ක්‍රියාවලියේදී විද්‍යුත් ක්‍රමයට ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා වන යාන්ත්‍රයක් භාවිතා කිරීම පිළිබඳව වූ යෝජනාව 2000 දශකයේ මැද භාගයේ සිට සාකච්ඡා කෙරෙමින් පවතින කරුණක් වුවද ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කොමිෂන් සභාව මෙතෙක් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

(ඒ) මැතිවරණ කටයුතු සඳහා වියදම් දැරීමේ දී නිසි පාලනයකින් හා සකසුරුවම්කමින්, නිසි සැලකිල්ලකින් යුතුව කටයුතු කිරීම පෙරදැරි කරගෙන මැතිවරණ කොමිෂන් සභාව විසින් ජනාධිපතිවරණය සඳහා චක්‍රලේඛ 74 ක්ද, මහා මැතිවරණය සඳහා චක්‍රලේඛ 72 ක් ද නිකුත් කර තිබුණි. එහෙත් එම චක්‍රලේඛ වලට අනුගතවීම් හෝ ඒවා අනුගමනය කිරීම ඉතා අවම මට්ටමක පැවති අතර එම චක්‍රලේඛ උපදෙස් අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් නිවැරදි පසුවිපරම් ක්‍රමවේදයක් නොතිබීම නිසා එම චක්‍රලේඛ වලට අනුකූල නොවීම බහුලව නිරීක්ෂණය විය. මේ නිසා මැතිවරණ කොමිෂන් සභාවට චක්‍රලේඛ නිකුත් කිරීමෙන් බලාපොරොත්තු වන අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ඔ) විදුලිය, ජලය හා දුරකථන පහසුකම් ලබාගැනීමේ දී දිස්ත්‍රික්ක අනුව වියදම් දැරීම සිදුකර තිබූ අතර ජාතික මට්ටමින් දිස්ත්‍රික් අවශ්‍යතාවයන් සළකා බලා ඒ අනුව සකස් කරන ලද පිරිවිතරයන් අනුව අදාල පහසුකම් ලබා ගැනීමේ පොදු ක්‍රමවේදයක් අනුගමනය කිරීම පිළිබඳව අවධානය යොමු වීම තුළින් තවදුරටත් වියදම් කළමනාකරණය කර ගැනීමට හැකියාව ඇති බව නිරීක්ෂණය විය.

(ඕ) 2009 අප්‍රේල් 16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009 අනුව පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමත්, එම චක්‍රලේඛයේ 02 (IV) වගන්තිය මෙන්ම මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ 2024 අගෝස්තු 09 දිනැති අංක PRE/2024/35 දරන චක්‍රලේඛයේ 04 ඡේදය මගින්ද පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍ර අනුව සනාථ කර ගැනීම කළ යුතු බව දක්වා තිබුණද එයට පටහැනිව 2024 ජනාධිපතිවරණයට අදාළ රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් රත්නපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නිලධාරීන් විසින් 2024 අගෝස්තු හා සැප්තැම්බර් මාසවලදී පමණක් රු.1,303,956 ක අතිකාල දීමනා හා නිවාඩු දින වැටුප් ලබා ගෙන තිබුණි.

## 4.2 ප්‍රසම්පාදනයන්

(අ) 2025 පළාත් පාලන මැතිවරණයට අදාල තැපැල් ඡන්ද ලිපිකවර A 750,000 ක් සහ ලිපිකවර D 500,000 ක් මිලදී ගැනීමට සැලසුම් කර පසුව A ලිපිකවර 600,000 ක් D ලිපිකවර 400,000 ක් ලෙසලිපිකවර සැපයුම සංශෝධනය කර දන්වා යවා තිබුණද භාණ්ඩ ලබා දියයුතු දිනය වූ 2025 මාර්තු මස 24 දිනට පසුව එම දැනුම් දීම සිදු කර තිබූ බැවින් A ලිපිකවර 650,000 ක් සඳහාද D ලිපිකවර 470,000 ක් සඳහා ද ගෙවීම් කිරීමට සිදු වී තිබුණි. ඒ අනුව ලිපි කවර අවශ්‍යතාවය නිවැරදිව තක්සේරු නොකිරීම හේතුවෙන් A ලිපිකවර 50,000 ක් සඳහා රු.553,000 ක් ද, D ලිපිකවර 70,000 ක් සඳහා රු.903,000 ක් ද බැගින් මුළු වටිනාකම රු.1,456,000 ක් වැඩියෙන් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) මෙම මිලදී ගැනීමට අදාල ලිපිකවර 2025 මාර්තු 24 දිනට පෙර ලබා දිය යුතු බව දන්වා තිබුණද, අදාල සැපයුම්කරුවන් විසින් නියමිත දිනට ලිපිකවර භාර දී නොතිබූ අතර ලංසු ආරාධනයෙහි 20.2 වගන්තියෙහි සඳහන් වන පරිදි සතියක ප්‍රමාද කාලය සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට01 ක් අයකර ගත යුතු වුවද මෙම ප්‍රසම්පාදනයෙහි D ලිපිකවර සඳහා අදාල සැපයුම්කරුගෙන් රු.76,110 ක් වූ ප්‍රමාද ගාස්තුව අය කරගෙන නොතිබුණි.

(ඇ) ජනාධිපතිවරණය සඳහා රු.34,817,758 ක් වටිනා කාඩ්බෝඩ් ඡන්දපෙට්ටි 14,250 ක් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.11 වගන්තිය අනුව නියම කලයුතු ලංසු සුරක්ෂණය ඇස්තමේන්තුගත මුදලින් සියයට01- සියයට 02දක්වා ප්‍රමාණයකට සමාන විය යුතු වුවත් මෙම ප්‍රසම්පාදනයට අදාල ලංසු සුරක්ෂණය සියයට 0.95 ක් එනම් රු.200,000 ක් ලෙස ලංසු ලියවිලි වල දක්වා තිබූ අතර ඊටද පටහැනි ලෙස සරප් වෙත ඇස්තමේන්තුගත මුදලින් සියයට 0.47 ක් ලෙස රු.100,000 ක මුදලක් ගෙවීමට අවස්ථාව ලබා දී තිබුණි.

(ii) ප්‍රසම්පාදනයට අදාල මිල ගණන් එක් සැපයුම්කරුවකු විසින් පමණක් ඉදිරිපත් කර තිබූ අතර එම ආයතනය විසින්ද ලංසු ලියවිලි වල පිරිවිතර වල සඳහන් " Thickness" හා "Material" සඳහා ප්‍රතිචාර දක්වා නොතිබුණි. එම සැපයුම්කරු විසින් පිරිවිතර සඳහන් කර නොතිබූ බැවින් තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් පිරිවිතර සඳහා එකහතාවය ලබා ගැනීමටත්, ඉදිරිපත් කර ඇති මිල ගණන් නැවත සමාලෝචනය කිරීමට ඇති හැකියාවත්, ඒ ඒ ප්‍රමාණ යටතේ සාම්පල 03 ක් සාදවා ඉදිරිපත් කරන ලෙසත් දන්වා තිබුණි.

සැපයුම්කරු විසින් 2024 අගෝස්තු 23 දිනැති ලිපියකින් එකඟතාවය පලකර තිබුණි. නමුත් එම සාම්පල් ලද බවට හෝ පරික්ෂා කල බවට අදාල තොරතුරු විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(iii) යථෝක්ත ඇණවුමට අදාලව රු.2,848,860 ක් වූ කාර්යසාධන ඇපකරය 2024 සැප්තැම්බර් 30 දින දක්වා වලංගු කර 2024 අගෝස්තු 30 දිනට පෙර ලබා දිය යුතු බව දක්වා තිබුණි.එසේ වුවද සැපයුම්කරු විසින් කාර්යසාධන සුරක්ෂණය 2024 සැප්තැම්බර් 19 දින සිට 2024 ඔක්තෝම්බර් 18 වන දින තෙක් වලංගු වන ලෙස ලබා දී තිබූ අතර මෙම ඇනවුම භාර දීමෙන් පසුව සුරක්ෂණය ඉදිරිපත් කර තිබුණි.

(ඇ) 2021 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව ගිනි ආරක්ෂණ පද්ධතියක් සවි කිරීම සඳහා රු.5,000,000 ක ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණද එම කාර්යය ඉටු නොවීම මත 2024 වර්ෂයේ රු.25,000,000කට ප්‍රතිපාදන වෙන්කර ගොඩනැගිලිදෙපාර්තමේන්තුව සමඟ රු.17,739,130 ක VAT රහිත ඇස්තමේන්තුවක් මත 2024 සැප්තැම්බර් 30 දින වනවිට වැඩ නිම කිරීමට 2024 ජුනි 07 වන දින ගිවිසුමකට එළඹ තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී ජංගම නොවන වත්කම්හි මාරුකිරීම් යටතේ මු.රෙ.208 මගින් රු.17,430,085ක වියදමක් දරා තිබුණද වියදම සනාථ කිරීමට ඉටුකල වැඩවලට අදාල බිල්පත් හෝ වෙනත් වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොවුණි. එමෙන්ම මෙම කාර්යය 2026 වර්ෂයේ අප්‍රේල් 30 වන තෙක්ම නිමකර බාරදුන් බවට විගණනයේදී තහවුරු නොවූ අතර ප්‍රමාද කාලය මාස 19 ක් වුවද එම කාලයට අදාල ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය ප්‍රතිපාදන ගිවිසුම මගින් සලසාගෙන නොතිබුණි.

(ඉ) මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ 2024 ජූලි 28 දිනැති අංක PRE/2024/12 හා චක්‍රලේඛයේ 03 වන ඡේදය අනුව ජනාධිපතිවරණ ඡන්ද විමසීමට "වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය" භාවිතා කර අවම වශයෙන් මිල ගණන් 05 ක්වත් ලබාගත යුතු විය. එසේම අවශ්‍ය තරම් මිලගණන් ලබාගැනීම අපහසු වන්නේ නම් ඊට හේතු ප්‍රසම්පාදන කමිටු තීරණයෙහි ඇතුලත් කළ යුතු වුවත් කුරුණෑගල දිස්ත්‍රික්කයට අදාලව ජනාධිපතිවරණ සඳහා සිදුකළ ප්‍රසම්පාදනයන්ට අදාලව අවම වශයෙන් මිලගණන් 05 ක් වත් ලබාගෙන නොතිබූ අවස්ථා පැවතියද ඊට හේතු ප්‍රසම්පාදන තීරණයෙහි සඳහන් කර නොතිබුණි.

(ඊ) මහනුවර දිස්ත්‍රික්කයේ ජනාධිපතිවරණය සඳහා පළතුරු මිල දී ගැනීමට අදාළව එක් සැපයුම්කරුවෙකු පමණක් මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර මිල කැඳවීම් යැවූ අනෙකුත් ආයතන අතරින් එක් ආයතනයක් මෙම මිල කැඳවීම් පිළිබඳව දැනුවත් නොවූ බවත් කාලයක් පුරා එම ස්ථානයේ ව්‍යාපාර කටයුතු නොකරන බවත්, තවත් ආයතනයක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු අනාවරණය කරගත නොහැකි බවත් සහ තවත් සැපයුම්කරුවෙකු කොළඹ ප්‍රදේශයේ ව්‍යාපාර කටයුතු සිදු කරන අයෙකු බවත් නිරීක්ෂණය විය. ඒ අනුව මෙලෙස ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ලේඛනමය අවශ්‍යතා සහ එම කාර්යයේ විනිවිදභාවය පිළිබඳව විගණනයට සෑහීමකට පත් විය නොහැකි විය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදනයේ මූලික අරමුණු වන අවම පිරිවැය මෙන්ම ප්‍රතිචාර දැක්වීමට උනන්දුවක් මෙන්ම හැකියාවක් පවතින ආයතනවල ප්‍රසම්පාදනයට සම්බන්ධ වීමට සාධාරණ අවස්ථාවක් ලබා දීම මෙමගින් ඉටු නොවන බවත් නිරීක්ෂණය විය.

NATIONAL AUDIT OFFICE

(උ) මැතිවරණ කොමසාරිස් ජනරාල්ගේ 2024 අගෝස්තු 05 දිනැති හා අංක PRE/2024/32දරන චක්‍රලේඛයේ 3.6.6 ඡේදය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික්කයට අදාලව ආහාර සැපයීම වැනි ප්‍රසම්පාදනයන්හි තෝරාගත් සැපයුම්කරුවන් සමග ගිවිසුමකට එළඹිය යුතු වුවද, ජනාධිපතිවරණ හා පාර්ලිමේන්තු මැතිවරණවලදී ආහාර ද්‍රව්‍ය මිලදී ගැනීමේ ප්‍රසම්පාදනයන්ට අදාළව සැපයුම්කරුවන් සමග ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 වගන්තිය අනුව නැවත ඇණවුම් කිරීමට ප්‍රතිපාදන පවතිනුයේ මුල් කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 50 ක් දක්වා වුවත් රත්නපුර දිස්ත්‍රික්කයේ 2024 ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ රාජකාරීවල නිරත නිලධාරීන් සඳහා උදෑසන ආහාර පාර්සල් 1050 ක් හා දිවා හා රාත්‍රී ආහාර කෑම පාර්සල් 5500 ක් ප්‍රසම්පාදනයට අදාලව අවස්ථා 03 කදී එම සීමාව ඉක්මවා සියයට 74 සිට සියයට 233 ක ප්‍රමාණයක් නැවත ඇණවුම් කිරීමට අනුමැතිය ලබා දී තිබුණි.

(එ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1(අ) වගන්තිය ප්‍රකාරව රු.250,000 ක් ඉක්මවන වැඩ සඳහා වූ කොන්ත්‍රාත් කාර්යයන් සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹිය යුතු වුවද, රු.මිලියන 12 ට වැඩි විදුලි සැපයුම් කාර්යයන් වෙනුවෙන් ලංකා විදුලි බල මණ්ඩලය හා මැතිවරණ කාර්යාලය අතර විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. ඒ අනුව ගිවිසුම්ගත නොවීමෙන් මැතිවරණ කාර්යය ඉටු කිරීම කෙරෙහි යම් අවාසිදායක හෝ ගැටළුකාරී තත්ත්වයන්ට මුහුණදීමේදී අවදානමක් පවතින බවත් නෛතික කාර්යයන්හිදී අවාසිදායකව බලපෑහැකි බවත් නිරීක්ෂණය විය.

(ඒ) ගාල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුව අනුව ද්‍රව්‍ය, කම්කරු කුලී,වෙනත් වියදම්, ප්‍රවාහන පිරිවැය, සහ ජෙනරේටර් සැපයීම සඳහා පිළිවෙලින් රු.7,058,783 ක්,රු.5,569,920 ක්, රු.200,000 ක්, රු.300,000 ක් සහ රු.3,003,207 ක් වෙන් කර තිබූ අතර අදාල සත්‍ය වියදම හඳුනා ගැනීමකින් තොරවඅදාල ඇස්තමේන්තුගත මුදල ගෙවීම් කර තිබුණි. මෙම විදුලි සැපයුමට අදාළ අවිනිශ්චිත ගෙවීම් සත්‍ය වශයෙන් හඳුනා ගැනිමකින් තොරව සියයට 05 ක් වන ලෙස වෙන්කර තිබූ රු.656,435 ක මුදලම අවිනිශ්චිතතා වෙනුවෙන් ගෙවීම් කර තිබුණි.

(ඔ) ජෙනරේටර් සැපයීම සඳහා ඇස්තමේන්තුගත මුදල වූ රු.3,003,207 ක් ගෙවීම් කර තිබුණද විදුලි බල මණ්ඩලයේ කොලොන්නාව ශාඛාව විසින් ඉදිරිපත් කර ඇති ඉන්වොයිසිය අනුව ඒ සඳහා අය කිරීම් වැට් සහිතව රු.1,130,772 ක් බැවින් ගාල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය වෙත මේ සඳහා රු.1,872,435 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ඕ) ගාල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය විසින් තාවකාලිකව විදුලිය ලෙකෝ ආයතනයෙන් ලබා ගැනීම සඳහා රු.2,834,870 ක් ඇස්තමේන්තු කර තිබුණි. ඒ සඳහා රු.986,396 ක් පමණක් වැය වී තිබුණු අතර එය සියයට 65 ක අධි ඇස්තමේන්තුවක් බැවින් ඇස්තමේන්තු වටිනාකම පදනම් කරගෙන ගෙවීම් කරන ලද ද්‍රව්‍ය සඳහා රු.7,058,783 ක්ද කම්කරුවන් සඳහා රු.5,569,920 ක් ද ප්‍රවාහනය සඳහා රු.300,000 ක්ද වෙනත් වියදම් සඳහා රු.200,000 ක්ද අවිනිශ්චිත වියදම් සඳහා වූ රු.656,435 ක් සහ ජෙනරේටර් ලබා ගැනීම සඳහා රු.3,003,207ක වූ ගෙවන ලද එකතුව රු.16,788,385 ක වටිනාකම අධි තක්සේරු වී ඇති බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ක) ජනාධිපතිවරණය පවත්වා මාස 01 ½ ට පසු පවත්වා තිබූ පාර්ලිමේන්තු මැතිවරණයේදී නැවත භාවිතා කල හැකි ද්‍රව්‍ය සඳහා රු.3,677,450 ක් හා ද්‍රව්‍ය සඳහා රු.337,461 ක් ලෙස රු.4,014,911 ක් ගෙවීම් කර තිබුණු අතර ඒ අනුව මැතිවරණ දෙකේදි ද්‍රව්‍ය සඳහා ගෙවන ලද රු.11,073,694 ක වටිනාකමට අදාළ ද්‍රව්‍යගාල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයවිසින් ගාල්ල මැතිවරණ කාර්යාලයට බාර දී නොතිබුණි. නැවත පළාත් පාලන ඡන්දය වෙනුවෙන් ද්‍රව්‍ය සඳහා රු.3,660,000 ක් ගෙවීමට කටයුතු කිරීම තුලින් අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය උපරිම කිරීමේ අරමුණ ඇතිව කටයුතු කර නොතිබුණි.

(ග) ගාල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුව අනුව ද්‍රව්‍ය, කම්කරු කුලී, වෙනත් වියදම්, ප්‍රවාහන පිරිවැය, සහ ජෙනරේටර් සැපයීම සඳහා සඳහා පිළිවෙලින් රු.4,014,911 ක්, රු.4,177,440 ක්, රු.300,000 ක්, රු.300,000 ක් සහ රු.2,092,602ක් වෙන් කර තිබූ අතර අදාල සත්‍ය වියදම හඳුනා ගැනීමකින් තොරව අදාල ඇස්තමේන්තුගත මුදලම ගෙවීම් කර තිබුණි.

(ච) මෙම විදුලි සැපයුමට අදාළ සියයට 05 ක් වන ලෙස රු.527,541 ක මුදලක් අවිනිශ්චිතතා වෙනුවෙන් වෙන්කර තිබූ අතර අවිනිශ්චිත ගෙවීම් සත්‍ය වශයෙන් හඳුනා ගැනීමකින් තොරව එම රු.527,541 ක මුදල ගෙවීමට කටයුතු කර තිබුණි.

(ජ) ගාල්ල ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලය විසින් තාවකාලිකව විදුලිය ලෙකෝ ආයතනයෙන් ලබා ගැනීම සඳහා රු.2,368,638 ක් ඇස්තමේන්තු කර තිබුණි. ඒ සඳහා රු.939,172 ක් පමණක් වැය වී තිබුණු අතර එය සියයට 60 ක අධි ඇස්තමේන්තුවක් බැවින් ඇස්තමේන්තුගත වටිනාකම පදනම් කරගෙන ගෙවීම් කරන ලද බිල්පතෙහි ඇතුලත් ද්‍රව්‍ය පිරිවැය, කම්කරු කුලිය, ප්‍රවාහනය සඳහා පිරිවැය හා අනෙකුත් වියදම්, අවිනිශ්චිත වියදම් සහ ජෙනරේටරය ලබා ගැනීම සඳහා ගෙවන ලද එකතුව රු.11,412,494 ක වටිනාකම අධි තක්සේරු වී ඇති බව විගණනයේදී බැහැර කළ නොහැකි විය.

(ට) ජනාධිපතිවරණය සඳහා විදුලි සම්බන්ධතා ලබා ගැනීමට මහනුවර දිස්ත්‍රික්කය සඳහා කටුගස්තොට විදුලි ඉංජිනේරු කාර්යාලය විසින් ඉදිරිපත් කර තිබූ රු.25,811,315 ක ඇස්තමේන්තුව අනුව කොන්ක්‍රීට් ඇණ 800ක්, එකක් රු.1,200 බැගින් රු.960,000 ක් ලෙස දක්වා තිබීම පසුව ඇණයක් රු.3 ක් ලෙස සංශෝධනය කිරීම නිසා මුල් ඇස්තමේන්තුව රු.987,600 කින් අධි ඇස්තමේන්තු කර තිබුණි. ඒ අනුව විදුලි බල මණ්ඩලයේ ප්‍රාදේශීය ඉංජිනේරුවරයෙකු විසින් නිර්දේශ කර ඉදිරිපත් කරන ලද මුල් ඇස්තමේන්තුව මැතිවරණ කාර්යාලය විසින් අනුමත කිරීමේ දී නිසි පරිදි පරීක්ෂා කර නිර්දේශ කිරීම හා අනුමත කර නොතිබුණි. තවද රු.24,631,887 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුව ද ලංකා විදුලි මණ්ඩලය විසින් පරීක්ෂා කිරීම, නිර්දේශ කිරීම සිදුකර නොතිබුණු අතර එය මැතිවරණ කාර්යාලය විසින් ද අනුමත කර නොතිබුණි.

(ඩ) ගණන් කිරීමේ මධ්‍යස්ථාන වල විදුලිය සඳහා රු.316,521 ක ඇස්තමේන්තුගත මුදලම ගෙවීම් කරන ලෙස ඉල්ලා තිබුණු අතර,මහනුවර මැතිවරණ කාර්යාලය විසින් එහි දී සත්‍ය වශයෙන්ම භාවිතා කල විදුලි පරිභෝජනය තහවුරු කර ගැනීමකින් තොරව ඒ සඳහා ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි.

(ණ) විදුලිබල මණ්ඩලය විසින් ලබා දී ඇති ඇස්තමේන්තුව තුළ මුළු ඇස්තමේන්තුවෙන් සියයට 05 ක් වන ලෙස රු.427,423 ක මුදලක් අවිනිශ්චිතා වෙනුවෙන් වෙන් කර

තිබුණ ද මෙම විදුලි සැපයුමට අදාළව අවිනිශ්චිත ගෙවීම් සත්‍ය වශයෙන් හඳුනා ගැනීමකින් තොරව ගෙවීම් කිරීමට කටයුතු කර තිබුණි.

(ත) පුත්තලම දිස්ත්‍රික්කයට අදාලව මැතිවරණයේ අවසන් ප්‍රතිඵල නිකුත් කිරීමේ මධ්‍යස්ථානය, රථ වාහන නතර කිරීමේ මධ්‍යස්ථානය හා රියදුරන් සඳහා නවාතැන් පහසුකම් සැපයීම වෙනුවෙන් යොදා ගන්නා ලද මධ්‍යස්ථාන සහ ගණන් කිරීමේ මධ්‍යස්ථාන වලට තාවකාලිකව ලබාගත් විදුලිය සඳහා රු.13,838,085ක් ලංකා විදුලි බල මණ්ඩලය වෙත ගෙවා තිබූ අතර ඇස්තමේන්තු වල අයිතම 05ක් යටතේ මුළු වියදම පමණක් ඉදිරිපත් කර තිබුණද, වියදම පිළිබඳ විස්තරාත්මක උපලේඛනයක් ඉදිරිපත් කර නොතිබුණි. එසේම පුත්තලම ඇන්ඩෲ විද්‍යාලය සඳහා තාවකාලික විදුලිය සැපයීමේ පිරිවැය ජනාධිපතිවරණයට සාපේක්ෂව සියයට 20 කින් ඉහළ ගොස් තිබුණි.

(ද) ප්‍රධාන කාර්යාලය මගින් මැතිවරණ රාජකාරි සඳහා යොදා ගෙන තිබූ රජයේ වාහන 09 ක වාර සේවාවන් සිදු කිරීම සඳහා රු.432,182 ක් ද, කොළඹ නාගරික මැතිවරණ කාර්යාලය සතු වාහන 34 ක් සඳහා රු.1,860,743 ක්ද වැය කර වාර සේවා සිදු කර තිබුණි.

(න) ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලය විසින් 2024 සැප්තැම්බර් 21 දින පැවැති ජනාධිපතිවරණයේදී වාහන 15ක් සඳහා රු. 322,080ක් වටිනා සුපිරි ඩීසල් ලීටර් 915 ක් හා 2024 නොවැම්බර් 14 දින පැවති මහා මැතිවරණයේ දී වාහන 17ක් සඳහා රු.313610 ක් වටිනා සුපිරි ඉන්ධන ඩීසල් ලීටර් 970ක් වශයෙන් වාහන වලට ඉන්ධන ලබා දී තිබුණි. වාහන සඳහා සුපිරි ඉන්ධන භාවිතා කිරීම සම්බන්ධයෙන් ලබාගත් විධිමත් අනුමැතියක් විගණනයට ඉදිරිපත් නොවූ අතර ජාතික මැතිවරණ සම්බන්ධයෙන් රජයට දැරීමට සිදුවන වියදම් අවම කර ගැනීම සඳහා මැතිවරණ රාජකාරි සඳහා සුපිරි ඉන්ධන භාවිතා කරන වාහන අවම වශයෙන් යොදා ගැනීම කෙරෙහි බලධාරීන්ගේ අවධානය යොමුවිය යුතු බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ප) 2024 නොවැම්බර් 14 දින පැවැති පාර්ලිමේන්තු මැතිවරණයේ දී ඉන්ධන ඇණවුම් මඟින් ඉන්ධන ලබාගැනීම සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් 2024 ඔක්තෝබර් 17 දිනැතිව නිකුත් කරන ලද අංක PF/2024/35 චක්‍රලේඛයේ Viii වන ඡේදයේ සඳහන් නියමයන්ට අනුව ඉන්ධන නිකුත් කිරීම සම්බන්ධයෙන් ගම්පහ දිස්ත්‍රික් මැතිවරණ කොමසාරිස් කාර්යාලය විසින් පවත්වාගෙන ගොස් තිබූ ඉන්ධන ලේඛනයේ 2024 නොවැම්බර් 02 දින සිට 2024 නොවැම්බර් 16 දක්වා කාලයට අදාලව වාහන 14 ක් සඳහා ලබා ගත් ඉන්ධන ලීටර් 560 ක් සඳහා ඉන්ධන ඇණවුම් වල මාණ්ඩලික නිලධාරීන්ගේ අත්සන යොදා නොතිබුණි. 2024 ඔක්තෝබර් 05 දින සිට 2024 නොවැම්බර් 21 දක්වා කාලයට අදාලව රියදුරන් විසින් වාහන 116 ක් සඳහා ලබාගත් ඉන්ධන ලීටර් 4,480 ක් සම්බන්ධයෙන් එම ඉන්ධන ලබාගත් බවට වාහන භාර රියදුරන් විසින් අත්සන් කර නොතිබුණි. ඒ අනුව චක්‍රලේඛයේ නියමයන්ට පටහැනිව රියදුරන් විසින් ලබාගෙන තිබූ ඉන්ධන ලීටර් 5,040 ක් සත්‍ය වශයෙන්ම මැතිවරණ රාජකාරි සඳහා භාවිතා කල වාහනවලට යොදාගත්තේද යන්න විගණනයේ දී තහවුරු කර ගැනීමට නොහැකි විය.

(බ) ඉන්ධන ඇණවුම් නිකුත්කිරීමට අදාල චක්‍රලේඛයන් අනුව නඩත්තු කළයුතු ඉන්ධන ඇණවුම් නිකුත්කිරීමේ ලේඛනයේ ඉන්ධන ඇණවුම ලබාගත් රියදුරුගේ අත්සන ලබාගත යුතු වුවද, කුරුණෑගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය තුල මැතිවරණ කටයුතු

සඳහා පවත්වාගෙන ගොස් තිබූ ඉන්ධන නිකුත් කිරීමේ ලේඛනයේ රියදුරුගේ අත්සන රහිතව ලීටර් 918 ක් සඳහා ඉන්ධන ඇණවුම් නිකුත් කර තිබුණි.

(ම) 2024 ඔක්තෝබර් 17 දිනැති PE/2024/39 දරන මැතිවරණ චක්‍රලේඛය අනුව ඡන්දපොල කාර්යමණ්ඩලය ඡන්ද පෙට්ටි හා අනෙකුත් ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම සඳහා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස් රථ යොදා ගැනීම සම්බන්ධ පරීක්ෂාවේදී ආසන 40 ට වැඩි සාමාන්‍ය බස් රථ සඳහා එක් දිනකට අවම අය කිරීම ලෙස රු.30,000 ක් ලෙසත් අවම ගාස්තුව යටතේ ධාවනය කල හැකි උපරිම කි.මී. ප්‍රමාණය 100 ක් ලෙසත් ලබා දිය හැකි උපරිම කාලය පැය 12 ක් ලෙසත් දක්වා ඇත. ගාල්ල මැතිවරණ කාර්යාලය සම්බන්ධව සිදුකල නියැදි පරීක්ෂාවේදී ගාල්ල ඩිපෝවට අයත් බස් රථ යොදා ගැනීම පිරිවැය පිරිමැසුම්දායක ලෙස යොදා ගෙන නොතිබූ අතර ඒ අනුව කි.මී.32 ත් 75 ත් අතර ප්‍රමාණයක් සඳහා රු. 1,140,000 ක් එනම් සියයට 57.9 ක් ධාවනය නොකලද ගෙවීම් සිදුකර තිබුණි.

(ය) රත්නපුර දිස්ත්‍රික්කයට අදාලව 2024 සැප්තැම්බර් 21 දින පවත්වන ලද ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා රු.8,983,235 ක් වැයකර වාහන 256 ක් කුලී පදනම මත ලබාගෙන තිබුණි. මේ සම්බන්ධව පහත කරුණු නිරීක්ෂණය විය

(i) ගෙවීම් වවුචරය සමඟ ඉදිරිපත් කරනු ලබන ධාවන සටහන් පතෙහි ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපතිවරයා විසින් ගමන් කළ නිලධාරියාගේ අත්සන තීරුවෙහි දිනයන්, පැමිණි හා පිටවූ වේලාව ද සහිතව ගමන් කළ ස්ථාන හා දුර ප්‍රමාණයන් ඉදිරියෙන් අත්සන් කළ යුතු වුව එසේ නොමැතිව එකතුව රු.1,267,880 ක් වූ වවුචර් 39 ක් සඳහා ගෙවීම් කර තිබුණි.

(ii) වවුචරය සමඟ ඉදිරිපත් කරන ධාවන සටහන් පතෙහි අදාළ වාහනය ප්‍රවාහන මධ්‍යස්ථානයට පැමිණෙන විට මයිලෝ මීටරය හා නිදහස් කරන විට මයිලෝ මීටරය නිවැරදිව සඳහන් කර නොමැති අවස්ථා හා මයිලෝ මීටර් අංක කිසිවක් සඳහන් කර නොමැති අවස්ථා නිරීක්ෂණය විය.

(iii) 2024 අගෝස්තු 18 දිනැති අංක PRE/2024/40 දරන චක්‍ර ලේඛය ප්‍රකාරව සුභසාධක කටයුතු ආදී වෙනත් අවශ්‍යතා සඳහා කුලී වාහන යොදා නොගත යුතු වුවද, ඊට අනුකූල නොවූ අවස්ථා 93 ක් සඳහා රු.288,290 ක් ගෙවීම් කර තිබුණි.

(iv) රත්නපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සිට ඡන්ද මධ්‍යස්ථාන සඳහා ගණනය කර ඇති දුර ප්‍රමාණය හා කුලී වාහනවල ධාවන සටහන්පත්හි සඳහන් දුර ප්‍රමාණයන් පරීක්ෂා කිරීමේ දී නියමිත දුරට (යාමට හා ඒමට ) වඩා වැඩි දුර ප්‍රමාණයක් වෙනුවෙන් රු.849,850 ක් වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(ර) කළුතර දිස්ත්‍රික්කයේ ජනාධිපතිවරණ රාජකාරි කටයුතුවල නිරත වූ කාර්ය මණ්ඩලයට ක්ෂණික නූඩ්ල්ස් බඳුන් එකක් රු.200 බැගින් බඳුන් 5540 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,108,000 ක මුදලක් ගෙවා තිබූ අතර පාර්ලිමේන්තු මහ මැතිවරණයට අදාලව එම ප්‍රමාණයේම නූඩ්ල්ස් බඳුන් එකක් රු.175 බැගින් බඳුන් 6326 ක් මිලදී ගැනීම වෙනුවන් රු.1,107,050 ක මුදලක් ප්‍රිමා අලෙවි නියෝජිතවරයෙකු වෙත ගෙවා තිබුණි.

(i) ජනාධිපතිවරණය සඳහා අවශ්‍ය ක්ෂණික නූඩ්ල්ස් මිලදී ගැනීම සඳහා ප්‍රිමා සමාගම ඇතුළු සැපයුම්කරුවන් 04 දෙනෙකු වෙතින් මිල ගණන් කැඳවා තිබූ

බව මිල කැඳවීමේ නාම ලේඛනයේ සඳහන් කර තිබුණද ඉන් එක් සැපයුම්කරුවෙකුගේ නමක් පසුව නාම ලේඛනයට ඇතුලත් කර තිබුණි. මෙහිදී ප්‍රිමා සමාගමෙන් මිල ගණන් කැඳවා තිබුණද මිල ගණන් ලැබී නොතිබූ අතර ප්‍රිමා අලෙවි නියෝජිතයකුගෙන් හා තවත් එක් සැපයුම්කරුවකුගෙන් පමණක් මිල ගණන් ලැබී තිබුණි.

(ii) එම සැපයුම්කරුවන් දෙදෙනා අතරින් ක්ෂණිකව පිසින ලද ග්‍රෑම් 180 ක නූඩ්ල්ස් බඳුනක් රු.200 ක මිලක් යටතේ ප්‍රිමා නියෝජිතයෙකුගෙන් මිලදී ගැනීමට තාක්ෂණික කමිටුවේ නිර්දේශය මත ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. එම තීරණය මත නූඩ්ල්ස් බඳුන් 5,540 ක් මිලදී ගෙන තිබුණද මිල ගණන් කැඳවීමේදී එකවර 500 ක් හෝ ඊට වැඩි ගණනක් අවශ්‍ය විය හැකි බව සඳහන් කර තිබුණි. ඒ අනුව දළ අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ඊට අනුව මිල කැඳවීම් සිදුනොකිරීම නිසා මිල ගණන් කැඳවීමේදී සඳහන් කර තිබූ ප්‍රමාණයට වඩා දස ගුණයකටත් වඩා වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීමේදී හිමි විය හැකිව තිබූ ආර්ථික වාසි නොසලකා හැර තිබුණි.

(iii) මේ අනුව සැපයුම්කරුවන් මිලගණන් ඉදිරිපත් කිරීමේදී ඒකක 500 ක් වෙනුවෙන් සැපයිය හැකි ඒකක මිල රු.200 ක් ලෙස මිල ගණන් ඉදිරිපත් කර තිබූ අතර ඒකක 5,000 ට වඩා වැඩි ප්‍රමාණයක් මිලදී ගැනීමේදීද එම මිලටම ලබා ගෙන තිබුණි.

(ල) ජනාධිපතිවරණයවෙනුවෙන් පානීය ජල බෝතල් මිලදී ගැනීම සඳහා රු.1,301,000 ක හා පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් රු.1,284,750 ක මුදලක් ගෙවා තිබුණි. ජනාධිපතිවරණය වෙනුවෙන් මිලදී ගෙන තිබූ මිලි ලීටර් 500 ප්‍රමාණයේ ජල බෝතල් 30,000 කින් ජල බෝතල් 5700 ක් ද ලීටර් 1 ප්‍රමාණයේ ජල බෝතල් 3020 න් බෝතල් 300 ක්ද පරිභෝජනයට ගැනීමෙන් තොරව මැතිවරණ කාර්යයන් අවසානයේ ඉතිරි වී තිබුණි. එහෙත් පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන්ද මිලිලීටර් 500 ප්‍රමාණයේ ජල බෝතල් 30000 ක ප්‍රමාණයක් නැවතත් මිලදී ගෙන තිබුණ අතර මැතිවරණ රාජකාරී සඳහා අනුයුක්ත කල නිලධාරීන් සංඛ්‍යාව හා සසඳන කල මෙය අසාමාන්‍ය තත්ත්වයක් ලෙස නිරීක්ෂණය විය.

(ව) 2024 ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණයේ සුභසාධන වියදම් දැරීම සම්බන්ධයෙන් වූ මැතිවරණ කොමිෂන් සභාවේ අංක PE/2024/15 දරන චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව සංග්‍රහ වියදම් දැරීම පිළිබඳ නිතර විගණන විමසුම් වලට භාජනය වන බැවින් සුභසාධන කටයුතු වලට අදාල සංඛ්‍යා සටහන් හා අදාල තොරතුරු ලිඛිතව ගොණුකර තබා ගැනීමට ක්‍රියාකළ යුතු බවට උපදෙස් ලබා දී තිබුණි. එසේ වුවද එම තොරතුරු නිසි පරිදි ගොණුකර තබා නොගැනීම හේතුවෙන් 2024 වර්ෂයේ පැවැත්වූ ජනාධිපතිවරණඡන්ද විමසීම සම්බන්ධව මූල්‍ය හා කාර්ය සාධන විගණනයට අදාල තොරතුරු කැඳවීම් ලිපි ආකෘති (XVII) ප්‍රකාරව සුභසාධන වශයෙන් ලබා දිය යුතු ආහාර වේල් පිළිබඳ සම්පූර්ණ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කිරීමට කළුතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය අපොහොසත් වී තිබුණි.

(ස) 2024 සැප්තැම්බර් 22 වන දින දිවයින පුරා පනවා තිබූ ඇඳිරි නීති තත්ත්වයන් හේතුවෙන් අනිවාර්යයෙන්ම උදෑසන හා දිවා ආහාර ලබාදිය යුතු වූ බැවින් කමිටුවට අනුයුක්තව සිටින මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන්ගේ සහය මත ආහාර සැපයුම් ආයතන කිහිපයකට උදෑසන හා දිවා ආහාර සැපයුම් භාර දෙන ලද බව සුභ සාධන

කම්ටු කාර්යසාධන වාර්තාවේ සඳහන් කර තිබුණි.කෙසේ වෙතත් එදින උදෑසන කෑම පාර්සල් 1650 ක් පමණක් මිලදී ගෙන තිබූ අතර එදින දිවා ආහාරය සඳහා උදෑසන ප්‍රමාණයට වඩා දෙගුණයකටත් වැඩියෙන් කෑම පාර්සල් එනම් 3485 ක් මිලදී ගෙන තිබීම විගණනයේදී මතභේදයට තුඩු දෙන කරුණක් විය.

(හ) තවද එදින දෙවන මනාප ගණන් කිරීම වෙනුවෙන් ගණන් කිරීමේ රාජකාරී සඳහා යොදවා තිබූ ජ්‍යෙෂ්ඨ ඡන්ද ස්ථානාධිපති තනතුර දැරූ නිලධාරීන් හා ඊට ඉහල තනතුර දැරූ නිලධාරීන් 1375 ක් හා කම්ටු රාජකාරී සිදු කරන ලද නිලධාරීන් 615 ක් වන ලෙස ආසන්න වශයෙන් නිලධාරීන් 1990 ක් පමණ යොදවා තිබූ බව ගොනු අනුව අනාවරණය විය. එවැනි තත්ත්වයක් තුල කෑම පාර්සල් 3485 ක් වෙනුවෙන් ගෙවීම් කර තිබීම නිසා කෑම පාර්සල් 1495 ක් වෙනුවෙන් රු.373,750 ක මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(ළ) මහ මැතිවරණයේදී ඡන්ද විමසීම් දිනට පසු දින උදෑසන කෑම පාර්සල් 7,250 ක් මිලදී ගැනීම වෙනුවෙන් රු.1,815,000 ක මුදලක් සැපයුම්කරුවන් 08 දෙනෙකු වෙත ගෙවා තිබුණි. ඡන්ද විමසීම් දිනට පසු දින උදෑසන කෑම වේල සඳහා ගණන් කිරීමේ කාර්යය මණ්ඩලය 5,375 ක් ලෙසට ඇස්තමේන්තු කර තිබුණි. නමුත් ඊට පෙර පැවති ජනාධිපතිවරණයේදී සමස්ථ ගණන් කිරීමේ කාර්යය මණ්ඩලය 3,164 ක් සඳහා පමණක් පත්වීම් ලබාදී තිබූ අතර මහ මැතිවරණයේදී ජනාධිපතිවරණය මත පදනම්ව ආහාර සැපයිය යුතු කාර්ය මණ්ඩලය ඇස්තමේන්තු කල හැකිව තිබියදී ඊට වඩා 2,211 ක් වැඩියෙන් ඇස්තමේන්තු කර තිබීම විගණනයේදී මතභේදයට තුඩුදෙන කරුණක් විය.

(අ.අ) එලෙස ගණන් කිරීමේ කාර්යය මණ්ඩලය 5375 ක් හා ඒ අනෙකුත් කාර්ය මණ්ඩලය 1886 ක් ලෙස ඇස්තමේන්තු කර තිබීම නිසා ඡන්ද විමසීම් දිනට පසු දින ලබාදිය යුතු උදෑසන කෑම ප්‍රමාණය 7261 ක් ලෙසට ඇස්තමේන්තු කර තිබූ අතර ඒ අනුව කෑම පාර්සල් 7250 ක් මිලදී ගෙන තිබූ බව නිරීක්ෂණය විය. නමුත් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව එම දිනයේදී සත්‍ය වශයෙන් යොදවා තිබූ සමස්ත කාර්ය මණ්ඩලය 4794 ක් පමණක් වූ අතර ඒ අනුව උදෑසන කෑම පාර්සල් 2467 ක් වෙනුවෙන් රු.616,750 කට ආසන්න මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(අ.ආ) මහනුවර දිස්ත්‍රික්කයට අදාලව ජනාධිපතිවරණයේඡන්ද විමසීමේ කාර්යයේ නිරත කාර්ය මණ්ඩල සඳහා බිස්කට් සැපයීම වෙනුවෙන් රු.548,330 ක වටිනාකම පුද්ගලික සමාගමකින් මිලදී ගැනීමට කටයුතු කර තිබූ අතරඑම බිස්කට් 2024 සැප්තැම්බර් 22 දින අවස්ථා 03 කදී මැතිවරණ කාර්යමණ්ඩලය වෙත බෙදා දීමට කටයුතු කර තිබුණි. ඒ අනුව මිල දී ගන්නා ලද හා බෙදා දීම සිදු කරන ලද ප්‍රමාණය පරීක්ෂාවේ දී රු.48,370 ක් වූ බිස්කට් පැකට් 3252 ක ප්‍රමාණයක වෙනසක් නිරීක්ෂණය විය.

(අ.ඇ) ජනාධිපතිවරණයේ ගණන් කිරීමේ කාර්යයයේ නිරත නිලධාරීන් වෙනුවෙන් 2024 සැප්තැම්බර් 20 හා සැප්තැම්බර් 22 යන දෙදින පුද්ගලයින් 7,319 ක් සඳහා පළතුරු බීම, බටර් කේක් හා මාළු පැටිස් ලබා දී තිබුණු නමුත් පළතුරු බීම සඳහා සිදු කරන ලද ගෙවීම් පරීක්ෂා කිරීමේ දී පළතුරු බීම 5,850 ක් සඳහා පමණක් ගෙවීම් කර තිබුණි. ලේඛන අනුව ලබා දුන් ප්‍රමාණය හා සත්‍ය වශයෙන් ගෙවීම් කරන ලද ප්‍රමාණය අතර පළතුරු බීම පැකට් 1,469 ක ප්‍රමාණයන් සම්බන්ධව ඉදිරිපත් කරන ලද තොරතුරු නිවැරදි නොවන බව නිරීක්ෂණය විය.

(අ.ඇ) පුත්තලම දිස්ත්‍රික්කයට අදාලව ප්‍රසම්පාදිත මිල ගණන් හා සැසඳීමේදී ආහාර මල්ල සඳහා වැය කල මුළු වියදම රු.2,742,780 ක් වුවද 2025 මාර්තු 14 දිනැති අංක PUT/EO/ADM/03/22 දරන ලිපියමගින් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයලබා දී ඇති තොරතුරු 05 (XVII) වගුව ප්‍රකාරව ආහාර මල්ල සඳහා වැය වූ මුළු වියදම රු.4,037,960 ක් වී තිබීමෙන් රු.1,295,180 ක වැඩිපුර වියදමක් නිරීක්ෂණය විය.

(අ.ඉ) ප්‍රසම්පාදන තීරණය අනුව පාර්සල් 1,000 දක්වා ප්‍රමාණයක් මිලදීගතයුතු බවට නිර්දේශ කර තිබුණද ඊට පටහැනිව කෑම පාර්සල් 2,900 ක් මිලදී ගෙනතිබුණි.

(අ.ඊ) ගාල්ල දිස්ත්‍රික්කයට අදාලව 2024 වර්ෂය තුලදි පවත්වන ලද ජනාධිපතිවරණය සහ පාර්ලිමේන්තු මැතිවරණයේදී ශාලාව බෙදා වෙන් කිරීමේ කර්මාන්තය සඳහා ජනාධිපතිවරණය සඳහා 96F කන්දෙවත්ත ග්‍රාම සංවර්ධන සමිතියට රු.1,215,805 ක මුදලක්ද පාර්ලිමේන්තු මැතිවරණය සඳහා 96B ගල්වඩුගොඩ ග්‍රාම සංවර්ධන සමිතියට රු.1,625,545 ක මුදලක්ද ශාලා සකස් කිරීම වෙනුවෙන් ජනාධිපතිවරණයේදී එම සමිතිය සඳහා පිළිවෙලින් රු.495,000 ක් සහ රු.858,000 ක් ගෙවා තිබුණි. 2024 ජනාධිපතිවරණය පවත්වා මාස 01 දින 23ක් ගත වූ පසු පැවැත්වූ පාර්ලිමේන්තු මැතිවරණයේදී ඡන්ද ගණන් කිරීමේ කටයුතු සඳහා යොදා ගන්නා ශාලා බෙදා වෙන් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ජනාධිපතිවරණයට සාපේක්ෂව පාර්ලිමේන්තු මැතිවරණයේදී වැඩ විෂයයන් 04 ක් වෙනුවෙන් රු.793,580 ක්ද ශාලා සහ අනෙකුත් ශාලාවල මේස පුටු සකස් කිරීම වෙනුවෙන් රු.183,150 ක් ද වැඩිපුර ගෙවීම් කර තිබුණි.

(අ.උ) කොළඹ දිස්ත්‍රික්කයට අදාලව ජනාධිපතිවරණ ඡන්ද විමසීමේ කටයුතු සඳහා යොදාගන්නා ලද කොළඹ ප්‍රධාන පාසල් 03ක අළුත්වැඩියා කටයුතු සඳහා ප්‍රජා සංවර්ධන සමිති 3ක් වෙත රු.7,135,020 ක කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. මෙම පාසල්වල අදාල අළුත්වැඩියාවන් සිදු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අදාල ශාලාව භාර නිලධාරීන්ගේ හෝ වෙනත් අදාල නිලධාරියෙකුගෙන් ඉල්ලීමක් ඉදිරිපත් වී නොතිබුණද මෙම පාසල් තුනෙහි ඉදිකිරීම් / අලුත්වැඩියාවන් සඳහා ඇස්තමේන්තු තාක්ෂණික සහකාර නිලධාරියා විසින් සකස් කරන ලද පදනම විගණනයේදී නිරීක්ෂණය නොවීය.

(අ.ඌ) 2021 සැප්තැම්බර් 29 දිනැති 01/2021 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.1 ඡේදය අනුව දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රි පුද්ගල කමිටුවක් මගින් යෝග්‍යතාවය සමාලෝචනය කිරීමෙන් අනතුරුව සුදුසු ප්‍රජා පාදක සංවිධානයකට වැඩ කොන්ත්‍රාත් පැවරීම නිර්දේශ කල හැකි වුවත් එවැනි කමිටුවක් පත් නොකර යෝග්‍යතාවය පිළිබඳ පරීක්ෂා කිරීමකින් තොරව ප්‍රජා සංවිධානයේ ඉල්ලීම පරිදි කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි.

(අ.එ) කොන්ත්‍රාත්තුව අවසන්කල දිනයන් ලේඛනවල සටහන් නොවූ අතර අදාල ප්‍රජා සංවිධාන විසින් දින රහිත ලිපියක් මගින් කොන්ත්‍රාත්තුව අවසන් කල බවට දැනුම් දී තිබුණි. මේ නිසා කොන්ත්‍රාත්තුව නියමිත කාලසීමාව තුල අවසන් කිරීම පිළිබඳව විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.පාසැල් තුනෙහිම අළුත්වැඩියා කිරීම නිසිලෙස ඉටුකර ඇති බවට ශාලා භාර නිලධාරීන්ගෙන් තහවුරු කර ගැනීමකින් තොරව අදාල ප්‍රජා සංවර්ධන සමිති වෙත මුදලින් රු.7,135,020 ක් ගෙවා තිබුණි.

කලවැඩ වාර්තාවට අදාල බිල්පත්වල තාක්ෂණික සහකාර නිලධාරියා අත්සන්කර තිබුණද එම කාර්යයන් නිසිලෙස ඉටුකර ඇති බවට සහතික කර නොතිබුණි.

(අ.ඒ) තිඹිරිගස්යාය විද්‍යාතිලක විද්‍යාලය මැතිවරණ කටයුතු සඳහා යොදාගැනීමට අයිතම 24 ක් අළුත්වැඩියා කිරීම සඳහා වැට් රහිතව රු.650,031 ක මුදලක් වැය වන බවට ඇස්තමේන්තු සකස්කර තිබූ අතර ඉන් රු.438,340 ක් වන අයිතම 16ක කටයුතු පමණක් සිදුකර ඇති බවට ගෙවීමට ඉදිරිපත් කල බිල් මගින් තහවුරු වුණි. ඒ අනුව සැලසුම්කල අයිතම 08ක් ඉටු කිරීම කොන්ත්‍රාත්කරු විසින් පැහැර හැර තිබුණි.එමෙන්ම මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කල වෝඩ් පෙදෙසේ ප්‍රජා සංවර්ධන සමිතිය විසින් මෙම පාසලේ රු.107,780 ක් වටිනා අමතර වැඩ කාර්යන් 22 ක් අතිරේකව සිදු කර ඇති අතර ඒ සඳහා ඉල්ලීමක් නොතිබූ අතර අමතර වැඩ සඳහා පූර්ව අනුමැතියක්ද නොමැතිව ගෙවීම් සිදු කර තිබුණි.

(අ.ඔ) කොළඹ රාජකීය විද්‍යාලය ඡන්ද කටයුතු සඳහා භාවිතා කිරීම සඳහා ගොඩනැගිලි හා ස්ථාන 13 ක අයිතම 67 ක් අළුත්වැඩියා කටයුතු කිරීමට ඇස්තමේන්තු සකස්කර තිබූ අතර මෙම අයිතම 67 න් රු.436,657ක් වූ අයිතම 15 ක් අලුත්වැඩියා කටයුතු කොන්ත්‍රාත්කරු විසින් සිදු කර නොතිබූ අතර ඒ සඳහා හේතු ද ඉදිරිපත් කර නොතිබුණි. කොන්ත්‍රාත්තුවේ අයිතම 67 න් අයිතම 17 ක් සඳහා ඇස්තමේන්තු ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ඉටු කිරීම හේතුවෙන් රු.585,022 ක් වැඩියෙන් වියදම් දරා තිබූ අතර අයිතම 3ක් ඇස්තමේන්තුව ප්‍රමාණයට වඩා අඩුවෙන් අළුත්වැඩියා කටයුතු සිදුකර තිබුණද ඒ සඳහා හේතු ඉදිරිපත්කර නොතිබුණි.

(අඕ) කොළඹ 07, D.S. සේනානායක විද්‍යාලය මැතිවරණ කටයුතු සඳහා යොදාගැනීමට සනිපාරක්ෂක හා අනෙකුත් අත්‍යවශ්‍ය අළුත්වැඩියා කිරීම් සඳහා රු.1,300,638 ක්ද තාවකාලික වෙන්කිරීම් හා ප්‍රාථමික අංශයේ පිවිසුමට තාර දැමීම සඳහා රු.1,088,111 ක්ද ලෙස අළුත්වැඩියා සඳහා ප්‍රජා සංවර්ධන සමිතියක් වෙත රු.2,388,749 ක් ගෙවා තිබුණි.තාවකාලික වෙන් කිරීම් සඳහා ඇස්තමේන්තුගත අයිතම 3න් 2ක ප්‍රමාණයන් අඩුකර තිබූ අතර එක අයිතමයක ප්‍රමාණයන් වැඩිකර තිබුනි. ඇස්තමේන්තුවේ සඳහන් නොවූ දොරවල්වල අගුලු, සරණේරු සවිකිරීම සඳහා රු.55,914 ක්ද අමතරව වියදම්කර තිබුණි.

(අ.ක) සනිපාරක්ෂක හා අනෙකුත් අත්‍යවශ්‍ය අළුත්වැඩියා කිරීම් ගොඩනැගිලි හා ආශ්‍රිත ප්‍රදේශ 17 ක අයිතම 85 ක අළුත්වැඩියා කටයුතු කිරීම සඳහා ගිවිසුමට එළඹ තිබුණද රු.680,092 ක් වූ අයිතම 31 ක අළුත්වැඩියා කටයුතු සිදු කිරීම පැහැර හැර තිබුණි. තාක්ෂණික සහකාර නිලධාරි විසින් සකස් කල ඇස්තමේන්තුවේ අයිතමයන් 18 ක් සඳහා ඇස්තමේන්තු ප්‍රමාණයන් වැඩිකරගෙන තිබූ අතර අයිතමය 16 ක ප්‍රමාණයන් ඇස්තමේන්තුවට වඩා අඩුකර අලුත්වැඩියා කර තිබුණි. එසේ ප්‍රමාණයන් වැඩි කිරීමට හෝ අඩු කිරීමට හේතු පැහැදිලි නොවීය. අළුත්වැඩියා කටයුතු සිදුකරන ගොඩනැගිලි හා ප්‍රදේශ 17 න් ගොඩනැගිලි හා ප්‍රදේශ 12 කට අයිතම 94 ක රු.898,345 ක අමතර අළුත්වැඩියා කිරීම සිදුකර තිබුණි.

(අ.ග) මෙම කොන්ත්‍රාත්තුව සඳහා ඇස්තමේන්තු මුදල VAT රහිතව රු.2,250,189 ක් වන අතර කොන්ත්‍රාත්කරු අයිතම 85 න් අයිතම 31 ක් සිදු නොකර තිබූ අතර අයිතම 34 ක ප්‍රමාණයන් වෙනස්කර තිබුණි. එමෙන්ම අමතර අයිතමයන් 94 ක් සිදු කර තිබූ අතර කොන්ත්‍රාත්තුව සඳහා ගෙවූ මුදල රු.1,867,316 ක් වේ. එය මුල් ඇස්තමේන්තුවට වඩා අඩු මුදලක් වූ අතර ඒ අනුව මෙම ඇස්තමේන්තු සකස් කිරීම නිසිලෙස සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2 වත්කම් කළමනාකරණය**

(අ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවන් අනුව භාණ්ඩ අයිතම 46 ක ඌණතාවයන් හා භාණ්ඩ අයිතම 21 ක අතිරික්තයන් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) රජයේ මුදල් රෙගුලාසි 756(6) ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ පැවැත්වූ භාණ්ඩ සමීක්ෂණයෙන් පොදු 47 වාර්තාවෙහි සඳහන් භාණ්ඩ සම්බන්ධයෙන් 2026 අප්‍රේල් 30 දිනට පෙර සුදුසු පරිදි ක්‍රියාකල යුතු වුවද 2026 මැයි මස 11 වන දින දක්වාම එසේ සිදුකර නොතිබුණි

(ඇ) 2023 අගෝස්තු 15 දින මිලදී ගෙන ස්ථාපිත කර තිබූ රු.6,289,650 ක් වූ අමතර විදුලි ජනන යන්ත්‍රය සහ ඉන්ධන ටැංකිය එය ස්ථාපිත කල දිනයේ සිට සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) මහනුවර මැතිවරණ කාර්යාලයේ විසින් පසුගිය කාල පරිච්ඡේදය තුළ පවත්වන ලද මැතිවරණ වෙනුවෙන් භාවිතයට ගැනීම සඳහා නිකුත් කරන ලද නමුත් භාවිතයට නොගත් මුද්‍රිත ටේප් 1371 රෝල් 1371 ක් දක්නට ලැබුණද, ඊට අදාළ තොග පොත් ලේඛන ශේෂය බිංදුවක් ලෙස දක්වා තිබුණි.

**4.3 කළමනාකරණ දුර්වලතා**

(අ) තාක්ෂණ අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2023 මැයි 02 දිනැති අංක MOT/DEV/POLICY/CYBERSEC දරන චක්‍රලේඛය අනුව කොමිෂන් සභාව විසින් තොරතුරු ආරක්ෂණ නිලධාරියා වෙත තොරතුරු හා සයිබර් ආරක්ෂණ වගකීම් ලිඛිතව පවරා නොතිබූ අතර තොරතුරු හා සයිබර් ආරක්ෂණ විගණනය පිළිබඳ වගකීම් ප්‍රධාන අභ්‍යන්තර විගණක වෙත පවරා නොතිබුණි.

(ආ) සයිබර් ආරක්ෂණය පිළිබඳ තීරණ ගැනීම සඳහා කමිටුවක් පිහිටුවා නොතිබූ අතර සයිබර් ආරක්ෂණ අවදානම් සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා අවදානම් කළමනාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණු අතර තොරතුරු වත්කම් ලේඛනයක ලේඛනගත කර නොතිබුණි. එමගින් එම වත්කම් තීරණාත්මකභාවය මත වර්ගීකරණය කර හිමිකාරිත්වයන් හඳුනාගෙන නොතිබුණි.

**5. මානව සම්පත් කළමනාකරණය**

**5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය**

2025 දෙසැම්බර් 31 දින වන විට කොමිෂන් සභාවේ සමස්ත පුරප්පාඩු සංඛ්‍යාව 107 ක් එනම් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 13 ක් විය.මෙම පුරප්පාඩු සංඛ්‍යාව තුල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 10, තෘතීය මට්ටමේ පුරප්පාඩු 05 ක්, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 49 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 43 ක් පැවතුණි. මෙම තත්ත්වය සභාවේ කාර්යසාධනය කෙරෙහි බලපෑමට ඉඩ ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

කේ.කේ.එස්.ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක**

ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම (%) | | |
|---|---|---|---|
| | **100%-90%** | **75%-89%** | **50%-74%** |
| | 95% | | |

## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

| අරමුණු අංකය | අරමුණු සහ ඉලක්ක | ඉලක්ක | කාල රාමුව | ආයතනයේ ක්‍රියාකාරී දර්ශකය | ප්‍රගතිය/ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 05. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | 5.1. ජාතික මට්ටමේ / ව්‍යවස්ථාදායකයේ කාන්තා නියෝජනය සාක්ෂාත් කර ගැනීම. | 5.1.1. අදාළ නීති සංශෝධන | 2021 - 2025 | කාන්තා නියෝජනය 25% වන බවට වග බලා ගැනීම | අදාළ යෝජනා මැතිවරණ නීති සංශෝධනය සඳහා වූ පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවට ඉදිරිපත් කිරීම. |
| | 5.5 දේශපාලන, ආර්ථික හා සමාජ්‍ය ජීවිතයේ සියලුම අවස්ථාවන්හි තීරණ ගැනීමේදී කාන්තාවන්ට නායකත්වය සහ සමාන අවස්ථා සැලසීම හා ඵලදායී අන්දමින් සහභාගී වීම තහවුරු කිරීම. | 5.5.1 අ. දේශපාලන පක්ෂවල විධායක සභාවේ කාන්තා නියෝජනය ඉහළ දැමීමට ක්‍රියා කිරීම. | 2021 - 2025 | | පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවට යෝජනා ඉදිරිපත් කර ඇත. |
| | | 5.5.2. මැතිවරණ කොමිෂන් සභාවේ විධායක ශ්‍රේණිවල තනතුරු හොබවන කාන්තාවන්ගේ ප්‍රමාණය වැඩි කිරීම. | 2021 - 2025 | - | ක්‍රියාකර ඇත |
| 10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩු කිරීම | 10.2 2030 වන විට වයස, ලිංගිකත්වය, ආබාධිතබව, ජන වර්ගය, ජාතිය, ආගම හෝ ආර්ථික හෝ වෙනත් තත්ත්වයන් පිළිබඳව තැකීමකින් තොරව සියලුදෙනාගේ සමාජ, ආර්ථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම. | සියලු දෙනා ඇතුළත් මැතිවරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම. | 2021 - 2025 | සුදුසුකම්ලත් සියලු පුරවැසියන් ඇතුළත් ඡන්දහිමි නාම ලේඛණය සකස් කිරීම. | ක්‍රියාකර ඇත |
| 16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම, යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබාදීම සහ සෑම මට්ටමකම ඵලදායී, වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම. | 16.7. සියලුම මට්ටම්වලදී ප්‍රතිචාරාත්මක, සියලුදෙනා අනතර්ගත වූ සහභාගීත්වයෙන් යුත් සහ නියෝජනයෙන් යුත් තීරණ ගැනීමේ ක්‍රියාවලියක් පැවතීම තහවුරු කිරීම. | 16.7.2. ස්ත්‍රී පුරුෂභාවය, වයස, ආබාධ සහිත බව හා ජන කණ්ඩායම් අනුව තීරණ ගැනීමේ ක්‍රියාවලිය තුළ තමන් ද අන්තර්ගත බවට සහ තම අදහස් වලට ප්‍රතිචාර දක්වන බවට විශ්වාසයක් සහිත ජනගහනයේ ප්‍රමාණය | 2021 - 2025 | සියලු පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ මීළඟ උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම. | ක්‍රියාකර ඇත |

| අරමුණු අංකය | අරමුණු හා ඉලක්ක | ඉලක්ක | කාල රාමුව | ආයතනයේ ක්‍රියාකාරී දර්ශකය | ප්‍රගතිය/ වර්තමාන තත්ත්වය |
|---|---|---|---|---|---|
| 17. ක්‍රියාවට නැංවීමේ ක්‍රම සවිමත් කිරීම සහ තිරසර සංවර්ධනය සඳහා වන ගෝලීය සහයෝගීතාවයේ පුනර්ජීවනය. | 17.8 2017 වන විට අවම වශයෙන් සංවර්ධනය වී ඇති රටවල් සඳහා තාක්ෂණ බැංකු හා විද්‍යාව තාක්ෂණය හා නවෝත්පාදන ධාරිතාවන් ගොඩනැංවීමේ යාන්ත්‍රණ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීම සහ විශේෂයෙන් තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන තාක්ෂණයන්හි නව තාක්ෂණය භාවිතා කිරීම වැඩිදියුණු කිරීම. | මැතිවරණ ක්‍රියාවලිය සඳහා නූතන තාක්ෂණ ක්‍රමවේද යොදා ගැනීම. | 2021 - 2025 | – ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම.<br>– මැතිවරණ ක්‍රියාවලියට දායකත්වය දක්වන සියලුම රජයේ නිලධාරීන්ගේ දත්ත පද්ධතිය සකස් කිරීම.<br>– ඒ අනුව මැතිවරණ රාජකාරි සඳහා අනුයුක්ත කිරීම.<br>– ඡන්දහිමි නාමලේඛනය සකස් කිරීමේදී ඇතිවන ගැටළු විසඳා ගැනීම සඳහා ඇමතුම් මධ්‍යස්ථානයක් හා මාර්ගගත ක්‍රම ස්ථාපිත කිරීම. | ක්‍රියාකර ඇත |
| | 17.16 විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවත්නා රටවල්ද ඇතුළුව සියලුම රටවලට තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම සඳහා විවිධ පාර්ශවයන්ගේ හවුල්කාරීත්වයෙන් දැනුම, පළපුරුද්ද, තාක්ෂණය සහ මූල්‍ය සම්පත් සජීවීකරණය සහ බෙදා ගැනීම ඔස්සේ තිරසර සංවර්ධනය සඳහා වූ ජගත් හවුල්කාරීත්වය වැඩිදියුණු කිරීම | සියලු පාර්ශවකරුවන් ඇතුළත් දත්ත පද්ධතියක් සැකසීම. | 2021 - 2025 | – මැතිවරණ නීතිය පිළිබඳව නිලධරයන්, ආරක්ෂක අංශ හා මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම. | ඒ ඒ වර්ෂයට අදාළව ක්‍රියාකර ඇත. |

**5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.**

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මෙ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49% | 50%-74% | 75%-100% |
| 05 පරිච්ඡේදය බලන්න | - | | | | 80% |

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 56 | 46 | 10 |
| තෘතීයික | 21 | 16 | 05 |
| ද්විතියික | 524 | 475 | 49 |
| ප්‍රාථමික | 209 | 166 | 43 |

මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලය, පහත සඳහන් තනතුරුධාරී නිලධාරී මණ්ඩලයකින් සමන්විතය. මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ඇතුළු සාමාජිකයින් පස් දෙනා හැරුණුවිට කොමිෂන් සභාව සඳහා ලේකම්වරයෙක් සිටී. ඒ හැර මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට, මැතිවරණ කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ (ශ්‍රී ලං.ප.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවයේ (ශ්‍රී ලං.ග.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ (ශ්‍රී.ලං.තො.ස.තා.සේ.) නිලධාරීන්, ශ්‍රී ලංකා සැලසුම් සේවයේ (ශ්‍රී ලං.සැ.සේ.) නිලධාරීන්, නීති නිලධාරීන්, භාෂා පරිවර්තක නිලධාරීන්ගෙන් කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන්, හා මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලයේ කළමනාකරණ සේවා නිලධාරීන්, සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන්, තොරතුරු තාක්ෂණ සහකාර නිලධාරීන්, ලේඛන සහකාරවරුන්, කාර්යාල කාර්ය සහයකයින් හා රියදුරන් ඇතුළත් වේ. ඒ අනුව 2025.12.31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ සමස්ත කාර්ය මණ්ඩලයේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

| | සංඛ්‍යාව |
|---|---|
| මාණ්ඩලික නිලධාරීන්<br>(මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයින් හැර අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් ඇතුළුව) | 62 |
| කළමනාකරණ සේවා නිලධාරීන් | 380 |
| සංවර්ධන නිලධාරී | 56 |
| කාර්මික නිලධාරී (සිවිල්) | - |
| තොරතුරු තාක්ෂණ සහකාර | 10 |
| ලේඛන සහකාර | 27 |
| පිළිගැනීමේ නිලධාරී | 01 |
| කාර්යාල කාර්ය සහායක | 122 |
| රියදුරු | 44 |
| රිය ශෝධක | - |

### 6.2. මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ මාණ්ඩලික නිලධාරීන්ගේ ආයතන කටයුතු

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු මාණ්ඩලික නිලධාරීන් සම්බන්ධයෙන් අදාළ කාලය තුළ සිදු කරන ලද වෙනස්කම් පහත සඳහන් පරිදි වේ.

#### 6.2.1. නව පත් කිරීම.

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතුව සිටි මාණ්ඩලික නිලධාරීන්ගේ, තනතුරුවල පැවැති පුරප්පාඩු හා ස්ථාන මාරුවීම් අනුව ඇති වූ පුරප්පාඩු පිරවීමට අදාළව 2025.01.01 සිට 2025.12.31 දින දක්වා මැතිවරණ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද පත් කිරීම පහත දැක්වේ.

- ❖ පුරප්පාඩුව පැවැති මාතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ මාතර සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර :-

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5808 හා 2025.01.06 දිනැති ලිපිය මගින් මෙම කොමිෂන් සභාවට වෙත ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ පී.එස්.පතිරණ මහතා 2025.01.07 වන දින සිට මැතිවරණ කොමිෂන් සභාවට අනුයුක්ත කරන ලද අතර, 2025.01.09 සිට මාතර දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත්කරන ලදි.

- ❖ පුරප්පාඩුව පැවැති පොළොන්නරුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර :-

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ SLAS/240715/6689 හා 2025.01.28 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය මනෝජි ටී ගුරුසිංහ මහත්මිය 2025.02.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

- ❖ පුරප්පාඩුව පැවැති මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පරිපාලන නිලධාරී තනතුර:-

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PA/MAS/SU/39830 හා 2025.02.10 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද කළමනාකරණ සේවා නිලධාරී අධිශ්‍රේණියේ ඩබ්ලිව්.එම්.ආනන්ද වනසිංහ මහතා 2025.02.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහනුවර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පරිපාලන නිලධාරී වශයෙන් පත් කරන ලදි.

- ❖ පුරප්පාඩුව පැවැති ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර :-

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ SLAS/240715/6712 හා 2025.02.13 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය එස්.කේ.දේවනෙරංජන් මහතා 2025.02.27 දින සිට ක්‍රියාත්මක වන පරිදි ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

❖ පුරප්පාඩුව පැවැති මුලතිව් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් තනතුර :-

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ SLAS/240715/6707 හා 2025.02.17 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණිය එස්.සින්තුසා මහත්මිය 2025.03.12 දින සිට ක්‍රියාත්මක වන පරිදි මුලතිව් දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පත් කරන ලදි.

❖ පුරප්පාඩුව පැවැති මැතිවරණ කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ(තොරතුරු තාක්ෂණ) තනතුර :-

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක CS/ICTS/02/0014 හා 2025.03.26 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I ශ්‍රේණියේ එච්.එච්.ඩී.ඒ.ඩබ්.දමයන්ති මහත්මිය 2025.04.07 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධ්‍යක්ෂ - වැ.බ. (තොරතුරු තාක්ෂණ) වශයෙන් පත් කරන ලදි.

❖ පුරප්පාඩුව පැවැති මැතිවරණ කොමිෂන් සභාවේ නීති නිලධාරී තනතුර:-

මැතිවරණ කොමිෂන් සභාවේ විධායක සේවා ශණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා එච්.එම්.එස්.එල්.පිලපිටිය මෙනවිය 2025.06.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ නීති නිලධාරී වශයෙන් පත් කරන ලදි.

❖ පුරප්පාඩුව පැවැති මැතිවරණ කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ පරිපාලන නිලධාරී තනතුර:-

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PA/MAS/SU/54651 හා 2025.06.19 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද කළමනාකරණ සේවා නිලධාරී අධිශ්‍රේණියේ මිරානි අතපත්තු ලියනගේ මහත්මිය 2025.07.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන කාර්යාලයේ පරිපාලන නිලධාරී වශයෙන් පත් කරන ලදි.

❖ පුරප්පාඩුව පැවැති මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස්(පාලන) තනතුර:-

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5911 හා 2025.10.08 දිනැති ලිපියෙන් ස්ථාන මාරු කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියේ බී.එම්.අයි.එස්.එල්.බණ්ඩාර මහතා 2025.10.10 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වශයෙන් පත් කරන ලදි.

❖ පුරප්පාඩුව පැවැති මැතිවරණ කොමිෂන් සභාවේ මැතිවරණ කොමසාරිස් ජනරාල් තනතුර:-

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ඉ ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිගේ අංක EC/01/06 හා 2025.10.14 දිනැති ලිපිය මගින් 2025.11.14 දින සිට ක්‍රියාත්මක වන පරිදි "මැතිවරණ කොමසාරිස් ජනරාල්" තනතුර සඳහා එච්.ආර්.පී.පීරිස් මහතා පත් කිරීම.

### 6.2.2. නිදහස් කිරීම් හා විශ්‍රාම ගැන්වීම්.

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතුව සිට මැතිවරණ කොමිෂන් සභා සේවයෙන් නිදහස් කරන ලද මාණ්ඩලික නිලධාරීන් පහත දැක්වේ.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5823 හා 2025.05.02 දිනැති ලිපිය අනුව සහකාර මැතිවරණ කොමසාරිස් ජේ.ජෙනිටන් මහතා 2025.05.20 දින සේවයෙන් පසුව ස්ථාන මාරු කිරීම හේතුවෙන් මැතිවරණ කොමිෂන් සභාවෙන් නිදහස් කිරීම.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5587 හා 2025.08.20 දිනැති ලිපිය අනුව බදුල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් කේ. කාන්දීපන් මහතා 2025.08.29 දින සේවයෙන් පසුව ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට පත්කිරීම හේතුවෙන් මැතිවරණ කොමිෂන් සභාවෙන් නිදහස් කිරීම.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/6032 හා 2025.08.20 දිනැති ලිපිය අනුව මඩකලපුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් එම්.බී.මොහොමඩ් සුෆ්යාන් මහතා 2025.09.04 දින සේවයෙන් පසුව ස්ථාන මාරු කිරීම හේතුවෙන් මැතිවරණ කොමිෂන් සභාවෙන් නිදහස් කිරීම.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5745 හා 2025.10.29 දිනැති ලිපිය අනුව වවුනියාව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ආර්සී.අමල්රාජ් මහතා 2025.11.11 දින සේවයෙන් පසුව ස්ථාන මාරු කිරීම හේතුවෙන් මැතිවරණ කොමිෂන් සභාවෙන් නිදහස් කිරීම.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5075 හා 2025.11.03 දිනැති ලිපිය අනුව රත්නපුර දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් සුරංග අඹගහතැන්නෙ මහතා 2025.11.11 දින සේවයෙන් පසුව ස්ථාන මාරු කිරීම හේතුවෙන් මැතිවරණ කොමිෂන් සභාවෙන් නිදහස් කිරීම.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක PA/MAS/SU/34947 හා 2025.01.21 දිනැති ලිපිය අනුව වයස අවු:60 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 17 වන වගන්තිය ප්‍රකාරව 2025.03.29 දින සිට විශ්‍රාම ගැන්වීම අනුමත කරන ලද කළමනාකරණ සේවා නිලධාරී අධි ශ්‍රේණියේ ඩී.එල්.එස්.දීපිකා මහත්මිය මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් විශ්‍රාම ගැන්වීම.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/3612 හා 2025.08.13 දිනැති ලිපිය අනුව වයස අවු:60 සම්පූර්ණ වීම මත විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 02 සහ 17 වන වගන්තිය ප්‍රකාරව 2025.11.14 දින සිට විශ්‍රාම ගැන්වීම අනුමත කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ එම්.කේ.එස්.එස්.රත්නායක මහතා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයෙන් විශ්‍රාම ගැන්වීම.

### 6.2.3. අභ්‍යන්තර ස්ථාන මාරුවීම්:-

- ❖ මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු එම්.එම්.එස්.කේ.බණ්ඩාර මාපා මහතා 2025.01.06 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ පළාත් පාලන අංශයේ අතිරේක මැතිවරණ කොමසාරිස් වශයෙන් ස්ථාන මාරු කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී ආර්.එම්.එස්.පී.රත්නායක මහතා 2025.01.20 දින සිට බදුල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ රාජකාරී සඳහා පූර්ණ කාලීනව අනුයුක්ත කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී එච්.එල්.ටී.සාරංගා මහත්මිය 2025.01.20 දින සිට ගාල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ රාජකාරී සඳහා පූර්ණ කාලීනව අනුයුක්ත කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වශයෙන් සේවයේ නියුතු පී.රගුනාදන් මහතා 2025.02.06 දින සිට කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් ද 2025.03.06 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොළඹ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් ලෙස පූර්ණ කාලීනව ස්ථාන මාරු කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (මැතිවරණ ආරවුල් නිරාකරණ) වශයෙන් සේවයේ නියුතු ඒ.ඩී.පී.එන්.ආටිගල මෙනවිය 2025.02.13 දින සිට කොළඹ නාගරික මැතිවරණ කාර්යාලයේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් වශයෙන් ස්ථාන මාරු කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු ආර්.සසීලන් මහතා 2025.02.24 දින සිට යාපනය මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පූර්ණ කාලීනව අනුයුක්ත කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ මන්නාරම දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු වී.සිවරාජා මහතා 2025.02.24 දින සිට කිලිනොච්චි මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පූර්ණ කාලීනව අනුයුක්ත කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ යාපනය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු ආර්.සී.අමල්රාජ් මහතා 2025.02.25 දින සිට වවුනියාව මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පූර්ණ කාලීනව අනුයුක්ත කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ අනුරාධපුර දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු කේ.මුගුන්දන් මහතා 2025.03.06 දින සිට මන්නාරම මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පූර්ණ කාලීනව අනුයුක්ත කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ පොළොන්නරුව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු එන්.පී.පී.අයි.ආර්.ගුණරත්න මහතා 2025.03.10 දින සිට අනුරාධපුර මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පූර්ණ කාලීනව අනුයුක්ත කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ මොණරාගල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු එන්.රේගන් මහතා 2025.09.04 දින සිට මඩකලපුව මැතිවරණ කාර්යාලයේ සහකාර මැතිවරණ කොමසාරිස් වශයෙන් පූර්ණ කාලීනව අනුයුක්ත කිරීම.

- මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් වශයෙන් සේවයේ නියුතු එම්.එම්.එස්.කේ.බණ්ඩාර මාපා මහතා 2025.11.25 දින සිට මැතිවරණ කොමිෂන් සභාවේ ජාතික මැතිවරණ අංශයේ අතිරේක මැතිවරණ කොමසාරිස් වශයෙන් ස්ථාන මාරු කිරීම.

### 6.2.4. වැඩ බැලීම හා රාජකාරී ආවරණය කිරීම සඳහා කරන ලද පත් කිරීම් :-

- ❖ වවුනියාව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ආර්.සී.අමල්රාජ් මහතා මුලතිව් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2025.02.28 දින සිට වැඩ බැලීම සඳහා පත් කරන ලදි.

- ❖ කිලිනොච්චිය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වී.සිවරාජා මහතා මන්නාරම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2025.02.28 දින සිට වැඩ බැලීම සඳහා පත් කරන ලදි.

- ❖ මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා 2025.05.09 දින සිට විදේශගත වන බැවින් එම කාලය සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල් තනතුරේ රාජකාරී ආවරණය කිරීම සඳහා අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ) එච්.ආර්.පී.පීරිස් මහතා පත් කිරීම.

- ❖ කොළඹ නාගරික නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් ඒ.ඩී.පී.එන්.ආටිගල මෙනවිය වෛද්‍ය නිවාඩු ලබා ඇති බැවින් 2025.07.28 දින සිට රාජකාරී ආවරණය සඳහා නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (කොළඹ දිස්ත්‍රික්) පී.රගුනාදන් මහතා පත් කිරීම.

- ❖ බදුල්ල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් කේ.කාන්දීපන් මහතා ස්ථානමාරු ලබා ඇති හෙයින් බදුල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2025.09.02 දින සිට වැඩ බැලීම සඳහා නුවරඑළිය දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් කේ.ඒ.එල්.එස්.කලුගම්පිටිය මහතා පත් කිරීම.

- ❖ මොණරාගල දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් එන්.රේගන් මහතා අභ්‍යන්තර ස්ථානමාරු ලබා ඇති හෙයින් මොණරාගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2025.09.04 දින සිට වැඩ බැලීම සඳහා හම්බන්තොට දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් වී.ඩී.ජේ.ලක්මාල් මහතා පත් කිරීම.

- ❖ මැතිවරණ කොමසාරිස් ජනරාල් සමන් ශ්‍රී රත්නායක මහතා 2025.09.30 දින සිට 2025.10.05 දින දක්වා 21 වන අන්තර්ජාතික මැතිවරණ සම්මාන උළෙල සහ පර්යේෂණ සැසිය සඳහා සහභාගී වීම පිණිස විදේශගත වන බැවින් මැතිවරණ කොමසාරිස් ජනරාල් තනතුරේ වැඩ බැලීම සඳහා අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ) එච්.ආර්.පී.පීරිස් මහතා පත් කිරීම.

- ❖ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (කොළඹ දිස්ත්‍රික්) පී.රගුනාදන් මහතා 2025.10.22 දින සිට 2025.12.04 දින දක්වා ඉන්දියාවේ පැවැත්වෙන පුහුණු වැඩසටහනකට සහභාගී වීම පිණිස විදේශගත වන බැවින් රාජකාරී ආවරණය සඳහා කොළඹ නාගරික නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් ඒ.ඩී.පී.එන්.ආටිගල මෙනවිය පත් කිරීම.

- ❖ රත්නපුර දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් සුරංග අඹගහතැන්නෙ මහතා ස්ථාන මාරු ලබා ඇති හෙයින් රත්නපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2025.11.11 දින සිට වැඩ බැලීම සඳහා සහකාර මැතිවරණ කොමසාරිස් කේ.එච්.එම්.එස්.පී.කස්තුරිසිංහ මහතා පත් කිරීම.

- ❖ වවුනියාව දිස්ත්‍රික් සහකාර මැතිවරණ කොමසාරිස් ආර්.සී.අමල්රාජ් මහතා ස්ථාන මාරු ලබා ඇති හෙයින් වවුනියාව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2025.11.12 දින සිට වැඩ බැලීම සඳහා සහකාර මැතිවරණ කොමසාරිස් කේ.මුගුන්දන් මහතා පත් කිරීම.

- ❖ මැතිවරණ කොමිෂන් සභාවේ 2025.11.17 දින පැවති 117 වන රැස්වීමේ තීරණය පරිදි මැතිවරණ කොමසාරිස් ජනරාල් රාජකාරී හෝ පෞද්ගලික නිවාඩු ලබා ඇති අවස්ථාලදී මැතිවරණ කොමසාරිස් ජනරාල් තනතුරේ වැඩබැලීමට/ රාජකාරී ආවරණය කිරීමට අතිරේක මැතිවරණ කොමසාරිස් බී.පී.සී.කුලරත්න මහතා පත් කිරීම.
- ❖ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන) ජේ.ඒ.එස්.පී.ජයසිංහ මහතා අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන) තනතුරේ පුරප්පාඩුවට සුදුසු නිලධාරියෙක් පත් කරන තෙක් 2025.11.25 දින සිට වැඩ බැලීම සඳහා පත් කිරීම.

### 6.2.5. උසස් කිරීම්

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5592 හා 2025.02.24 දිනැති ලිපියෙන් පී.රගුනාදන් මහතා 2025.12.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කර ඇති බැවින් එදින සිට කොළඹ දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් තනතුරට පත් කරන ලදි.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5617 හා 2025.04.11 දිනැති ලිපියෙන් ආර්.සසීලන් මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට 2024.12.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස් කර ඇති බැවින් එදින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් තනතුරට පත් කිරීම.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 76/1/15/විශේෂ XXII වෙළුම - I හා 2025.06.06 දිනැති ලිපියෙන් එස්.අච්චුදන් මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කර ඇති බැවින් 2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ අතිරේක මැතිවරණ කොමසාරිස් තනතුරට පත් කිරීම.

- ❖ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/PRO/6/1190/2024 හා 2025.06.24 දිනැති ලිපිය මගින් කේ.කාන්දීපන් මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II ශ්‍රේණියට උසස් කිරීමේ දිනය 2019.02.26 ලෙස සංශෝධනය කිරීම.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 75/10/5587 හා 2025.07.17 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථාවේ 13.2 වගන්තිය හා එහි සංශෝධිත විධිවිධාන ප්‍රකාරව 2024.12.03 දින සිට ක්‍රියාත්මක වන පරිදි, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කේ.කාන්දීපන් මහතා ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියට උසස් කර ඇත.

- ❖ රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MPubAd/AcSD/3291 හා 2025.10.08 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාවේ 10.1.1 වගන්තිය හා එහි සංශෝධිත විධිවිධාන ප්‍රකාරව 2025.02.05 දින සිට ක්‍රියාත්මක වන පරිදි, වයි.ඩී.ගමගේ මහත්මිය ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ II ශ්‍රේණියට උසස් කර ඇත.

## 6.3. පාලන ශාඛාවේ කටයුතු

### 6.3.1. පාලන අංශය

#### 6.3.1.1. ඉදිකිරීම් හා අළුත්වැඩියා

**වැය විෂය - 2001**

මැතිවරණ මහලේකම් කාර්යාලයේ අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන) නිල කාමරය නවීකරණය, උතුරු පර්යන්ත ගොඩනැගිල්ලේ දෙවන මහලේ පිහිටි කෑම කාමරය අලුත්වැඩියාව ඇතුළු අනෙකුත් හදිසි අලුත්වැඩියා, මැතිවරණ මහලේකම් කාර්යාලයේ මළඅපවහන පද්ධතිය අලුත්වැඩියා කිරීම, බිම් මහලේ බෙදා වෙන් කිරීම්, මැතිවරණ මහලේකම් කාර්යාලයේ ගිණි ආරක්ෂණ පද්ධතිය යථාවත් කිරීම හා ඊට අදාළව නව ජල පොම්පාගාරයක් ස්ථානගත කිරීම, උතුරු පර්යන්ත ගොඩනැගිල්ලේ බිම් මහලේ පිහිටි මාණ්ඩලික නිලධාරී නවාතැන් කාමරය අලුත්වැඩියා කිරීම, මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික නිල කාමර අලුත්වැඩියා කිරීම, පරිපාලන නිලධාරී නිල කාමරය ප්‍රතිස්ථාපනය කිරීම, විදුලි ජනක යන්ත්‍ර තබා ඇති ගොඩනැගිලිවල දැල් ආවරණය කිරීම, මැතිවරණ මහලේකම් කාර්යාලයට පැමිණෙන ආබාධිත ප්‍රජාවට පහසුකම් සැලසීම සඳහා ස්ථානයක් සකස් කිරීම සහ බත්තරමුල්ල රජමල්වත්තේ පිහිටි මැතිවරණ කොමිෂන් සභාවට අයත් ඉඩම වටා ආරක්ෂක වැට නවීකරණය ඇතුළු අලුත්වැඩියාවන් සිදුකර ඇත.

එමෙන්ම කොළඹ (නාගරික), ගම්පහ, නුවරඑළිය, ගාල්ල, මාතර වවුනියාව, මන්නාරම, ත්‍රිකුණාමලය, මඩකලපුව කුරුණෑගල, පුත්තලම කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම් සහ කළුතර, මහනුවර, දිස්ත්‍රික් නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් නිල නිවාස සහ නුවරඑළිය, මාතර, මඩකලපුව, අනුරාධපුර, පොළොන්නරුව, මොණරාගල දිස්ත්‍රික්වල මැතිවරණ කොමිෂන් සභාවට අයත් නිල නිවාස අලුත්වැඩියා කිරීම් මෙන්ම නුවරඑළිය සහ ත්‍රිකුණාමලය සංචාරක බංගලාවන්හි හදිසි අලුත්වැඩියා කිරීම් ද සිදුකර ඇත.

**වැය විෂය - 2104**

මහල් 04 කින් යුත් යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ දෙවන අදියරේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත. තෙවන අදියරේ කටයුතු මේ වන විට ක්‍රියාත්මකව ඇති අතර, යාපනය දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය, එකී නව ගොඩනැගිල්ලේ බිම් මහලේ සහ පළමු මහලේ ස්ථාපිත කර ඇත.

#### 6.3.1.2. දේශීය පුහුණු

2025 ජනවාරි මස 08 වන දින භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණුවක් අතුරුගිරිය ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ දී මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයන් 43 දෙනෙකුගේ සහභාගිත්වයෙන් සිංහල බසින් පැවැත්වීමට ක්‍රියා කර ඇත.

2025 ජනවාරි මස 18 දින භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණුවක් වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයන්ගේ සහභාගිත්වයෙන් දමිළ බසින් පැවැත්වීමට ක්‍රියාකර ඇත.

2025 පෙබරවාරි මස 14 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී ලිපිගොනුකරණය පිළිබඳ පුහුණු වැඩමුළුවක් සඳහා කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් 06 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 පෙබරවාරි මස 20 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී ගබඩා කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුවක් සඳහා කළමනාකරණ සේවා නිලධාරීන් දෙදෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 පෙබරවාරි මස 28 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී හානි පාඩු මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය පිළිබඳ පුහුණු වැඩමුළුවක් සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයේ හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල ප්‍රසම්පාදනය පිළිබඳ විෂය කරනු ලබන කළමනාකරණ සේවා නිලධාරීන් 04 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 මැයි මස 28 හා 29 දෙදින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩමුළුවක් සඳහා මැතිවරණ මහලේකම් කාර්යාලයේ හා අම්පාර, හම්බන්තොට, මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කළමනාකරණ සේවා නිලධාරීන් හා සංවර්ධන නිලධාරීන් 09 දෙනෙක් සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 ජුනි මස 04 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩමුළුවක් සඳහා මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ හා අම්පාර, හම්බන්තොට, මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කළමනාකරණ සේවා හා සංවර්ධන නිලධාරීන් 04 දෙනෙක් සහභාගී විය.

2025 ජුනි මස 04 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී ගබඩා කළමණාකරනය පිළිබඳ පුහුණු වැඩමුළුවක් සඳහා අම්පාර, මාතලේ, පොළොන්නරුව, රත්නපුර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කළමනාකරණ සේවා නිලධාරීන් 05 දෙනෙක් සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 ජුනි මස 13 හා 14 දෙදින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුවක් සඳහා අම්පාර, හම්බන්තොට, මාතලේ, මඩකලපුව, රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කළමනාකරණ සේවා, සංවර්ධන හා ලේඛන සහකාර නිලධාරීන් 08 දෙනෙක් සහභාගී විය.

2025 ජුනි මස 19 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී හානි පාඩු මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය පිළිබඳ වැඩසටහන සඳහා මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ හා මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කළමනාකරණ සේවා හා සංවර්ධන නිලධාරීන් නිලධරයන් 06 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 ජුනි 12 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී රථ වාහන නඩත්තු පිළිබඳ කළුතර, වවුනියාව, පොළොන්නරුව හා මාතලේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල රියදුරු මහතුන් 04 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 ජුනි මස 19 වන දින සී/ස නිපුණතා සංවර්ධන අරමුදල (SDFL) දී රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "B" ගිණුම් පිළියෙළ කිරීම පිළිබඳ වැඩමුළුව සඳහා මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ නිලධරයන් දෙදෙනෙකු සහභාගී විය.

2025 අගෝස්තු මස 11 වන දින Metropolitan Campus KDU හී දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් ලිපි ලිවීම පිළිබඳ වැඩමුළුවක් මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ නිලධරයන් 04 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 ජුනි මස 14 හා 15 දෙදින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ වැඩුමළුවක් මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ හා කළුතර, කුරුණෑල, රත්නපුර, නුවරඑළිය, වවුනියාව, පොළොන්නරුව හා කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කළමනාකරණ සේවා නිලධරයන් 12 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 සැප්තැම්බර් මස 10 දින දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ දී පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව පිළිබඳ මූලික වැඩමුළුව සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් 04 දෙනෙකු සහභාගී විය.

2025 සැප්තැම්බර් මස 02 දින දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ දී කාර්යාල කාර්යය සහයකයින් රියදුරන්ගේ ආකල්ප හා වෘත්තීය දැනුම ඉහල නැංවීම පිළිබඳ මූලික වැඩමුළුවක් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යාල කාර්යය සහයක නිලධාරීන් 05 දෙනෙකු හා රියදුරු මහතුන් 02 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 අගෝස්තු මස 29 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී හානි පාඩු මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය පිළිබඳ වැඩමුළුවක් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් 02 දෙදෙනෙකු හා කළුතර හා කෑගල්ල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල නිලධාරීන් 02 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

2025 අගෝස්තු මස 21 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී කාර්යාල ක්‍රම පිළිබඳ වැඩමුළුවක් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් හා කළුතර, මාතලේ, නුවරඑළිය, කුරුණෑගල හා රත්නපුර හා පොළොන්නරුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල නිලධාරීන් 13 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කර ඇත.

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන දෙවන බස දෙමළ පැය 200 පුහුණු වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් 04 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

දෙවන බස දෙමළ පැය 150 පුහුණු වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් 02 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකර ඇත.

සියලුම දිස්ත්‍රික් වල ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරයන් 25 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මු.රෙ.135 යටතේ පරීක්ෂණය කිරීම හා වවුචර්පත් සම්බන්ධයෙන් එක් දින පුහුනු වැඩසටහනක් මැතිවරණ කොමිෂන් සභාවේ දී පවත්වන ලදී.

2025 ජූලි මස 29 දින දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ දී රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් විධිවිධාන පිළිබඳ මූලික වැඩමුළුවක් සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ පරිපාලන නිලධාරී සහභාගී කරවීමට ක්‍රියා කරන ලදී.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පවත්වනු ලබන Researcher Development Program පාඨමාලාව සඳහා නිලධරයන් 02 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියා කරන ලදී.

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව මඟින් පවත්වනු ලබන Introduction Workshop on the Electronic Procurement Monitoring System වැඩසටහන සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් තිදෙනෙකු සහභාගී කරන ලදී.

උපාය මාර්ග සැලැස්මට අනුව ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනය පිළිබඳ පුහුණු වැඩසටහනක් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් 56 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025.09.09 දින මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්විණි.

2025 සැප්තැම්බර් මස 16,23 හා 30 යන තෙදින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී පරිපාලන නිලධාරී සංවර්ධන ධාරිතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව සඳහා නිලධරයන් 02 දෙනෙකු සහභාගී කරවීමට ක්‍රියාකරන ලදී.

2025 සැප්තැම්බර් මස 17,26 හා ඔක්තෝම්බර් මස 01 යන තෙදින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලිය හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ වැඩමුළුව සඳහා එක් නිලධරයකු සහභාගී කරවීමට ක්‍රියා කරන ලදී.

උපාය මාර්ග සැලැස්මට අනුව ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනය පිළිබඳ පුහුණු වැඩසටහනක් මැතිවරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල නිලධරයන් 13 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025.09.26 දින බදුල්ල සේවා සංස්කරණ ආයතනය, බිඳුණුවැව දී පැවැත්විණි.

උපාය මාර්ග සැලැස්මට අනුව ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනය පිළිබඳ පුහුණු වැඩසටහනක් මැතිවරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල නිලධරයන් 20 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025.10.13 දින අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවැත්විණි.

උපාය මාර්ග සැලැස්මට අනුව ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනය පිළිබඳ පුහුණු වැඩසටහනක් මැතිවරණ කොමිෂන් සභාවේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල නිලධරයන් 20 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025.10.14 දින වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවැත්විණි.

2025 සැප්තැම්බර් මස 23 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී රජයේ වාහන නඩත්තුව පිළිබඳ වැඩමුළුව සඳහා කොළඹ නාගරික, ගම්පහ, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්කවල වාහන විෂයභාර නිලධරයන් 04 දෙනෙකු කරවීමට ක්‍රියා කරන ලදී.

2025 ඔක්තෝම්බර් මස 03 ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී ගබඩා කළමනාකරණය පිළිබඳ වැඩමුළුව සඳහා ප්‍රධාන කාර්යාලයේ හා කොළඹ දිස්ත්‍රික්, මහනුවර, ත්‍රිකුණාමලය හා මොණරාගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල 05 දෙනෙකු බැගින් සහභාගී කරවීමට ක්‍රියා කරන ලදී.

2025 ඔක්තෝම්බර් මස 14 හා 15 යන දෙදින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී ගිණුම්කරණ කාර්යයභාරය හා ප්‍රායෝගික භාවිතය පිළිබඳ වැඩමුළුව සඳහා ප්‍රධාන කාර්යාලයේ නිලධරයන් 04,කොළඹ නාගරික 01, මහනුවර 02, මාතලේ/ නුවරඑළිය/මාතර/කුරුණෑගල දිස්ත්‍රික් වලින් නිලධරයන් 01අයෙකු බැගින් හා කුරුණෑගල දිස්ත්‍රික්කයෙන් නිලධරයන් 02 දෙදෙනෙකු සහභාගී කරවන ලදී.

2025 ඔක්තෝම්බර් මස 15 හා 16 දෙදින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී සංවර්ධන නිලධාරීන්ගේ හා කළමනාකරණ සේවා නිලධාරීන්ගේ කුසලතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව සඳහා කොළඹ නාගරික, කළුතර,මාතලේ,නුවරඑළිය,ගාල්ල,බදුල්ල,මොණරාගල දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල නිලධරයන් 07 දෙනෙකු මෙම වැඩමුළුව සඳහා සහභාගී කරවන ලදී.

2025 ඔක්තෝම්බර් මස 16 දින වැටුප් පරිවර්තනය පිළිබඳ විවෘත හා දුරස්ථ ඉගෙනුම් මධ්‍යස්ථානයේ පැවති පුහුණු පාඨමාලාව සඳහා මැතිවරණ මහ ලේකම් කාර්යාලයේ නිලධරයන් 05 දෙනෙකු සහභාගී කරවීමට කටයුතු කරන ලදී.

2025 නොවැම්බර් මස 14 දින ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ දී පැවති මූලික විමර්ශන පිළිබඳ වැඩමුළුව සඳහා ගම්පහ, මාතලේ, මාතර හා පුත්තලම දිස්ත්‍රික්කවල නිලධරයන් 04 දෙනෙකු සහභාගී කරවන ලදී.

මැතිවරණ කොමිෂන් සභාව වෙත ස්ථාන මාරුවීම් ලැබ පැමිණි හා නවක පත්වීම් ලබා පැමිණි නිලධරයන් 39 දෙනෙකු සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව මූලික හඳුන්වා දීමේ වැඩසටහනක් 2025.12.18 හා 19 දෙදින මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්විණි.

### 6.3.1.3. මැතිවරණ ක්‍රමවේද සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය (IFES) මඟින් පවත්වන ලද පුහුණු

2024 ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ සහ 2024 පාර්ලිමේන්තු මහ මැතිවරණයේ උගත් පාඩම් පිළිබඳ සාකච්ඡාවක් හා පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ සංවිධාන කටයුතු පිළිබඳ වැඩමුළුවක් නිලධරයන් 55 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025 ජනවාරි 09 සහ 10 දෙදින මීගමුව, අමගි අරියා හිදී පැවැත්විණි.

මැතිවරණ ක්‍රියාවලියට අදාළ තොරතුරු දැනගැනීමේ පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුවක් නිලධරයන් 47 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025 ජනවාරි 26 සහ 27 දෙදින දඹුල්ල, අවුඩන්ගාව කොවැන්රෝ සීගිරිය හිදී පැවැත්විණි.

2025 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ උගත් පාඩම් හා ඉදිරි උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම පිළිබඳ වැඩමුළුවක් නිලධරයන් 38 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025 මැයි 27 සහ 28 දෙදින හලාවත, බංගදෙණිය අනන්තය රිසෝට් හිදී පැවැත්විණි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් වන වැඩමුළුවක් නිලධරයන් 30 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025 ජූනි 23 හා 24 දෙදින මැතිවරණ කොමිෂන් සභාවේ හා සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල ප්‍රසම්පාදන විෂය කටයුතු සිදු කරන කළමනාකරණ හා සංවර්ධන නිලධාරීන් සඳහා ආඩිඅම්බලම, ටමරින්ඩ් ට්‍රී ගාර්ඩ්න් හිදී පැවැත්විණි.

මැතිවරණ කොමිෂන් සභාවේ 2026 - 2029 උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම පිළිබඳ වැඩමුළුවක් නිලධරයන් 45 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025 සැප්තැම්බර් 18 සහ 19 දෙදින සීදූව, විවන්තා කලම්බු හිදී පැවැත්විණි. එම අවස්ථාවේ ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.












මැතිවරණ මෙහෙයුම් සැලැස්ම හා එය ක්‍රියාත්මක කිරීම පිළිබඳව දිස්ත්‍රික් තේරීම්භාර නිලධරයන් / දිසාපතිවරුන් / දිස්ත්‍රික් ලේකම්වරු සහ ඡන්ද විමසීම්වල මූලික කටයුතු සිදුකරනු ලබන ඒ ඒ දිස්ත්‍රික්කවල මාණ්ඩලික නිලධරයන් / කමිටු ප්‍රධානීන් සහ ප්‍රමුඛ නිලධරයන් සඳහා පහත සඳහන් දිස්ත්‍රික්ක ආවරණය කරමින් පුහුණුවක් ලබාදීමට ක්‍රියාකරන ලදී.

මාතර, හම්බන්තොට, පුත්තලම, මඩකලපුව, ත්‍රිකුණාමලය, වව්නියාව, මුලතිව් හා මන්නාරම, අනුරාධපුර සහ මොණරාගල දිස්ත්‍රික්කවල නිලධරයන් සඳහා එකී පුහුණුව ලබාදීමට ක්‍රියාකර ඇත.

### 6.3.1.4. කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (KOICA) ආයතනය මඟින් පවත්වන ලද පුහුණු

කෘත්‍රිම බුද්ධිය ඇතුළු ඩිජිටල් නව්‍යකරණය පිළිබඳ වැඩමුළුවක් මැතිවරණ කොමිෂන් සභාවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සහභාගීත්වයෙන් KOICA ආයතනයේ අනුග්‍රහයෙන් විසින් 2025.08.14 දින මැතිවරණ කොමිෂන් සභාවේ ප්‍රධාන ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට ක්‍රියාකරන ලද අතර එය ඉතා සාර්ථක වැඩමුළුවක් විය.








### 6.3.1.5. Factum ආයතනය මඟින් පවත්වන ලද පුහුණු

Training on Social Media Monitoring පිළිබඳ වැඩමුළුවක් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් හා මැතිවරණයන්හිදී සමාජ මාධ්‍යය පිළිබඳව කටයුතු කරනු ලබන වෙනත් රාජ්‍ය ආයතන කිහිපයක නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2025.03.05 දින සිට 2025.03.07 දින දක්වා මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්විණි.

Training on Social Media Monitoring පිළිබඳ වැඩිදුර පුහුණුව සඳහා වූ වැඩමුළුවක් මැතිවරණ කොමිෂන් සභාවේ නිලධාරීන් 13 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025.09.11 දින මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්විණි. එම අවස්ථාවේ ලබාගත් ඡායාරූප කිහිපයක් පහත දැක්වේ. එය දිස්ත්‍රික් මට්ටමේදී සමාජ මාධ්‍යය සමඟ කටයුතු කරන නිලධරයන්, සිය අත්දැකීම් බෙදා ගැනීම සඳහා යොදාගන්නා ලද අවස්ථාවක් විය.





Training on Social Media Monitoring පිළිබඳ වැඩමුළුවක් මැතිවරණ කොමිෂන් සභාවේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල නිලධාරීන් 28 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2025.09.24 සහ 25 දෙදින මැතිවරණ කොමිෂන් සභාවේ දී පැවැත්විණි. එම අවස්ථාවේ ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.
















### 6.3.2. ආයතන අංශය

ආයතන අංශය අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන), නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් සහ සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. ඒ අනුව මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයේ පරිපාලන නිලධාරි මෙහෙයවීමෙන් හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීන් 02 නෙකුගේ සහ කළමනාකරණ සේවා නිලධාරින් නව දෙනෙකුගෙන් සමන්විතව ක්‍රියාත්මක වේ. තවද, පරිපාලන නිලධාරිණියගේ මෙහෙයවීම හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිගේ සුපරීක්ෂණයෙන් සිදු වන පිළිගැනීමේ කවුළුවක් ද වේ.දිවයිනේ පිහිටි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල 27 ක සහ මැතිවරණ මහලේකම් කාර්යාලයේ මාණ්ඩලික නොවන නිලධාරීන්ගේ සියලුම ආයතන කටයුතු, මැතිවරණ කොමිෂන් සභාවේ ආයතනික පරිපාලන කටයුතුද,පවිත්‍රතා හා ආරක්ෂක අංශ අධීක්ෂණයද මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරයවේ.

#### 6.3.2.1. කාර්ය මණ්ඩල කටයුතු

ආයතන අංශයට අනුයුක්තව සේවය කරන කළමනාකරණ සේවා නිලධාරින්ට පැවරී ඇති රාජකාරී කටයුතු පිළිබඳව 2025 වර්ෂයේදී නිලධාරීන්ගේ කාර්ය සාධන සැලැස්මක් සකස් කරන ලද අතර, මාස 03කට වරක් එහි ප්‍රගතිය සමාලෝචනය කිරීමට පියවර ගන්නා ලදී.

#### 6.3.2.2. කළමනාකරණ සේවා නිලධාරි සේවය

2025 වාර්ෂික ස්ථාන මාරුවීම් යටතේ කළමනාකරණ සේවා නිලධරයන් 04 දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට ස්ථාන මාරු ලබා ඉවත්ව ගිය අතර, එලෙස ස්ථාන මාරු වී ගිය නිලධරයන් 04 දෙනාගේම අනුප්‍රාප්තික නිලධරයන් සේවය සඳහා වාර්තා කරන ලදි.

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ කළමනාකරණ සේවා නිලධරයන් 15 දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව කළමනාකරණ සේවා නිලධාරීන් 06 නෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

මැතිවරණ කොමිෂන් සභාවට අනුමත වී පැවති ලේඛන සහකාර තනතුරු 51න් තනතුරු 23ක් යටපත් කර කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 23ක් මු.රෙ.71 යටතේ අලුතින් ඇති කිරීමට අදාලව නිර්දේශ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලද අතර, ඉදිරිපත් කරන ලද කරුණු හා සේවා අවශ්‍යතාව සැලකිල්ලට ගෙන මෙම කොමිෂන් සභාව සඳහා අනුමත ලේඛන සහකාර තනතුරු 23ක් යටපත් කර කළමනාකරණ සේවා නිලධාරි තනතුරු 23ක් අලුතින් ඇති කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව අලුතින් ඇතිවූ එම තනතුරු සංඛ්‍යාව හා එදිනට පැවති කළමනාකරණ සේවා නිලධාරි පුරප්පාඩු සංඛ්‍යාවද සමඟ මුළු පුරප්පාඩු සංඛ්‍යාව 46ක් විය. එම පුරප්පාඩු සඳහා ඉදිරි බඳවා ගැනීම් වලින් නිලධරයන් ලබා දෙන ලෙස ලේකම් (රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය) වෙතින් ඉල්ලීමක් සිදු කරන ලදී.

### 6.3.2.3. සංවර්ධන නිලධාරි සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ සංවර්ධන නිලධාරි සේවයේ නිලධරයන් 06 දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව සංවර්ධන නිලධාරීන් 06 දෙනෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

### 6.3.2.4.තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධරයන් 01 අයෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධරයන් 01 අයෙකු ස්ථාන මාරු ලබා දෙන ලදී.

### 6.3.2.5. කාර්යාල සේවක සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ කාර්යාල සේවක සේවයේ සේවකයින් 03 දෙනෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව කාර්යාල සේවක සේවයේ සේවකයින් 01 අයෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

### 6.3.2.6. රියදුරු සේවය

අන්තර් දෙපාර්තමේන්තු ස්ථාන මාරුවීම් යටතේ මෙම කොමිෂන් සභාවට පැමිණීමට කැමැත්ත පළ කළ රියදුරු 01 අයෙකු මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය මත ස්ථාන මාරු කර ගන්නා ලදී.

මැතිවරණ කොමිෂන් සභාවෙන් පිටතට අනුප්‍රාප්තිකයින් රහිතව රියදුරුන් 03 දෙනෙකු ස්ථාන මාරු ලබා යන ලදී.

### 6.3.2.7. නව බඳවා ගැනීම්

#### 6.3.2.7.1. කාර්මික නිලධාරි (සිවිල්) තනතුරට බඳවා ගැනීම

මැතිවරණ කොමිෂන් සභාවේ පුරප්පාඩුව පවතින මෙම තනතුර සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම සඳහා, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරි කමිටුව වෙත අනුමැතිය සඳහා ලිපි යොමු කරන ලදී. ඒ අනුව කාර්මික නිලධාරි (සිවිල්) තනතුර සඳහා අදාල සේවා ව්‍යවස්ථාව/ අනුමත බඳවා ගැනීම් පටිපාටිවල විධිවිධානයන්ට අනුගතව බඳවා ගැනීම සිදු කිරීමට ඉහත කමිටුවේ අනුමැතිය ලබා දෙන ලදී. මේ අනුව මේ සඳහා බඳවා ගැනීම් පටිපාටියක් කෙටුම්පත් කර අනුමැතිය ලබා ගැනීමට අදාල කටයුතු දැනට සිදුවෙමින් පවතී.

#### 6.3.2.7.2. විදුලි කාර්මික නිලධාරි තනතුරට බඳවා ගැනීම

මැතිවරණ කොමිෂන් සභාවේ පුරප්පාඩුව පැවති විදුලි කාර්මික නිලධාරි තනතුර සඳහා නව බඳවා ගැනීම් සිදු කිරීම සඳහා, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්ය මණ්ඩල කළමනාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කළ නිලධාරි කමිටුව වෙත අනුමැතිය සඳහා ලිපි යොමු කරන ලදී. ඒ අනුව විදුලි කාර්මික නිලධාරි තනතුර සඳහා අදාල සේවා ව්‍යවස්ථාව/ අනුමත බඳවා ගැනීම් පටිපාටිවල විධිවිධානයන්ට අනුගතව බඳවා ගැනීම සිදු කිරීමට ඉහත කමිටුවේ අනුමැතිය හිමි වන ලදී. මේ අනුව මෙම තනතුර සඳහා බඳවා ගැනීම් පටිපාටියක් කෙටුම්පත් කර අනුමැතිය සඳහා ආයතන අධ්‍යක්‍ෂ ජනරාල් වෙත යොමු කර ඇත.

### 6.3.2.8. සේවය හැරයාමේ නිවේදන නිකුත් කිරීම

මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතුව සිටි පහත නම් සඳහන් නිලධරයන් විධිමත්ව නිවාඩු අනුමත කරවා ගැනීමකින් තොරව රාජකාරිය සඳහා වාර්තා කර නොමැතිවීම මත රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති 1 වන කාණ්ඩයේ XV පරිච්ඡේදයේ 214 වන වගන්තිය ප්‍රකාරව තනතුර අතහැර ගියාසේ සලකා කටයුතු කරන ලදී.

| අනු අංකය | නම | තනතුර | ක්‍රියාත්මක වන දිනය |
|---|---|---|---|
| 01 | කේ.ජී.සී.ජේ. කපුගම මහතා | කළමනාකරණ සේවා නිලධාරි II | 2019.03.30 සිට |
| 02 | එම්.එච්.එම්. හස්මත් මහතා | කාර්යාල සේවක සේවය III | 2022.02.09 සිට |
| 03 | ජී.කේ. ගයන්ත මහතා | කාර්යාල සේවක සේවය III | 2024.10.28 සිට |
| 04 | එන්. ලලිතා ශක්ති මිය | කළමනාකරණ සේවා නිලධාරි III | 2024.01.01 සිට |
| 05 | එම්.ඒ.ඩී. වීරසේකර මහතා | කාර්යාල සේවක සේවය II | 2024.02.01 සිට |
| 06 | එස්. ක්‍රිෂ්ණනර්මදා මෙය | කළමනාකරණ සේවා නිලධාරි III | 2023.11.24 සිට |
| 07 | එන්. දිනේෂ් මහතා | කාර්යාල සේවක සේවය III | 2022.11.07 සිට |

### 6.3.2.9. මියයාම්

මඩකලපුව දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අනුයුක්තව සේවය කළ සංවර්ධන නිලධාරි III එම්. ප්‍රශාන්තන් මහතා 2025.10.30 දින සිය දිවි හානි කර ගන්නා ලදී.

### 6.3.2.10. විශ්‍රාම ගැන්වීම්

මැතිවරණ කොමිෂන් සභාවේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 01 නිලධරයෙකු, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ අධිශ්‍රේණියේ 01 නිලධරයෙකු, කළමනාකරණ සේවා නිලධාරි සේවයේ නිලධාරීන් 15 දෙනෙකු, කාර්යාල සේවක සේවයේ සේවක මහතුන් 02 නෙකු හා රියදුරු සේවයේ සේවක මහතුන් 01 අයෙකු 2025 වර්ෂය තුළ විශ්‍රාම ගන්නා ලදී. මෙලෙස විශ්‍රාම ලබා ගත් 20 දෙනාගෙන් 19 දෙනෙකුගේ විශ්‍රාම ලිපි ගොනුවල කටයුතු සිදු කර අවසන් කරන ලදී. 2025 වර්ෂයේ දෙසැම්බර් මාසයේ විශ්‍රාම යන ලද එක් නිලධරයෙකුගේ විශ්‍රාම ලිපි ගොනුවල කටයුතු අවසන් අදියරේ පවතී. විශ්‍රාම ගත් නිලධාරීන් හා සේවක මහතුන් පිළිබඳ විස්තරාත්මක වාර්තාව සටහන 31 ලෙස යා කර ඇත.

නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (කොළඹ දිස්ත්‍රික්) තනතුරෙහි සේවයේ යෙදී සිටියදී 2024.12.08 දින මිය ගිය ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I ශ්‍රේණියේ ආර්.එස්. වෙදගේ මහතාගේ මරණ පාරිතෝෂිකය ඔහුගේ කලත්‍රයා හට සහ එම දරුවා වෙත ගෙවීම් කිරීමට අදාල කටයුතු නියමිත පරිදි ඉටු කරන ලදී.

### 6.3.2.11. තනතුරෙන් මුදා හැරීම

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ කේ.ඒ.ඩී. සමන්තිකා මහත්මිය, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරකට පත්වීම් ලබා තිබීම නිසා එම පත්වීම භාර ගැනීමට හැකි වන පරිදි දරන ලද තනතුරෙන් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය සමත් මැතිවරණ කොමිෂන් සභාවට අනුයුක්තව සේවය කරන ලද ලේඛන සහකාර නිලධරයන් 11 දෙනෙකු සහ කාර්යාල සේවක සේවයේ 05 දෙනෙකු කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ පත්වීම් ලබා තිබීම නිසා එම පත්වීම් භාර ගැනීමට හැකි වන පරිදි දරන ලද තනතුරු වලින් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ ඒ.ටී.එල්. ද අල්විස් මහත්මිය, විද්‍යාත්මක සේවයේ III වැනි ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරි ශ්‍රේණියේ තනතුරකට පත්වීම් ලබා තිබීම නිසා එම පත්වීම භාර ගැනීමට හැකි වන පරිදි දරන ලද තනතුරෙන් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.
කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියේ ටී. ජනර්තන් මහතා, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත - ඛණ්ඩ 2 සේවා ගණයේ බලයලත් නිලධාරි තනතුරේ II ශ්‍රේණියේ තනතුරකට පත්වීම් ලබා තිබීම නිසා එම පත්වීම භාර ගැනීමට හැකි වන පරිදි දරන ලද තනතුරෙන් නිදහස් කිරීමට කටයුතු කරන ලදී.

### 6.3.2.12. නව පත්වීම්

මැතිවරණ කොමිෂන් සභාවේ කළමනාකරණ සේවා නිලධාරි සේවයේ පැවති පුරප්පාඩු වලින් කොටසක් පිරවීම සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගයේ ප්‍රතිඵල මත 2025.03.03 දින සිට පත්වීම් ලද නවක කළමනාකරණ සේවා නිලධරයන් 11 දෙනෙකු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දීමට කටයුතු කරන ලදී.

තවදුරටත් පැවති කළමනාකරණ සේවා නිලධාරි පුරප්පාඩු වලින් කොටසක් පිරවීම සඳහා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත 2025.10.01 දින සිට පත්වීම් ලද නවක කළමනාකරණ සේවා නිලධරයන් 16 දෙනෙකු ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දීමට කටයුතු කරන ලදී.

### 6.3.2.13. දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු අනුමත කිරීම

රා.ප.ච.14/2022, 14/2022(I), 14/2022(II) හා 14/2022(III) අනුව දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු අයදුම් කරන ලද ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල සේවයේ නියුතු නිලධරයන් සඳහා පහත පරිදි නිවාඩු අනුමත කරන ලදී.

| සේවය | **වැටුප් රහිත දේශීය** | **වැටුප් රහිත විදේශීය** |
|---|---|---|
| කළමනාකරණ සේවා නිලධාරි | - | 02 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර III | 01 | - |
| රියදුරු සේවය | - | 02 |
| කාර්යාල සේවක සේවය | - | 01 |

### 6.3.2.14. නිවාඩු කළමනාකරණ පද්ධතිය පවත්වා ගෙන යාම

2021 වර්ෂයේ සිට ප්‍රධාන කාර්යාලය සඳහා හඳුන්වා දෙන ලද නිවාඩු කළමනාකරණ *පද්ධතිය* (Leave Management System)මේ වනවිටත් ක්‍රියාත්මක වන අතර, නිවාඩු ලබා ගන්නා නිලධරයන් එම නිවාඩු පද්ධතිය හරහා නිවාඩු අයදුම් කරනු ලැබේ.

### 6.3.2.15. වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම

2025 වර්ෂය තුලදී මැතිවරණ කොමිෂන් සභාවට අනුයුක්තව පහත තනතුරු වල සේවයේ නියුතු නිලධරයන්ට පහත පරිදි වාර්ෂික වැටුප් වර්ධක 652 ක් ගෙවීම් කල යුතුව තිබූ අතර එයින් 536 කගේ වැටුප් වර්ධක නියමිත දිනට ගෙවීම් කිරීමට කටයුතු කරන ලදී.

| තනතුර | වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම අවසන් නිලධාරීන් සංඛ්‍යාව (අ) | නොගෙවන ලද වාර්ෂික වැටුප් වර්ධක සංඛ්‍යාව (ආ) |
|---|---|---|
| කළමනාකරණ සේවා නිලධාරි | 316 | 74 |
| සංවර්ධන නිලධාරි | 31 | 26 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර III | 06 | 04 |
| ලේඛන සහකාර | 24 | 03 |
| කා.සේ.සේ | 114 | 08 |
| රියදුරු | 45 | 01 |

කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත් නොවීම, ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ලැබී නොතිබීම, කාර්ය සාධන වාර්තා සම්පූර්ණ කර ඉදිරිපත් නොකිරීම, සේවය ස්ථිර කර නොතිබීම හා දේශීය/ විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා තිබීම යන හේතුමත ඉහත (ආ) තීරයේ දක්වා ඇති නිලධාරීන් සංඛ්‍යාවන් සඳහා නියමිත පරිදි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට නොහැකි වී ඇත.

2025 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය කිරීමට අදාල 2025.03.25 දිනැති රා.ප.චක්‍රලේඛ 10/2025 අනුව නව වැටුප් වැඩිවීම් 2025.01.01 දින සිට බලාත්මක කිරීමට සහ 2025.04.01 දින සිට කිසිදු හිඟ ගෙවීමකින් තොරව එම චක්‍රලේඛයේ උපලේඛන IIIහි පරිදි එම වැටුප් පරිමාණ අනුව වැටුප් ගෙවීමට රජය තීරණය කර තිබුණි. ඒ අනුව 2025.03.31 දිනට මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතුව සිටි මාණ්ඩලික නොවන නිලධරයන් 645 දෙනෙකුගේ වැටුප් පරිවර්තන දින 14ක් වැනි කෙටි කාල සීමාවකදී සකස්කර අවසන් කරන ලදී. එසේම ඉහත චක්‍රලේඛය අනුව 2026.01.01 දිනට සිදු කල යුතු වැටුප් පරිවර්තනද 2025 දෙසැම්බර් මස තුලම සිදු කර අවසන් කරන ලදී.

**6.3.2.16.** **වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය**

වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ පහත පරිදි ලියාපදිංචි කිරීමේ කටයුතු කරන ලදී.

| තනතුර | වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය අවසන් නිලධාරින් සංඛ්‍යාව | වැන්දඹු, අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචිය අවසන් නොමැති නිලධාරින් සංඛ්‍යාව |
|---|---|---|
| කළමනාකරණ සේවා නිලධාරි | 353 | 18 |
| සංවර්ධන නිලධාරි | 53 | 04 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර III | 09 | 01 |
| ලේඛන සහකාර | 26 | 01 |
| කා.සේ.සේ | 92 | 29 |
| රියදුරු | 36 | 08 |

විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත  අදාල අයදුම්පත්/ ලේඛන ඉදිරිපත් කර තිබුනද මෙතෙක් ලියාපදිංචිය තහවුරු නොකිරීම, නිලධාරින් විසින් අදාල තොරතුරු නිවැරදි බව සනාථ කර නොතිබීම හා ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ලැබී නොතිබීම යන හේතුමත ඉහත දක්වා ඇති නිලධාරීන් සංඛ්‍යාව සඳහා ලියාපදිංචි කිරීම සිදුකර ගැනීම ප්‍රමාද වී ඇත.

**6.3.2.17.** **පවිත්‍රතා කටයුතු**

මැතිවරණ මහලේකම් කාර්යාල පරිශ්‍රයේ පවිත්‍රතා කටයුතු කරන ලද දීප්ති ක්ලීනින් සර්විස් ආයතනය සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2024.02.28 දිනෙන් අවසන්වූ අතර,ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මඟින් ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි.ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුණේ බිලියන්ට් ක්ලීනින් සර්විස් ආයතනයි. එහෙත් එම ආයතනය විසින් ලබා දෙන ලද සේවය සතුටුදායක මට්ටමක නොමැතිවීම මත, එම ආයතනය සමඟ ඇති කර ගෙන තිබූ ගිවිසුම 2025.03.31 දින සේවයෙන් පසු අවලංගු කිරීමට කටයුතු කරන ලදී. මේ අනුව ඊළගට අවම මිළ ඉදිරිපත් කර තිබූ දීප්ති ක්ලීනින් සර්විස් ආයතනය සමඟ 2025.04.01 දින සිට 2026.02.28 දින දක්වා වූ කාලය සඳහා පවිත්‍රතා කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදී.

### 6.3.2.18. ආරක්ෂක කටයුතු

මැතිවරණ මහලේකම් කාර්යාලය හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල සඳහා ආරක්ෂක සේවාව ලබා ගැනීම සඳහා අයන් ආම්ස් සිකියුරිටි සර්විසස් (පුද්) සමාගම සමඟ අත්සන් කර තිබූ ගිවිසුමේ නිල කාලය 2025.02.28 දිනෙන් අවසන්වූ අතර,ඉදිරි වසරක කාලයක් සඳහා ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් මඟින් ජාතික තරඟකාරි ලංසු කැඳවීම යටතේ මිල ගණන් කැඳවීමට කටයුතු කරන ලදි.ඒ අනුව අවම මිළ ඉදිරිපත් කර තිබුනේ ඩබ්.එම්. සෙකියුරිටි සර්විසස් ආයතනයි. එබැවින් 2025.03.01 දින සිට 2026.02.28 දින දක්වා වූ කාලය සඳහා ඩබ්.එම්. සෙකියුරිටි සර්විසස් (පුද්) සමාගම සමඟ ආරක්ෂක කටයුතු ඉටු කර ගැනීම වෙනුවෙන් ගිවිසුමක් අත්සන් කරන ලදී.

### 6.3.2.19. “සෙයිරි සතිය” ක්‍රියාත්මක කිරීම

“ක්ලීන් ශ්‍රී ලංකා (Clean Sri Lanka) ” ජාතික වැඩ සටහනට සමගාමීව රාජ්‍ය ආයතන තුල සංවිධිත බව පවත්වා ගැනීම සඳහා “සෙයිරි සතිය” ක්‍රියාත්මක කිරීම මැයෙන් නිකුත් කල 2025.08.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2025 හි සඳහන් කරුණු වලට අනුගතව මැතිවරණ මහලේකම් කාර්යාලය ඇතුලුව සියලුම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වල කාර්ය මණ්ඩල දැනුවත් කිරීමට සහ 2025.09.01,02,03 හා 04 යන දිනවල ඊට අදාලව වැඩසටහන් කිහිපයක් සංවිධානය කිරීම සහ සංවිධිත බව පවත්වා ගෙන යාම සඳහා අදාල උපදෙස් නිකුත් කිරීමට ද ක්‍රියා කරන ලදී.

### 6.3.2.20. විදේශ ශිෂ්‍යත්ව

ඕස්ට්‍රේලියාවේ ෆ්ලින්ඩර්ස් විශ්වවිද්‍යාලය විසින් ප්‍රදානය කරන ලද Disability practices and Leadership පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවට (2025.01.14 දින සිට 2027.01.31 දින දක්වා) සහභාගී වීම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු සහකාර මැතිවරණ කොමසාරිස්, ටී.ඩබ්ලිව්.පී. කෞමදී මහත්මිය ඕස්ට්‍රේලියාව බලා පිටත්විය.

### 6.3.2.21. විදේශ පුහුණු

2025.01.01 දින සිට 2025.12.31 දින දක්වා මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයන් 50 දෙනෙකු ඒ ඒ නිලධරයාට පැවරී ඇති රාජකාරී සහ මැතිවරණ කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ ධාරිතා සංවර්ධනය සහ අනුසාංගික කරුණු වලට අදාළ විදේශ පුහුණු සඳහා සහභාගී ඇති අතර ඒ පිළිබඳ තොරතුරු සටහන 32 ලෙස ඇතුළත් කර ඇත.

### 6.3.2.22. විදේශ සම්මන්ත්‍රණ හා නිල චාරිකා

2025.01.22 දින සිට 2025.01.27 දින දක්වා ඉන්දියාවේ පැවති International Conference on the theme “2024: A Global Election Year – Reiteration and Reclaiming of Democratic Spaces”, 2025 වර්ෂයේ ජාතික ඡන්ද හිමියන්ගේ දින සැමරුම සහ ඉන්දියානු ජනරජ දින සැමරුම සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජික ඒ. ෂන්මුගනාදන් මෙනෙවිය, සහකාර මැතිවරණ කොමසාරිස් (මාතලේ) එච්.ඒ.ඊ. පුෂ්පකුමාර මහතා සහභාගී විය.

2025.02.04 දින සිට 2025.02.08 දින දක්වා පිලිපීනයේ පැවති Open Government Partnership (OGP) Asia & the Pacific Regional Meeting 2025 සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ

නියුතු අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති) බී.පී.සී. කුලරත්න මහතා ශ්‍රී ලංකාවේ මැතිවරණ කළමනාකරණ ආයතනය වන මැතිවරණ කොමිෂන් සභාව නියෝජනය කරන ලදී.

2025.05.09 දින සිට 2025.05.13 දින දක්වා පිලිපීනයේ පැවති Election Observation Programme for the upcoming Midterm Elections of the Philippines සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා සහ මැතිවරණ කොමසාරිස් ජනරාල් එම්.කේ.එස්.එස්. රත්නායක මහතා සහභාගී විය.

2025.09.30 දින සිට 2025.10.05 දින දක්වා බොට්ස්වානාහි දී පැවති 21st International Electoral Awards & Symposium සඳහා මැතිවරණ කොමසාරිස් ජනරාල් එම්.කේ.එස්.එස්. රත්නායක මහතා සහභාගී විය.

2025.10.20 දින සිට 2025.10.24 දින දක්වා ඉන්දුනීසියාවේ පැවති International workshop on Electoral efficiency and Sustainability by the International IDEA සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සභාපති ආර්.එම්.ඒ.එල්. රත්නායක මහතා සහභාගී විය.

2025.11.21 දින සිට 2025.11.24 දින දක්වා බංග්ලාදේශයේ පැවති Representative for Session on Citizen Observation & Election Oversight සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ සේවයේ නියුතු අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති) බී.පී.සී. කුලරත්න මහතා සහභාගී වෙමින්, ශ්‍රී ලංකාවේ අත්දැකීම් අනෙකුත් මැතිවරණ පාර්ශවකරුවන් සමඟ හුවමාරු කර ගන්නා ලදී.

### 6.3.3. ප්‍රවාහන අංශය

#### 6.3.3.1. වාහන පාලනය

මැතිවරණ කොමිෂන් සභාව සතු වාහන 63 ක් පවතින අතර ඉන් දිස්ත්‍රික් කාර්යාල සතුව වාහන 28 ක් ද ප්‍රධාන කාර්යාලය සතුව වාහන 35 ක් ද ඇත. ප්‍රධාන කාර්යාලය සතු වාහන වල වාර සේවාවන් සහ අළුත්වැඩියා කටයුතු ප්‍රවාහන අංශය මඟින් ඉටු කරනු ලැබේ. ඒ අනුව 2025 වර්ෂය තුලදී ප්‍රධාන කාර්යාලයේ වාහන වල සේවාවන් සහ අළුත්වැඩියා කටයුතු සඳහා වියදම **රු. 31,636,645.84** ක්ද වාහන වලට සැපයූ ඉන්ධන සඳහා වූ වියදම **රු. 6,424,540.24** විය. (මැතිවරණ කාලසීමාවල දී වියදම් මීට ඇතුළත් නොවේ.)

මෙම වර්ෂය තුළ පළාත් පාලන මැතිවරණය ද පැවති අතර එම වියදම් පිළිබඳ තොරතුරු පහත සඳහන් කර ඇත.

නියමිත කාලසීමාව තුළ දී සියළුම වාහන සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ද කටයුතු කරන ලදී.

2026 වර්ෂය සඳහා වාහන රක්‍ෂණය කිරීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ඒ අනුව ජාතික රක්ෂණ භාර අරමුදල (National Insurance Trust Fund ) වාහන රක්ෂණය සඳහා තෝරා පත් කර ගෙන ඇත.

### 6.3.3.2. මැතිවරණ කාල සීමාව තුළ පරිපාලන කටයුතු

2025.05.06 වැනි දින පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පැවැත්විණි.පූර්ව මැතිවරණ රාජකාරිවල නිරත වූ ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන්ට/ සේවකයින්ට ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා කාර්, වෑන් සහ කැබ් රථ සහ ගබඩා ද්‍රව්‍ය ප්‍රවාහනයට අවශ්‍ය අමතර ලොරි රථ කීපයක් ද වෙනත් රාජ්‍ය ආයතන වලින් ලබා ගැනීමට සිදු විය.

වෙනත් රාජ්‍ය ආයතන වලින් ප්‍රධාන කාර්යාලයට තාවකාලික ලබා ගත් වාහන පිළිබඳව විස්තර පහත පරිදි වේ.

#### 6.3.3.2.1. පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව

**වෙනත් රජයේ ආයතන වෙතින් තාවකාලික පදනම මත ලබා ගත් වාහන පිළිබඳ තොරතුරු -**

කැබ් රථ සංඛ්‍යාව - 12
වෑන් රථ සංඛ්‍යාව - 07
ලොරි රථ සංඛ්‍යාව - 02
කාර් රථ සංඛ්‍යාව - 03
ජීප් රථ සංඛ්‍යාව - 02
එකතුව 26

මෙම වාහන වලට සහ ප්‍රධාන කාර්යාලය සතු වාහන වලට ඉන්ධන සැපයීම වෙනුවෙන් වියදම රුපියල් **14,752,322.40** ද සේවා සහ අළුත්වැඩියා කටයුතු සඳහා වියදම රුපියල් **2,605,869.65** ක් ද විය.

#### 6.3.3.2.2. මැතිවරණ කොමිෂන් සභාවේ වාහන පිළිබඳ තොරතුරු

2025.12.31 දිනට මැතිවරණ කොමිෂන් සභාව සතුව පැවති වාහන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | වාහන වර්ගය | සංඛ්‍යාව | කාර්යාලය | | | |
|---|---|---|---|---|---|---|
| | | | ප්‍රධාන කාර්යාලය | | දිස්ත්‍රික් කාර්යාල | |
| | | | සංචිත | වෙන්කල | සංචිත | වෙන්කල |
| 1 | කැබ් | 35 | 08 | - | 27 | - |
| 2 | කාර් | 19 | 12 | 06 | - | 01 |
| 3 | වෑන් | 03 | 03 | - | - | - |
| 4 | ජීප් | 02 | - | 02 | - | - |
| 5 | ලොරි | 01 | 01 | - | - | - |
| 6 | කෘ කැබ් | 01 | 01 | - | - | - |
| 7 | යතුරු පැදි | 01 | 01 | - | - | - |
| 8 | බස් | 01 | 1 | - | - | - |
| එකතුව | | 63 | 27 | 8 | 27 | 01 |

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූලවේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් / නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාළ නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | - | - |
| **2** | **පොත්පත් ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකට නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවවත් හරහා අනුමක වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුලදී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | - | - |
| 6.2 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) ඉ උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | - | - |
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධරයෙකු පත්කර එම නිලධරයා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂනයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම | අනුකූල වේ | - | - |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | - | - |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළැඹීම | අනුකූල වේ | - | - |
| 12 | **රජයේ නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පදිරි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| 15 | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | - | - |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් පවත්වා ගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරිමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කර තිබීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැකස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම් 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 20 | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

## 08. පරිච්ඡේදය - සමාප්තිය

2025 වර්ෂයේදී මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යසාධනය, මැතිවරණ කොමිෂන් සභාව වෙත පැවරුණු කාර්යයය සහ කර්තව්‍ය සාර්ථකව ඉටු කිරීම තුළ අත්පත් කර ඇති බව සතුටින් සඳහන් කරමු.

මැතිවරණ කොමිෂන් සභාව
සරණ මාවත,
රාජගිරිය.

2026.06.11 දින දීය.

# සටහන්

සටහන 01



මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමසාරිස් ජනරාල්
අතිරේක මැතිවරණ කොමසාරිස් (පාලන)
අතිරේක මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්)
අතිරේක මැතිවරණ කොමසාරිස් (නීති හා විමර්ශන)
ප්‍රධාන මූල්‍ය නිලධාරි
ලේකම්
නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (දිස්ත්‍රික්)
නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන)
නියෝජ්‍ය මැතිවරණ (ජාතික මැතිවරණ)
අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්)
අධ්‍යක්ෂ (පර්යේෂණ සහ සැලසුම්)
ප්‍රධාන ගණකාධිකාරි
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර මැතිවරණ කොමසාරිස් (දිස්ත්‍රික්)
සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන)
ගණකාධිකාරි (ප්‍රසම්පාදන)
සහකාර මැතිවරණ කොමසාරිස් (ජාතික මැතිවරණ)
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
සහකාර මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන ආයතන ඡන්ද විමසීම්)
සහකාර මැතිවරණ කොමසාරිස් (නීති)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ සහ සැලසුම්)
ගණකාධිකාරි (ගෙවීම්)
සහකාර ලේකම්
සභාපති සම්බන්ධීකරණ ලේකම්
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
පරිපාලන නිලධාරි
භාෂා පරිවර්තක
තොරතුරු තාක්ෂණ නිලධාරි
නීති නිලධාරි
ප්‍රධාන ක.සේ.නි (මැතිවරණ කොමසාරිස් ජනරාල් සම්බන්ධීකරණ ඒකකය)
ප්‍රධාන ක.සේ.නි
ප්‍රධාන ක.සේ.නි. (ආයතන/පාලන/ප්‍රවාහන)
සං. නි.
සං.නි.
තො.තා. සහකාර / සං.නි
මුදල් සහකාර / සං.නි.
ක.සේ.නි
පිළිගැනීමේ නිලධාරි
ලේඛණ සහකාර
රියදුරු
කා.කා.ස.

**සටහන 02**

## ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2025

**මැතිවරණ කොට්ඨාසවලට අදාළව ඉවත් වන නම් ("අ" නම්) සංඛ්‍යාව සහ ඇතුළත් වන නම් ("ආ" නම්) සංඛ්‍යාව**

| මැතිවරණ කොට්ඨාසය | A "අ" නම් සංඛ්‍යාව | B "ආ" නම් සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 56,828 | 81,724 |
| ගම්පහ | 62,460 | 73,832 |
| කළුතර | 36,113 | 38,012 |
| මහනුවර | 38,041 | 36,392 |
| මාතලේ | 13,219 | 13,444 |
| නුවරඑළිය | 17,831 | 19,275 |
| ගාල්ල | 30,264 | 27,148 |
| මාතර | 21,745 | 17,753 |
| හම්බන්තොට | 15,608 | 14,650 |
| යාපනය | 16,124 | 13,729 |
| කිලිනොච්චිය | 1,543 | 2,681 |
| මන්නාරම | 3,629 | 3,289 |
| වවුනියාව | 2,154 | 4,115 |
| මුලතිව් | 1,494 | 2,051 |
| මඩකලපුව | 15,442 | 16,490 |
| දිගාමඩුල්ල | 19,921 | 21,509 |
| ත්‍රිකුණාමලය | 11,964 | 13,190 |
| කුරුණෑගල | 43,582 | 40,371 |
| පුත්තලම | 23,646 | 28,972 |
| අනුරාධපුර | 18,344 | 18,601 |
| පොළොන්නරුව | 8,710 | 8,770 |
| බදුල්ල | 21,207 | 20,729 |
| මොණරාගල | 12,858 | 13,006 |
| රත්නපුර | 30,325 | 27,926 |
| කෑගල්ල | 15,362 | 21,449 |
| **එකතුව** | **538,414** | **579,108** |

සටහන 03

**ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2025**
**1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය යටතේ**
**හිමිකම් ඉල්ලීම් හා විරෝධතා ඉදිරිපත් කිරීම්**

| මැතිවරණ කොට්ඨාසය | හිමිකම් | | විරෝධතා | |
|---|---|---|---|---|
| | ලැබුණු හිමිකම් සහ ප්‍රමාද ඉල්ලීම් සංඛ්‍යාව | ඉඩදුන් හිමිකම් සහ ප්‍රමාද ඉල්ලීම් සංඛ්‍යාව | ලැබුණු විරෝධතා සංඛ්‍යාව | ඉඩදුන් විරෝධතා සංඛ්‍යාව |
| 01. කොළඹ | 12,453 | 10,745 | 23 | 7 |
| 02. ගම්පහ | 5,798 | 4,732 | 19 | 13 |
| 03. කළුතර | 12,264 | 4,170 | 41 | 10 |
| 04. මහනුවර | 2,690 | 2,491 | 8 | 3 |
| 05. මාතලේ | 1,530 | 1,194 | 68 | 37 |
| 06. නුවරඑළිය | 1,153 | 966 | 5 | 5 |
| 07. ගාල්ල | 3,546 | 2,892 | 119 | 47 |
| 08. මාතර | 2,025 | 1,701 | 13 | 7 |
| 09. හම්බන්තොට | 2,030 | 1,077 | 17 | 8 |
| 10. යාපනය | 2,414 | 1,256 | 2 | 1 |
| 11. වන්නි | 2,184 | 1,188 | - | - |
| 12. මඩකලපුව | 675 | 504 | 28 | 9 |
| 13. දිගාමඩුල්ල | 565 | 483 | 9 | 2 |
| 14. ත්‍රිකුණාමලය | 1,149 | 625 | 4 | 2 |
| 15. කුරුණෑගල | 4,060 | 3,742 | 8 | 6 |
| 16. පුත්තලම | 2,775 | 2,578 | 3 | 3 |
| 17. අනුරාධපුර | 1,789 | 1,509 | 25 | 14 |
| 18. පොළොන්නරුව | 827 | 663 | 20 | 13 |
| 19. බදුල්ල | 1,681 | 1,440 | 22 | 5 |
| 20. මොණරාගල | 1,060 | 750 | 33 | 17 |
| 21. රත්නපුර | 3,362 | 2,770 | 47 | 10 |
| 22. කෑගල්ල | 6,224 | 2,582 | 26 | 8 |
| එකතුව | **72,254** | **50,058** | **540** | **227** |

සටහන 04

**ඡන්ද හිමි නාම ලේඛන ප්‍රතිශෝධනය - 2025**

**එක් එක් මැතිවරණ කොට්ඨාසයේ බහු ලියාපදිංචි බව අනාවරණය වූ බැවින් ලියාපදිංචි නොකල නම් සංඛ්‍යාව**

| මැතිවරණ කොට්ඨාසය | ඉවත් කරන ලද මුළු නම් සංඛ්‍යාව |
|---|---|
| 01. කොළඹ | 9854 |
| 02. ගම්පහ | 9641 |
| 03. කළුතර | 3765 |
| 04. මහනුවර | 4893 |
| 05. මාතලේ | 1596 |
| 06. නුවරඑළිය | 3304 |
| 07. ගාල්ල | 2670 |
| 08. මාතර | 1792 |
| 09. හම්බන්තොට | 1332 |
| 10. යාපනය | 821 |
| 11. වන්නි | 1604 |
| 12. මඩකලපුව | 1749 |
| 13. දිගාමඩුල්ල | 3189 |
| 14. ත්‍රිකුණාමලය | 735 |
| 15. කුරුණෑගල | 1972 |
| 16. පුත්තලම | 3616 |
| 17. අනුරාධපුර | 3657 |
| 18. පොළොන්නරුව | 1425 |
| 19. බදුල්ල | 1966 |
| 20. මොණරාගල | 1031 |
| 21. රත්නපුර | 1894 |
| 22. කෑගල්ල | 2132 |
| **එකතුව** | **64638** |

සටහන 05

## ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන - 2025

**2025 ඔක්තෝබර් මස 31 වන දින සහතික කරන ලද 2025 වර්ෂයේ ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය අනුව ලියාපදිංචි ඡන්දහිමියන් සංඛ්‍යාව**

| මැතිවරණ කොට්ඨාසය | ලියාපදිංචි ඡන්ද සංඛ්‍යාව |
|---|---|
| කොළඹ | 1,797,862 |
| ගම්පහ | 1,901,866 |
| කළුතර | 1,034,976 |
| මහනුවර | 1,200,493 |
| මාතලේ | 433,888 |
| නුවරඑළිය | 609,360 |
| ගාල්ල | 909,155 |
| මාතර | 689,094 |
| හම්බන්තොට | 525,272 |
| යාපනය | 599,214 |
| වන්නි | 310,095 |
| මඩකලපුව | 455,220 |
| දිගාමඩුල්ල | 561,252 |
| ත්‍රිකුණාමලය | 320,409 |
| කුරුණෑගල | 1,428,078 |
| පුත්තලම | 672,396 |
| අනුරාධපුර | 747,915 |
| පොළොන්නරුව | 353,169 |
| බදුල්ල | 710,597 |
| මොණරාගල | 403,307 |
| රත්නපුරය | 930,592 |
| කෑගල්ල | 714,018 |
| **එකතුව** | **17,308,228** |

සටහන 06

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 98(8) ව්‍යවස්ථාව අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි තෝරා පත්කිරීමට හිමිකම් ඇති මන්ත්‍රීන් සංඛ්‍යාව වාර්ෂිකව ගණනය කිරීම**

**2025.10.31 දින 2025 ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනය සහතික කිරීමෙන් පසුව ( 2025 (1) සහ 2025 (2) පරිපූරක නාමලේඛන සමඟ)**

| | මැතිවරණ කොට්ඨාසය | 2025 සහතික කළ ඡන්දහිමි නාමලේඛනය අනුව ඡන්දහිමි සංඛ්‍යාව | 2025(1) පරිපූරක නාමලේඛනය (01.02.2025 - 31.05.2025) | 2025(2) පරිපූරක නාමලේඛනය (01.06.2025 - 30.09.2025) | 2025 ප්‍රධාන නාමලේඛනය + 2025 (1) පරිපූරක + 2025 (2) පරිපූරක (1=A+B+C) | පරිමිත සංඛ්‍යාව | පරිමිත සංඛ්‍යා පදනම මතවූ මන්ත්‍රීන් සංඛ්‍යාව | | පරිමිත සංඛ්‍යා පදනම මතවූ මන්ත්‍රීන් සංඛ්‍යාව x පරිමිත සංඛ්‍යාව | ඉතිරිය | ඉතිරිය මත පදනම් වූ මන්ත්‍රීන් සංඛ්‍යාව | එකතුව | 96(4) ව්‍යවස්ථාව යටතේ දැක්වෙන මන්ත්‍රීන් සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1 | B | C | 1 | 2=(1/160) | 3=(1/2) | | 4=(2*3) | 5=(1-4) | 6 | 7=(3+6) | 8 | 9=(7+8) |
| 1 | කොළඹ | 1,797,862 | 4,063 | 3,733 | 1,805,658 | | 16.561 | 16 | 1,744,496 | 61,162 | | 16 | 2 | 18 |
| 2 | ගම්පහ | 1,901,866 | 6,570 | 6,405 | 1,914,841 | | 17.562 | 17 | 1,853,527 | 61,314 | 1 | 18 | 1 | 19 |
| 3 | කළුතර | 1,034,976 | 4,130 | 4,093 | 1,043,199 | | 9.568 | 9 | 981,279 | 61,920 | 1 | 10 | 1 | 11 |
| 4 | මහනුවර | 1,200,493 | 4,928 | 4,534 | 1,209,955 | | 11.097 | 11 | 1,199,341 | 10,614 | | 11 | 1 | 12 |
| 5 | මාතලේ | 433,888 | 1,630 | 1,517 | 437,035 | | 4.008 | 4 | 436,124 | 911 | | 4 | 1 | 5 |
| 6 | නුවරඑළිය | 609,360 | 2,376 | 2,279 | 614,015 | | 5.632 | 5 | 545,155 | 68,860 | 1 | 6 | 2 | 8 |
| 7 | ගාල්ල | 909,155 | 4,225 | 4,338 | 917,718 | | 8.417 | 8 | 872,248 | 45,470 | | 8 | 1 | 9 |
| 8 | මාතර | 689,094 | 2,897 | 2,849 | 694,840 | 109,031.30 | 6.373 | 6 | 654,186 | 40,654 | | 6 | 1 | 7 |
| 9 | හම්බන්තොට | 525,272 | 2,424 | 2,345 | 530,041 | | 4.861 | 4 | 436,124 | 93,917 | 1 | 5 | 2 | 7 |
| 10 | යාපනය | 599,214 | 2,927 | 3,548 | 605,689 | | 5.555 | 5 | 545,155 | 60,534 | | 5 | 1 | 6 |
| 11 | වන්නි | 310,095 | 1,420 | 1,622 | 313,137 | 109,031 | 2.872 | 2 | 218,062 | 95,075 | 1 | 3 | 3 | 6 |
| 12 | මඩකළපුව | 455,220 | 2,508 | 2,733 | 460,461 | | 4.223 | 4 | 436,124 | 24,337 | | 4 | 1 | 5 |
| 13 | දිගාමඩුල්ල | 561,252 | 2,863 | 2,885 | 567,000 | | 5.200 | 5 | 545,155 | 21,845 | | 5 | 2 | 7 |
| 14 | ත්‍රිකුණාමලය | 320,409 | 1,644 | 1,685 | 323,738 | | 2.969 | 2 | 218,062 | 105,676 | 1 | 3 | 1 | 4 |
| 15 | කුරුණෑගල | 1,428,078 | 5,253 | 5,040 | 1,438,371 | | 13.192 | 13 | 1,417,403 | 20,968 | | 13 | 2 | 15 |
| 16 | පුත්තලම | 672,396 | 1,657 | 1,597 | 675,650 | | 6.197 | 6 | 654,186 | 21,464 | | 6 | 2 | 8 |
| 17 | අනුරාධපුරය | 747,915 | 3,162 | 3,279 | 754,356 | | 6.919 | 6 | 654,186 | 100,170 | 1 | 7 | 2 | 9 |
| 18 | පොළොන්නරු | 353,169 | 1,255 | 1,383 | 355,807 | | 3.263 | 3 | 327,093 | 28,714 | | 3 | 2 | 5 |
| 19 | බදුල්ල | 710,597 | 2,801 | 2,564 | 715,962 | | 6.567 | 6 | 654,186 | 61,776 | 1 | 7 | 2 | 9 |
| 20 | මොණරාගල | 403,307 | 1,934 | 1,962 | 407,203 | | 3.735 | 3 | 327,093 | 80,110 | 1 | 4 | 2 | 6 |
| 21 | රත්නපුර | 930,592 | 5,071 | 4,920 | 940,583 | | 8.627 | 8 | 872,248 | 68,335 | 1 | 9 | 2 | 11 |
| 22 | කෑගල්ල | 714,018 | 2,929 | 2,798 | 719,745 | | 6.601 | 6 | 654,186 | 65,559 | 1 | 7 | 2 | 9 |
| | එකතුව | 17,308,228 | 68,667 | 68,109 | 17,445,004 | | | 149 | 16,245,619 | 1,199,385 | 11 | 160 | 36 | 196 |

සටහන 07

**ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2025**

**2025 ප්‍රධාන නාමලේඛනය සහතික කරන ලද සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරීන්ගේ විස්තර**

| මැතිවරණ කොට්ඨාසය | සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී |
|---|---|
| කොළඹ | පියුමි ආටිගල |
| ගම්පහ | ඩබ්ලිව්.ඒ. රවීන්ද්‍ර වික්‍රමසිංහ |
| කළුතර | කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු |
| මහනුවර | එච්.ඩී.එන්. සම්පත් ප්‍රනාන්දු |
| මාතලේ | එච්.ඒ.ඊ. පුෂ්පකුමාර |
| නුවරඑළිය | කේ.ඒ.එල්.එස්.කලුගම්පිටිය |
| ගාල්ල | ඩබ්ලිව්.එච්.ආර්. විජය කුමාර |
| මාතර | පී.එස්. පතිරණ |
| හම්බන්තොට | වී.ඩී.ජේ. ලක්මාල් |
| යාපනය | ආර්. සසීලන් |
| වන්නි | ආර්.සී. අමල්රාජ් |
| මඩකලපුව | එන්. රේගන් |
| දිගාමඩුල්ල | කසුන් ශ්‍රීනාත් අත්තනායක |
| ත්‍රිකුණාමලය | එස්. කේ. දේව නෙරංජන් |
| කුරුණෑගල | ආර්.එම්.එච්.බී. රත්නායක |
| පුත්තලම | එස්.එල්.ආර්. ජයනායක |
| අනුරාධපුරය | එන්.පී.පී.අයි.ආර්. ගුණරත්න |
| පොළොන්නරුව | මනෝජ් ටී. ගුරුසිංහ |
| බදුල්ල | කේ.ඒ.එල්.එස්.කලුගම්පිටිය |
| මොණරාගල | වී.ඩී.ජේ. ලක්මාල් |
| රත්නපුර | සුරංග අඹගහතැන්නෙ |
| කෑගල්ල | සජිත් පී. කස්තුරිසිංහ |

සටහන 08

## ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2025

### ජාතික හැඳුනුම්පත් විස්තර ඉදිරිපත් කළ පුද්ගලයින් සංඛ්‍යාව

| මැතිවරණ කොට්ඨාසය | මුළු ඡන්ද හිමියන් සංඛ්‍යාව | ජාතික හැඳුනුම්පත් ඉදිරිපත් කර ඇති පුද්ගලයින් සංඛ්‍යාව | ප්‍රතිශතය % |
|---|---|---|---|
| 01 - කොළඹ | 1,797,862 | 1,777,934 | 98.89 |
| 02 - ගම්පහ | 1,901,866 | 1,869,100 | 98.28 |
| 03 - කළුතර | 1,034,976 | 1,016,745 | 98.24 |
| 04 - මහනුවර | 1,200,493 | 1,182,979 | 98.54 |
| 05 - මාතලේ | 433,888 | 425,710 | 98.12 |
| 06 - නුවරඑළිය | 609,360 | 584,228 | 95.88 |
| 07 - ගාල්ල | 909,155 | 896,004 | 98.55 |
| 08 - මාතර | 689,094 | 671,765 | 97.49 |
| 09 - හම්බන්තොට | 525,272 | 514,932 | 98.03 |
| 10 - යාපනය | 599,214 | 589,900 | 98.45 |
| 11 - වන්නි | 310,095 | 300,075 | 96.77 |
| 12 - මඩකලපුව | 455,220 | 444,655 | 97.68 |
| 13 - දිගාමඩුල්ල | 561,252 | 549,755 | 97.95 |
| 14 - ත්‍රිකුණාමලය | 320,409 | 313,796 | 97.94 |
| 15 - කුරුණෑගල | 1,428,078 | 1,403,515 | 98.28 |
| 16 - පුත්තලම | 672,396 | 655,936 | 97.55 |
| 17 - අනුරාධපුර | 747,915 | 725,616 | 97.02 |
| 18 - පොළොන්නරුව | 353,169 | 344,769 | 97.62 |
| 19 - බදුල්ල | 710,597 | 692,766 | 97.49 |
| 20 - මොණරාගල | 403,307 | 396,202 | 98.24 |
| 21 - රත්නපුරය | 930,592 | 907,640 | 97.53 |
| 22 - කෑගල්ල | 714,018 | 699,795 | 98.01 |
| **එකතුව** | **17,308,228** | **16,963,817** | **98.01** |

# ඡන්ද ප්‍රදේශ අනුව ප්‍රධාන ඡන්දහිමි නාමලේඛනවල ලියාපදිංචි වී ඇති ඡන්ද හිමියන් සංඛ්‍යාව පිළිබඳ තුලනාත්මක සටහන 2014 - 2025

මැතිවරණ කොට්ඨාස අංක **01** - කොළඹ

| ඡන්ද ප්‍රදේශ අක්ෂරය හා නම | | එක් එක් වර්ෂයට අදාළ ඡන්ද හිමියන් සංඛ්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | **2014** | **2015** | **2016** | **2017** | **2018** | **2019** | **2020** | **2021** | **2022** | **2023** | **2024** | **2025** |
| අ | උතුරු කොළඹ | 89,771 | 93,408 | 92,840 | 92,387 | 94,185 | 94,192 | 96,818 | 96,587 | 97,139 | 96,655 | 97,943 | 99,296 |
| ආ | මැද කොළඹ | 131,482 | 133,539 | 131,126 | 129,274 | 125,335 | 127,068 | 125,801 | 126,632 | 127,378 | 118,746 | 119,605 | 123,747 |
| ඇ | බොරැල්ල | 60,109 | 63,002 | 63,166 | 62,499 | 62,230 | 63,125 | 63,372 | 64,481 | 64,934 | 63,563 | 63,445 | 64,587 |
| ඈ | නැගෙනහිර කොළඹ | 66,941 | 68,603 | 68,096 | 68,032 | 66,799 | 68,805 | 69,130 | 69,857 | 70,177 | 68,150 | 68,336 | 69,435 |
| ඉ | බටහිර කොළඹ | 40,609 | 42,448 | 42,567 | 41,852 | 40,665 | 42,406 | 42,316 | 42,886 | 43,414 | 42,472 | 42,372 | 43,426 |
| ඊ | දෙහිවල | 59,812 | 61,407 | 60,887 | 61,096 | 59,653 | 63,277 | 64,259 | 65,554 | 66,192 | 66,311 | 66,644 | 67,809 |
| උ | රත්මලාන | 66,793 | 69,712 | 69,908 | 68,628 | 70,055 | 71,515 | 71,002 | 71,115 | 71,394 | 70,647 | 71,052 | 72,441 |
| ඌ | කොළොන්නාව | 120,617 | 126,882 | 130,112 | 130,201 | 134,181 | 138,002 | 138,891 | 139,855 | 140,196 | 142,487 | 144,160 | 147,259 |
| එ | කෝට්ටේ | 74,934 | 76,640 | 75,806 | 74,480 | 74,941 | 76,305 | 76,393 | 76,655 | 76,809 | 75,797 | 76,663 | 77,835 |
03. 1980 අංක 44 දරන ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12(1) වගන්තියට අනුව 2025 වසරේ ඡන්ද හිමියන් ගණන් ගැනීම 2025 ජනවාරි මස 01 වන දින ආරම්භ කරන බව 2025.01.01 දිනැතිව අති විශේෂ ගැසට් නිවේදනයක් පළ කිරීම මෙන්ම භාෂාත්‍රයෙන් පුවත්පත්වල ද නිවේදනයක් මහජන ප්‍රදර්ශනය සඳහා පළ කිරීමට නියමිතය. එසේම, ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 3 වන වගන්තියෙන් ප්‍රතිපාදන සලසා ඇති පරිදි 2025 වර්ෂයේ පෙබරවාරි මස 01 දින ඡන්ද හිමියන්ගේ සුදුසුකම් ලැබීමේ දිනය ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

04. 2025 වර්ෂය සඳහා බී. සී. ආකෘති පත්‍ර හා නිවාස වලට ලබා දෙන ලදුපත් මුද්‍රණය නොකිරීමට හා සෑම ගෘහයකටම ගෘහ මූලිකයාගේ අත්සන් ලබා ගන්නා ගණන් ගැනීමේ ආකෘති මුද්‍රණය නොකිරීමට තීරණය කර ඇත. ඡන්ද හිමියන් ගණන් ගැනීම සඳහා 2025/ER ආකෘතිය භාවිත කරනු ලැබේ. 2025/ER ආකෘතිය මුද්‍රණය කර අවසන් වූ වහාම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත එවීමට කටයුතු කෙරේ.

05. ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළව පිළිගත් දේශපාලන පක්ෂ නියෝජිතයින් පත්කර එවීම සඳහා කටයුතු කරන ලෙසට ඔබටද පිටපතක් සහිතව පක්ෂ ලේකම්වරුන් වෙත දැනුම් දීම සිදු කිරීමට කටයුතු සූදානම් කර ඇති අතර, ER ආකෘතිය සම්පූර්ණ කරන අවස්ථාවලදී සහ ගණන් ගන්නා නිලධාරී ER ආකෘති එකතු කර අවසාන වූ පසු නිර්දේශ යෙදීමෙන් අනතුරුව එම ආකෘති පරීක්ෂා කර බැලීමට පක්ෂ නියෝජිතයන්ට අවස්ථාව ලබා දිය යුතු වේ. පක්ෂ නියෝජිතයකු යම් පැමිණිල්ලක් ඉදිරිපත් කළහොත් ඒ

පිළිබඳව අප්‍රමාදව සොයා බලා ඡන්ද හිමියන් ගණන් ගැනීමේ කටයුතු වල වරදක් හෝ අඩුපාඩුවක් සිදුවී ඇති බව හෙළිවුවහොත් ඒවා නිවැරදි කිරීමට ක්‍රියා කළ යුතුය. ඡන්ද කොට්ඨාශ හෝ ග්‍රාම නිලධාරී වසම් අනුව පත් කරනු ලැබ ඇති පක්ෂ නියෝජිතයින් වෙත පත්වීම් ලිපියක් නිකුත් කළ යුතු අතර ඒ පිළිබඳව සියළුම ග්‍රාම නිලධාරීන් දැනුම්වත් කළ යුතු වේ. පක්ෂ නියෝජිතයින් වෙත ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනයේදී ඔවුන්ගේ කාර්යභාරය පැහැදිලි කිරීම වැදගත් වේ.

## 06. උපදෙස් පන්ති පැවැත්වීම

6.1 එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් උපදෙස් පන්ති පවත්වා ගණන් ගැනීමේ ආකෘති බෙදා දීම සිදු කිරීම හෝ උපදෙස් ලිඛිතව ලබා දීම සහ අදාළ ආකෘති පත්‍ර ග්‍රාම නිලධාරී වසම් අනුව පැකට් කර ලබා දීම සිදු කළ යුතුය. මේ සඳහා පරිපාලන ග්‍රාම නිලධාරී සහාය ලබා ගත හැකි අතර ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ සහාය ලබා ගන්නා ආකාරය හා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව දිස්ත්‍රික් ලේකම්/ ලියාපදිංචි කිරීමේ නිලධාරී අත්සනින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත දැනුම් දීම සිදු කරන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සෙසු කාර්ය මණ්ඩලයේ සහාය අවශ්‍ය අවස්ථා වලදී ලබා ගැනීමට ක්‍රියා කරන්න.

6.2 මේ සම්බන්ධව දිස්ත්‍රික් ලේකම්ගේ ප්‍රධානත්වයෙන් මාසිකව පැවැත්වෙන ප්‍රාදේශීය ලේකම් හමුවට සහභාගී වී ප්‍රතිශෝධන ප්‍රගතිය පිළිබඳව ඔවුන් දැනුම්වත් කිරීමට ද සටහන් කර ගන්න. එමෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල මාසිකව පැවැත්වෙන කොට්ඨාස දින රැස්වීම් සඳහා ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන් සහභාගි කරවන්න. නැතිනම්, ප්‍රගතිය වාර්තා කරන්න.

6.3 ප්‍රතිශෝධනය සම්බන්ධයෙන් ගණන් ගන්නා නිලධාරීන්ට උපදෙස් සකස් කිරීමේදී සහ ප්‍රතිශෝධන කටයුතු සංවිධානය කිරීමේදී මතු දැක්වෙන කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කළ යුතු බව දන්වනු කැමැත්තෙමි.

## 07. ඡන්ද කොට්ඨාස වෙන් කිරීම 9(3) වගන්තිය

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 9(3) වගන්තිය යටතේ ඡන්ද ප්‍රදේශවල දැනට වලංගුව පවතින ඡන්ද කොට්ඨාසවලට අයත් ගම් ප්‍රදේශ / වීථි නිවැරදිව හඳුනාගෙන ඒවා යටතේ ඡන්ද හිමියන් ගණන් ගෙන, ප්‍රතිශෝධන කටයුතු ගණන් ගන්නා නිලධාරීන් විසින් අවසන් කළ යුතුය. පළාත් පාලන ආයතනයක් විසින් ගැසට් නිවේදනයක් මගින් ප්‍රසිද්ධ කරන ලද පාර / වීථි 9(3) දැන්වීමෙහි අන්තර්ගතව නොමැති නම් දැනට ඇති අදාළ ගම / වීථිය සමඟ වරහන් තුළ එම පාර / වීථිය යෙදීමට කටයුතු කරන්න.

## 08. ඡන්ද හිමියන්ගේ සුදුසුකම්

මෙහිදී ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ පනත හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ ප්‍රතිපාදන ද සැලකිල්ලට ගෙන ගණන් ගන්නා නිලධාරීන් දැනුම්වත් කළ යුතුය. විශේෂයෙන්ම ඡන්ද බලය ජනතා පරමාධිපත්‍යය යටතට ගැනෙන බවත් ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම සඳහා ඡන්ද හිමි නාමලේඛනයේ නම ඇතුළත්ව තිබිය යුතු බව හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාව පරිදි ඡන්ද හිමියකු වීමට නුසුදුසුකම් ද පැහැදිලි කරදීම අවශ්‍ය වේ. විශේෂයෙන් ලියාපදිංචි වීමෙන් පුරවැසිභාවය ලබාගත් පුද්ගලයන්ගේ මෙන්ම පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ පනත් අනුව පුරවැසිභාවය හිමිවන පුද්ගලයන්ට අදාළව ගණන් ගන්නා නිලධාරීන්ට විශේෂයෙන් කටයුතු කිරීමට සිදුවන්නේ නම්, ඒ කරුණු පිළිබඳව ද ඔවුන් දැනුම්වත් කිරීම සුදුසුය.

### 08.1 පුද්ගලයන්ගේ වයස

8.1.1 ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් ලබන්නේ ප්‍රතිශෝධන වර්ෂයේ පෙබරවාරි මස 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වන පුද්ගලයන්ය. ඒ අනුව 2025 වසරේ ප්‍රතිශෝධනයේ දී 2025 පෙබරවාරි 01 වන දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වීම සඳහා අදාළ පුද්ගලයින් **2007** ජනවාරි මස **31** වන දින හෝ එයට පෙර උපන් අය විය යුතුය. වයස සම්පූර්ණත්වය හේතුවෙන් (අනෙකුත් සුදුසුකම් ද සපුරා ඇති) අළුතින් මෙම වර්ෂයට ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචිය සඳහා යමෙකුගේ තොරතුරු ගෘහමූලිකයකු විසින් ඉදිරිපත් කර ඇත්නම් උප්පැන්න සහතිකය / ජාතික හැඳුනුම්පත පරීක්ෂා කිරීමෙන් ER ආකෘති පත්‍රයේ සඳහන් එබඳු උපන්දින සම්බන්ධව සෑහීමකට පත්වීමේ අවශ්‍යතාව පිළිබඳව ගණන් ගන්නා නිලධාරින්ට දැනුම් දිය යුතුය.

8.1.2 වයස අවුරුදු 18 සම්පූර්ණ වී වසර දෙක තුනක් යන තෙක් ඡන්ද හිමි නාමලේඛනයට නම ඇතුළත් කර ගැනීමට නොහැකි වූ පුද්ගලයින්ගේ නම මෙම ප්‍රතිශෝධනයේ දී පළමුවරට ඇතුළත් කරන විට අදාළ ඡන්ද දායකයින්ගේ නම් තොරතුරු තහවුරු කරගෙන පිළිගන්නා ලෙස ඡන්ද ප්‍රදේශ භාර නිලධාරින් දැනුම්වත් කරන්න. එවැනි අවස්ථාවල ඒ බවට ගණන් ගන්නා නිලධාරී විසින් අදාළ ER ආකෘතියේ සටහනක් යෙදිය යුතු බව ගණන් ගන්නා නිලධාරීන්ට දැනුම් දෙන්න.

### 09. පදිංචිය වෙනස් කිරීම නිසා යම්කිසි ස්ථානයක අළුතින් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කරන කැනැත්තන්

9.1 ප්‍රවර්ථන නාමලේඛනයේ ලියාපදිංචි වී නොමැති යම් පවුලක් යම් ලිපිනයක් යටතේ අළුතින් ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කරන්නේ නම් ඔවුන් එම ලිපිනයට, පෙබරවාරි මස 01 දින වනවිට පදිංචියට පැමිණ සිටිය යුතුය. තවද ඔවුන් ඊට පෙරාතුව ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචිව සිටි ස්ථානය හෝ පදිංචිව සිටි ස්ථානය පිළිබඳව කරුණු විමසා බැලීම ගණන් ගන්නා නිලධාරියාගේ වගකීමකි. අවසන්වරට ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි ලිපිනය ER ආකෘති පත්‍රයේ 2B කොටසෙහි 6,7 සහ 8 වන තීරුවල සඳහන් කළ යුතු වේ.

9.2 අවසන් වරට ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි විස්තර ඇතුළත් ලිපියක් ලබා දෙන ලෙස ඡන්ද හිමියකු ඉල්ලා සිටින්නේ නම් ආදර්ශ ලිපි - 1 භාවිතා කර පූර්ව ලියාපදිංචිය පිළිබඳ එවැනි ලිපියක් නිකුත් කරන ලෙස ගණන් ගන්නා නිලධාරීන්ට උපදෙස් දෙන්න. අළුතින් වසමට පදිංචියට පැමිණි පුද්ගලයකු එවැනි ලිපියක් ඉදිරිපත් කරන්නේ නම් එය භාරගෙන ER ආකෘතියට අමුණා මැතිවරණ කාර්යාලයට භාර දෙන ලෙස උපදෙස් දෙන්න. පෙර ලියාපදිංචියට අදාළ තොරතුරු 9.1. ඡේදය අනුව නිසිපරිදි ලබාදී ඇත්නම් ලිපියක් අවශ්‍ය නොවන බවටද ගණන් ගන්නා නිලධාරීන් දැනුම්වත් කළ යුතුය. පදිංචිය හැරයාමේ ලිපියක් අමුණා ඇතත් නැතත් පෙර පදිංචියෙන් ඉවත්ව ඇත්ද යන්න පිළිබඳව ඡන්ද ප්‍රදේශභාර නිලධාරි විසින් පරීක්ෂා කර සෑහීමට පත්විය යුතුය.

### 10. ක්ෂේත්‍ර සංගණනයේදි ප්‍රමාණවත් තොරතුරු සැපයීමට අපොහොසත් වූ කැනැත්තන් ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි කිරීම

දීර්ඝකලක් අදාළ ලිපිනයේ සාමාන්‍ය පදිංචිව සිටියද පෙර පදිංචි විස්තර සනාථ කිරීමට තොරතුරු ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම නිසා ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචියට බාධා පැමිණ ඇතිවිට ඔහු / ඇයගෙන් මීට අමුණා ඇති ආදර්ශ ආකෘතියේ (ආදර්ශ ලිපි - 2) පරිදි ප්‍රකාශයක් ලබාගෙන හෝ ඔවුන් දිගු කලක් අදාළ ලිපිනයේ පදිංචිව සිටි බවට ගණන් ගන්නා නිලධාරි විසින් එම ගෘහයට අදාළ ER ආකෘතියේ සටහනක් සහිතව, අත්සන් තබා ඇතිනම්, එම ඡන්ද හිමියන්ගේ නම පිළිගත හැකිය.

10.1 ජාතික හැඳුනුම්පත හෝ උප්පැන්න සහතිකය ඉදිරිපත් කිරීමට අපොහොසත්වීම මත වයස තීරණය කර ගැනීමේ ගැටළු, පුරවැසිභාවය තීරණය කිරීමට අදාළ ගැටළු නිසා ඡන්ද හිමියකු

ලියාපදිංචියට බාධා පැමිණ ඇතිවිට අදාළ ආකෘතියේ වූ ප්‍රකාශයක් අනිවාර්යයෙන්ම ලබාගත යුතුය. ක්ෂේත්‍ර ගණන් ගැනීමේදී එම ප්‍රකාශ ලබාගෙන සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කරන ලෙස ගණන් ගන්නා නිලධාරීන්ට උපදෙස් දීම හෝ එකී ප්‍රකාශයේ පිටපතක් ද සමඟ අභියාචනා කාල සීමාවේදී හිමිකම් ඉල්ලුම්පතක් ඉදිරිපත් කරන ලෙස ඡන්ද හිමියන් දැනුම්වත් කරන ලෙස ගණන් ගන්නා නිලධාරීන්ට උපදෙස් දෙන්න. ක්ෂේත්‍ර ගණන් ගැනීමේදී ගණන් ගන්නා නිලධාරී විසින් ඡන්ද හිමියන්ගෙන් අදාළ ප්‍රකාශ ලබාගෙන ඉදිරිපත් කර ඇති අවස්ථා වලදී, අවශ්‍ය යැයි හැඟේනම් ඡන්ද හිමියා කැඳවා, පරීක්ෂණයකට භාජනය කොට, ඔහු / ඇයගේ නම ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කිරීම හෝ නැතිනම් අභියාචනා කාල සීමාව තුළ ලද හිමිකමක් ලෙස සලකා තවදුරටත් පරීක්ෂා කර බලා හෝ තීරණ ගැනීම සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී විසින් කළ හැකිය.

10.2 එසේ වුවද වෙනත් ස්ථානයක පදිංචිව සිටිමින් විවිධ අවශ්‍යතා වෙනුවෙන් තවත් ස්ථානයක ලියාපදිංචි වීමට උත්සාහ දරන තැනැත්තන් සම්බන්ධයෙන් මෙම ප්‍රකාශය හෝ වෙනත් දිවුරුම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම ගැන නොසලකා පූර්ණ විධිමත් පරීක්ෂණයක් සහ අවශ්‍ය යැයි හැඟේනම් ක්ෂේත්‍ර පරීක්ෂණයක්ද පවත්වා තීරණය ගත යුතු වේ.

## 11. සාමාන්‍ය පදිංචිය

### 11.1 අදාළ ගෘහයේ සාමාන්‍ය පදිංචියක් තිබීමේ අවශ්‍යතාව

ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේදී පුද්ගලයින්ගේ නම, පවුල් වශයෙන් ඔවුන් පදිංචි ලිපින යටතේ ලියාපදිංචි කළ යුතුය. යමෙකුගේ සාමාන්‍ය පදිංචි ලිපිනය හැටියට ඔහු / ඇය සිය පවුලේ සාමාජිකයන් සමඟ වාසය කරන හා සිය දෛනික සාමාන්‍ය කටයුතු ඉටු කරනු ලබන ස්ථානය පිළිගත හැකිය (පවුල් ඒකකයක් එක් ලිපිනයක ලියාපදිංචි කිරීමේ ප්‍රමුඛ අරමුණ වන්නේ ද්විත්ව හා බහුලියාපදිංචි අවම කිරීමයි. කිසියම් ඡන්ද හිමියෙකුට සාමාන්‍ය පදිංචි ලිපිනයන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සත්‍ය වශයෙන්ම ඇත්නම් ඉන් එක් ලිපිනයක පවුල් ඒකකයෙන් බැහැරව ලියාපදිංචිවීම සඳහා නෛතික අයිතියක් ඇතිබව අවධානය යොමු කිරීමට කැමැත්තෙමි. හැකිතාක් දුරට පවුල් ඒකකය එක් ලිපිනයක ලියාපදිංචි කරවීම සඳහා උත්සහය ගතයුතුය). විශේෂයෙන් යමෙකු තමාට පැවරී ඇති රාජකාරි කටයුත්තක් නිසා සාමාන්‍ය පදිංචි ස්ථානයෙන් බැහැරව ගොස් ඇත්නම්, ඒ පිළිබඳව සැලකිල්ල යොමු කළ යුතු බව අදාළ පනතේ සඳහන් වේ. තවද, තාවකාලිකව යම්කිසි නිවසකට කුමන හෝ කාර්යයක් සඳහා පවුලේ සාමාජිකයෙකු නොවන අයෙකු පැමිණ සිටින්නේ නම්, එබඳු අයෙකුගේ නම ER ආකෘතිපත්‍රයට ගෘහ මූලිකයා විසින් ඇතුළත් නොකළ යුතු බැවින් ඒ පිළිබඳව ද ගණන් ගන්නා නිලධාරියාගේ සැලකිල්ල යොමු කළ යුතුය. පනතේ 4(3) උප වගන්තියට යටත්ව පහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන,

- වාසස්ථාන නොවන හෝ ගෘහයක් නොමැති කිසිදු ස්ථානයකට නම් ඇතුළත් නොකරන ලෙස,
- ගෘහයක් තිබුණ ද, එහි අයිතිය තිබුණ ද සාමාන්‍ය පදිංචියක් නොමැති නම් ලියාපදිංචි නොකරන ලෙස,
- ඉඩම් අයිතිය තහවුරු කර ගැනීම සඳහා පදිංචියක් නොමැතිව ඡන්දහිමි නාමලේඛනයට නම් ඇතුළත් කර ගැනීමට කටයුතු කරන අවස්ථාවල
- පාසල් වලට ළමුන් ඇතුළත් කර ගැනීම, විශ්ව විද්‍යාල ප්‍රවේශය හා රැකියා අවස්ථා සඳහා පදිංචිය සනාථ කිරීමට සහ දේශපාලනඥයින්ගේ අවශ්‍යතා මත සමහර ගෘහ වලට පදිංචියක් නොමැතිව නම් ඇතුළත් කර ගැනීමට උත්සාහ කිරීම වැනි අවස්ථාවල

ඒ සඳහා අවස්ථාව ලබා නොදී සාමාන්‍ය පදිංචිය ගැන අවධානය යොමු කොට තීරණ ගත යුතු බවට ගණන් ගන්නා නිලධාරීන් දැනුම්වත් කරන්න.

### 11.2 සාමාන්‍ය පදිංචි ස්ථාන කිහිපයක් ඇති පුද්ගලයන්

සමහර අවස්ථා වලදී නිල නිවාසවල පදිංචි වී සිටින පවුල් ඒ යටතේ ලියාපදිංචි නොවී, ඔවුන්ට අයත් පෞද්ගලික නිවාස යටතේ ලියාපදිංචි වීමට ඉල්ලුම් කිරීමට පුළුවන. එබඳු අවස්ථා වලදී ඉදිරිපත් කරනු ලබන කරුණු නිවැරදි නම් එම ගෘහ මූලිකයාගේ කැමැත්තට ඉඩ දිය හැකිය. පනතේ 4(3) උප වගන්තිය කෙරෙහි අවධානය යොමු කරවමි.

### 11.3 ව්‍යාපාරික ස්ථාන යටතේ පදිංචිව සිටින තැනැත්තන්

සමහර පුරවැසියන් තමාට අයත් ව්‍යාපාරික ස්ථාන යටතේ ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචි වීමට ඉල්ලා සිටින අවස්ථා ඇත. එබඳු අවස්ථා වලදී එම පවුලේ සාමාජිකයින් එම ස්ථානයේ සැබෑලෙසම පදිංචිව සිටීද යන්න පිළිබඳව කරුණු සොයා බැලිය යුතුය. එවැනි තැනැත්තන් එම ස්ථානයේ පදිංචිව සිටින්නේ නම් ලියාපදිංචිය සඳහා ඉඩ දිය හැකිය. එහෙත් ඔවුන්ගේ වෙනත් සාමාන්‍ය පදිංචි ලිපිනයක් තිබේ නම් ඒ පිළිබඳව කරුණු සොයාබැලීමට හැකිවන පරිදි එම විස්තර ගණන් ගන්නා නිලධාරී විසින් සටහන් කරගත යුතුවේ.

### 11.4 වැඩිහිටි නිවාස

රජයේ හා පෞද්ගලික ආයතන මගින් පවත්වාගෙන යනු ලබන වැඩිහිටි නිවාස යටතේ ඒවායේ නේවාසිකව පදිංචි වී සිටින අයගේ නම් අදාළ ස්ථාන භාරකරුවන් විසින් ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථා ඇත. එබඳු අවස්ථා වලදී අදාළ පුද්ගලයන්ට අයත් පූර්ව ලියාපදිංචි විස්තර සටහන් කර ගැනීම අවශ්‍ය වේ. සුදුසුකම් සපුරාලන්නේ නම් එබඳු අයගේ නම් එවැනි ස්ථාන යටතේ ලියාපදිංචි කළ හැකිය.

### 11.5 ඡන්දය ලියාපදිංචි වීම සඳහා දේපල අයිතිය අවශ්‍ය නොවේ.

11.5.1 ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා 2025 පෙබරවාරි මස 01 දිනට සාමාන්‍ය පදිංචිය පමණක් ප්‍රමාණවත් වන අතර දේපල අයිතිය අවශ්‍ය නොවේ. කුලී හෝ බදු නිවැසියන් මෙන්ම අනවසර පදිංචි කරුවන්ට අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරන්නේ නම් තමන් සාමාන්‍ය පදිංචි ලිපිනයේ ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි විය හැක. මේ සඳහා දේපල අයිතිකරුවන්ගේ කැමැත්ත හෝ එකඟතාවය අවශ්‍ය නොවේ.

11.5.2 පුරවැසියාගේ අත්හළ නොහැකි පරමාධිපත්‍යය බලයට ඡන්ද බලයද ඇතුළත් වන අතර, ඡන්ද බලය ක්‍රියාත්මක කිරීම සඳහා ඡන්දහිමි නාමලේඛනයේ නම ඇතුළත්ව තිබිය යුතුය. ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා පුරවැසියන්ට බාධා කිරීම අධිකරණයක් මගින් දඩයකට හෝ බන්ධනාගාර ගත කිරීමකට හෝ මේ දෙකටම හෝ යටත් විය යුතු වරදකි.

11.5.3 කුලී නිවැසියන් හෝ බදු නිවැසියන් හෝ අනවසර පදිංචි කරුවන් ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි කිරීම පුරවැසියන්ගේ ඡන්දබලය තහවුරු කිරීම සඳහා පමණක් වන අතර, එම ලියාපදිංචි කිරීම දේපල අයිතිය හෝ ස්ථිර පදිංචිය තහවුරු කර ගැනීම සඳහා නොවන බවද අවධාරණය කළ යුතුවේ.

11.5.4 මෙම ගැටළුව හේතුවෙන් මෙතෙක් ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි වීමට නොහැකි වූ තැනැත්තන් සිටීනම් 2025 වර්ෂයට ලියාපදිංචි කළ යුතු බව දන්වමි.

11.5.5 එහෙත් අධිකරණයක් මගින් නෙරපීම නියෝගයක් නිකුත් කර ඇති විට ලියාපදිංචි නොකළ යුතු අතර උපදෙස් සඳහා විස්තර සහිතව ප්‍රධාන කාර්යාලයට යොමු කළ යුතුවේ.

### 11.6 අනවසර හා රක්ෂිත ප්‍රදේශවල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීම

අනවසර හෝ රක්ෂිත ප්‍රදේශවල පදිංචිකරුවන්ගේ නම් ඉහත 11.5.5 අනුමැතියට යටත්ව ඡන්ද හිමියන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා වන අනිකුත් සුදුසුකම් සපුරා තිබේ නම් එම

තැනැත්තන්ගේ නම "RE" යනුවෙන් අක්ෂරයන් යොදා ( උදා - ගෘහ අංක 110 RE ලෙස) එකී අංකය යටතේ ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි කිරීමට කටයුතු කළයුතුය.

### 11.7 අභිගුණ්ඨික ජනතාව ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි කිරීම

දිවයිනේ බොහෝ නාගරික/අර්ධ නාගරික මෙන්ම ඇතැම් ගම්වල ද තාවකාලිකව වාසය කරනු ලබන අභිගුණ්ඨික ජනතාව ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි කිරීමට මෙවන විටත් අවශ්‍ය පියවර ගෙන ඇත. අභිගුණ්ඨික ජනතාව පිළිබඳව වර්ෂයේ වැඩි කාල සීමාවක් පදිංචි ප්‍රදේශයේ තොරතුරු අදාළ වසමේ ග්‍රාම නිලධාරී මගින් ලබාගෙන, සාමාන්‍ය පදිංචිය සහ ඡන්දය ප්‍රකාශ කිරීමට හැකි ඡන්ද මධ්‍යස්ථාන ආදිය පිළිබඳව සොයා බලා එම ජනතාවගේ තොරතුරු ER ආකෘතිය මගින් ලබාගෙන, සුදුසු ගෘහ අංකයක් ලබාදී ඔවුන්ගේ නම ලියාපදිංචි කළ යුතුය. ( අදාළ ග්‍රාම නිලධරයන් මගින් මෙම අයගේ තොරතුරු ලබාගත යුතුය). එමෙන්ම පුත්තලම ප්‍රදේශයේ අප්‍රිකානු සම්භවයක් ඇති ශ්‍රී ලාංකිකයින්ගේ හා මඩකළපුවේ පදිංචි පෘතුගීසි සම්භවයක් සහිත ශ්‍රී ලාංකිකයන් මෙවැනි ක්‍රියාමාර්ග ගැනීමෙන් ඡන්ද හිමි නාමලේඛනයට මෙවන විට සම්පූර්ණයෙන් ඇතුළත්වී ඇති බව විශ්වාස කෙරේ.

### 11.8 වතු ආශ්‍රිත ප්‍රදේශවල පදිංචිකරුවන් ලියාපදිංචි කිරීමේ ගැටලු

වතු නිවාසවල පදිංචි, එහෙත් අදාළ වත්තේ සේවය නොකරන මලය තමිල් ජනතාව අතුරින් රැකියා කටයුතුවල නිරතවීම සඳහා කොළඹ හෝ වෙනත් නාගරික ප්‍රදේශවල තාවකාලිකව පදිංචිව සිටින තැනැත්තන් අවිවාහක නම් ඔවුන්ගේ දෙමාව්පියන් සමඟ ද, විවාහක නම් එම අයගේ කලත්‍රයා සමඟ ද සාමාන්‍ය පදිංචිය තිබෙන වතු නිවාසවල ලියාපදිංචි කිරීමට පියවර ගන්න. එසේ වුවද, මෙසේ කරනු ලබන්නේ මෙවැනි තැනැත්තන් ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි කිරීමට අපේක්ෂිත ලිපිනයේ සාමාන්‍ය පදිංචියක් ඇති බව සනාථ වන්නේ නම් පමණක් බව අවධාරනය කරමි.

### 11.9 රැඳවුම් කඳවුරුවල සිටින පුරවැසියන්

ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචිය සඳහා අනෙකුත් සුදුසුකම් සපුරා ඇති පරිවාසභාරයේ සිටින හා රැඳවුම් ස්ථානවල නේවාසිකයන් අධිකරණයෙන් වරදකරුවන් වී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 (ඇ) ඡේදයේ ඡන්ද බලය අහිමිවන සීරුඳුවම්වලට යටත්කර නැත්නම්, අවිවාහක පුරවැසියන්ට තම දෙමාපියන් සමඟත්, විවාහක පුරවැසියන්ට තම කලත්‍රයා සමඟත් පෙර පරිදි ලියාපදිංචි කිරීමට බාධාවක් නොමැත.

### 11.10 රැකියා සඳහා ස්වකීය ගම් ප්‍රදේශයෙන් බැහැරව සිටින තැනැත්තන්, කර්මාන්ත ශාලාවල සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම.

ඉහත සඳහන් 11.8 කාරණයට අදාළ වන පරිදිම ස්වකීය රැකියා අවශ්‍යතා සඳහා නිත්‍ය පදිංචි ස්ථානයෙන් තාවකාලිකව බැහැරව සිටින තැනැත්තන්ගේ නම ඔවුන්ගේ සාමාන්‍ය පදිංචිය ඇති ලිපිනයේ ( උදා - ආයෝජන ප්‍රවර්ධන මණ්ඩල කලාප / ඇඟලුම් කර්මාන්ත ශාලාවල සේවා නියුක්තිකයින්) ඡන්ද හිමියන් ලෙස ලියාපදිංචි කිරීමට පියවර ගනු ලැබිය යුතුය. විවාහක යුවලක් මේ අයුරින් රැකියා අවශ්‍යතා සඳහා නිත්‍ය පදිංචි ස්ථානයෙන් බැහැර ඇති ස්ථානයක තාවකාලිකව පදිංචිව සිටී නම් ඔවුන්ට සාමාන්‍ය පදිංචිය ඇති බව සනාථ කළහැකි ලිපිනයේ ලියාපදිංචි කළ හැකිය.

**11.11** ඉහත අවස්ථා වලදී සාමාන්‍ය පදිංචියක් තිබේද නැද්ද යන්න ගණන් ගැනීමේ නිලධාරී/ ග්‍රාම නිලධාරී නිර්දේශය ලබා ගැනීමට ක්‍රියා කරන්න. ගැටලුකාරී තත්ත්වන් මතුවන සෑමවිටම ස්ථානීය පරීක්ෂණයන් සිදුකර තීරණය ගතයුතු වන අතර, මේ පිළිබඳව තවදුරටත් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය නම් මැතිවරණ කොමිෂන් සභාවෙන් උපදෙස් ලබා ගැනීමට ක්‍රියාකළයුතු වේ.

## 12. ප්‍රවර්තන ඡන්දහිමි නාමලේඛනයේ සඳහන් ඡන්දහිමියන්ගේ නම, ජාතික හැඳුනුම්පත් අංක හා වෙනත් තොරතුරුවල නිරවද්‍යතාව

12.1 ගෘහමූලිකයා විසින් සම්පූර්ණ කර ඇති ER ආකෘතිපත්වල සඳහන් පුද්ගලයන්ගේ නම සහ ජාතික හැඳුනුම්පත් අංක, නිවැරදිව ඇතුළත් කර ඇත්දැයි ER ආකෘතිපත් එකතු කරන අවස්ථාවේදී ගණන් ගන්නා නිලධාරියා විසින් පරීක්ෂා කර බැලිය යුතුය. හැකිතාක් දුරට එබඳු අවස්ථා වලදී එම විස්තරවල නිවැරදිතාව අදාළ ජාතික හැඳුනුම්පත් පරීක්ෂා කිරීමෙන්ම තහවුරු කර ගැනීම අවශ්‍ය වේ.

12.2 ඡන්දහිමියන් ගණන් ගන්නා අවස්ථාවේදී යම ඡන්දහිමියෙකුගේ නමක, ජාතික හැඳුනුම්පත් අංකයක, ගෘහ අංක හෝ ස්ත්‍රී පුරුෂභාවයට අදාළව ප්‍රවර්තන නාමලේඛනයෙහි වැරදි අන්දමින් තොරතුරු සටහන් වී ඇත්නම් ඒවා නිවැරදි විය යුතු ආකාරය ඔබ වෙත සපයා ඇති ආකෘති අංක 04 න් ගණන් ගන්නා නිලධාරීන්ගෙන් ලබා ගැනීමට කටයුතු කරන්න.

12.3 පුද්ගලයකුගේ ජාතික හැඳුනුම්පත් අංකය හා නමෙහි නිවැරදි බව සනාථකර ගැනීම සඳහා හැඳුනුම්පතේ ඡායා පිටපතක් අවශ්‍ය නොවන අතර අංකය හා නම නිවැරදි බවට වූ ග්‍රාම නිලධාරී සටහන සහිතව ග්‍රාම නිලධාරී විසින් අත්සන් කර ඇත්නම් එය ප්‍රමාණවත් වේ.

12.4 ඡන්දහිමි නාමලේඛනය 2024 සහතික කළ පසු එහි තොරතුරුවල දෝශ පිළිබඳව ලිපි මඟින් දන්වා ඇති ඡන්දහිමියන්ගේ ඉල්ලීම් අනුව ,අවශ්‍ය නිවැරදි කිරීම කරන ලෙස ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන් දැනුම්වත් කළ යුතු වේ.

**13. විදේශගත ඡන්දහිමියන්**

රැකියා කටයුතු හෝ අධ්‍යාපන කටයුතු හෝ වෙනුවෙන් විදේශගත වී සිටින මෙරට පුරවැසියන්ගේ හෝ ද්විත්ව පුරවැසියන්ගේ අදාළ විස්තර ඔවුන්ගේ මෙරට සාමාන්‍ය පදිංචි ලිපිනය යටතේ ගෘහ මූලිකයකු විසින් ඉදිරිපත් කරනු ලබන්නේ නම් හා එම අදාළ කරුණු නිවැරදි නම් සුදුසුකම් ඇති එබඳු පුද්ගලයන්, ඔවුන්ගේ මෙරට සාමාන්‍ය පදිංචි ලිපිනය යටතේ ලියාපදිංචි කිරීම සඳහා නිර්දේශ කළ හැකිය.

**14. ග්‍රාම නිලධාරී වසම් තුළ පදිංචි විශේෂ පුද්ගලයින්ගේ නම් ගණන් ගැනීම**

වසම් තුළ පදිංචි වත්මන්/හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හා හිටපු පළාත් සභා මන්ත්‍රීවරුන් පළාත් පාලන ආයතන ප්‍රධානීන් හා නියෝජිතයන් මෙන්ම අදාළ ඡන්ද විමසීම් වලදී තරඟ කරන ලද අපේක්ෂකයන්ගේ නම් ද ඇතුළුව අනිකුත් ප්‍රමුඛ පුරවැසියන්ගේ (විහාරාධිපති හිමිවරුන් ඇතුළු පූජ්‍ය / පූජක උතුමන් වහන්සේ, අධිකරණ සේවයේ විනිශ්චයකරුවන්, ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන්, ප්‍රදේශයේ සමිති සමාගමවල නිලධාරීන්) නම් ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් වී තිබේද යන්න සම්බන්ධයෙන් නිසැක විය යුතු බවට ගණන් ගන්නා නිලධාරීන් දැනුම්වත් කළ යුතුය. එවැනි විශේෂිත යම් අයෙකුගේ නම ඇතුළත් කිරීමට නොහැකි තත්ත්වයක් මතුව ඇත්නම් හෝ තොරතුරු ලබාගත නොහැකි නම් හෝ ප්‍රතිශෝධන ලේඛන ආපසු මැතිවරණ කාර්යාලයට භාරදීමට පැමිණි පසු ඔබ හමුවී ලිඛිතව එවැනි තොරතුරු ලබා දිය යුතු බවට ගණන් ගන්නා නිලධාරීන් දැනුම්වත් කරන්න.

**15. පරිපූරක ඡන්දහිමි නාමලේඛන සකස් කිරීම .**

2025 හා 2026 වර්ෂ සඳහා සකස් කළ යුතු පරිපූරක ඡන්දහිමි නාමලේඛන 06ක් සඳහා තොරතුරු එක්රැස් කිරීම සිදු කළ යුතුවේ.

15.1 2025(1), 2025(2) සහ 2025(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සඳහා සුදුසුකම් ලබන කාලපරිච්ඡේදය හා වයස් කාණ්ඩ පහත දැක්වේ.

| පරිපූරක ඡන්දහිමි නාමලේඛනය | අවුරුදු 18 සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය | උපන්දිනය |
|---|---|---|
| 2025 (1) | 2025.02.01 සිට 2025.05.31 දක්වා | 2007.02.01 සිට 2007.05.31 දක්වා |
| 2025 (2) | 2025.06.01 සිට 2025.09.30 දක්වා | 2007.06.01 සිට 2007.09.30 දක්වා |

| | | |
|---|---|---|
| 2025 (3) | 2025.10.01 සිට 2026.01.31 දක්වා | 2007.10.01 සිට 2008.01.31 දක්වා |

15.2. 2026(1),2026(2). සහ 2026(3) පරිපූරක ඡන්දහිමි නාමලේඛන සඳහා සුදුසුකම් ලබන කාලපරිච්ඡේදය හා වයස් කාණ්ඩ පහත දැක්වේ.

| පරිපූරක ඡන්දහිමි නාමලේඛනය | අවුරුදු 18 සම්පූර්ණ කළ යුතු කාල පරිච්ඡේදය | උපන්දිනය |
|---|---|---|
| 2026 (1) | 2026.02.01 සිට 2026.05.31 දක්වා | 2008.02.01 සිට 2008.05.31 දක්වා |
| 2026 (2) | 2026.06.01 සිට 2026.09.30 දක්වා | 2008.06.01 සිට 2008.09.30 දක්වා |
| 2026 (3) | 2026.10.01 සිට 2027.01.31 දක්වා | 2008.10.01 සිට 2009.01.31 දක්වා |

15.3. පරිපූරක ඡන්දහිමි නාමලේඛන සඳහා සුදුසුකම් ලබන තැනැතතන්, තම උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ ජාතික හැඳුනුම්පතේ පිටපතක් ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙනුවට ගණන් ගැනීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුවේ.

15.4 පරිපූරක ඡන්දහිමි නාමලේඛනයට ගණන් ගැනීම සඳහා YC ආකෘති භාවිත කළ යුතුවේ. YC ආකෘතියෙහි 2 වෙනි පිට සඳහන් උපදෙස් කෙරෙහි ගණන් ගැනීමේ නිලධාරීන්ගේ අවධානය යොමු කර ඊට අනුකූල වන අයුරින් ක්‍රියා කරන ලෙස දන්වන්න.

15.5 2024 ප්‍රතිශෝධනයේ දී 2025(1), 2025(2) සහ 2025(3) පරිපූරක නාමලේඛන සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ විස්තර YC ආකෘති පත්‍ර මඟින් ලබා ගත් අතර එම පරිපූරක නාමලේඛන සඳහා ලැබී ඇති සියළුම අයදුම්පත්වල විස්තර පරිගණක ගත කර එහි ලැයිස්තුවක් ගණන් ගැනීමේ නිලධාරී වෙත ලබාදිය යුතු වේ. එම ලැයිස්තුවෙහි නම සඳහන් තැනැත්තන් 2025.02.01 දිනට පෙර ලිපිනයේම ඇත්නම් 2025 වර්ෂය සඳහා නැවත YC ආකෘතියක් සම්පූර්ණ කළ යුතු නොවේ.

**16.** **පසුගිය ප්‍රතිශෝධනයේදී ස්වකීය නම් ලියාපදිංචි නොවූ බවට ඉදිරිපත් වූ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම**

2024 ඡන්දහිමි නාමලේඛනයේ නම ඇතුළත් නොවීම සම්බන්ධයෙන් පැමිණිලි කළ සියලුම තැනැත්තන් පිළිබඳ තොරතුරු ගණන් ගැනීමේ නිලධාරීන්ට ලබා දිය යුතු අතර එම පුද්ගලයන් ඡන්දහිමියන් ලෙස ලියාපදිංචිවීමට සුදුසුකම් ලබා ඇතිනම් අත්‍යවශ්‍යයෙන්ම ඔවුන්ගේ නම් ලියාපදිංචි කිරීමට පියවර ගෙන ඇත්දැයි යන්න නිසැකවන්න. එමෙන්ම 2025 පෙබරවාරි 01 දින සාමාන්‍ය පදිංචිය නොමැති එහෙත් ඉන්පසු වසමේ සාමාන්‍ය පදිංචිය ඇති 2025 හිමිකම් ඉල්ලුම්කරුවන් පිළිබඳ විශේෂ අවධානය යොමුකරන්න.

**17. 2024 බීසී ඩොකොට්වුව 2025 සඳහා යාවත්කාලීන කිරීම.**

2025 වර්ෂයේ දී සෑම නිවසකටම බීසී ආකෘති පත්‍රයක් නිකුත් කරනු නොලබන හෙයින් 2024 නාමලේඛනය ගැලපෙන අයුරින් යාවත්කාලීන කළ යුතුය. මේ සම්බන්ධයෙන් වැඩිදුර උපදෙස් ඉදිරියේදී එවීමට අපේක්ෂා කෙරේ.

**18.** ප්‍රතිශෝධන කාල සටහන

ප්‍රතිශෝධන කාල සටහනෙහි (ඉදිරි වැඩ සැලැස්ම) පරිපූරක නාමලේඛනය සකස් කිරීමට ද අදාළවන පරිදි සකස් කර ඇති අතර, එහි පිටපතක් මේ සමඟ එවා ඇත. ඊට අනුකූල වන අයුරින් කටයුතු සංවිධානය කළ යුතුවේ. උපදෙස් හා ආකෘති මුද්‍රණය ප්‍රමාදය සැලකිල්ලට ගෙන කාල සටහනෙහි 1 හි 2 ප්‍රධාන ක්‍රියාකාරකම් දින 10ක් පමණ ප්‍රමාද කළ හැක.

19. 2025/ ER ආකෘතිය බෙදාහැරීම හා එකතු කර ගැනීම.

19.1 ඔබ දිස්ත්‍රික්කය වෙත ලබා දී ඇති 2025/ ER ආකෘතිය මීට පෙර වසමේ A හා B නම ගණන සැලකිල්ලට ගෙන ගණන් ගැනීමේ නිලධාරි වෙත ලබා දෙන්න. මහජනයා විසින් ඉල්ලා සිටින අවස්ථාවලදී ආකෘති පත්‍ර නිකුත් කරන ලෙස දන්වන්න. දුරකථන ඇමතුම් මගින් හෝ වෙනත් සන්නිවේදන මාධ්‍යයකින් ER ආකෘති ඉල්ලා සිටින විට අදාළ ගෘහය වෙත එය ලැබීමට සලස්වන ලෙස ගණන් ගන්නා නිලධාරීන් දැනුම්වත් කරන්න. එමෙන්ම වසමට/ ඡන්ද කොට්ඨාසයට අළුතින් පදිංචියට පැමිණි තැනැත්තන් පිළිබඳව සොයා බලා ඔවුන් වෙත ER ආකෘතිය ලබාදීමට පියවර ගත යුතු වේ.

19.2 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට මහජනයා ඉල්ලූ විට ලබා දීම සඳහා ER ආකෘති ලබා දෙන්න.

19.3 මැතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවිය ඔස්සේ මෙම ආකෘතිය බාගත කිරීමේ පහසුකම සලසා ඇත. එමෙන්ම දත්ත එක්රැස් කිරීමට වැඩ සටහනක් තොරතුරු තාක්ෂණ අංශය මගින් සැකසෙමින් ඇත.

19.4. තම ග්‍රාම නිලධාරී වසමේ සාමාන්‍ය පදිංචියක් ඇති සුදුසුකම් ලැබූ සියළුම ඡන්දහිමියන් ගණන් ගැනීම ගණන් ගැනීමේ නිලධාරීන්ගේ වගකීමක් බව අවධාරණය කරමි.

20. රාජ්‍ය ආයතනවලින් තොරතුරු ලබාගැනීම.

20.1 ඡන්දහිමියන් ගණන් ගැනීමට අදාළව පහත සඳහන් ආයතනවලින් මතු සඳහන් තොරතුරු ලබාගැනීමට අපේක්ෂා කෙරේ.

19.1.1. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් වයස අවුරුදු 18 සම්පූර්ණ තැනැත්තන්ගේ විස්තර ලබාගැනීම.

19.1.2. රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් මරණයට පත්වූ තැනැත්තන්ගේ විස්තර ලබාගැනීම.

20.2 ඊට අමතරව පාසල් මගින්, විදේශ සේවා නියුක්ති කාර්යාංශය මගින්, ආගමන විගමන දෙපාර්තමේන්තුව මගින්, සේවක අර්ථ සාධක අරමුදල මගින් තොරතුරු ලබාගැනීමට ඉදිරියේදී සාකච්ඡා පැවැත්වීමට නියමිත වේ.

20.3 මෙමගින් අපේක්ෂා කරනුයේ එම ආයතනවල ඇති දත්ත ආශ්‍රයෙන් ලියාපදිංචි නොවූ ඡන්දහිමියන්ගේ තොරතුරු ග්‍රාම නිලධාරී වසම් අනුව ගණන් ගැනීමේ නිලධාරීන් වෙත යවා ඒ පිළිබඳව ඔවුන්ගේ අවධානය යොමු කොට ER ආකෘති සම්පූර්ණ කර ගැනීමයි.

20.4 එම තොරතුරු ලද විගස දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත යොමු කරනු ලැබේ. එම දත්ත ගණන් ගැනීම නිලධාරීන් වෙත අවස්ථානුකූලව යොමු කරන ලෙස දන්වමි.

21. ඉහත සෑම මූලාශ්‍රයකින්ම ලැබෙන දත්ත ආශ්‍රයෙන් ER ආකෘති සම්පූර්ණ කර ගැනීමත් 2025.01.01 දින සිට 2025.02.28 අතර කාලය තුළ අදාළ පිටපත් හා ලියාපදිංචිය ඉල්ලා ඇති තැනැත්තන් සඳහා නිර්දේශ සටහන් කිරීම සිදුකළ යුතුවේ. සෑම ඉවත්වන නමක් සහ ඇතුළත්වන නමක් සම්බන්ධයෙන් ගණන් ගන්නා නිලධාරි නිවසට ගොස් පරීක්ෂා කර ඔහුගේ නිර්දේශය ලබාදීම අනිවාර්ය වේ.

22. ගණන් ගැනීමේ ආකෘති 2025.03.03 දින සිට 2025.03.28 දින දක්වා අතර කාලය තුළදී භාර ගැනීමේ වැඩපිළිවෙලක් සැලසුම් කළයුතු අතර ඒවා විධිමත්ව හා නිවැරදිව මැතිවරණ කාර්යාලයට භාරගැනීමට ක්‍රියාකළ යුතුවේ.

23. 2024වර්ෂයේ නාමලේඛනයේ සඳහන් 2025 වර්ෂය සඳහා B ගතවන සෑම නමක්ම 2025 වර්ෂයේ දී අදාළ ස්ථානයේ A ලැයිස්තුවකට ඇතුළත් විය යුතුය.

23.1. මෙම පරීක්ෂාව සිදුකිරීම සඳහා පරිගණක වැඩසටහන යාවත්කාලීන කිරීමට අපේක්ෂා කෙරේ.

24. 2024.03.03 සිට 28 දක්වා කාලය අතර තුර ගණන් ගන්නා නිලධාරීන්ගෙන් පහත සඳහන් ආකෘති සම්පූර්ණ කර වාර්තා ලබාගත යුතුවේ.

- අ / A ආකෘතිය
- ආ / B ආකෘතිය
- "අ" සහ "ආ" නම් පිළිබඳ සංශෝධන
- ආකෘති අංක 1 – 6 දක්වා

25. ඡන්ද ප්‍රදේශ භාර නිලධාරීන් විසින් විධිමත් A හා B ලැයිස්තු සකස් කිරීම 2025.03.15 සිට 2025.04.25 දින අතර සිදුකළ යුතුවේ.

26. ගණන් ගැනීමේ ආකෘති ආපසු බාරගැනීමේ වැඩසටහන පිළිබඳව අදාළ ප්‍රාදේශීය ලේකම්වරුද දැනුම්වත් කළ යුතුය. එම ලේඛන භාරදීම, අවසරයකින් තොරව ප්‍රමාද කරනු ලබන නිලධාරීන් සම්බන්ධව සුදුසු පරිදි කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් සහ දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරියා වෙත වාර්තා කළ යුතුය. ගණන් ගන්නා නිලධාරියා විසින් ප්‍රතිශෝධන ලේඛන මැතිවරණ කාර්යාලයට භාරදීම පමා කිරීම හේතුවෙන් වසමකට අයත් “අ” සහ “ආ” ලැයිස්තු නියමිත දිනට ප්‍රදර්ශනය කිරීමට නොහැකි වුවහොත් එබඳු නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව ක්‍රියාකිරීම සඳහා දිස්ත්‍රික් ලියාපදිංචි කිරීමේ නිලධාරියාට, මටද පිටපතක් සහිතව වාර්තා කළ යුතුය. ***ඡන්දහිමියන් ගණන් ගැනීමේ කටයුතු මෙන්ම ගණන් ගැනීමේ ආකෘති නියමිත දිනට ආපසු බාරගැනීමේ කටයුතු විධිමත්ව ඉටුකර ගැනීම සඳහා ප්‍රාදේශීය ලේම්වරුන් වෙත ප්‍රගතිය දැනුම් දෙන්න.***

27. ගණන් ගැනීමේ ආකෘති මැතිවරණ කාර්යාලයට භාරදුන් පසුව ග්‍රාම නිලධාරි නිර්දේශය සහිතව මැතිවරණ කාර්යාල වලට ලැබෙන ගණන් ගැනීමේ ආකෘති සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.

ER ආකෘතිපත් ගණන් ගන්නා නිලධාරීන්ගෙන් භාරගත් පසුවද, සමහර පුද්ගලයන් මැතිවරණ කාර්යාලයට පැමිණ හෝ තැපැල් මගින් බීසී ආකෘතිපත් එවන අවස්ථා බොහෝවිට නාගරික ප්‍රදේශවලදී දක්නට ඇත. එලෙස භාරදෙන ER ආකෘතිපත් ගණන් ගන්නා නිලධාරීන් විසින් නිර්දේශ කර ඇත්නම් සහ “අ” සහ “ආ” ලැයිස්තු ප්‍රදර්ශනයට පෙර එවා ඇතිනම් ඒවා අදාළ පරිදි “අ” සහ “ආ” ලැයිස්තුවලට ඇතුළත් කිරීම සහ ඩොකට්ටුවේ නියමිත ගෘහ අංක යටතේ බැඳ තැබීමත් කළ යුතුය. “අ” සහ “ආ” ලැයිස්තු ප්‍රදර්ශනයට පසුව ලැබී ඇති එවැනි ඉල්ලීම හිමිකම් ලෙස සලකා අවශ්‍ය කටයුතු කළ යුතු වේ. මෙම හිමිකම් අවස්ථානුකූලව හිමිකම් පරීක්ෂණයකින් තොරව පිළිගත හැක.

**28. ගෘහමූලික විසින් ER ආකෘතියේ සඳහන් කර ඇති නමුත් ගණන් ගන්නා නිලධාරීන් විසින් නිර්දේශ කර නොමැති නම් සහ යම් ගෘහයක ප්‍රවර්තන නාමලේඛනයේ නම් සඳහන් සියලුම දෙනා "අ" ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් ක්‍රියා කිරීම.**

**28.1.** **මෙය අතිශයින්ම වැදගත් හා අත්‍යාවශ්‍ය කාර්යයක් බව අවධාරණය කරනු ලැබේ.**

2025 වර්ෂයේ ER ආකෘතියේ ගෘහමූලික විසින් ගණන් ගැනීම සඳහා ඇතුළත් කර ඇති නමුත්, ග්‍රාම නිලධාරී / ගණන් ගන්නා නිලධාරී විසින් නිර්දේශ කර නොමැති නම හෝ යම්කිසි ගෘහයක් යටතේ ප්‍රවර්තන නාමලේඛනයේ නම සඳහන් සියළුම දෙනා ගණන් ගන්නා වර්ෂයේදී ඉවත් කර “අ” ලැයිස්තුගත කර ඇත්නම් ඒ සම්බන්ධයෙන් **අප්‍රමාදව ගෘහමූලිකයා දැනුවත් කළ යුතු වේ.** ඡන්දහිමියන් ගණන් ගැනීමේ කටයුතු අවසන්වීමෙන් පසු ගණන් ගන්නා නිලධාරී විසින් 3 ආකෘතිය මගින් එම තොරතුරු වාර්තා කළ යුතු අතර, බීසී ආකෘති පරීක්ෂා කරන අවස්ථාවේදීම එම තොරතුරු ගණන්

ගණන්නා නිලධාරී විසින් නිවැරදිව සටහන් කර ඇතිබව සනාථ කරගෙන එම ලේඛනයට අනුව ගෘහමූලික වෙත ලිපි යැවිය යුතුය. ඒ සම්බන්ධයෙන් ගෘහමූලිකයින් වෙත යැවිය යුතු ලිපියේ සහ ලබාගතයුතු තොරතුරු වාර්තාවේ ආදර්ශ ලිපියක් මෙයට අමුණා ඇත. ඊට අදාළව ගෘහමූලිකගෙන් ලැබෙන පිළිතුර අනුව අවශ්‍ය අවස්ථාවන්හිදී ග්‍රාම නිලධාරීන්ගෙන්ද විමසා බලා ප්‍රශ්නයට තුඩු දී ඇති නම ඇතුළත් කිරීම හෝ නොකිරීම පිළිබඳ තීරණය සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරියා විසින් ගතයුතු වේ. "අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනයට පෙර නමක් ඇතුළත් කිරීමට තීරණය කරන්නේ නම් අදාළ පරිදි එම නම "අ" ලැයිස්තුවෙන් ඉවත් කිරීම හෝ "ආ" ලැයිස්තුගත කිරීමට කටයුතු කළ යුතුය. "අ" සහ "ආ" ලැයිස්තු ප්‍රදර්ශනයෙන් පසුව පිළිගැනීමට තීරණය කරනු ලබන සියළු නම පිළිගත් හිමිකම් ලෙස සලකා කටයුතු කිරීමට පුළුවන. කෙසේවෙතත් ඇතුළත් නොකිරීමට තීරණය වන නම් ඇතොත් ඒවා හිමිකම් ඉල්ලීම් ලෙස සලකා හිමිකම් පරීක්ෂණ අවස්ථාවේදී කැඳවීමට ක්‍රියා කළ යුතුය.

28.2 ගෘහමූලික වෙත යවන ලද ලිපියට පිළිතුරක් ලැබී නොමැති අවස්ථාවල මීට පෙර අවස්ථාවකදී අදාළ කරුණ පිළිබඳව දැනුම් දී ඇති බව සඳහන් කරමින්, හිමිකම් / විරෝධතා කාලසීමාව තුළ හිමිකමක් ඉදිරිපත් කරන ලෙසත් හිමිකම් ඉදිරිපත් කළ යුතු ආකාරයත් දන්වා යවන්න. උපදෙස් පරිදි කටයුතු නොකළහොත් 2025 ඡන්දහිමි නාමලේඛනයට නම ඇතුළත් නොවන බවද ලිපියේ දන්වා යවන්න.

29. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ තොරතුරු ඕනෑකමින්ම යටපත් කරන්නා වූ හෝ ඉවත් කරන්නා වූ හෝ අසත්‍ය තොරතුරු සපයන්නා වූ නිලධාරීන්ට දඬුවම්.

29.1 ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 12 (5) උපවගන්තියේ උපුටනයක් පහත දැක්වේ.

"12(5) ලියාපදිංචි කිරීමේ නිලධරයකු විසින් පත් කරනු ලැබ සිටින්නා වූ ද

(අ) ඡන්දහිමියකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා යම් තැනැත්තකුගේ සුදුසුකම්වලට අදාළ වූ හෝ යම් කැනැත්තකුගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරනු ලැබිය යුතු ද නොයුතු ද නැතහොත් තබා ගත යුතු ද නොයුතු ද යන වග තීරණය කිරීම පිණිස අදාළ වූ තොරතුරු කිසිවක් තමන් වෙත සපයනු ලැබීමෙන් නැතහොත් තමා විසින් ම සොයා ගනු ලැබීමෙන් පසු ඒ තොරතුරු ඕනෑකමින් ම යටපත් කරන්නා වූ ද එසේ නැතහොත් පෙර කී කාර්යය සඳහා අදළ වන කොරතුරු කිසිවක් අසත්‍ය බව දැන දැන ම ඒ තොරතුර දෙන්නා වූ ද ; නැතහොත්

(ආ)ඡන්දහිමියකු ලෙස ලියාපදිංචි කරනු ලැබීම හෝ තබා ගැනීම සඳහා හිමිකම් ඇති යම් තැනැත්තකුගේ නම, ඕනෑකමින් ම සහ යුක්ති සහගත හේතුවක් නොමැතිව නාම ලේඛනයෙන් ඉවත් කරන්නා වූ නැතහොත් ඉවත් කිරීමට සලස්වන්නා වූ සහ නාම ලේඛනයෙහි ඇතුළත් කිරීම ඕනෑකමින් ම සහ යුක්ති සහගත හේතුවක් නොමැතිව පැහැර හරින්නා වූ ද
සෑම නිලධරයකු ම, වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියෙහි වරදකරු කරනු ලැබූ විට , රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට හෝ එක් මාසයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතුය."

29.2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 89 වන ව්‍යවස්ථාවේ නුසුදුසුකමකට ලක් නොවූ හා ගණන් ගන්නා දිනට සාමාන්‍ය පදිංචියක් ඇති සියළුම තැනැත්තන් ගණන් ගැනීම සිදු නොකිරීම පනතේ 12(5)උප වගන්තිය කඩකිරීමක් ලෙස සැලකිය හැක.

30. මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු පිළිබඳව දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් ස්වකීය දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කිරීමේ නිලධරයා වන දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරයා සමග සාකච්ඡා කිරීම අවශ්‍ය වන අතර, එසේ සකාච්ඡා කරන ලද බව හා මෙම චක්‍රලේඛය ලද බව දැන්වීමේ ලිඛිත වාර්තාවේ සටහන් කර තිබීම අත්‍යාවශ්‍ය බව කාරුණිකව දන්වමි.

මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,

සමන් ශ්‍රී රත්නායක,
මැතිවරණ කොමසාරිස් ජනරාල්

සටහන - මෙම චක්‍රලේඛය සියලුම දිස්ත්‍රික් කාර්යාලවල, සියලුම ඡන්ද ප්‍රදේශභාර නිලධාරීන් හා සෙසු නිලධාරීන්ගේ අවධානයට යොමු කළ යුතු අතර, මේ සම්බන්ධයෙන් අවශ්‍ය සටහන් තබාගැනීමට ඔවුන්ට උපදෙස් දිය යුතුය. ප්‍රතිශෝධන කටයුතු සඳහා විශ්‍රාමික හෝ වෙනත් නිලධාරීන් සහාය කරගන්නාවිට ඔවුන්ද දැනුවත් කිරීම අත්‍යාවශ්‍යය.

පිටපත - 1. ලේකම් මැතිවරණ කොමිෂන් සභාව - දැන ගැනීම පිණිස කාරුණිකව
2. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - දැන ගැනීම පිණිස සහ අදාළ සෙසු නිලධාරීන් දැනුවත් කිරීම වස්,

ඇමුණුම 03

රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
Home Affairs Division

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விட்டிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email. info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No: HA/3/7/29-2
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.01. 17

සියළුම දිස්ත්‍රික් ලේකම් / දිසාපතිවරුන් ‍ෙ
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2025 ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කාල සමාව තුළ අදාළ ග්‍රාම නිලධාරී ස්ථානමාරු වීම් අත්හිටුවීම සහ එම කාලය තුළ ග්‍රාම නිලධාරී කාර්යාල දින සීමා කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් මැතිවරණ කොමසාරිස් ජනරාල් විසින් යොමු කර ඇති අංක NE1/64(2025) හා 2024.12.30 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ විධිවිධාන අනුව 2025 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය සිදු කළ යුතු වේ.

03. පනතේ 12වන වගන්තිය අනුව ඡන්දහිමියන් ගණන් ගැනීමේ නිලධාරී ලෙස ග්‍රාම නිලධාරී ක්‍රියා කරනු ලැබේ. ඡන්දහිමියන් ගණන් ගැනීම සෑම ග්‍රාම නිලධාරීවරයෙකුගේ ප්‍රමුඛ, අත්හළ නොහැකි, ව්‍යවස්ථාපිත කාර්යභාරයකි.

04. පවත්නා නීතිය අනුව සෑම වර්ෂයකම ප්‍රධාන නාම ලේඛනය සකස් කිරීමට අමතරව පෙබරවාරි 01 සිට මැයි 31 දක්වාත්; ජුනි 01 සිට සැප්තැම්බර් 30 දක්වාත්; ඔක්තෝබර් 01 සිට ජනවාරි 31 දක්වාත් යන මාස 04 ක කාල පරිච්ඡේදය තුළ වයස අවුරුදු 18 සම්පූර්ණ කරනු ලබන යොවුන් පුරවැසියන් ඇතුළත් පරිපූරක නාමලේඛනය ද සකස් කළ යුතු අතර ඊට අදාළ ක්ෂේත්‍ර ගණන් ගැනීම හා නිර්දේශ ලබා දීමේ කටයුතු ග්‍රාම නිලධාරී විසින් ඉටු කළයුතු වේ.

05. 2025 වර්ෂයේදී පහත සඳහන් අයුරින් ඡන්දහිමියන් ගණන් ගැනීමට කොමිෂන් සභාව තීරණය කර ඇත.

5.1. ප්‍රධාන ඡන්ද හිමි නාමලේඛනයට අදාළ තොරතුරු ER ආකෘතිය මගින් ද; පරිපූරක නාමලේඛනයට අදාල තොරතුරු YC ආකෘති මගින්ද ලබා ගැනීම.

5.2. ER/ YC ආකෘතියට අදාළ ගෘහයන් වෙත පමණක් ග්‍රාම නිලධාරී ගොස් පෞද්ගලිකව පරීක්ෂා කර බලා ඡන්දහිමියන් ගණන් ගැනීම සිදුකළ යුතු බව.

5.3. 2024 වර්ෂයේ නාමලේඛනයේ ඇතුළත්ව නොමැති තැනැත්තන්; අවුරුදු 18 සම්පූර්ණ වූ, අළුතින් පදිංචියට පැමිණි අය පිළිබඳව ER ආකෘතියක් සම්පූර්ණ කර තොරතුරු ලබා ගැනීම.

5.4. 2024 වර්ෂයේ නාමලේඛනයේ ඇතුළත්ව ඇති නමුත් මිය යාම, පදිංචිය හැර යාම වැනි හේතු මත ලියාපදිංචි කිරීමට නුසුදුසු තැනැත්තන් පිළිබඳව ER ආකෘතිය මගින් වාර්තා ලබා ගැනීම.

5.5. වයස අවුරුදු 16 සම්පූර්ණ කළ යොවුන් පුරවැසියන්ගේ තොරතුරු YC ආකෘති පත්‍ර මගින් ලබා ගැනීම.

5.6. බහු ලියාපදිංචිය, හැඳුනුම්පත් නොමැති, විශේෂ අවශ්‍යතා ඇති තැනැත්තන් සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම.

06. නියමිත ගෘහයට ගොස් ඡන්ද හිමියන් ගණන් ගැනීමෙන් අනතුරුව ග්‍රාම නිලධාරි විසින් ආකෘති පත්‍ර සම්පූර්ණ කර ගණන් ගැනීමේ ලියවිලි දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත භාර දිය යුතුය.

07. ඉන්පසු දිස්ත්‍රික් මැතිවරණ කාර්ය මණ්ඩලය "අ" හා "ආ" ලැයිස්තු පිළියෙළ කර එය දින 28 ක් ප්‍රදර්ශනය කිරීම සඳහා කටයුතු කරන අතර එම කාලය තුළ හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ. ඉන් අනතුරුව හිමිකම් හා විරෝධතා පරීක්ෂණ පවත්වනු ලබන අතර ඒ සඳහා ග්‍රාම නිලධාරීන්ගේ සහාය අවශ්‍ය වේ.

08. එම පරීක්ෂණ අවසානයේදී ඡන්ද හිමි නාමලේඛනය සහතික කරනු ලැබේ.

09. එක් ප්‍රතිශෝධන වර්ෂයකදී පරිපූරක ඡන්ද හිමි නාමලේඛන 03 ක් සකස් කළයුතු අතර එම පරිපූරක ඡනද්හිමි නාමලේඛන සකස් කිරීමේ දී ද, මෙම පියවර අනුගමනය කරනු ලැබේ.

10. ඡන්දහිමියන් ගණන් ගැනීමේ කාල සීමාව තුළ ග්‍රාම නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වූවහොත්, එය මෙම ප්‍රතිශෝධන කාර්යය සාර්ථකව ඉටු කරගෙන යාම සඳහා අහිතකර ලෙස බලපෑ හැකිය. එසේ හෙයින් විනය ක්‍රියාමාර්ග හේතුවෙන් හෝ අත්‍යාවශ්‍ය හා නොවැලැක්විය හැකි අවස්ථාවලදී සහ 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝග හැර 2025 ජනවාරි මස 01 දින සිට 2025 මාර්තු මස 31 දින දක්වා කාලය තුළ දී ග්‍රාම නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදු නොකිරීමට පියවර ගත යුතුය.

11. විවිධ විෂයයන් යටතේ පැවරී ඇති අධික රාජකාරි හේතුවෙන් ඇතැම් ග්‍රාම නිලධාරීන් වෙතින් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ රාජකාරී කටයුතු නියමිත පරිදි අප්‍රමාදව හා නිවැරදිව සිදු නොවන අවස්ථා නිරීක්ෂණය වී ඇත. මෙම කටයුතු නියමිත දින වකවානු තුළ සිදු නොවුනහොත් පහතේ දැක්වෙන පරිදි නියමිත කාලසීමාව තුළ ඡන්දහිමි නාමලේඛනයේ වැඩ අවසන් කිරීමට නොහැකි වනු ඇත. එසේ හෙයින් ග්‍රාම නිලධාරීන් විසින් ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනයට අදාළ ක්ෂේත්‍ර ගණන් ගැනීමේ කටයුතු සිදු කරනු ලබන කාල සීමාව තුළ, එනම් 2025 ජනවාරි මස 01 දින සිට 2025 මාර්තු මස 31 දින දක්වා හෝ එම නිලධාරීන් විසින් ඡන්දහිමියන් ගණන් ගැනීමේ කාර්ය අවසන් කරන දින යන දෙකෙන් කලින් එළඹෙන දිනය තෙක් ග්‍රාම නිලධාරීන් ස්වකීය කාර්යාලයේ අත්‍යාවශ්‍යයෙන්ම රැඳී සිටිය යුතු දින ලෙස අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා පෙරවරුව සීමා කරන ලෙස හා සේවයේ හදිසි අවශ්‍යතාවයන්ට යටත්ව ඉතිරි දිනයන් ක්ෂේත්‍ර ගණන් ගැනීම් සඳහා නිදහස් කරන ලෙසක් දන්වමි.

ඉහත කරුණු සම්බන්ධයෙන් ඔබගේ කාරුණික අවධානය යොමු කොට ග්‍රාම නිලධාරීන් දැනුවත් කර ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධන කාර්යය සාර්ථක කර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් මෙයින් කාරුණිකව දන්වමි.

ජී.ජී.නිශාන්ත
අතිරේක ලේකම් (ස්වදේශ කටයුතු)

අත්/කළේ:- එස්.ආලෝක බණ්ඩාර
ලේකම්
රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත :-
01. මැතිවරණ කොමසාරිස් ජනරාල් - ඔබගේ අංක NE1/64(2025) හා 2024.12.30 දිනැති ලිපිය අනුව
කරු.දැ.ගැ.ස.

ඇමුණුම 04

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2444/61 - 2025 ජූලි මස 11 වැනි සිකුරාදා - 2025.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ඡන්දහිමි නාමලේඛන ප්‍රතිශෝධනය - 2025**

මෙම QR කේතය Scan කර ලියාපදිංචි තොරතුරු බලාගත හැක. නැතිනම් ec.lk/vrd අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.

"අ", "ආ" ලැයිස්තු ප්‍රදර්ශනය, හිමිකම් හා විරෝධතා ඉදිරිපත් කිරීම පිළිබඳව මැතිවරණ කොමිෂන් සභාවේ නිවේදනය

අර්ථ දැක්වීම:

01. "පනත" - 2021 අංක 22 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ ( සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 44 දරන ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනත

02. වලංගු ඡන්දහිමි නාමලේඛනය - 2024 වර්ෂයේ ප්‍රධාන නාමලේඛනය සහ 2024(1), 2024(2) සහ 2024(3) යන පරිපූරක ඡන්දහිමි නාමලේඛන අදහස් වේ.

03." 'අ' ලැයිස්තුව" - වලංගු ඡන්දහිමි නාමලේඛනයේ නම් සඳහන්ව ඇති අයගෙන් මියගොස් ඇති හෝ පදිංචිය හැරගොස් ඇති හෝ වෙනත් හේතුවක් මත හෝ සුදුසුකම් නොලබන තැනැත්තන්ගේ එනම් වලංගු ඡන්දහිමි නාමලේඛනයේ සුදුසුකම් නොලබන ලිපිනයෙන් ඉවත් කිරීමට නියමිත තැනැත්තන්ගේ නම් සඳහන් වන ලැයිස්තුව

04." 'ආ' ලැයිස්තුව" - වලංගු ඡන්දහිමි නාමලේඛනයේ සුදුසුකම් ලබන ලිපිනයේ නම් ඇතුළත් නොවන නමුත් වයස අවුරුදු 18 සම්පූර්ණ වීම හෝ පදිංචියට පැමිණීම හෝ වෙනත් හේතුවක් මත හෝ 2025 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට අලුතින් නම් ඇතුළත් කිරීම සඳහා සුදුසුකම් ලබන තැනැත්තන්ගේ නම් සඳහන් වන ලැයිස්තුව

1A - G 44809 — 19 (2025/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**වලංගු නාමලේඛනය (හෝ කොටසක්) සහ "අ" ලැයිස්තු හා "ආ" ලැයිස්තු ප්‍රදර්ශන ස්ථාන :**

| *ප්‍රදර්ශනය පිණිස තබනු ලබන ස්ථානය* | *ප්‍රදර්ශනය පිණිස තබා ඇති ඡන්දහිමි නාමලේඛනය සහ ලැයිස්තු හෝ ඒවායේ කොටස්* |
|---|---|
| 01. එක් එක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය | අදාළ මැතිවරණ කොට්ඨාසයෙහි (දිස්ත්‍රික්කයේ) වලංගු ඡන්දහිමි නාමලේඛනයේ සම්පූර්ණ පිටපත සහ ඊට අදාළ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත්. |
| 02. එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන වලංගු ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත්. |
| 03. එක් එක් පළාත් පාලන ආයතනය | අදාළ පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ පිහිටා ඇති සියලුම ඡන්ද කොට්ඨාස දැක්වෙන වලංගු ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත්. |
| 04. එක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලය | අදාළ ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ පිහිටා ඇති ඡන්ද කොට්ඨාස දැක්වෙන වලංගු ඡන්දහිමි නාමලේඛන කොටසෙහි පිටපතක් සහ ඊට අදාළ "අ" සහ "ආ" ලැයිස්තුවල පිටපත්. |

**උපදෙස්:**

01. "අ" සහ "ආ" ලැයිස්තු පිළියෙල කර අවසන් බව හා එම ලැයිස්තු හෝ ඒවායේ කොටස් කාර්යාල වේලාවන් හි දී ඉහත සඳහන් ප්‍රදර්ශන ස්ථානයන්හි දී මහජනයාට පරීක්‍ෂා කිරීම පිණිස තබා ඇති බව මෙහි පහත උපලේඛනයෙහි, I වන තීරයෙහි සඳහන් මැතිවරණ කොට්ඨාසය සඳහා එහි II වන තීරයෙහි අනුරූප සටහනේ සඳහන් සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරී විසින් 2025.07.11 දින නිවේදනය කර ඇති බව ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 13 වන වගන්තිය අනුව එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ලියාපදිංචි කිරීමේ නිලධාරි වෙනුවෙන් දැනුම් දෙනු ලැබේ.

02. ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ 14 වන වගන්තිය ප්‍රකාර එක් එක් මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ එකී ඡන්දහිමි නාමලේඛනයේ තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නමක් ඇතුළත් කරවා ගැනීමට සුදුසුකම් ඇත්තාවූ එහෙත් තමාගේ නම ඡන්දහිමි නාමලේඛනයෙන් හා "ආ" ලැයිස්තුවෙන් ඉවත් කොට හෝ "අ" ලැයිස්තුවේ ඇතුළත් කර හෝ ඇති යම් කිසිවෙකු විසින් තමාගේ නම හෝ වෙනත් තැනැත්තෙකුගේ නම නාමලේඛනයෙහි ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ අවස්ථාවෝචිත පරිදි තමා විසින් හෝ තමා වෙනුවෙන් වෙන කෙනෙකු විසින් හෝ හිමිකම් ඉල්ලා සිටින්නේ නම් එසේ හිමිකම් ඉල්ලා සිටින අය විසින් ඒ බව යථෝක්ත ඡන්දහිමියන් ලියාපදිංචි කිරීමේ පනතේ උපලේඛනයේ නියම කර ඇති "අ" සහ "ආ"ආකෘතියට සාරානුකූලව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 2025 ජූලි 11 දින පළ කරන අතර එදින සිට සති 4 ක් ඇතුළත එනම් 2025 අගෝස්තු මස 07 දින හෝ ඊට පෙර මේ සඳහා වූ සෑම ඉල්ලුම් පත්‍රයක්ම එක් එක් මැතිවරණ කොට්ඨාසයෙහි ලියාපදිංචි කිරීමේ නිලධාරී (දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය) වෙත ලැබිය යුතුය.

03. මැතිවරණ කොට්ඨාසයට අදාළ වූ ඡන්දහිමි නාමලේඛනයේ හෝ "ආ" ලැයිස්තුවේ තමාගේ නම ඇතුළත්ව ඇත්තාවූ යම් කෙනෙකුට, තමාගේ නම හෝ එකී නාමලේඛනයේ හෝ "ආ" ලැයිස්තුවේ හෝ නම සඳහන් වී ඇත්තාවූ වෙන යම් කෙනෙකුගේ නමක් හෝ එකී නාමලේඛනයේ ඇතුළත් කර තිබීම ගැන හෝ එකී නාමලේඛනයේ නම ඇතුළත් කරවා ගැනීම පිණිස හෝ තබා ගැනීම පිණිස හෝ විරුද්ධතාවය දක්වා සිටීමට පුළුවන. එසේ දක්වා සිටින විරුද්ධතාවන් යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි "ඇ" ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට, මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. නාමලේඛනයේ නම ඇතුළත් කිරීම ගැන සඳහන් වනු ලබන සෑම විරුද්ධතාවක්ම මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට එනම් 2025 ජූලි මස 11 දින සිට සති හතරක් ඇතුළත එනම් 2025 අගෝස්තු මස 07 දින හෝ ඊට පෙර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ නිලධාරී තැන වෙත ලැබෙන සේ එවිය යුතුය.

04. හිමිකම් ඉල්ලා සිටින අයකුගේ නමක් ඡන්දහිමි නාමලේඛනයේ ඇතුළත් කිරීම ගැන දක්වනු ලබන සෑම විරුද්ධතාවයක්ම හිමිකම් ඉල්ලා සිටින්නන්ගේ නම් ලැයිස්තුවක් අඩංගු දැන්වීමක් දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේ ප්‍රදර්ශනය කරනු ලැබූ දින සිට

දින 14 ක් ඇතුළත යථෝක්ත පනතේ උපලේඛනයේ නියම කර ඇති පරිදි "ඇ" ආකෘතියට සාරානුකූලව පිටපත් දෙකකින් යුක්ත කොට ලියාපදිංචි කිරීමේ නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය. මෙම දැන්වීම දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල 2025 ජූලි මස 25 වන දින සහ 2025 අගෝස්තු මස 11 වන දින ප්‍රසිද්ධ කරනු ඇත.

05. හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන "අ" "ආ" ආකෘති පත්‍ර සහ විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය වන "ඇ" "ඇ" ආකෘති පත්‍ර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හෝ පළාත් පාලන ආයතන කාර්යාල හෝ ග්‍රාම නිලධාරී කාර්යාලවලින් ලබා ගත හැකිය.

**ආර්.එම්.ඒ.එල්. රත්නායක,**
**සභාපති,**
**මැතිවරණ කොමිෂන් සභාව**

2025 ජූලි මස 11 වන දින.
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *I වන තීරය* මැතිවරණ කොට්ඨාසය | *II වන තීරය* 2025 "අ" සහ "ආ" ලැයිස්තු සකස් කළ සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි | *I වන තීරය* මැතිවරණ කොට්ඨාසය | *II වන තීරය* 2025 "අ" සහ "ආ" ලැයිස්තු සකස් කළ සහකාර ලියාපදිංචි කිරීමේ නිලධාරි |
|---|---|---|---|
| 01. කොළඹ | පියුමි ආටිගල | 12. මඩකලපුව | එම්. බී. එම්. සුහියාන් |
| 02. ගම්පහ | ඩබ්ලිව්. ඒ. රවින්ද්‍ර වික්‍රමසිංහ | 13. දිගාමඩුල්ල | කසුන් ශ්‍රීනාත් අත්තනායක |
| 03. කළුතර | කාලින්ද්‍ර ජයවීර ප්‍රනාන්දු | 14. ත්‍රිකුණාමලය | එස්.කේ. දේවනෙරංජන් |
| 04. මහනුවර | එච්.ඩී.එන්. සම්පත් ප්‍රනාන්දු | 15. කුරුණෑගල | ආර්.එම්.එච්.බී. රත්නායක |
| 05. මාතලේ | එච්.ඒ.ඊ. පුෂ්පකුමාර | 16. පුත්තලම | එස්.එල්.ආර්. ජයනායක |
| 06. නුවරඑළිය | කේ.ඒ.එල්.එස්.කලුගම්පිටිය | 17. අනුරාධපුරය | එන්.පී.පී.අයි.ආර්. ගුණරත්න |
| 07. ගාල්ල | ඩබ්ලිව්.එච්.ආර්. විජය කුමාර | 18. පොළොන්නරුව | මනෝජි ටී. ගුරුසිංහ |
| 08. මාතර | පී.එස්. පතිරණ | 19. බදුල්ල | කේ. කාන්දීපන් |
| 09. හම්බන්තොට | වී.ඩී.ජේ. ලක්මාල් | 20. මොණරාගල | එන්. රේගන් |
| 10. යාපනය | ආර්. සසීලන් | 21. රත්නපුර | සුරංග අඹගහතැන්නෙ |
| 11. වන්නි | ආර්.සී. අමල්රාජ් | 22. කෑගල්ල | සජිත් පී. කස්තුරිසිංහ |

EOG 07 - 0131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.